IFJ FIP

# සහයෝගය තුළින් නිදහස

## දකුණු ආසියාවේ සාමය සඳහා මාධ්‍ය ක්‍රියාකාරිත්වය

















සාමය සඳහා එක්සත් ජනපද ආයතනය

# හැඳින්වීම

| **Speak!** | **කියනු!** |
|---|---|
| *Speak, for your two lips are free¦* | කියනු දෙතොල් නිදහස්ව ඇති තාක් |
| *Speak, your tongue is still your own¦* | කියනු දිව ඔබ සතුව පවත්නා තාක් |
| *This straight body still is yours—* | මේ නොවක් සිරුර තවමත් ඔබෙයි |
| *Speak, your life is still your own'* | කියනු ජීවිතය ඔබටම හිමි තාක් |
| | |
| *See how in the blacksmith¡s forge* | බලනු ලෝකුරුවා නවන හැඩ |
| *Flames leap high and steel glows red"* | ගිනුදලු උස්ව ගොස් යකඩ රත්පැහැ වෙයි |
| *Padlocks open wide their jaws"* | අගුල් දිගහැරෙයි සිය හකු විවර කරමින් |
| *Every chain¡s embrace outspread* | හැම යදමකම පුරුක් විසිරෙත්‍ය |
| | |
| *Time enough is this brief hour* | මේ කෙටි හෝරාවේ කාලය ඇතිය |
| *Until body and tongue lie dead¦* | සිරුරත් දිවත් මියැදෙන තුරු |
| *Speak, for truth is living yet—* | දිවි ඇති තෙක්ම ඇත්තම කියනු |
| *Speak whatever must be said'* | කවරක් වුවත් කිව යුතු දේ කියනු. |

*Bol (Speak) by Faiz Ahmed FaizTranslated by V G Kiernan*

දකුණු ආසියාවේ මාධ්‍ය කළාපයේ සිදුවෙමින් පවතින විශාල වෙනස්කම් සමඟ පොර බදිමින් ඉතා දුෂ්කර තුළිත කාර්යක නිරත වී සිටිති. කළාපයේ සියළුම රටවල් සංක්‍රාමී සමාජ ලෙස හඳුන්වා දිය හැකිය. මෙම වර්තාවෙන් ආවරණය කර ඇති රටවල් පහ ඇතැම් විශේෂ කරුණු සම්බන්ධයෙන් වෙනස් වුවද ගැටුම් නිරාකරණ යාන්ත්‍රණයේ සුවිශේෂී සාධකයක් ලෙස මාධ්‍ය නදහස පිළිබඳ ගැටළුව ආමන්ත්‍රණය කිරීම සඳහා පොදු කළාපීය උපාය මාර්ගයකට ඉඩ තැබීමට තරම් ප්‍රමාණවත් සමානතා පෙන්වයි. ඒ එකම ඉතිහාසයකට හිමිකම් කියූ නිසා පමණක් නොවේ.

ජනමාධ්‍ය නිදහස සම්බන්ධ අර්බුදයන්හි දී එකමුතු වී ප්‍රතිචාර දැක්වීම සඳහා ජනමාධ්‍ය සංවිධානයන්ගේ භූමිකාව සහ ඔවුන්ගේ ධාරිතව පිළිබඳ ඍජු අවධානය යොමු කිරීම සඳහා ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය ඔවුන්ගේ අනුබද්ධ ආයතන සහ හවුල්කරුවන් සමග දියත් කළ පර්යේෂණයක ප්‍රතිඵල මෙම වෙළුම තුළ කැටි වී ඇත. අර්බුද අවස්ථා වලට කොටු වූ ජනමාධ්‍ය සංවිධානයන්ගේ සාර්ථක සාමූහික ක්‍රියාවන් පිළිබඳ බොහෝ උදාහරණ තිබේ. එමෙන්ම සාමූහික ක්‍රියාවන්ට බලාපොරොත්තු වූ ඉලක්ක වෙත යාමට නොහැකි වූ අවස්ථාද තිබේ. එවන් අවස්ථා කිහිපයක්ම අනාවරණය කර ඒවා සම්බන්ධ කිරීමෙන් අර්බුද අවස්ථාවන්හි ජනමාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම සඳහා උපාය මාර්ග කට්ටලයක් දියුණු කිරීමට මෙම වාර්තාව තුළින් බලාපොරොත්තු වේ.

කළාපයේ විශාලම රට වන ඉන්දියාව සතුව නීතියේ පාලනය පිළිබඳ සියළු පක්ෂ සහ ආයතන අතර ඇති කර ගෙන ඇති පුළුල් එකඟතාවය ලබන බොහෝ දුරට ස්ථාවර දේශපාලන පද්ධතියක් ඇත. නව ගෝලීය පද්දතිය තුළ "ඉදිරියට එන රටක්" ලෙස හඳුනා ගැණෙන එහි ආර්ථිකය සෑම ස්ථරයකදීම අවස්ථා මෙන්ම තර්ජනාත්මක හැඟීම් උපදවමින් වැදගත් ව්‍යුහාත්මක පරිණාමයක් හරහා ගමන් කරයි. විශාලත්වය සහ විවිධත්වය අනුව කළාපයේ ආර්ථික කටයුතු බොහොමයක් සඳහා කේන්ද්‍රය බවට පත් වීමේ හැකියාව ඉන්දියාව සතු වුවද ඉන්යාවේ සියළු අසල්වැසි රටවල් සමග ඇති සබදතාවන්ට බාධා පමුණුවන ආරක්ෂක ව්‍යාකූලතා හේතුවෙන් මෙම හැකියාව නිවැරදි ලෙස සාක්ෂාත් ගැනීමට හැකි වී නොමැත. ඉන්දියාව අභන්තරයේ ජම්මු හා කාශ්මීර්හි ආතතීන් තව දුරටත් කැකෑරෙමින් පවතී. එහි ඊසාන දිග ප්‍රාන්තයන්හි ජනවාර්ග ික දිශානතියකින් යුත් කැරළි සක්‍රීයව පවතී. මේ අතර ඉන්දියාවේ මධ්‍ය කළාපයේ දැකිය හැකි වන්නේ ආරක්ෂක බලඇණි සහ ප්‍රාන්ත පහක් පුරා විහිදී ඇති මාවෝවාදී කැරළි කණ්ඩායම් අතර දෛනිකව ඇති වන ප්‍රචණ්ඩකාරී ගැටුම්ය. මෙම තත්ත්වයන් සියල්ලම හේතුවෙන් ජනමාධ්‍යවේදීන්ට අනුකම්පා රහිත අභියෝග රැසකට මුහුණ දීමට සිදු වන අතර ඔවුන්ගේ ප්‍රතිචාර විවිධ මෙන්ම නිර්මාණාත්මක ද වී ඇත.

දකුණු ආසායවේ සෙසු රටවල් සංකීර්ණ බහුමාන දේශපාලන සංක්‍රාන්තියක් අත්දකිමින් සිටිති. පාකිස්තානය සහ නේපාලය 2008 මුල දී ඔවුන්ගේ පාලන ක්‍රමයේ වෙනසක පොරොන්දුව රැගෙන පැමිණි ජාතික මැතිවරණයන්ට මුහුණ දී ඇත. ප්‍රජාතන්ත්‍රවාදී බලවේග යන්ට දේශපාලන කේන්ද්‍රය බවට පත් කරමින් ණී එක් අවස්ථාවකදී මිලිටරි පාලනයක් සහ තවත් අවස්ථාවකදී රාජාණ්ඩු ක්‍රමයක් යන අත්තනෝමතික පාලනයන්ට බල කරමින් දේශපාලන පථය වෙනස් කළ හවුල් සංවිධානයන්හි ප්‍රධාන සාධකයක් බවට රටවල් දෙකෙහිම ජනමාධ්‍ය සංගම පත්වීමට සමත් විය.

2010 මැයි වන විට ජාතිය වෙනුවෙන් ජනරජ ව්‍යවස්ථාවක් නීතිගත කිරීමට දුන් පොරොන්දුව ඉටු කිරීමට නේපාලයේ අළුතින් පත් වූ ව්‍යවස්ථා සභාව අසමත් වී ඇත. ආණ්ඩු දෙකක් නිලය දරා ඇත්තේ වෙනත් අවස්ථාවලදී කටුක විරුද්ධවාදීවන පක්ෂයන් අතර සිදුකළ සංකීර්ණ කේවල් කිරීමේ ක්‍රියාවලීන්ගෙන් පසුවය. ඒකමතිකභාවය යන මූලධර්මය මත පිහිටා පාලනය මෙන්ම ව්‍යවස්ථාව සම්පාදනය කිරීම යන ක්‍රියාවන් දෙකම සිදු කළ යුතුය යන බවට සියළු පක්ෂ අතර තිබූ ගිවිසුම මැතිවරණ අවසන් වී මෙන් පසුව ඉතා ඉකමණින් බිඳ වැටුණි 2008 ඓතිහාසික ජාතික මැතිවරණයන්ගෙන් පසු බලයට පත් වූ දෙවන ආණුඩුවේ ඉල්ලා අස් වීමෙන් පටන් නේපාලය අනුප්‍රාප්තික පරිපාලනයක් වෙනුවෙන් මේ වන තෙක් දීර්ඝ කාලයක් නිකරුණේ බලා සිට ඇත.

මැතිරණයකින් තේරී පත් වූ රජයක් වෙත සංක්‍රමණය වීම සහතික කිරීම සඳහා 2007 වසරේදී පාකිස්තානයේ අති විශාල අරගලයක් ඇති විය. එවක් පටන් පාකිස්තාන මහජන පක්ෂය විසින් නායකත්වය දරන සන්ධාන රජය ප්‍රජාතන්ත්‍රවාදය යළි ස්ථාපනය කිරීමෙහි ලා ජනමාධ්‍යවේදීන්ගේ භූමිකාව අර්ධ වශයෙන් හඳුනා ගනිමින් පෙර තිබූ මිලිටරි පරිපාලනය විසින් හඳුන්වා දුන් නරකම නීති සහ ක්‍රියා පටිපාටි ඉවත් කර තිබේ.  නමුත් ගෝලීය භූ දේශපාලන සමීකරණය තුළ පාකිස්තානය සතු සුවිශේෂි ස්ථානය හේතුවෙන් එහි පාලනය තවමත් ශක්තිමත් වී නැත. පාකිස්තානයේ දෛවය සෑම අවස්ථාවේදීම එහි ආසන්නම අසල් වැසියන් වන ඉන්දියාව සහ ඇෆ්ගනිස්තානය සමග වෙලී පවතී. ඇෆ්ගනිස්ථානයේ ඇතිවී තිබෙන තත්ත්වය පකිස්තානය මත ඇති කරන්නේ දීර්ඝ කාලීන අඳුරු සෙවණැල්ලකි. පාකිස්තානයේ කයිබර් පක්තුන්කාවා පළාත (පෙරදී වයඹ දිග ප්‍රත්‍යන්ත පළාත) ගෝත්‍රික ප්‍රදේශ සහ බලුකිස්ථානය යන ප්‍රදේශයන්හි ඇෆ්ගනිස්ථානු තලෙයිබාන් කණ්ඩායම් විශාල පරිමාණයේ ජනාවාස ඇති කිරීමෙන් හට ගත් අස්ථාවරභාවය මෙන්ම රටෙහි තත්ත්වය නරක අතර හැරවීමට දායක වී ඇත්තේ ෆෙඩරල් ආණ්ඩුවේ ලිඛිත ආඥාව ප්‍රතික්ෂේප කරන රටෙහි පශ්තුන් සහ බලොච් ප්‍රදේශයන්හි කැකෑරෙන තත්ත්වයන්ය.

ජනමාධ්‍යවේදීන් සෑහෙන වැටුප් සහ සේවා තත්ත්වයන් සඳහා මෙන්ම ආරක්ෂාව සහ රැකවරණය සඳහා අවශ්‍ය විධි විධාන ලබා ගැනීමට කැරෙන අරගලය දිගින් දිගටම පවත්වාගෙන ගොස් ඇත. ඒවාට සැළකිය යුතු සාර්ථකත්වයක් ලැබී ඇති  නමුත් විශාල මාධ්‍ය ආයතන සභය දැක්වීමේදී මන්දෝත්සාහී භාවයක් පෙන්නුම් කර ඇත. නේපාලයේ මෙන් ප්‍රජතන්ත්‍රවාදය යලි ස්ථාපිත කිරීමේ ව්‍යාපාරයට සැළකිය යුතු සාර්ථකත්වයක් ලඟා කර දුන් සෙසු සිවිල් සමාජ සංවිධාන සමග ඇති කර ගත් පුළුල් සන්ධානය ආසන්නම අරමුණ වෙත ළඟා වීමත් සමග විසිරී ගොස් ඇත.

ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීන සිවිල් යුද්ධය විසින් සිවිල් සමාජය මෙන්ම මාධ්‍ය තුළද කටුක මෙන්ම ගැඹුරු ධ්‍රැවීකරණයක් නිර්මාණය කර තිබිණි ගැටුමේ නරකම කාලය අතරතුර දී වාර්ක අනන්‍යතාවය නොසලකා තමන් දකින දේ ඒ අයුරින් වාර්තා කිරීම සඳහා ජනමාධ්‍යවේදීන්ට ඇති අයිතීන් තහවුරු කිරීම සඳහා කැපී පෙනෙන උත්සහයන් දක්නට






දකුණු ආසියාවේ ජනමාධ්‍යවේදීහු ඔවුන්ගේ වෘත්තිමය දෛනික ජීවිතයේදී කායික ප්‍රහාරයන්ට ගොදුරුවෙති. එමෙන්ම අතරින් පතර පෙශාවර් ජනමාධ්‍ය සමාජයට එල්ලවූ මරාගෙන මැරෙන ප්‍රහාරය වැනි මරණීය ප්‍රහාරයන්ගේ ද ඉලක්ක බවට පත්වෙති. ජීවන අරගලයේ අර්බුදයට ද මුහුණ දෙන ඔවුනට සාධාරණ වැටුප් සහ යහපත් වෘත්තීයමය කොන්දේසි සඳහා බොහෝවිට වීදී බැසීමට ද සිදුවෙයි.

ලැබිණි 2002 දී දෙපාර්ශවයම විසින් ප්‍රකාශයට පත් කෙරුණ සටන් විරාමය ජනමාධ්‍යවේදීන්ගේ සාමූහික සහයෝගීතාවය ගොඩනැංවීමටත් අන්තර් - වාර්ගික ව්‍යාපාරයන් සඳහා වේදිකා නිර්මාණය කිරීමටත් ජනමාධ්‍යවේදීන්ට අවස්ථා ළගා කර දුන්නේය. එනමුත් දේශපාලන පද්ධතියේ ප්‍රධාන කොටස්කරුවන් ගණනාවක් විසින්ම රාජ්‍ය පාලිත මාධ්‍ය ප්‍රතිසංස්කරණය කිරීම ප්‍රමුඛ කරුණක් ලෙස හඳුනා ගනු ලැබුවද ඒ සඳහා දැරූ වෑයම් ලබා ගත්තේ සුළු ප්‍රගතියකි. 2006 දී යුද්ධය නව ප්‍රචණ්ඩතාවයක් සමග නැවත ආරම්භ වීමත් සමඟ ජනමාධ්‍ය සංවිධාන නිදහස් සහ සාධාරණ වාර්තාකරණයක් සඳහා උපකාරී වන වාතාවරණයක් ඇති කිරීම වෙනුවෙන් සිදු කළ සාමූහික ක්‍රියා මාර්ග ඉදිරියට ගෙන ගියහ. මාධ්‍ය ආයතන හිමිකරුවන්ගේ උදාසීනත්වය සහ ආණ්ඩුවේ "එක්කෝ අප සමඟ හෝ නැත්නම් අපට විරුද්ධව" යන ආකල්පය තුළට ඇතුළත් වීමට තිබූ ඔවුනගේ කැමැත්ත සහ එදිරිවාදිකම් යළි ආරම්භ වූ පසු රාජ්‍ය පාලිත මාධ්‍ය විසින් ඉතා සූක්ෂම ආකාරයකින් සිදු කළ ප්‍රචාරක කටයුතු ඇති වූ දරුණු බාධකබවට පත්විය. විශේෂයෙන්ම ඔවුන්ගේ ප්‍රධාන නායකයන් බොහොමයක් ඉලක්ක ගත කිරීමත් නිහඬවීමට හෝ රට හැර යාමට බල කිරීමත් සමඟ ජනමාධ්‍ය සංවිධාන ඇති වූ මාධ්‍ය මර්දනයේ නව වාතාවරණය තුළ වැඩි අවධානමකට ලක් වූ බව පෙනිනි. එනමුත් ලංකාවේ අත්දැකීම් දකුණු ආසියාවේ මෙන්ම වෙනත් ස්ථානයන්හි ජනමාධ්‍යවේදී සංවිධාන සඳහා වටිනා පාඩම් ලබා දේ.

බංග්ලාදේශය ආසන්න වශයෙන් අවුරුදු දෙකක් මිලිටරි සහාය ලද භාරකාර පරිපාලනයකින් පසුව 2009 මුල භාගයේදී මැතිවරණයකින් තෝරා පත් කර ගැණුනු ආණ්ඩුවක් වෙත සංක්‍රමණය විය. සාම්ප්‍රදායික ලෙස භාවිතයේ යෙදුණ දේශපාලනය මත මාස ගණනක් පැවති හදිසි නීතියේ බලපෑම දැඩි ස්වභාවයක් ගත්තේය. විවිධ තලයන්හි නායකයන් සිර ගත කිරීම හේතුවෙන් ප්‍රධන පක්ෂ දෙකම ක්‍රියාකාරී නොවන තත්ත්වයට පත් වුවද ජාතික පාර්ලිමේන්තු මැතිවරණ කාලසටහන නිල වශයෙන් නිවේදනය කිරීමත් සමග ඔවුහු නැවත ජීවය ලැබූහ. නමුත්, අවාමි ලීගයට තීරණාත්මක ජයග්‍රහණයක් ගෙන දුන් මැතිවරණයේ සිට සිවිල් සමාජය සහ ජනමාධ්‍ය, පක්ෂ දෙක අතර ඇති ප්‍රතිවිරෝධයත් අධිකරණය සහ මැතිවරණ කොමිසම වැනි ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවෙහි යෙදවීම සඳහා අත්‍යවශ්‍ය ආයතන ක්‍රියාතමක විය යුත්තේ කෙසේද යන්න පිළිබඳ එකඟ වීමට පක්ෂ සතු නොහැකියාවත් හේතුවෙන් දරුණු ලෙස බෙදී පවතී. ඒ අතර රටෙහි ආරම්භක අග්‍රාමාත්‍ය ෂෙයික් මුජිබූර් රහ්මන්ගේ ඝාතකයන් පස් දෙනෙකුට මරණීය දණ්ඩනය ලබා දීමෙන් ඉතා කෙටි කලකට පසුව 1971 රටෙහි ජාතික විමුක්ති සටන අතර කාලයේ සිදුකෙරුණ යුධ අපරාධ සඳහා නඩු විභාග ආරම්භ විය. සිවිල් ආණ්ඩුවක් නැවත ඇති වූ දා සිට දේශපාලනය අස්ථාවර තත්ත්වයක පැවතී ඇති අතර වඩා දරුණු ව්‍යාකූලතා ඇතිවීමේ ඉඩ බොහෝය. එනමුත් 1975 සිදු කළ අපරාධයක් වෙනුවෙන් මුජිබ් ඝාතකයන්ට මරණ දඬුවම ලබා දීම මෙන්ම යුධ අපරධ නඩු විභාග ආරම්භ කිරීමද සිවිල් සමාජය අනුමත කරන බව පෙනෙන්නට තිබේ. බංග්ලාදේශයේ සිටින නිරීක්ෂකයන් ගේ අදහස වන්නේ මෙමඟින් මාධ්‍ය ප්‍රජාව තුළ ඇති කටුක ධ්‍රැවීකරණයෙහි බලය හීන කරන සුළු බලපෑමක් ඇති කළ හැකි බවයි. නමුත් කිසිවක් ස්ථිරවම කිව නොහැකිය.

## විවිධ වූ කතිකා

බංග්ලාදේශය හැරුණු විට මෙම වාර්තාවෙන් ආවරණය වන අන් සියළුම රටවල් භාෂාමය වශයෙන් විවිධත්වයක් උසුලයි. භාෂා විවිධත්වය මාධ්‍ය පරිභෝජකයින් කොටස් වලට බෙදීමට හේතු වන අතර එමඟින් විවිධ ප්‍රජාවන් තුළ වෙන වෙනස් කතිකාවන් නිර්මාණය වීමේ හැකියාව ඇති වේ. මෙම රටවල ඉංග්‍රීසි ජනමාධ්‍යයට කැපී පෙනන පැවැත්මක් තිබුණද, ඉංග්‍රීසි භාෂාවේ බලපෑම කඩතොළු සහිත වන අතර අසමානය. ඉන්දියාවේ ඉංග්‍රීසි භාෂා ජනමාධ්‍ය විශාල වන අතර වැඩෙමින් පවතී. එය ආදායම් සහ ධන පරිමාණයේ ඉහළ කෙලවරේ සිටින ජනකණ්ඩායම් වල ඕනෑ එපාකම් පිරිමසන අතර එම නිසා වඩාත්ම වාසිදායී ප්‍රචාරක දැන්වීම් ආකර්ශණය කර






ගනී. ශ්‍රීලංකාවේ සහ පාකිස්තානයේද ඊට වඩා අඩු මට්ටමකින් වුවද ඒ සමාන ආකාරයෙක් ක්‍රියාත්මක වේ. නමුත් බංග්ලාදේශයේ සහ නේපාලයේ ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙහි ව්‍යාප්තිය ජනගහනයට සාපේක්ෂව අඩු මට්ටමක පවතී. එය සමාජයේ ඉහළ ස්ථරය විසින් කියවනු ලැබීමත් මෙම රටවල සිදුවීම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා බාහිර ලෝකයට මූලික තොරතුරු ගලා යන්නේ එමගින් වීමත් යන කරුණු මත එහි බලපෑමෙහි ශක්තිය රඳා පවතී.

කළාපයේ ඉංග්‍රීසි භාෂා මාධ්‍ය ජනගහණයෙන් සාපේක්ෂ වශයෙන් පටු වූ සමෘද්ධිමත් සමාජ තලයක ලැදියාවන් සමග තදින් බැඳී තිබීමේ නැඹුරුවක් පෙන්වයි. සෙසු භාෂා මාධ්‍ය ඔවුන්ට අදාල සංස්කෘතික ප්‍රජාව තුළ මුල් බැසගෙන තිබීම වඩා මෙය පැහැදළි ලෙස වෙනස් සංසිද්ධියකි. බොහෝ අවස්ථාවලදී මෙආකාර සංස්කෘතික බෙදීම් ජාතික ආණ්ඩු ක්‍රමයෙහි දෝෂ සමග පැහෙන අවස්ථාවන්හි දී එක් පාර්ශවයක් හෝ අනෙකෙහි ආභරණයක් ලෙස ජනමාධ්‍ය අර්බුදය තුළට ඇද ගනු ලබයි. එවන් අවස්ථාවක් වන්නේ මතභේදාත්මක ලෙස ආගමික භාරකාරිත්වයකට ඉඩම් පවරා දීමේ සිද්ධියක් හේතුවෙන් 2008 ජූලි සහ අගෝස්තු මාසයන්හි දී ඉන්දියාවේ ජම්මු කාශ්මීර් ප්‍රාන්තයේ සිවිල් කෝලහල ඇති වීමයි. එකිනෙකට වෙනස් වූ සංස්කෘතීන්ගෙන් යුක්ත ප්‍රාන්තයේ කොටස් දෙක ඔවුන්ගේ ප්‍රතිචාර සම්බන්ධයෙන් ධ්‍රැවීකරණය වී සිටියහ. එහි ප්‍රතිඵල ලෙස කාශ්මීර් කළාපයේ ජනමාධ්‍ය ගිණි අවුළුවන සුළු සහ අතිශයෝක්තිමය වාර්තාකරණයක් සිදු කළ බවට ජම්මුහි පුළුල්ව විවේචනයට ලක් වූ අතර ජම්මු ජනමාධ්‍ය දැක්වූවා යැයි කියන අසංවේදීභාවය හේතුවෙන් කාශ්මීර් කළාපය විසින් එම මාධ්‍ය හෙළා දකින ලද. මෙම ධ්‍රැවීකරණය ප්‍රාදේශීය මාධ්‍ය තුළ මෙන්ම ඉංග්‍රීසි භාෂා ජනමාධ්‍ය තුළද පැතිරී ගියේය.

2010 වසර මුලදී ඉන්දියවේ ඊසාන දිග ප්‍රාන්තයක් වන මනිපූර්හි ඒ හා සමාන සිදුවීමක් දක්නට ලැබිණිඃ නිම්නයේ සහ කඳුකර ප්‍රදේශ වල ජීවත් වන ජන කණ්ඩායම් තියුණු ලෙස ධ්‍රැවීකරණය වී සිටියහ. නියතයෙන්ම මෙම ප්‍රජාවන් අතර වූ දේශපාලන ආතතිය ජනමාධ්‍යයටද බලපෑම් කළ අතර එමගින් නිදහසේ කටයුතු කිරීමට ජනමාධ්‍යවේදීන්ට දරුණු ලෙස බාධා එල්ල විය.

## ජනමාධ්‍ය සහ සමාජීය තරාතිරම

ජාතික ප්‍රතිපත්ති පිළිබඳ වැදගත් ගැටළු සාකච්ඡා කරන අවස්ථාවලදී ජනමාධ්‍යයෙහි සමාජීය ස්ථාවරය ප්‍රශ්ණයට නගනු ලැබේ. උදාහරණයක් ලෙස ඉන්දියානු කුළ ධුරාවලිය යටතේ අවාසිදායක තත්ත්වයක පසු වූ පුද්ගලයන් වෙනුවෙන් සිදු කළ සාධනීය ක්‍රියාමාර්ග පෙන්වා දිය හැකිය. 2006 දී ඉන්දියාවේ එවන් පොදු විවාදයක් හට ගැනීමට ප්‍රථමයෙන් දිල්ලියේදී සිදු කළ සමීක්ෂණයකදී පෙනී ගියේ ප්‍රවෘත්ති ප්‍රමුඛතා මත සුළු හෝ සාමාන්‍ය හෝ තීරණාත්මක යන ඕනෑම ආකාරයේ බලපෑමක් ඇති කළ හැකි ජනාමධ්‍යවේදීන්ගේ 80%ක් අයත් වන්නේ කුළ ධුරාවලියේ ඉහළ ස්ථරයන්ට බවය. කුළ දෘෂ්ඨිවාදය අනුව "බැහැර කර ඇති" යැයි සැලකෙන කොටස් වලින් එනම්, දලිත් සහ "සෙසු පසුබට පන්තීන්ගෙන්" පැවත එන්නන් සිටියේ කිහිප දෙනෙකි. එමෙන්ම ආගමික සුළුතරය නියෝජනයද සම්පූර්ණ ජනගහණයෙන් ඔවුන් සතු ප්‍රතිශතයට අනුකූලව ඌණ මට්ටමක පවතී.[1]

ශ්‍රී ලංකාවේ, ජනමාධ්‍ය ආයතනයන්හි සමාජ තරාතිරම සහ ඔවුන් ආමන්ත්‍රණය කරන ප්‍රේක්ෂකයන්ගේ ලක්ෂණ ඉතා ඉහල වැදගත් කමක් උසුළයි. රජය සහ දෙමළ සටන්කාමීන් අතර පැවති වසර 25ක් පමණ දීර්ඝ ප්‍රචණ්ඩකාරී ගැටුම, 2009 මැයි මාසයේදී අවසන් බව නිල වශයෙන් ප්‍රකාශ වුවද තවමත් අඳුරු සෙවණැලි ඇති කරමින් සිටින නිසා මෙහිදී දර්ශනය වන රූපය දුර්වර්ණය. මාධ්‍ය තුළින්ද

---

1 බලන්න Aloke Thakore, "Breaking into the Media", *The Hoot*, June 12, 2006, and "Caste matters in the Indian media", *The Hindu*, June 3, 2006. මාධ්‍යයේ කාර්යබාරය ඇතුළු සාධනීය සැළකීම පිළිබඳ පුළුල් සාකච්ජාව සඳහා බලන්න "Reservations: The Die is Caste", *The Little Magazine,* Volume VI, Numbers 4 and 5, 2006 (copies available for purchase online at http://www.littlemag.com/reservation/printmag.html

මෙම ධ්‍රැවීතරණයෙහි ස්වභාවය පෙන්නුම් වේ. මෙතෙක් පැවති ද්වී ධ්‍රැවීය අර්බුධයට මෑත කාලීන වර්ෂවල සිට තෙවන මානයක් එක් වී ඇත. එනම්, අනුකම්පා විරහිත සටන්කාමීන් දෙපිරිස මැදට වඩ වඩාත් හසුවී සිටි මුස්ලිම් ප්‍රජාවේ දෘෂ්ටියයි. මෙහිදී ද ජනමාධ්‍ය සඳහා තත්ත්වය ඉතා අඳුරුය. ජනමාධ්‍යවේදය එදිරිවාදිකම් තුළට ඇද ගැණුන අතර ජනමාධ්‍යවේදය යුධකාමී කණ්ඩායම් වල ලැදියාවන්ගෙන් වියුක්තව පැවතීම අවසන් විය. එබැවින් ගැටුම් නිරාකරණය සඳහා ජනමාධ්‍යවේදය යාන්ත්‍රණයක් ලෙස යොදා ගැනීමට නොහැකි විය.

මෙය ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය තුළ තිබෙන දිගු කාලීන ගැටළුවකි. 2003 වසරේදී රටෙහි ජනමාධ්‍ය පිළිබඳ සිදු කළ අධ්‍යයනයක සඳහන් වන පරිදි අන්තර් - සංස්කෘතික වාර්තාකරණය සිදු වන්නේ ඉතා සුළු වශයෙනි. තමන් අයත් වන පටු භාෂාමය කණ්ඩායම හෝ සමාජ ආර්ථික ස්ථරයේ ලැදියාවන් සහ කැමැත්තට අනුකූල පරිදි කටයුතු කළහොත් තම මෙහෙවර ඉටු වනු ඇති බව සෑම මාධ්‍ය ආයතනයම විශ්වාස කරයි. අන්තර් - සංස්කෘතික වාර්තාකරණයක් ඇතිවූයේ නම් ඒ බොහෝ අවස්ථා වලදී අදහස් වූයේ "අනෙක් ජනවාර්ගි කණ්ඩායමේ අවමානාත්මක ලක්ෂණ පෙන්වා දීමය.."[2] අර්බුදයේ අවසන් වසර කිහිපය තුළ ජනමාධ්‍යවේදී සංවිධාන, තම වෘත්තීයමය කටයුතු වලදී ස්වකීය ප්‍රජාවේ අවධානය ලබන කරුණුවලට අමතරව පුළුල් සැළකිල්ලට භාජනය වූ කරුණු ඉදිරිපත් කරන බව තහවුරු කර ගැනීම සඳහා දැනුවත්ව යොමු වීමත් සමඟ මෙම තත්ත්වය වෙනස් වීම ආරම්භ විය. නියත වශයෙන්ම මේ පියවර බොහෝ අවස්ථාවලදී දෝෂාරෝපණයන්ට ලක් වූ අතර අවස්ථා රාශියකදීම රජයේ පාර්ශවයෙන් හිංසාකිරීම් සහ ප්‍රචණ්ඩකාරී පළිගැනීම් එල්ල විය. එනමුත් යුද්ධය නිමාවත් සමග පටු ප්‍රජා අනන්‍යතාවයන්ගෙන් ඔබ්බට ගොස් සාධාරණ හ සමාන ලෙස රටේ සුළුතරයන්ගේ සැළකිල්ලට ලක්වන කරුණු ආමන්ත්‍රණය කරන වාර්තාකරණයක් පිළිබඳ සම්ප්‍රදායක් නිර්මාණය කිරීමට මාධ්‍ය වෘත්තිකයෝ උතසාහ දරති. ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ සමයේ ප්‍රධාන ප්‍රමුඛතාවය සමාජ සාධාරණත්වයේ සිට ආර්ථික සංවර්ධනය යැයි යොමු කරමින් මාතෘකාව වෙනස් කිරීමට පවතින පාලනය දරන වෑයම්ද ඇතුලුව තවත් බරපතල බාධා පවතී.

## අවදානම් කළාප

පකිස්තානයේ කයිබර් පක්තූන්කාවා පළාතේ බලුකිස්ථානය සහ පෙඩරල් පරිපාලනය යටතේ ඇති ගෝත්‍රික කළාපයන්හි (ෆ්ඕ) පවතින විවෘත ගැටුම විසින් ජනමාධ්‍යවේදීන් විශාල සංඛාවක් මරණයට පත් කර ඇත. නමුත් ජනමාධ්‍යවේදින් අනතුරට භාජනය වන්නේ මෙම විවෘත ගැටුම් පවතින කළාප වලදී පමණක් නොවේ. බොහෝ විට ප්‍රාදේශීයව බලය හොබවන කණ්ඩායම් සහ රාජ්‍ය ආරක්ෂක ඒජන්සි නීත්‍යනුකූලභාවයේ සීමාවන් උල්ලංඝණය කරන ඔවුන්ගේ යම් ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා කරන ජනමාධ්‍යවේදීන් ට පහර දීම සහ බිය ගැන්වීම සම්බන්ධයෙන් ප්‍රසිද්ධය. සිවිල් යුද්ධයේ දරුණුම දින කිහිපය අතරතුර දී ශ්‍රී ලංකාවේ මෙන්, පාකිස්තානයේ ප්‍රචණ්ඩත්වය අහඹු ලක්ෂනයක් අත්පත් කර ගෙන ඇති අතර ඉලක්ක ද තෝරා ගෙන ඇත. මානසික සහ භෞතික යන දෙආකාරයෙන්ම ඉහළම හානි බලාපොරොත්තුවෙන් 2010 ජූලි මාසයේදී ලාහෝරයේ සංකේතමය ඉස්ලාම් දේවස්ථානයක් වන ඩාටා ගන්ජ් බක්ෂ් වෙත එල්ල කරන ලද බෝම්බ ප්‍රහාරය ඒ බව පෙන්නුම් කරයි.

ජනමාධ්‍ය සංවිධාන පාකිස්තානයේ ප්‍රජාතන්ත්‍රවාදය නැවත ස්ථාපිත කිරීම පිළිබඳ වූ අරගලයේ ප්‍රමුඛස්ථානයේ සිටියේය. මෙම උත්සාහයේදී, මාධ්‍ය හිමිකරුවන්, කර්තෘවරුන් සහ නීතිඥයන් වැනි සෙසු වෘත්තිය කණ්ඩායම් සමඟ පුළුල් සන්ධානයකට එළඹීමට සමත් වූ අතර එමගින් ඔවුන්ගේ මැදිහත්වීම්වල බලපෑම ඉහළ නංවන ලදී. 2008 වසරේදී හදිසි අරමුණ ළඟා කර ගැනීමෙන් පසුව මෙම පුළුල් සන්ධාන පැවතියේ නැත. නේපාලයේ ඉතා ඉහල මට්ටමක පවත්නා ජනමාධ්‍ය සංවිධාන 2001 දී ප්‍රකාශයට පත් කළ ව්‍යවස්ථාපිත වැටුප් තීරණ ක්‍රියාත්මක කිරීම සුරක්ෂිත කිරීමට තදින්ම ක්‍රියා කර ඇති අතර එපරිද්දෙන්ම ගැටුම් කළාප වල සේවය කරන ජනමාධ්‍යවේදීන් සඳහා අතිරේක ආරක්ෂක වැඩසටහන් සහතික කිරීම වෙනුවෙන්ද ක්‍රියා කර ඇත. බොහෝ අවස්ථා වලදී අර්ධ සාර්ථකත්වයක් විශාල උද්ඝෝෂණයන්ද, සුවිශේෂී අවස්ථාවල වර්ජන හෝ සාමූහික වැඩ නැවැත්ම් ආදියද, යොදා ගෙන ඇත.

දකුණු ආසියාවේ සෙසු රටවල් මෙන් නොව, චිතගොන් කඳු ප්‍රදේශ වල සහ කුල්නාහි නිරිත දිග පරිපාලන කොට්ඨාශායේ පවතින සුළු ප්‍රමාණයේ ගැටුම් හැරුණු කොට බංග්ලාදේශය තුළ, සක්‍රීය කැරළි පිළිබඳ ගැටළු නොමැත. එරට ගැටුම්හි ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ තරඟකාරී දේශපාලන පක්ෂ කෙරෙහි පවතින පක්ෂපාතිත්වය විසින් මෙහෙයවනු ලබන ජනමාධ්‍යවේදී ව්‍යුහයන්ද ඇතුළු සිවිල් සමාජයේ ආයතනද සමගින් ගැඹුරු ලෙස ධ්‍රැවීකරණ වූ දේශපාලන වටපිටාවයි. බිය ගැන්වීම් සහ ශාරීරික උපද්‍රවයන් නිරිත දිග දිස්ත්‍රික්ක වල සිටින ජනමාධ්‍යවේදීන්ට බලපාන ප්‍රධාන ප්‍රශ්ණය වේ. බංග්ලාදේශයේ ප්‍රධාන පරිපාලන කළාප හයෙන් එකක් වන කුල්නා කළාපය රටේ ජනමාධ්‍යවේදීන් මුහුණ දෙන වඩාත්ම භයානක සේවා තත්ත්වයන් පිළිබඳ සාක්ෂි දරයි. සැබවින්ම මාධ්‍ය වෘත්තිකයන් සහ සෙසු සිවිල් වැසියන් කරා වූ ඉලක්ක ගත සහ අහඹු ප්‍රචණ්ඩක්‍රියා ඇතුළත් "ත්‍රස්තවාදය" පිළිබඳ ප්‍රපංචය ඇතැම් විට ආරම්භ වූයේ මෙම ප්‍රදේශයේ විය හැකිය. මාධ්‍ය තුළ පැතිරී පවතින අනාරක්ෂිතභාවය පිළිබඳ හැඟීම ඉහළ නංවමින් ඉස්ලාම් ආගමික කණ්ඩායම් සහ රැඩිකල් වාමවාදී කණ්ඩායම් යන දෙපාර්ශවයම විසින් එල්ල කැරෙන බිය ගැන්වීම් අද වන තුරු නොනැසී පවතී.

නේපාලය පසුගිය වසර තුන ඇතුළත මාධ්‍ය වාරණයේ උච්චතම අවස්ථා අත්දුටු අතර එම අත්දැකීම තුළින් නිදහස් මාධ්‍යයේ ප්‍රතිලාභයන්හි වටිනාකම අවබෝධකර ගැනීමටත් ඒ වෙනුවෙන් සටන් කිරීමටත් අවශ්‍ය වන අතිශයින් වර්ධනය වූ ධාරිතාවක් සමඟ නැගී සිටියේය.

2005 පෙබරවාරිහිදී ගයනේන්ද්‍ර රජු පූර්ණ බලය ලබා ගැනීම සඳහා දැරූ අවසන් උත්සාහය පළමුවෙන්ම හෙලාදැක්කේත් එය ප්‍රජාත්නත්‍රවාදයට විරුද්ධ කුමන්ත්‍රණයක් ලෙස නියම නමින් ඇමතුවේත් නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයයි. ඉන් පසු නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයේ තෝරා පත් ඉහළම නිලධාරීන් ඇතුළු ජනමාධ්‍යවේදීන් බොහොමයක් සිර ගත කරනු ලැබීය. වාරණයක් නිරපේක්ෂ විය.

2006 මාර්තුමුලදී අනවරත මාවෝවාදී කැරළිවලින් රාජකීය පරමෝත්මවාදය තෙරපුමට පත්වීමත් සමඟ ප්‍රජාතන්ත්‍රවාදී බලවේග ඇපසු සටන්කිරීම සඳහා මහජනයා ඒකරාශී කිරී ආරම්භ කළේය. එහිදී නේපාල ජනමාධ්‍යවේදන්ගේ සම්මේලනය නේපාල පුවත්පත් සංගමය සහ නේපාලයේ ජනමාධ්‍යවේදීන්ගේ ජාතික සංගමය විසින් පෙරමුණ ගනු ලැබූ ජනමාධ්‍ය ප්‍රජාව ඉතා වැදගත් භූමිකාවක් රඟ දැක්වූවේය. ජාතික සභාව නැවත යථා තත්ත්වයට පත් කිරීමටත් තම පූර්ණ බලතල අත් හැරීමටත් අවසානයේදී රජුව බලහත්කාරයෙන් යොමු කෙරුණ අවස්ථාවේදී ජනමාධ්‍ය ප්‍රජාවට විශාල සදාචාරාත්මක බලයක් අත්වියි එම සදාචාරාත්මක බලය ඉතා හොඳින් යොදවනු ලැබීය. සියළු ජනමාධ්‍යවේදීන් නිසි ලෙස අර්ථ දැක්වුණු වේතන සහ වෘත්තීය සුරක්ෂිතාවය යටතේ සේවයේ නියුක්ත වන බවත් වෘත්තීයමය කුසලතා සංවර්ධනය කිරීමෙහිලා ජනමාධ්‍ය සංවිධානයන්හි කැප වීමේ ප්‍රතිඵල ලබනු ඇති බවත් තහවුරු වන ලෙස නේපාලයේ වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ පණතට වැදගත් සංශෝධන ඇතුළත් කිරීම සඳහා වූ ජනමාධ්‍යප්‍රජාවේ උද්ඝෝෂණ වෑයම සාර්ථක විය. ප්‍රජාතන්ත්‍රවාදය යලි ස්ථාපනය කිරීමෙහිලා ජනමාධ්‍ය ප්‍රජාවේ භූමිකාව හඳුනාගනිමින් අන්තර්වාර ජාතික සභාව විසින් තොරතුරු නිදහසේ නීතිය නීතිගත කරන ලදී.

2 බලන්න S. Deshapriya and S. Hattotuwa, *Study of the Media in the North-East of Sri Lanka*, Centre for Policy Alternatives, Sri Lanka, and International Media Support, Denmark, 2003, page 8.

නේපාලයේ පවත්නා අයහපත් භෞතික තත්ත්වයන් හේතුවෙන් මෙම නීති ක්‍රියාත්මක නොවී පැවතුණද ඕනෑ නිදහස් මාධ්‍ය සහ ජනමාධ්‍යවේදීන්ගේ සමාජීය සහ වෘත්තීයමය අයිතීන් පිළිබඳ ගැටළු වලට නේපාලයෙහි නව දේශපාලන ක්‍රමය ප්‍රමාණවත් තරම් අවධානය යොමු කරනු ඇතැයි මාධ්‍ය ප්‍රජාව බලාපොරොත්තු සහගතව සිටී.

## දේශසීමා හරහා ඇති විය හැකි ගැටුම්

දකුණු ආසියාවේ සෑම රටක් තුළම පවතින ගැටුම් හැරුණු කොට රටවල් අතරද ආතතීන් පැවතීමේ ඉතිහාසයක් දැකිය හැකිය. ඒ අතර ඉන්දු - පාකිස්තාන අර්බුදය මෙන්ම යම් තරමකට බංග්ලාදේශය නේපාලය ශ්‍රී ලංකාව සහ ඉන්දියාව ඇති ගැටුම්ද කැපී පෙනේ. කාශ්මීරය සහ දේශසීමා ආසන්නයේ පවතින ත්‍රස්තවාදය පිළිබඳ අන්‍යෝන්‍ය සැළකිල්ල හේතුවෙන් ඉන්දියාව සහ පාකිස්තානය අතර ඉහල ගැටුම් විභවතාවක් පවතී. ඇත්ත වශයෙන්ම පාකිස්තානය සහ ඇෆ්ගන්ස්ථානය එක් දේශසිමාවක් හවුලේ භුක්ති විඳින අතර එම නිසා එක් රටක් අනෙක් රටෙහි දේශාපලන අස්ථාවරත්වයභාවයක් ඇති කිරීම සඳහා පදනම වී ඇති බවට පවතින සැකය හේතුවෙන් දෙරට අතර අර්බුදයක් ඇතිවීමේ හැකියාව ඉහළ යයි. මෙම අර්බුද බොහොමයක් තුළින් බරපතල "පාර ජාතික සහ ගෝලීය විපාකයන්" ඇතිවේ. ආර්ථික දේශපාලන මෙන්ම සමාජීය වශයෙන් සංකීර්ණවූත් බහුවිධවූත් ගැටළු තුළින් මෙම අර්බුද පැණ නගී. ඉතිහාසයෙන් උරුම වන දේශසීමා හරහා ජනවාර්ගික සහ පාරම්පරික බැඳීම් පැවතීමද ඇතුළු ඓතිහාසික සාධක ද ප්‍රබල බලපෑමක් ඇති කරයි. බෙදී පවතින ජම්මු කාශ්මීර් ප්‍රාන්තයේ දෙපිරිස අතර බංග්ලාදේශ සහ එහි අසල්වැසි ඉන්දීය ප්‍රාන්ත අතර නේපාල තැනිතලා ටෙරායි ප්‍රදේශ සහ බිහාර් සහ උත්තර් ප්‍රදේශ් යන ඉන්දීය ප්‍රාන්තයන්හි අතර මෙන්ම ඇෆ්ගනිස්තානය සහ පාකිස්තානය වෙන් කරන ඩුරාන්ද් මායිම දෙපස සිටින පශ්තුන් ගෝත්‍රික පිරිස් අතර එවැනි සාධක දැකිය හැකිය.

යටත් විජිතවාදයේ පසුබෑම තුළ හට ගත් ජාතික රාජ්‍යයන්ගේ "භෞමික අවිනිශ්චිතතාවය" හේතුවෙන් යට ගත හැකි ප්‍රචණ්ඩත්වයේ විභවය පිළිබඳ සිදු කෙරුණ වාර්තාවක් ඉන්දියාවේ දේශසීමාවන්හි ඇති අවිනිශ්චිතභාවය තුළින් හට ගන්නා තෙආකාර ජාතිකවාදී උද්වේගයන් හඳුනාගනී. එනම් මැක් මහෝනියන් සහ රැඩ්ක්ලිෆියන් (අනුපිළිවෙළින් චීනය සහ පාකිස්තානය අතර දේශසීමා සැළසුම් කළ බ්‍රිතාන්‍ය නිලධාරින්ගේ නමින් හැඳින්වේ.) සහ (ප්‍රදේශය ඉන්දියාවට අනුබද්ධව තිබීම තුළින් ඇති වන්නා වූ ) කාශ්මීර උද්වේගයන්ය. මෙම සෑම සිදුවීමක්ම ප්‍රචණ්ඩත්වයක් ඇති කර ඇති අතර ප්‍රජා සහ ඥාතිත්වය පිළිබඳ ස්වභාවික සම්බන්ධතා වෙන් වෙන් ජාතීන්ගේ භෞමික විධි විධාන සමඟ මායිම් දිස්ත්‍රික්කයන්හි මේ තත්ත්වය වඩාත් තියුණු ලෙස දැකිය හැකි ප්‍රචණ්ඩකාරී සට්ටනයන්ට එළඹ ඇත්තේය.[3] මෙම භෞමික අවිනිශ්චිතතා හේතුවෙන් ඉන්දියාව මුහුණ දෙන ගැටළු වල ප්‍රතිමූර්ත ආකාරයේ ගැටළු දකුණු ආසියානු ජාතික දේශසීමාවන්හි අනෙක් පසද විශේෂයෙන්ම පාකිස්තානයේ සහ බංග්ලාදේශයේ තිබෙන බව කීම නුවුවමනාය.

සැබවින්ම මෙම රටවල් සියල්ලේම පාහේ තිබෙන දේශසීමා හරහා ඇති බැඳීම් බොහෝ අවස්ථාවලදී පශ්චාත් යටත්විජිතවාදී සන්ධර්භයක් තුළ බලාපොරොත්තු වන ජාතික රාජ්‍ය වෙත සියළු දෙනා දක්වන පක්ෂපාතීත්වයට බාධා පැමිණවීමේ හැකියාව ඇති භෞමික රාජ්‍යයෙන් පිටත ඇති පක්ෂපාතීකම් සඳහා සාක්ෂි වේ. එකිනෙක රටවල ජාතික දේශපාලනය තුළ එවැනි සමාජ කණ්ඩායම් ආන්තීකරණය කිරීමට මෙම තත්ත්වය මඟ පාදා ඇත. ඉන්දියාව නේපාලය සහ ශ්‍රී ලංකාවේ විවිධ ආකෘතින්ගෙන් පවතින කුළ ක්‍රම මගින් පනවා ඇති බැහැර කිරීමේ ප්‍රවේණි ක්‍රමයන්ගෙන් ඉහත ආකාරයේ සමාජීය බැහැර කිරීම් ඇත්තෙන්ම වෙනස් වේ. එමෙන්ම සෑම රටකම මාධ්‍ය ඉතා ඉහළ මට්ටමකින් රාජ්‍ය මඟපෙන්වීම් වලට සාවධානව සිටිමින් හොඳ ප්‍රතිචාර දක්වන නිසා දේශසීමා හරහා පක්ෂපාතීකම් තබා ගන්නවා යැයි දකිනු ලබන ප්‍රජාවන්ට මාධ්‍ය තුළ සාධාරණ අවකාශයක් ලැබෙන්නේ කළාතුරකිනි. එහි ප්‍රතිඵලයක් ලෙස අර්බුදය නොනිමී පවතී.

දුර්විපාක නොලැබීමේ සංස්කෘතියට විරුද්ධව ප්‍රබල ලෙස කටයුතු කිරීමට රජයන් අකමැති වීමත් සමග ජනමාධ්‍යවේදීන් බොහෝ අවස්ථාවලදී ප්‍රවේශමෙන් ක්‍රියා කිරීමේ ආකල්පයක එල්බ ගනී. භාෂණයේ නිදහස ක්‍රියාවට නැංවීම සඳහා පූර්ව තහනමක් නොමැති වුවද එදිරිවාදී වාතාවරණයන් විසින් ස්වයං වාරණයක් පනවා ගැනීමට ජනමාධ්‍යට බල කෙරේ. මාධ්‍ය මත සාම්ප්‍රදායික සමාජීය සහ දේශපාලන තහංචි පැනවීම මඟින් විවිධ වූ දෘෂ්ඨිකොණයන් පිළිබඳව ඇති වන පොදු කතිකාවට බාධා පැමිණේ. කාශ්මීරයේ තත්ත්වය පිළිබඳ ඉන්දියානු ජනමාධ්‍යයේ වාර්තාකරණය සහ රටෙහි පැවති අර්බුදය සහ පශ්චාත් අර්බුද සමය පිළිබදව විවේචනාත්මක වාර්තාකරණය වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාව තුළ දැකිය හැකි උත්සහයන් ඒ සඳහා උදාහරණ දෙකක් ලෙස දැක්විය හැකිය. ප්‍රමාණවත් ලෙස නියෝජනය කෙරෙන තොරතුරු සඳහා අවකාශය නැත්නම් ගැටුම්කාරී කණ්ඩායම් ප්‍රති සංධාන කරවීමට උත්සාහ දරන යාන්ත්‍රණයන්ට සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියට පූර්ණ සහභාගීත්වය ලබා දීමට පුරවැසියා අසමත් වේ.

## සහයොගිතාවයේ සහ අරගලයේ උපාය මාර්ග

සංඛ්‍යාත්මකව විශාල ප්‍රමාණයක් ජනමාධ්‍යවේදීන් සිටින ස්ථානයක ඔවුන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් කිරීමේ සාමූහික හැකියාව බොහෝ සෙයින් ඉහළය. නමුත් ජනමාධ්‍යවේදීන් සුළු ප්‍රමාණයක් සහිත හෝ නගරයෙන් දුරස්ථව සිටින අවස්ථාවලදී මෙම වැදගත් ප්‍රජාව යම් කිසි සාර්ථක සාමූහික ක්‍රියාවකට ඒකරාශී කර ගැනීම බොහෝ විට දුෂ්කර වේ. ඉන්දියාව වැනි අති විශාල ප්‍රදේශයක පැතිරුණු රටවල හෝ භූ ලක්ෂණයක්ගෙන් හා සංස්කෘතීන්ගෙන් විශාල විවිධත්වයක් සහිත පාකිස්තානය සහ නේපාලය වැනි රටවල පදගතාර්ථයෙන් සහ රූපමය වශයෙන් යන දෙකෙන්ම සැලකූ කළ අනතුරට ලක් විය හැකි ජනමාධ්‍යවේදීන් වන්නේ ජාතික අග නගරයෙන් හා ප්‍රධාන නගරයන්ගෙන් දුරස්ථව සිටින්නවුන්ය. මෙම සියල්ලටම පෙර සාර්ථක සාමූහික ක්‍රියාවක් සඳහා ගැටුම් වලට නම්‍යතාවයක් දක්වන සියළුම කළාප වන සිටින ජනමාධ්‍යවේදීන් සහ ජාතික අගනගරය සහ ප්‍රධාන නගරවල සිටින ඔවුන්ගේ සහායකයින් අතර ඵලදායී ජාල ගත කිරීමක් අවශ්‍යවේ. එවිට මෙම නගර කළාපීය සහ ගෝලීය ජාලයන්ට ප්‍රාදේශීය ව්‍යාපාරයන්හි සඵලත්වය ඉහළ නැංවීමට උපකාරීවන තොරතුරු සැපයීමේ පුරුක් ලෙස ක්‍රියා කරති.

ජනමාධ්‍යවේදී වෘත්තීය සමිති සහ සංවිධාන මාධ්‍ය ආවරණය සඳහා න්‍යායන් සකස් කිරීමේදී පළාත් මට්ටමින් ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කළ යුතුය. එයට උදාහරණයක් ලෙස උතුරු - නැගෙනහිර ඉන්දියාවේ පිහිටි මනිපූර් නගරය දැක්විය හැකිය. එහි ජනමාධ්‍යවේදීන් විරුද්ධ අරමුණු වෙනුවෙන් ක්‍රියාකරන සහ අනෙකාගේ අයගේ හඬ යටපත් කිරීමට උත්සාහ ගන්නා කැරලිකාර කණ්ඩායම් ගණනාවක පීඩනයට ලක් වේ. ආචාර ධර්ම සංග්‍රහයක් සකස් කිරීම හා එය පුළුල්ව ප්‍රකාශයට පත් කිරීම හරහා රාජ්‍ය කාර්යාංශ  කැරළි කාර කණ්ඩායම් වලට මාධ්‍ය හරහා ඔවුන්ගේ දැක්ම කොතෙක් දුරට ප්‍රචාරය කළ හැකිද යන්න පිළිබඳ දැනුවත් කිරීම තුළින් මනිපූර් ප්‍රාන්තයේ වෘත්තීය සංගමය මෙම අභියෝග වලට ප්‍රතිචාර දැක්වීය. කෙසේ හෝ තම මාධ්‍ය ආවරණය ලබා ගැනීමට කටයුතු කරන සන්නද්ධ කණ්ඩායම් වල ඉල්ලීම් පහත හෙළීමට සහ ස්වාධීන ජනමාධ්‍යවේදීන් ගේ ශක්තිය සැළකිය යුතු ලෙස ඉහළ නැංවීමට මෙම සාමූහිකව එකඟත්වයට භාජනය වූ ආචාර ධර්ම සංග්‍රය හේතු විය.

ක්ෂේත්‍රයේ සිටින වෘත්තිකයන්ට ගැටුම් වාර්තා කිරීමට සුදුසු ශබ්ද මාලාවද බොහෝ විට අභියෝගයක් වී ඇත. ඔවුන් මුහුණ දුන් සිදුවීම් වල ඇති වූ සියුම් වෙනස්කම් සැලකිල්ලට යොමු කරමින් පරීක්ෂාකාරීව

3 බලන්න Willem van Schendel, "The Wagah Syndrome: Territorial Roots of Contemporary Violence in South Asia", in Amrita Basu and Srirupa Roy (editors), *Violence and Democracy in India*, Seagull Books, London and New York, pp 36 to 82.

නිර්මාණය කරනු ලැබූ පුවත් වාර්තා බොහෝ අවස්ථා වලදී සංස්කරණය කොට ශීර්ෂ පාඨ යොදා පුවත්පතේ පළ කෙරෙන්නේ දුරස්ථ නගර වල නොඉවසිල්ලෙන් ව්‍යාකූල වූ සහ පැහැදිළි විස්තරයක් පළ කිරීමට ඉතා උනන්දුවක් දක්වන කාර්ය මණ්ඩලයක් විසිනි. ජනමාධ්‍යවේදියාට තම වාර්තාවේ ඇති ශීර්ෂ පාඨ සහ ඒස මඟ පළ කැරෙන රූප තීරණය කිරීමට නොහැකිය. ඡායාරූප ශිල්පියාට තම නිර්මාණ සමග යොදා ඇති මාතෘකා වගකීමක් ද නිති විය හැකිය. තම නිර්මාණ නාමය යටතේ පළ වූ වාර්තා වල භාවිත කරන ලද විශේෂණ පද හෝ වාක්‍ය ඛණ්ඩයන්ට අදාල මූලිකම වගකීම වෙනත් අයෙක් අත රැඳී තිබුණද ඒවා පැහැදිළි කිරීමට බොහෝ විට සිදුවන ගැටුම් කළාප වල සිටින ජනමාධ්‍යවේදීන්ට සහ මාධ්‍ය වෘත්තිකයන්ට මාධ්‍ය ආතනයන්හි පවත්නා මෙම ශ්‍රම විභජනය උපද්‍රව ඇති කරයි. දකුණු ආසියාවේ ගැටුම් කළාපවල ජනමාධ්‍යවේදී වෘත්තීය සංගම් ඔවුන් මුහුණපාන අවස්ථාවල ඇති සියළුම සංකීර්ණතා සහ ව්‍යාකූලතා මතුවී පෙනෙන පරිදි තමන්ගේම වචන මාලාවක් සකස් කර ගනිමින් මෙම අභියෝගයට ප්‍රතිචාර දැක්වීය. මෙය අවසානයේදී ප්‍රකාශයට පත් කෙරුණ පරිදි මෙම පාරිභාෂික ශබ්ද මාලාව පුවත් ආවරණයේදී පිළිගත් අංගයක් බවට පත් කිරීමට කර්තෘ මූලස්ථානයේ සහය අවශ්‍යය.

ගැටුම් ප්‍රදේශ වලදී ජනමාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සේව්‍යයන්ගේ සහ මාධ්‍ය ආයතනයන්හි වල මූලිකම වගකීම ලෙස දක්වන ඍජු නියමයන් ස්ථාපනය කර ගත යුතුය. උග්‍ර උවදුරු සහිත ප්‍රදේශ වල එසැණ පුවත් ආවරණය කිරීමේදී යොදා ගත හැකි නියමයන් ආදී ලෙස සකස් වූ වැදගත් සාමූහික ක්‍රියාවලීන් ඇත. එසැණ පුවත් විස්තර වාර්තා කිරීමේ ප්‍රථමයන් වීමට ඇති උනන්දුව නිසාම ජනමාධ්‍යවේදීන් බොහෝ විට මාරාන්තික අනතුරු වලට මුහුණ දෙති. කේබල් සහ චන්ද්‍රිකා නාලිකා වල ප්‍රගමනය සමග වේගවත් වී ඇති මාධ්‍ය ආයතන අතර ඇති තරගකාරිත්වය මෙම ආකල්පය පෝෂණය කරයි.

වීදි විරෝධතාවන්ගේ සිට පිටුපස සිට කැරෙන අධිවාචනයන් දක්වා උද්ඝෝෂණය ක්‍රම වෙනස්ය. ගැටළු පුළුල් වූ විට සහ සමාන අරමුණු ඇති සිවිල් සමාජ සංවිධානයන්හි විශාල පිරිස් ආකර්ශනය කර ගැනීමට හැකි වූ විට වීදි පෙළපාලිවලට උපරිම බලපෑමක් ඇත. කාශ්මීරයේ වසා දැමීම් බොහෝ විට ස්වෙච්චාවෙන් නොව බලහත්කාරයේ සිදුවුවද කාශ්මීර සහ මනිපූර්හිදී ක්‍රියා කළා මෙන් තර්ජනයන් තීව්‍ර වන සහ බහුවිධ වන අවස්ථාවලදී අවසාන උපාය වන සමස්ථ වසා දැමීම සිදු කිරීමට ජනමාධ්‍යවේදීන්ට බොහෝ විට සිදුවේ. තීරණ ගන්නා බොහෝ දෙනෙක් සිටින සහ කාර්මීකරණ විලාසයකට සහ ඉහළ සංවිධානාත්මක ආකාරයට ක්‍රියා කරන මාධ්‍ය ඇති ස්ථානයන්හි මෙම තීරණය සාමාන්‍යයෙන් සාද්‍ය නොවේ.

යම් ආණ්ඩු ක්‍රමයක් තුළ තෝරා පත් කර ගත් නිලධාරීන් වගවීම පිළිපදින විට සහ ඔවුන් මාධ්‍යයේ කීර්ති නාමය ලබා ගැනීමට වඩාත් උනන්දුවන්නේය යන කාරණය මත බලපෑමේ උත්සාහයන් වාසිදායක විය හැකිය. නමුත් මෙය විශේෂ අවස්ථාවක ප්‍රතිඵල ලැබීමේදී සාමූහිකත්වයට වඩා විශේෂ පුද්ගලයන්ගේ හැකියා කරා නැමියාවක් දක්වන ජනමාධ්‍ය වෘත්තියේ අත්දැකීමකි. මෙවැනි ක්‍රියාවලීන්ට ප්‍රවේශ වීමේදී නායකයන් හා බලය පැවරුණ සාකච්ජාකරුවන් පූර්ණ විනිවිධභාවයකින් යුතු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය මෙමඟින් මතු කර දක්වයි. 2002 වසරේ සිට ඵලදායී ලෙස ක්‍රියාත්මක වන ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය සංගම් සහ නිදහස් ජනමාධ්‍යවේදීන්ගේ පුළුල් සන්ධානයක් වූ දකුණු ආසියානු ජනමාධ්‍ය සහයෝගිතා ජාලයේ අත්දැකීම් වලට අනුව පෙනී යන්නේ තීරණාත්මක අවස්ථා වලදී ජාත්‍යන්තර සහයොගිතාවය සහ ජාල ගත වීම වැදගත් සහායක් ලබා දෙන බවයි.

## ක්‍රමවේදය

ජාත්‍යන්තර ජනමාද්‍යවේදීන්ගේ සම්මේලනය හා එහි අනුබද්ධ ආයතන හා හවුල්කරුවන් අර්බුද හා ගැටුම් අවස්ථාවලදී කරන ලද වඩා වැගදත් මැදිහත් වීම් සහ ක්‍රියාවන්හි පුනරාවර්ජනයන් පළමුවෙන්ම මෙම ව්‍යාපෘතියට අන්තර් ගත කර ගන්නා ලදී. මෙහිදී ආමන්ත්‍රණය කරන ලද ක්‍රියාවන්ට ඇතුළත් වූයේ ගැටුම් අවස්ථාවලදී වාර්තාකරණයේ යෙදීමට සිදුවූ ජනමාධ්‍යවේදීන්ගේ ප්‍රතිචාර (ඍජු පහර දීම ගැටුම් සහ ඉලක්ක ගත තර්ජන හා බිය වැද්දවීම් ද ඇතුළුව) ගැටුම් අවස්ථාවලදී අධිවාචනය (යුද්ධයේ සිට කුමණ්ත්‍රණ ද සිවිල් අසහනයේ සිට ප්‍රජාතන්ත්‍රික නොවන ආකාරයට පිහිටුවා ගත් රාජ්‍ය පාලනයන් දක්වා පරාසයන්) යනාදියයි. මෙම අවස්ථාවලදී සමීක්ෂණය බලාපොරොත්තු වූයේ ගැටුම් සංවේදිත්වයේ ගැටළු ජනමාධ්‍ය සංවිධාන මෙහෙයවනු ලබන පුහුණු කිරීම් සහ අනෙකුත් කටයුතු තුලට ඇතුළත් වූයේ කෙසේද සහ ආචාර ධර්ම සංග්‍රහයන්හි ගැටුම් සංවේදීතාවය අන්තර්ගත කැරුණේද යන්න වාර්තාගත කිරීමය.

සමීක්ෂණය කරන ලද්දේ මෙම එක් එක් සිදුවීම් වලට අදාල ප්‍රධානීන් සමග සබඳතා පිහිටුවාගෙන සහ අනෙකුත් වැදගත් පාර්ශවයන් සම්මුඛ සාකච්ඡා වලට භාජනය කරමිනි. අවිධිමත් ලෙසය. රටවල් පහ තුළ ඇති දකුණු ආසියානු ජනමාධ්‍ය සහයෝගිතා ජාලයේ සියළුම හවුල්කාර සංවිධානයන් සමග ඇති විධිමත් හා අවිධිමත් සබදතා හරහා තොරතුරු ඒකරාශී කර ගන්නා ලදී. දුරස්ථව සහ සැඟවී ලබාගත් අවබෝධය ලබා ගැනීම සඳහා හිංසනය සහ බිය වැද්දීමේ සිද්ධීන්ට ඍජුවම බලපෑමට ලක් වූ ජනමාධ්‍යවේදීන් සමග ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය ගොඩනගා ගෙන තිබූ පෙර සබදතා නැවත ප්‍රාණවත් කරන ලදී.

මෙම ක්‍රියාවලියට ඉන්දියවේ සහ බංග්ලාදේශයේදී ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා ඇතුළත් විය. ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදීන් ඇතුළත් සාමූහික ක්‍රියාවන්ට තත්ත්වය යෝග්‍ය නොවුණ හෙයින් ඉලක්ක ගත කණ්ඩායම් වෙනුවට රටේ සිටි සහ දැනට රටින් පිටත වාසය කරන ජනමාධ්‍යවේදීන් සමග අප්‍රසිද්ධියේ සාකච්ජා කරන ලදී. නේපාලයේ හා පාකිස්තානයේදී ව්‍යාපෘතියේ යෙදි සිටි පර්යේෂකයා පුළුල්ව සංචාරය කොට ගැටුම් අවස්ථා විසින් මතු කැරෙන විශේෂ අභියෝග පිළිබඳව වැදගත් නිරීක්ෂනයන් සහිත සහ නිදහස් ජනමාධ්‍යවේදය වෙනුවෙන් ක්‍රියාකාරීව අරගල කළ ජනමාධ්‍යවේදීන් සමග විශාල පරාසයක සම්මුඛ සාකච්ඡා පැවැත්වීය. 2008 සැප්තැම්බර් සහ 2009 දී පැවැත්වුණු දකුණු ආසියානු ජනමාධ්‍ය සහයෝගිතා ජාලයේ වාර්ශික සම්මේලනය වැනි ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයේ ව්‍යාපෘතිය යටතේ සංවිධානය කරන ලද ක්‍රියාකාරකම් මෙම වාර්තාවේ ඉලක්කයන්ට අදාල තේමාවන් සහ ගැටළු පිළිබදව සහභාගි වූවන්ගේ වටිනා අදහස් ලබා ගැනීමට භාවිත කරන ලදී.

සමීක්ෂණයේ සොයා ගැනීම් පිළිබඳ රටවල් පිළිබඳ විස්තරාත්මක වාර්තා කෙටුම්පත් ලෙස සකස් කර රටවල් පහේම ජේෂ්ඨ ජනමාධ්‍ය නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් 2010 ජූලි මස නේපාලයේ කත්මන්ඩු නුවර පැවති කළාපීය සාකච්ඡාවට ඉදිරිපත් කරන ලදී. ගැටුම් අවස්ථාවලදී ජනමාධ්‍යයේ ජනමාධ්‍යවේදීන්ගේ සහ මාධ්‍ය සංවිධානවල භූමිකාව සහ දකුණු ආසියානු රටවල් තුළ සහ රටවල් අතර ගැටුම් අවම කිරීමට ඔවුන් ඉටු කරන භූමිකාව වටමේස සාකච්ඡා වලදී විශ්ලේෂණය කරන ලදී. ගැටුම් අවස්ථා ආමන්ත්‍රණය කිරීමට සහ වාර්තා කිරීමට අවසානයේදී ගැටුම නිරාකරණය සඳහා සහය වීමට රට තුළ මෙන්ම කළාපය තුළද මාධ්‍ය ප්‍රජාව විසින් යොදා ගන්නා ලද ක්‍රියාකාරකම් ව්‍යාපාර සහ අධිවාචන උපාය මාර්ග හදුනා ගැනීමට සාකච්ඡා තුළින් තව දුරටත් බලාපොරොත්තු විය. මෙම සාකච්ඡාවන්හිදී විවිධ අවස්ථා අනුව කුමන උපාය මාර්ගය ඵලදායී වීද අනාගතයේදී සාමකාමී ගැටුම් නිරාකරණය ජය ගැනීමට හෝ වර්ධනය කිරීමට කුමක් කළ හැකිද යන්න සහභාගිවූවන් විසින් තක්සේරු ලදී කරන



පාර්ලිමේන්තුව විරුද්ධ පාක්ෂික දේශපාලනය සඳහා යෝග්‍ය ක්ෂේත්‍රයක් ලෙස නොසැළකෙන අතර එය වැඩිවැඩියෙන් සිදුවන්නේ ජනමාධ්‍යයෙහි සහ වීදියෙහි ය. (ඡායාරූප ස්තුතිය: සුකුමාර් මුරලිදරන්)

# බංග්ලාදේශය

## දේශපාලන ධ්‍රැවීකරණය ජනමාධ්‍ය බෙදා වෙන් කරයි

2009 ජනවාරි මුල් භාගයේදී මැතිවරනයෙන් තෝරා පත් ආණ්ඩුව ප්‍රතිෂ්ඨාපන වීමත් සමග ඉදිරි වර්ෂයන් සඳහා දේශපාලනය මෙහෙයවනු ඇති ස්ථාවර ඒකමතිකතාවයන් නැවත ගොඩනැංවීම පිළිබඳ බලාපොරොත්තුවක් බංග්ලාදේශය සතුව ඇත. මෙම කර්තව්‍ය ඉතාමත් අසීරු එකක් බව පෙනී ගොස් තිබේ. ප්‍රධාන දේශපාලන විපක්ෂය වන බංග්ලාදේශ ජාතික පක්ෂය (ඊහජ) නව පාර්ලිමේන්තුව පිහිටුවා වැඩි කල් යන්නට මත්තෙන් ඔවුන්ගේ ප්‍රධාන ප්‍රතිවාදී පිළවන අවාමි ලීගයට වාසිදායක අයුරින් පැවැත් වූ මැතිවරණය දූෂිත යැයි කියමින් එහි සභා කටයුතු වර්ජනය කරන බව ප්‍රකාශ කළේය.

නීති පිළිබඳ මූලික රාමුවකට එකඟ වීමට රටෙහි ප්‍රධාන දේශපාලන සංවිධාන අසමත් වීම හේතුවෙන්, ජනමාධ්‍ය නැවත අම්හිරි පක්ෂපාතිත්වයකට නැඹුරු වීමට ඉඩ තිබේ. මාධ්‍ය අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියක් සකස් කිරීමට බංග්ලාදේශය අසමත් වී ඇත්තේ ප්‍රදාන වශයෙන්ම මෙකී පක්ෂපාතීත්වයන් නිසාය.

1971 බංග්ලාදේශ් නිදහස් සටනේ නායකත්වය දැරූ ෂෙයික් මුජ්බාර් රහ්මාන් ඝාතනය සම්බන්ධයෙන් වරද කරුවන්වූ පුද්ගලයන් 9 දෙනාගෙන් පස් දෙනෙකුට 1999 ආරම්භ කළ නඩු විභගයකට අනුව 2010 ජනවාරි මාසයේදී, එනම්, අදාල සිදුවීමෙන් දශක දෙකකටත් වැඩි කාලයකට පසු මරණ දඬුවම ලබා දෙන ලදී. එය දැඩි දේශපාලන අසමගියක් නිමිත්තක් බවට පත් විය. පාලක පක්ෂය වන ෂෙයික් මුජීබ් විසින් ආරම්භ කරන ලද අවාමි ලීගය එම මරණ දඬුවම රටෙහි ඓහිලෞකිකවාදයෙහි සහ ප්‍රජාතන්ත්‍රවාදයෙහි මූලික වටිනාකම් නැවත තහවුරු කිරීම සඳහා ඉතා වැදගත් ක්‍රියාවක් බවට තර්ක කළේය. විපක්ෂය වන බංග්ලාදේශ ජාතික පක්ෂය තමන් බලයේ සිටින විට සිය ආරක්ෂාව ලැබූ පුද්ගලයන්ට මරණ දඬුවම පැමිණවීම සම්බන්ධයෙන් එකඟ නොවන බව පැහැදිළිව පෙන්වන නිහඬ බවක් ඉසිලීය.

ජනමාධ්‍ය මෙම සිදුවීම එහි සංකේතාත්මක අගය සහ එමගින් නීතියේ ආධිපත්‍යයට ජාතියේ කැපවීම නැවත තහවුරු කර ගැනීමෙහිලා එහි වැදගත්කම උඩ එම තීන්දුවට සතුට පළ කළේය. නිව් ඒජ් පුවත්පත සිය කතුවැකියේ සඳහන් කළේ "අපරාධකරුවන්ගේ සිරුරු වැළලීමත් සමග මුජීබ් පාලනය සාහසිකලෙස පෙරළා දැමීම පිළිබඳ වූ දේශපාලන විවාද වැළලී නොයනු ඇත. එය එසේ සිදුවීමට නම් එකී මාරක දේශපාලන අභ්‍යාගය වෙත මඟ පෙන්වූ දේශපාලන සිදුවීම්, එහි දේශපිලන හා සංස්කෘතික ප්‍රතිඵල සහ වසර 34කට පෙර එම අභ්‍යාගය විසින් අප ඉතිහාසයේ සනිටුහන් කර ඇති දේශපාලන නිද්‍රාවෙන් මිදීමේ මාර්ග පිළිබඳ ඉදිරගාමී සාකච්ඡා සහ දැනුවත් විවාද සමාජයට අවශ්‍ය වනු ඇත,"[1] යනුවෙනි.

බංග්ලාදේශයේ වැඩිම අලෙවියක් ඇති ඉංග්‍රීසි මාධ්‍ය පුවත්පත වන *ඩේලි ස්ටාර්* සතුව මේ පිළිබඳ වඩා ධනාත්මක ඇගයීමක් තිබිණි එමගින් ප්‍රකාශ කෙරුණේ, "නීතියේ ආධිපත්‍ය බලවත්ය, සැමදේම සිදුවිය යුත්තේ සාධාරණත්වය මතය, අපරාධයක් සිදු කරන කිසිවෙක් ඉන් පලා යාම බලාපොරොත්තු නොවිය යුතුය, යන ශේෂ්ඨ අදහස වෙත නැවත නැඹුරු වීම කෙලින්ම සහ තර්කානුකූල වශයෙන් මෙම ජාතියේ යහපතට මඟ පාදනු ඇත. සත්‍ය වශයෙන්ම දැන් නීතිමය ක්‍රියාපටිපාටිය විසින් සාධාරණත්වය යන මූලධර්මය නැවත ස්ථාපිත කිරීම තහවුරු කොට ඇති බැවින්, දේශාපාලන විශ්වාසය හෝ අනුබද්ධ පක්ෂය ගැන නොසලකා, සියළුම පුරවැසියන්ට වඩා හොඳ සහ සමානාත්මවාදී හෙට දවසක් කරා අපේ ගමන දීර්ඝ කාලයක් තිස්සේ වළක්වමින් තිබූ අඳුරු ඡායාව පිළිබඳව නැවත සිතා බැලීමට කාලය පැමිණ ඇත"[2]

මෙම වාර්තාව සැකසීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස බංග්ලාදෙශයේ මාධ්‍ය ප්‍රජාව සමග සිදු කළ සමීක්ෂනය හෙළිදරව් කරන්නේ අති විශාල ජනසමූහයක් කරා ළගා වන බංග්ලා බසින් පළ වන පුවත් පත් සුළු වක්‍රෝක්තියක් සහිතව චූදිතයන් පස් දෙනාට මරණ දඬුවම පැමිණවීම අනුමත කිරීමේ නැඹුරුවක් පෙන්වූ බව යි. එසේ නොකළ පුවත් පත් දෙක වූයේ ජමාත් - ඊ - ඉස්ලාම් නම් වන දක්ෂිනාංශික දේවවාදී පක්ෂය විසින් පාලනය කළ *සංග්‍රාම* පුවත්පත සහ සැම විටම අවාමි ලීගය පිළිබඳ ප්‍රතිපාක්ෂික ස්ථාවරයක් සමග බැඳී ඇති *අමර් දේශ්* පුවත් පතයි. එවක් පටන්, *අමාර් දේශ්* පුවත් පත පාලක පක්ෂය සහ විපක්ෂය අතර බරපතල ගැටුමක් සඳහා වේදිකාවක් බවට පත් විය. එහි ප්‍රතිඵලය වූයේ පුවත්පත කෙටි කාලයක් වසා දැමීමට සිදුවීම සහ එහි කර්තෘ වරයා අත්අඩංගුවට පත්වීමත්ය. අව්‍යාජ දේශපාලන වාද විවාද සඳහා වේදිකාවක් ගොඩනැගීමට මහජන සහ ව්‍යවස්ථාමය ආයතනයන්ට ඉතා සුළු ඉඩ කඩක් ඇති වටපිටාවක් තුළ බංග්ලාදේශයේ මාධ්‍ය විවිධ පක්ෂයන් සඳහා සටන් බිමක් වී ඇත්තේ කෙසේදැයි මෙම සිදුවීම පෙන්නුම් කරයි. (අදාල සිදුවීම පිළිබඳව

1 බලන්න Editorial, *New Age*, January 29, 2010, extracted at: http://www.newagebd.com/2010/jan/29/edit.html#1.

2 බලන්න Editorial, *The Daily Star*, January 29, 2010, extracted at: http://www.thedailystar.net/newDesign/news-details.php?nid=123985.

වැඩිදුර සාකච්ඡා වනු ඇත - කොටුව බලන්න) එමගින් පෙනී යන්නේ බංග්ලාදේශ ජනමාධ්‍යවේදීන්ගේ අරගලය මහජනයාට නිවැරදි සහ විශ්වාස කටයුතු තොරතුරු ලබා දෙන කතිකාවතක් ලෙස ජනමාධ්‍ය දිගටම පවත්වා ගැනීම මත අර්ධ වශයෙන් පදනම් වී ඇති බවයි. නොයෙක් බාධා පැමිණියද මෙම දුෂ්කර ක්‍රියාවෙහිලා ජනමාධ්‍යවේදීන් සැලකිය යුතු සාර්ථකත්වයක් ලබා තිබේ.

නව ආණ්ඩුව බලතල භාර ගැනීමෙන් සති කිහිපයකට පසුව බංග්ලාදේශ රයිෆල් බැරැක්කයන්හි හට ගත් කැරැල්ලකින් බංග්ලාදේශය දෙදරා ගියේය. බංග්ලාදේශ රයිෆල් යනු රටේ අගනුවර වන ඩකාහි රඳවා ඇති රටෙහි දේශසීමා රැකවල් කිරීමේ කාර්ය භාර වී ඇති සමාන්තර හමුදාවකි. මෙම සිදුවීම විශාල කම්පනයක් ඇති කළ අතර අළුතින් පිහිටවනු ලැබූ ආණ්ඩුව අස්ථාවර කිරීමේ තර්ජනයක් එල්ල කළේය. තවද, එම සිදුවීම මගින් පෙන්වා දුන්නේ ප්‍රජාතන්ත්‍රවාදී නියෝජිත ක්‍රමයක කේන්ද්‍රීය මූලධර්මයන්ට සිවිල් සහ මිලිටරි ආයතන දක්වන කැපවීමේ ඇති දුර්වලතාවයයි. රජය මෙම සිදුවීමට දැක්වූ පළමු ප්‍රතික්‍රියාව වූයේ වීඩියෝ හුවමාරු වෙබ් අඩවියක් වන යූ ටියුබ් තහනම් කිරීම සහ එම සිදුවීමට සම්බන්ධ රූප දර්ශන සහ වෙනත් විශේෂාංග පල කළ බ්ලොග් අඩවි  කිහිපයක් තහනම් කිරීමයි. බංග්ලාදේශයේ සියළු අන්තර්ජාල භාවිත කරන්නනට මෙම වෙබ් අඩවි සඳහා ප්‍රවේශය තහනම් කරනු ලැබීය. කෙසේ වෙතත් එම වෑයම සම්පූර්ණයෙන්ම සාර්ථක වූයේ නැත. බංග්ලාදේශයෙන් පිටතදී මෙම වෙබ් අඩවි තුළට ප්‍රවේශ වීමේ හැකියාව තිබූ අතර එම තොරතුරු ලබා ගැනීමට අධිෂ්ඨානය ඇත්තන්ට ප්‍රමාණවත් මාර්ග අන්තර්ජාලය විසින් සපයා දී තිබිණි.[3]

කෙසේ වෙතත් බංග්ලාදේශයේ මුඛ්‍ය ධාරාවේ ජනමාධ්‍ය කැරළි අතරතුර සහ ඉන් පසුව ඇති වූ බරපතල අවහිතා මග හැරීමට සමත් වූහ. ඊට අර්ධ වශයෙන් හේතු වූයේ - කැරළිකරුවන් විසින් සිදු කළ දාමරිකකම්වල ප්‍රමාණය පැහැදිළි වූ විට - සියළු දෙනා එකතු වී කැරළිකරුවන් නීතිය ඉදිරියට රැගෙන ඒමට නව ආණ්ඩුවේ උත්සාහයන්ට සහය දීමයි. 2010 සැප්තැම්බර් මැද වන විට, සිල්හෙත් නගරයේ බැරැක්ක වල සාපේක්ෂ වශයෙන් සුළු සිදුවීම් වලට සහභාගි වූ කැරළිකරුවන් සම්බන්ධයෙන් තීරණයක් නිකුත්වී තිබිණි අතිශය දරුණු දඬුවමක් ලබා දීමෙන් පළිගැනීම් සිදු විය හැකි බවට තිබූ අවබෝධය මධ්‍යයේ ඩකා කැරළිකරුවන්ට එරෙහි චෝදනා ගොනු කරමින් පැවැතුණි. සිවිල් නීතිය නැවත ස්ථාපනය වීම හේතුවෙන් ජනමාධ්‍ය නිදහසට සැළකිය යුතු වෙනසක් සිදුවී ඇත්ද යන්න තව දුරටත් අවිනිශ්චිතව පවතී. බංග්ලාදේශය පදනම් කොට ගෙන ඇති මානව හිමිකම් සංවිධානයක් වන ඔධිකාර් විසින් සකස් කරනු ලැබූ ලැයිස්තුවකට අනුව 2008 වර්ෂයේදී පහර දීමේ සිට පැහැරගෙන යාම් දක්වාත්, තර්ජනයන්හි සිට විවේචනාත්මක වාර්තාකරණය නිශ්ශබ්ද කිරීමේ අභිප්‍රායෙන් ගත් නීතිමය පියවර දක්වාත් වූ ජනමාධ්‍ය නිදහසට එරෙහිව සිදුකළ හඳුනාගත් අපරාධ සංඛ්‍යාව 115ක් වන්නේය.[4] මැතිවරණයකින් තේරී පත් වූ රජයක් ප්‍රතිස්ථාපනය වීමෙන් පසු එළඹි පළමු පූර්ණ වසර වූ 2009 වසරේදී එම මූලාශ්‍රයම එවැනිම සිදුවීම් පරාසයක් ආවරණය කරමින් මාධ්‍ය නිදහසට එරෙහි ප්‍රහාර 266ක් වාර්තා කළේය.[5]

නමුත් 2008 වසරේදී හදිසි නීතිය විසින් විවේචනාත්මක ජනමාධ්‍යවේදය මත ඇති කළ නොයෙක් අවහිරතා හේතුවෙන් එම වර්ෂය පිළිබඳ දත්ත අවප්‍රමාණ වී තිබීමට ඉඩ ඇති බව මතක තබා ගත යුතුය. 2008 ඔධිකාර් වාර්තාවේ සඳහන් වන්නේ 2008 වසර පුරා විද්‍යුත් මාධ්‍ය සහ මුද්‍රිත මාධ්‍ය මත "සැඟවුණු සහ විවෘත බාධා" පැනවූ බවයි. සරලව ගතහොත්, තොරතුරු වලට මහජන විෂය පථය වෙත ගමන් කිරීමට හැකියාවක් නොවූ නිසා ඇත්තෙන්ම මෙවන් විවිධ සීමා කිරීම් විසින් කෙතරම් දුරට මාධ්‍ය මර්දනය වී ඇත්දැයි නිවැරදිව තීන්දු කර ගැනීමට වළක්වනු ලැබීය. කෙසේ නමුත්, සිවිල් නීතිය නැවත ස්ථාපනය කිරීමෙන් පසු සමස්ථ මානව හිමිකම් තත්ත්වය වැඩි දියුණු වී ඇතැයි විශ්වාස කිරීමට ද පදනමක් නැත.

2008 ඔධිකාර් වාර්තාවේ නීතියට පිටින් සිදුවූ ඝාතන 149ක් සිදු වී ඇති බව ඉතා පැහැදිළිව සඳහන් වේ. නීතියට පිටින් සිදුවූ ඝාතන 154ක් වාර්තා වූ 2009 වසර ඊටත් වඩා අයහපත් එකක් විය. නැවත වතාවක්, 2008 වසරේ තොරතුරු වටපිටාව ප්‍රමාණවත් විනිවිද භාවයක් නොඉසුලූ නිසා එම වසරෙහි සංඛ්‍යා 2009 දත්ත සමග සංසන්ධනය කළ නොහැකි බව මතක ලබා ගත යුතුය. තවද නීතියට පිටින් සිදුවූ මරණ පිළිබඳ ප්‍රමාණය වාර්තා කිරීමෙන් මාධ්‍යට ඇතිවිය හැකිව තිබූ බාධා සළකන කල කණගාටුවක් ඇති වේ.

දකුණු ඉන්දියානු රටවල් බොහෝමයක මෙන් බංග්ලාදේශයේද ජනමාධ්‍ය, පසුගිය දශක දෙක තුළ, විෂම ආකාරයකින් වුවද, ශීඝ්‍ර ලෙස වර්ධනය වී ඇත. කෙසේ වෙතත්, ප්‍රචාරක දැන්වීම් වලින් ලැබෙන ආදායම දුර්වල වීම සහ අඩු සාක්ෂරතා මට්ටම හේතුවෙන්  මුද්‍රිත මාධ්‍ය වෙත ළඟා වන පාඨකයන් ප්‍රමාණය හා විෂය පථය අතින් සීමා වී ඇත. විද්‍යුත් මාධ්‍ය වර්ධනය වී ඇති නමුත් ඔවුන්ගේ අවධානය විශාල වශයෙන් කේන්ද්‍ර ගත වන්නේ විනෝදාස්වාදය මතයි. අප්‍රසන්න නීති හරහා ගුවන් විදුලිය මත සීමා පැනවී ඇත. 2008 වසර මුලදී ප්‍රකාශයට පත් වූ ප්‍රජා ගුවන්විදුලි ප්‍රතිපත්තියක් තරමක පැකිලීමකින් යුතුව වුවද එවක පටන් ක්‍රියාත්මක වී ඇත.

## හදිසි අවස්ථාව සහ ඉන් පසු අවධිය

මෙම වාර්තාවට වඩාත්ම කැපී පෙනෙන බලපෑමක් ඇති කළ සිදුවීම සිදුවූයේ වහාම අවධානයට ලක්වන කාල පරිච්ඡේදයට ඉහතිනි. 1994 දී එක්සත් බංග්ලාදේශ ජනමාධ්‍යවේදීන්ගේ පෙඩරල් සංගමය දෙකඩ විය. ඒ වන විට ෂීක් මුජිබ්ගේ ඝාතනයෙන් පසු වසර ගණනාවක් පැවති හමුදා පාලනය අවසන්ව සිවිල් පාලනයක් උදා වී ගත වී තිබුණේ වසර 3ක් පමණී සංගමය දෙකඩ වූ පසු දෙපිරිසම ප්‍රධාන සංගමයේ පදනම තමන්ගේ බව කියා සිටින්නට වූහ. එකල, මුල් අවස්ථාවේ තිබූ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක අතර වූ විරුද්ධවාදී ධ්‍රැවීකරණය හේතුවෙන් දෙකඩ වූ සංගමය නැවත එක් කිරීමට නොහැකි විය.

2001 වසරේ දී දේශපාලන පක්ෂවලින් එකක් ජාතික මැතිවරණයේදී තීරණාත්මක ජයග්‍රහණයක් ලබා කෙටි කලකට පසු, බංග්ලාදේශයේ සුළුතර ආගම් සහ දේශපාලනය තුළ ආගමික අපක්ෂපාතීත්වය වෙනුවෙන් පෙනී සිටි බහුතරයට අයත් පුද්ගලයන්ට එරෙහිව සැලසුම් සහගත ඝාතන මාලාවක් සිදු වන්නට විය. මේ වන විට අවාමි ලීගය සහ බංග්ලාදේශ ජාතික පක්ෂය අතර පැවති විරුද්ධවාදීකම් සම්පූර්ණ වී විසඳිය නොහැකි තත්ත්වයට පත්ව තිබුණි රටෙහි ඉතිහාසයේ විවාද සම්පන්න කරුණු මෙන් ම ජාතික සුබ සිද්ධිය වඩාත් ම හොඳින් සැපයීම සඳහා අසල්වාසීන් සහ ලෝකය සමග සම්බන්ධ විය යුත්තේ කෙසේද යන්න පිළිබඳව පැවති මහත් වෙනස හේතුවෙන් එතැන් සිට බේදය තව තවත් පුළුල් විය.

2006 වසරේ දී තවත් මැතිවරණ වටයක් පැවැත්වීමට නියමිතව තිබියදී වීදිවල දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා පැන නැගුණි. දෙපාර්ශ්වය අතර ගැටුමට මාධ්‍ය නැවතත් මැදිහත් විය. ගැටළුව වූයේ රාජ්‍ය බලය සංවිධානය කිරීමට බලය ඇති පවතින ආණ්ඩුවට නිදහස් මැතිවරණයක් පැවැත්වෙන බවට සහතික විය හැකි ද යන්නයි. බංග්ලාදේශ ජාතික නීතියට අනුව එක් ආණ්ඩුවක් ඉවත් වී ඊළඟ ආණ්ඩුව පත්වන අතරතුර කාලයේ රාජ්‍ය කටයුතු භාරකාර පරිපාලනයක් මගින් සිදු කිරීමට ඉඩ සළසා තිබේ. එහෙත් ජාතික පක්ෂ අතර අන්‍යෝන්‍ය විශ්වාසය බිඳ වැටීම සහ රාජ්‍ය ආයතනවල අවංකබව පිළිබඳ මහජනතාවගේ

3 මෙය සහ අනෙක් අදාළ සිදුවීම් 2009 අයි.එෆ්.ජේ දකුණු ආසියා මාධ්‍ය නිදහස පිළිබඳ වාර්තාවේ ඇත ඵ : http://asiapacific.ifj.org/assets/docs/082/145/d084a52-925-dc91.pdf.

4 බලන්න Figures obtained from page 36 of Odhikar¡s report on human rights in Bangladesh in 2008; available at: http://www.odhikar.org/report/pdf/hr_report_2008.pdf.

5 බලන්න Figures obtained from page 27 of Odhikar¡s report on human rights situation in Bangladesh in 2009; available at: http://www.odhikar.org/documents/2009/English_report/HRR_%202009.pdf



හදිසි නීති පාලනය විසංවාදයට මර්දනය කළේ ය. එසේ නමුත් ජනමාධ්‍යවේදීහු සිය සාධාරණ ඉල්ලීම් විදීයට ගෙනයාම නතර නොකළහ. (ඡායාරූප ස්තුතියෘ ඩ්‍රික් නිව්ස්)

අවිශ්වාසය කොතරම් ගැඹුරුද කිවහොත් සමස්ත ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රියාවලිය නවතා "හදිසි නීති පාලනයක්" ඇති කරන ලදී. එහි ප්‍රධානීන් ලෙස පිටතට පෙණුනේ සිවිල් සමාජයේ උසස් නිලධාරීන් පිරිසක් වුවද සැබැවින් ම යටින් ක්‍රියාත්මක වූයේ හමුදා බලයයි.

"හදිසි අවස්ථාව" ප්‍රකාශයට පත් කළ වහාම පුවත් රික්තයක් ඇති විය. අනතුරුව පුවත්පත් කතුවරුන්, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන් සහ අලුතින් පත් වූ භාරකාර පරිපාලනයේ නිලධාරීන් අතර හමුවීම් රැසක් පවත්වන ලදී. ඉන්පසු පුවත් වාර්තාකරණය සඳහා පැවති තහනම ලිහිල් කෙරුණු අතර "සිද්ධිමය කරුණු" වාර්තා කිරීමට මාධ්‍යයට ඍජුවම අවසරය ලැබුණි රූපවාහිනී වැඩසටහන්වල නැවතත් පුවත් වැඩසටහන් විකාශය වන්නට වූ අතර පුවත්පත්වල නැවතත් පුවත් පළ වන්නට පටන් ගත්තේය. කෙසේ වුව ද එය සිදුවූයේ පරිස්සමින් සහ ස්වයං වාරණයක් යටතේ ය.

පාර්ලිමේන්තුව තාවකාලිකව අත්හිටුවා තිබූ කාලය තුළ මහජන විවාද පැවැත්වීම සඳහා ඵලදායී වේදිකාවක් ලෙස ජනමාධ්‍ය ක්‍රියා කරනු ඇතැයි බලාපොරොත්තු වන බව අගමැතිවරයාගේ බලතල මත ක්‍රියා කළ බංග්ලාදේශ යුද හමුදාවේ මාණ්ඩලික ප්‍රධානියා සහ ජනාධිපතිවරයාගේ ප්‍රධාන උපදේශකවරයා යන දෙදෙනා විසින්ම සෑම අවස්ථාවකම තහවුරු කරන්නට යෙදුණහ. කෙසේ වුවත් හදිසි අවස්ථා රජය මුලින්ම කළ කටයුතුවලින් එකක් වූයේ මාධ්‍ය පිළිබඳ ක්‍රියා කිරීමට විශේෂ ඒකකයක් ස්ථාපනය කිරීමයි. එය මාධ්‍ය පාලනය කිරීම සඳහා කළ දෙයකි. පුවත්පත්වල පළ වන විවේචනාත්මක විස්තරවල පැවතිය යුතු සීමාවන් සම්බන්ධයෙන් අලිඛිත උපදෙස් මාධ්‍යයන්ට ලැබුණි සජීවී සාකච්ඡාමය වැඩසටහන් මගින් ආවරණය කළ හැකි මාතෘකා මොනවාද, එම වැඩසටහන්වලට ආරාධනා කළ හැක්කේ කාටද යන්න පිළිබඳව ගුවන් විදුලි මාධ්‍යවලට නිශ්චිත ලිඛිත නියෝග නිකුත් කරන ලදී.

හදිසි අවස්ථා රජයේ අරමුණුවලට සහාය දක්වන ලෙස මාධ්‍යවලින් ඉල්ලා සිටීම සඳහා නිරන්තර සාකච්ඡා හරහා පරිපාලනය විසින් මේ කාලය තුළ පවත්වන ලදී. 2007 අප්‍රේල් මස දී රජය විසින් මාධ්‍ය වාරණය තවත් පියවරක් ඉදිරියට ගෙන යමින්, "විශේෂයෙන් රාජ්‍ය නිලධාරීන්ට, ව්‍යාපාරවලට, වෘත්තිකයන්ට, බුද්ධිමතුන්ට සහ දේශපාලනඥයන්ට එරෙහිව, අයහපත් අරමුණු සහිත හෝ හිංසාකාරී හෝ නොමග යවන සුළු අන්දමේ හෝ වාර්තා" පළ කිරීම හෝ ප්‍රචාරය කිරීම සිදු නොකරන ලෙසට මාධ්‍ය ආයතනවලට ලිපි එවන ලදී. එම ලිපියේ මෙසේ සඳහන් විය. "විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යයන්ගේ සාධනීය භූමිකාව පවත්වාගෙන යාම පිණිස දේශපාලනයට අදාළ සහ වැදගත් පුවත්, විශේෂාංග, සාකච්ඡා, උපහාසාත්මක චිත්‍ර සටහන් සහ කාටූන් පළ කිරීමේ දී / ප්‍රචාරය කිරීමේ දී රටේ ජනමාධ්‍ය විශේෂයෙන් සැලකිලිමත් වනු ඇතැයි රජය අපේක්ෂා කරයි." මාධ්‍ය මත තහනම් පැනවීම සඳහා කොතරම් දැඩිව ක්‍රියා කිරීමට රජය සූදානමින් සිටී ද යන්න මෙම ලිපියෙන් ද පැහැදිලි වූයේ නැත. ඒ සඳහා හදිසි අවස්ථා පරිපාලනය විසින් කුමන මෙවලම් යොදා ගනීද යන්නත් පැහැදිලි නොවීය. මෙම හේතු නිසා රජය මගින් කළ මෙම මුල්පිරීම් මගින් මුලදී එතරම් විශාල බලපෑමක් ඇති වූයේ නැත. එහෙත් පරිස්සම් වීමේ ප්‍රතිපත්තිය මාධ්‍ය විසින් දිගටම පිළිපදින ලදී.

2007 අගෝස්තු මාසයේදී ඩකා විශ්ව විද්‍යාලයේ විරෝධතා මතු වීමත් සමග නව පාලනයට එල්ල වන අභියෝගයන් පිළිබඳව පළමු සංඥා දර්ශනය වූ විට නිල ප්‍රතිචාරය සැලකිය යුතු ලෙස දරුණු විය. උද්ඝෝෂණ සඳහා මාධ්‍ය ආවරණය ලබා දීමත් සමඟ පරිපාලනය "හදිසි නීතිය" යටතේ ඇති විශේෂ තත්ත්වයන් පිළිබඳව සිහිපත් කර දුන්නේ කෲර ලෙසය. පරිපාලකයන්ගේ ඍජු යෝජනා හැර අන් සියළුම හැඟවීම් ප්‍රකාශ කළේ මාධ්‍ය ආවරණය විසින් විරෝධතා උසි ගන්වා ඇති බවත් ශිෂ්‍යයන් ප්‍රචණ්ඩකාරීව හැසිරුණේ එම හේතුව නිසා පමණක් බවත්ය. කැරැල්ල ව්‍යාප්ත වීමත් සමඟ හදිසි නීතිය යටතේ රටේ පරිපාලන කොට්ඨාශ හයක ප්‍රධාන නගරයන්ට ඇඳිරිනීතිය පනවනු ලැබිණි ඒ වන විට ජනාධිපත්වරයාගේ තොරතුරු උපදේශක වූ මයිනුල් හොසේයින් බංග්ලාදේශයේ ප්‍රමුඛ පෙළේ කර්තෘවරුන් සහ රූපවාහිනී නාලිකා ප්‍රධානීන් ගේ සාකච්ඡාවක් කැදවා "සවිඥානිකව සහ වගකිව යුතු" ලෙස වාර්තා කරන ලෙස ඔවුන්ට බල කර සිටියේය. ඔහු ප්‍රකාශ කළේ, බලතල තිබුණද, රජයට කිසිම ආකාරයක වාරණයක් පැනවීමේ බලාපොරොත්තුවක් නොමැති බවයි. ඇතැම් පුවත්පත් විශේෂාංග වල ආණ්ඩුව පිළිබඳව විවේචනාත්මක ස්වරයකින් වාර්තා කෙරුණ නමුත්, තත්ත්වයෙහි පැවති ව්‍යාකූලතාවයන් නිසාත්, පෙර වසරවල පැවති අමිහිරි කර්කශ භාවයෙන් තොර නව ආකාරයක දේශපාලන ඒකමතිකතාවයක් ඇති කිරීමට හදිසි අවස්ථා පරිපාලනය උත්සාහ දැරූ බවට පොදු විශ්වාසයක් වූ නිසාත් ජනමාධ්‍ය ප්‍රතිචාරය වුවමනාවට වඩා එදිරිවාදී නොවීය.

2008 දෙසැම්බර් මාසයේදී හදිසි අවස්ථාව ලිහිල් කරන තෙක් මතුපිටට නොපෙණුන ආතතීන් දිගින් දිගටම පැවතුණි 2008 දෙසැම්බර් මස 05 වන දින හදිසි නීතියේ ඉතිරිකොටස් ඉවත් කිරීමට ඉතා ආසන්නව තිබියෙදී බංග්ලාදේශයේ ප්‍රධාන ඉංග්‍රීසි මාධ්‍ය පුවත්පතක් වන නිව් ඒජ් කතුවැකිය මෙසේ ප්‍රකාශ කර තිබිණිඃ "ප්‍රවෘත්ති මාධ්‍ය මුහුණ දුන් මැදිහත්වීම් සහ බිය ගැන්වීම් මෙන්ම විශේෂයෙන්ම වාර්තාකරුවන්, මුහුණ දුන් අඩන්තේට්ටම් පසුගිය වසර 15 තුළ අත්දුටු තත්තවයන්ට වඩා කැපී පෙනෙන ලෙස ඉහල මට්ටමක" පැවතියේ ය.

## බරපතල සිදුවීම් පිළිබඳ පුනරාවර්ජනයක් ලුහුඬින්

දේශපාලනය කෙසේ සිදු විය යුතුද යන්න සහ විවේචනාත්මක ජනමාධ්‍ය විචාරයන්ගේ සීමාවන් මොනවාද යන්න පිළිබඳ ස්ථිර එකඟතාවයක් නොමැති වීම හේතුවෙන් ජනමාධ්‍යයට ඇති වී ඇති උවදුරු පිළිබඳව අවධානය යොමු කරන පසුගිය වසර පහ ඇතුළත සිදුවූ සිද්ධීන් කිහිපයක සංෂිප්තයෙන් පහත දැක්වේඃ

- 2005 නොවැම්බර් මාසයේදී මනික්චාරි මාධ්‍ය සමාජයේ

මහලේකම් මෙන්ම *දෛනික් ආජ්කේර් කාගොජ් සහ දෛනික් සුපරාවත්* සඳහා ලිපි සැපයූ හබිබූර් රහ්මන් හබීබ් පාලක පක්ෂය වන බංග්ලාදේශ් ජාතික පක්ෂයේ හමුදා විසින් ප්‍රහාරයකට ලක් කරන ලදී. ප්‍රහාරයට පළමුව පාලක පක්ෂයේ පාර්ලිමේන්තු සාමාජිකයෙක් බාග්‍රාචාරි හි ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන්ට තර්ජන එල්ල කළේය. බංග්ලාදේශ දේශප්‍රේමී පක්ෂයේ සාමාජිකයන් විරෝධත්වයක්ද පැවැත් වූ අතර ශිරාජ්ගල්ජ් - උල්ලහ්පාරා හි දිනපතා පුවත්පතක් වන *දෛනික් ජුගන්තෝර්* හි පිටපත් වලට ගිණි තැබීය. මෙම සිදුවීම සිදුවූයේ *දෛනික් ජුගන්තර්* "බංග්ලා භායි - ඉස්ලාම් යුධ වාදීන්ගේ නායකයා බංග්ලාදේශ් ජාතික පක්ෂයේ නායකයාගේ නිවසේ නවාතැන් ගනී" මැයෙන් වාර්තාවක් පළ කිරීමෙන් පසුවය.

- රාජ්ශාහි ප්‍රදේශයේ *අමාර්දේශ්* නම් දිනපතා පුවත්පතට ලිපි සැපයූ රෆිබුල් ඉස්ලාම්, පාලක පක්ෂයේ ශිෂ්‍ය සංගමය වන ජාතියාතබාදී චත්‍ර දාල් හි සාමාජිකයන්ගේ සාහසික ප්‍රහාරයකට ගොදුරු විය. දූර්ගා පූර් ජනමාධ්‍ය සමාජයට ඇතුළු වූ ප්‍රහාරකයින් දස දෙනෙක් සමාජයේ සභාපතිත්වය දැරූ රෆිබුල් ඉස්ලාම් ට පහර දුන්හ. සමාජයේ මහ ලේකම් වන නුරුල් ඉස්ලාම් එයට මැදිහත් වීමට උත්සාහ කළ විට ඔහුටද පහර දෙන ලදී. පහර දීමට පෙර ශිෂ්‍ය සංගමයේ සාමාජිකයන් විසින් සිදුකළා යැයි කියූ අසාධාරණ අය කිරීමක් සම්බන්ධයෙන් වාර්තා නොකරන ලෙස අනතුරු හැඟවීම් කළ බව පවසමින් රෆිබුල් ඉස්ලාම් විසින් පොලීසිය වෙත පැමිණිල්ලක් ගොනු කර තිබුණ ද කිසිදු ආරක්ෂාවක් ඔහුට ලබා දී තිබුණේ නැත.
- 2006 මැයි මාසයේදී කුෂ්තියා නගරයේදී, බංග්ලාදේශ් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු සාමාජිකයෙකු වූ ෂහිදුල් ඉස්ලාම් විසින් ආසන්නයේ පැවැත්වෙමින් තිබූ ජනමාධ්‍යවේදීන්ගේ ප්‍රාදේශීය පුවත්පත් සමාජයක පැවැති රැස්වීමකට පහර දීම සඳහා ඔහුගේ ආරක්ෂක භටයින් පිටත් කර හරින ලදී. හිටපු බංග්ලාදේශ් ඔබ්සවර් පුවත්පතේ කර්තෘ, බංග්ලාදේශ ෆෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ සභාපති වූ ඉක්බාල් සොබහාන් චවුද්‍රි ඇතුළු වැඩසටහනට සහභාගී වීම සඳහා ආරධනා ලැබූ ඩකා සිට පැමිණි ජ්‍යෙෂ්ඨ ජනමාධ්‍යවේදීන් කිහිපදෙනෙක්ම ප්‍රහාරයේදී තුවාල ලැබූහ.
- 2005 මාර්තු 5 වන දින 'රී ප්‍රවෘත්ති ඒජන්සියට සහ *දෛනික් ගිරි දර්පන්* ප්‍රාදේශීය පුවත්පතට ලිපි සැපයූ ජමාල් උද්දීන් කතල්ටලාහි පිහිටි ඔහුගේ නිවසේ සිටියදී අතුරුදහන් විය. පසුදින රංගමතී වැව අසල තිබී ඔහුගේ මෘත ශරීරය සොයා ගන්නා ලදී. ඔහුගේ මුහුණේ කොටසකට හානි වී තිබූ අතර ඔහුගේ සිරුරේ අනෙක් කොටස් සීරීම් වල සලකුණු දක්නට ලැබුණි ඔහුගේ ගෙල වටා කඹයක්ද විය. ඔහුගේ මෘත ශරීරය හමු වීමෙන් දින 12කට පසු නිකුත් කළ මරණ පරීක්ෂණ වාර්තාව නිගමනය කළේ ජමාල් උද්දීන් දිවි නසා ගන්නට ඇති බවයි. කෙසේ නමුත් ජමාල් උද්දීන් සතුව දිවි නසාගැනීමේ නැඹුරුවන් නොතිබූ බවත් අවස්ථානුගත සාක්ෂි මත මෙම නිගමනය පිළිගත නොහැකි බවත් ඔහුගේ සගයන් සහ ඥාතීන් විසින් පෙන්වා දෙන ලදී. ජමාල් උද්දීන්ගේ මෘත ශරීරයේ තිබී ඔහු දිවි නසා ගැනීමේ ප්‍රකාශයක් පටිගත කළ කැසට් පටයක් හමු වූ බව පොලීසිය විසින් ප්‍රකාශ කළ නමුත් එම හඬ පටයට සවන් දීමට ඔහුගේ සගයන්ට ඉඩ ලැබුණේ නැත.
- 2007 ඔක්තෝබර් 23 රාත්‍රී, *සංග්බාද්* දිනපතා පුවත් පතේ සහ සී.එස්.බී. ටෙලිවිෂන් නාලිකාවෙහි සේවය කළ වාර්තාකරුවෙකු වූ ජහන්ගීර් ආලාන් ආකාෂ් බංග්ලාදේශයේ රාජ්ශාහි පරිපාලන කොට්ඨාසයේ පිහිටි ඔහුගේ නිවසේදී ශීඝ්‍ර කාර්ය බලඇණියේ 'වී' අංශයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගනු ලැබිණි. අත්අඩංගුවට ගත් කණ්ඩායමේ නායකත්වය ගෙන ඇත්තේ, ඔහුගේ ඇතැම් වාර්තාවන්හි සිවිල් ඝාතන කිහිපයකටම වග කිව යුතු යැයි නම් කළ නිලධාරියෙකි. අත්අඩංගුවට ගැනීම සිදු කළේ ආකාශ් විසින් අසාධාරණ අය කිරීමක් කර ඇති බවට ප්‍රාදේශීය දේශපාලඥයෙකු විසින් කළ පැමිණිල්ලක් මතය. ආකාශ් විසින් එම දේශපාලනඥයා යටතේ බහුලව මූල්‍යමය වංචා සිදු වූ බවට ප්‍රකාශිත විමර්ශන වාර්තා කිහිපයක්ම ඉදිරිපත් කිරීමෙන් පසුව එකී දේශපාලඥයා සතුව තිබූ පළාතේ ආගමික ආයතනයන්හි දේපළ පරිපාලනය කළ ආයතනයක භාරකාරිත්වය අවලංගු වී තිබිණි පැමිණිල්ල ගොනු කළ වහාම ආකාශ් විසින් අදාල උසාවියෙන් පූර්වාපේක්ෂ ඇප ලබා ගෙන තිබූ නමුත් අදාල ශීඝ්‍ර කාර්ය බලඇණියේ 'වී' නිලධාරීන් විසින් ඔහුගේ නිවස වැටලීමට පැය හතරකට පමණ පෙර ගොනු කර තිබූ තවත් පැමිණිල්ලක් හේතුවෙන් ඔහුව නැවත අත්අඩංගුවට ගනු ලැබීය. නොවැම්බර් 19 වන දා වන තෙක් ඔහුව රඳවා තබා ගැණුන අතර ශීඝ්‍ර කාර්ය බලඇණිය 'වී' නිලධාරීන්ගෙන් මෙන්ම රාජ්ශාහි පොලීසියද ඔහුව වද හිසාංවන්ට ලක් කළේය. ඔහු ඇප මත මුදා හැරීමෙන් පසුවද ප්‍රසිද්ධ අපරාධකරුවන් විසින් ඔහුට විරුද්ධව නව පැමිණිලි ගොනු කළ අතර ඔහුගේ පවුලේ නිවසට නොගොස් ඩකාහි ආරක්ෂක ස්ථානයක රැඳී සිටීමට ඔහුට සිදු විය. දැන් ඔහු සිය නිවසට යාමට නොහැකිව ඩකාහි රැඳී සිටී.
- 2007 ඔක්තෝබර් මාසයේදී, දිනපතා පුවත්පත් වන *ඉන්කුයිලාබ්* සහ *නිව් නේෂන්* යන පුවත් පත් වලට ලිපි සැපයූ සහිරුල් හක් ටිටූ නිරිත දිග බංග්ලාදේශ්හි ඔහුගේ නිවස පිරිටි නගරය වන පිරෝජ්පූර්හිදී රඳවා තබා ගන්නා ලදී. සාමාන්‍යයෙන් පොලිස් බලතලයක් වන පරීක්ෂා කිරීම සහ පරිග්‍රහණය කිරීම පිළිබඳ බලය පොලිස් නොවන සෙසු ආරක්ෂක අංශ වලටද හිමි කර දෙන හදිසි නීතිය 16(2) කොටස යටතේ ඔහුව අත්අඩංගුවට ගැණුනු බව ප්‍රකාශ කළද ඒ සඳහා කිසිදු චෝදනාවක් ගොනු කළේ නැත. ටිටූ බංග්ලාදේශ ජනතා පක්ෂය පාලනය යටතේ 2003 සිටම ඉස්ලාම් අන්තවාදීන්ගේ සහ ඔවුන්ගේ මිත්‍ර පාර්ශවයන්ගේ ප්‍රසිද්ධ එදිරිවාදීකම් වලට මුහුණ දුන්නේය. බංග්ලාදේශ ජනතා පක්ෂය බොහෝ අවස්ථාවලදී අවාමි ලීගය සමග මාරුවෙන් මාරුවට බලයෙහි රැඳී සිටිම හේතුවෙන් ඔහුට විරුද්ධ පහරදීම් බොහොමයක් පිළිබඳව කිසිදු පරීක්ෂණයක් සිදු වී නොමැත.
- 2007 මැයි 11 වන දින, ජනමාධ්‍යවේදියෙකු සහ මානව හිමිකම් ක්‍රියාධරයෙකු වූ තස්නීම් ක්හලීල් ඔහුගේ නිවසේ සිටියදී සිවිල් ඇඳුමින් පැමිණි පොලිස් නිලධාරීන් විසින් අත්තඩංගුවට ගන්නා ලදී. ඔහුව සංග්සාද් භවාන් හමුදා කඳවුරට රැගෙන යන ලද අතර එහිදී වදහිංසාවන්ට ලක් කරන ලදී. බංග්ලාදේශයේ ප්‍රමුඛ පෙළේ ඉංග්‍රීසි පුවත් පතක් වන *ඩේලි ස්ටාර්* හි සහකාර කර්තෘ වරයෙකු වන ක්හලීල් ලොව පුරා විකාශය වන සීඑන්එන් ඉන්ටනැෂනල් වෙනුවෙන්ද සේවය කර ඇති අතර හියුමන් රයිට්ස් වොච් වෙනුවෙන් වාර්තා සම්පාදනයෙන්ද දායක වී ඇත. වද හිංසා නිසා ඇති වූ දරුණු තුවාල වලින් පීඩා විඳි ඔහුව එක් දිනක් රඳවා තබා ගැනීමෙන් පසුව, මුදා හරින ලදී.
- 2007 සැප්තැම්බර් මාසයේදී බංග්ලා දිනපතා පුවත්පතක් වන *ප්‍රොතෝම් ආලෝ* පුවත්පතෙහි කාටූන් ශිල්පියෙකු වූ අරිෆූර් රහ්මාන් මාධ්‍ය ආයතන හිමිකරු විසින් සේවයෙන් පහ කරන ලදී. එය සිදු වූයේ රහ්මන් මුහම්මද් නාමය සමග වචන පෙරලියක් ඇතුළත් කරමින් නිර්මාණය කළ කාටූනයකට විරුද්ධව ඉස්ලාම් කණ්ඩායම් විසින් දැඩි විරෝධතා ව්‍යාපාරයක් දියත් කිරීමෙන් පසුවයි. අදාල කාටූනය පළ කිරීම සම්බන්ධයෙන් පුවත්පත් සමාව ඉල්ලා සිටි අතර කර්තෘ වරයා හෝ මුද්‍රණකරු කිසිදු දඬුවමක් නොලැබුවේය. දින දෙකකට පසු රහ්මාන් අත්අඩංගුවට ගැණිනි. ඔහුට ඇපකරුවෙක් වීමට කිසිවෙකු ඉදිරිපත් නොවුණ හෙයින් ඔහු දින 30කට සිර ගත

> කරන ලදී. ඔහුගේ රඳවා තැබීම නැවත නැවත දීර්ඝ කිරීමෙන් පසු 2008 මාර්තු 20 වන දින ඔහුව නිදහස් කළ අතර 2010 ජනවාරි මාසයේදී ඔහුට විරුද්ධව තිබූ සියළු චෝදනාවන්ගෙන් ඔහුව නිදහස් කරන ලදී.

බංග්ලාදේශයේ ජනමාධ්‍යවේදීහු ඔවුන්ගේ වෘත්තීය ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය පිළිබඳව ඇති වී ඇති අභියෝග ආමන්ත්‍රණය කිරීම සඳහා ඉතා ශක්තිමක් ලෙස සංවිධානය වී සිටිති. නමුත් විවිධ අවස්ථා වලදී ඔවුහු විවිධාකාර බාධක වලට මුහුණ දෙති. ඒ කෙසේද යත්, ජනමාධ්‍ය සම්බන්ධයෙන් වර්ධනය වන බිය ජනක තත්ත්වය පිළිබඳව විරෝධය දැක්වීම සඳහා 2005 නොවැම්බර් මාසයේදී බංග්ලාදේශ පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය විසින් ජනමාධ්‍යවේදීන්ගේ ජාතික රැස්වීමක් සංවිධානය කිරීමට සූදානම් වෙමින් සිටියදී, ඒ සඳහා ඔවුන් කලින් වෙන් කරවා ගෙන තිබූ ස්ථානය ඔවුන්ට ලබා නොදීමට ආණ්ඩුව ක්‍රියා කළේය. සෑහෙන තරමින් ලෙස පැහැදිළි නොකළ "ආරක්ෂක" හේතූන් විනා ඒ පිළිබඳ කිසිදු පැහැදිළි හේතුවක් ලබා දුන්නේ නැත.

ජනමාධ්‍යවේදීන්ට සහ ජනමාධ්‍යයට විරුද්ධව සිදු වන ප්‍රචණ්ඩක්‍රියා බොහොමයක් සම්බන්ධයෙන් දඬුවම් ලැබෙන්නේ නැත. මේ සිදුවීම් තුළ පෙනී යන්නේ බංග්ලාදේශයද බොහොමයක් දකුණු ආසියානු රටවල පවතින විරල බලාපොරොත්තු සහිත, වරදට දඬුවම් නොලබන සංස්කෘතියට හිමිකම් කියන බවයි.

## අපහාස නඩු සහ කප්පම් චෝදනා

විශේෂයෙන් හමුදා සහ ආරක්ෂක ආයතන මගින් නීතියෙන් පිටත සිදු කළ ඝාතන වලට අදාළ මානව හිමිකම් ගැටලු ආවරණය කරන මාධ්‍යවේදීහු බංග්ලාදේශයේ දී බරපතළ තර්ජනවලට මුහුණ දෙති. තවත් හිංසාවක් වන්නේ විවේචනාත්මක වාර්තාකරණය නිහඬ කිරීම සඳහා අපහාස නීතිය සහ කප්පම් පිළිබඳ චෝදනා එල්ල කිරීමයි.

2005 ජුලි මස දී බංග්ලා බසින් පළ වන දිනපතා පුවත්පත් දෙකක කතුවරුන්ට එරෙහිව බංග්ලාදේශ ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙකු විසින් අපහාස නඩුවක් පවරා වරෙන්තු නිකුත් කරන ලදී. මංත්‍රිවරයා සහ ඔහුගේ දෙසොහොයුරන් මිනී මැරුමකට සම්බන්ධ බව සඳහන් කෙරුණු වාර්තාවක් එම පුවත්පත්වල පළ වූ බව ඔහුට විරුද්ධව එල්ල වූ චෝදනාව විය.

තවත් අවස්ථාවක තමන් පිළිබඳ පුවත් වාර්තාවක් පළ කිරීම සම්බන්ධයෙන් බංග්ලාදේශ ජාතික පක්ෂයේ නායකයෙකු වන ජමල්පූර් දිස්ත්‍රික්කයේ මෙලන්දහා ප්‍රදේශයේ ෆකීර් අබු සිද්දික් සහ නායනගර් පරිශ්ද් සංගමයේ (පළාත් පාලන පද්ධතියේ පළමු මට්ටම) සභාපතිවරයා විසින් *භෝරර් කාගොජ්* සහ *ප්‍රොතොම් අලෝ* යන දිනපතා පුවත්පත් දෙකෙහි කතුවරුන්ට සහ ප්‍රකාශකයන් ඇතුළු ශමෝකාල් ප්‍රාදේශීය වාර්තාකරුවන්ට එරෙහිව අපහාස නඩුවක් පවරන ලදී.

2006 පෙබරවාරි මස මහාධිකරණය විසින් *සංග්බාද්* දිනපතා පුවත්පතේ කතුවරයා වූ බස්ලූර් රහ්මන්ට පූර්වාපේක්ෂිත ඇප ලබා දීම එක් සුබවාදී පියවරක් වශයෙන් පෙන්වා දිය හැකිය. 2005 ජුලි මස *සංග්බාද්* පුවත්පතේ පළ වූ "ජමල්පූර්හි බංග්ලාදේශ ජාතික පක්ෂ සාමාජිකයන් අතර ගැටුම්" නම් වූ වාර්තාවේ එක්තරා ප්‍රාදේශීය දේශපාලනඥයෙකු අපරාධ නඩුවක සැකකරුවෙකු බව සඳහන් කර තිබුණු අතර ඒ සම්බන්ධව පුවත්පතේ කතුවරයාට සහ එම වාර්තාව ලියූ වාර්තාකරුට එරෙහිව අපහාස නඩුවක් පැවරුණී

## මාධ්‍යවේදීන්ගේ සංවිධාන අතර අප්‍රසන්න බෙදීමක්

සැඟවුණු එදිරිවාදිකම් භයානක ලෙස මතුපිටට පැමිණෙන තරමට මාධ්‍ය මගින් දේශපාලන විරුද්ධවාදීන් නියෝජනය කරන අවස්ථා තිබුණි මේ අතර වඩාත්ම කතාබහට ලක් වූ සිදුවීම වූයේ 2010 මාර්තු මස ජාතික ජනමාධ්‍ය සමාජයේ සභාපති මාධ්‍යවේදී සහ බංග්ලාදේශ ජාතික පක්ෂයේ සභාපති ඛලීඩා සියාගේ උපදේශක ෂෝකත් මහ්මුද් විසින් සිදු කරන ලද ප්‍රසිද්ධ මැදිහත්වීමයි. හිටපු බංග්ලාදේශ ජනාධිපති සහ බංග්ලාදේශ ජාතික පක්ෂයේ නිර්මාතෘ සහ දේශපාලන සංකේතයක් වූ ජෙනරාල් සියා උර් රහ්මන්ගේ සොහොන නඩත්තු කිරීම සඳහා වැය වන මහජන වියදම පිළිබඳ අගමැතිනි ෂීක් හසීනා විසින් කරන ලද ප්‍රකාශයක් නිසා කුපිත වූ මහ්මුද් එම ස්මාරකයේ රාජකීයත්වය නැති කිරිමට උත්සාහ කරන ඕනෑම කෙනෙකුට ශාරීරික හිංසා කරන බවට දරුණු සහ ඍජු අනතුරු ඇඟවීමක් නිකුත් කළේය. එසේ ම බංග්ලාදේශ ජාතික පක්ෂයේ නිර්මාතෘවරයාගේ දේශපාලන උරුමයට සහ බංග්ලාදේශය තුළ බහු පාක්ෂික ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ඔහුගේ භූමිකාවට ගරු කිරීමක් වශයෙන් ස්මාරකය පසු කර යන සෑම අවස්ථාවක ම ඊට ආචාර කළ යුතු බව ද ඔහු අගමැතිනියට බල කළේය.

පාලක පක්ෂයේ සාමාජිකයන් විසින් වහා ම මහ්මුද්ට එරෙහිව විවිධ අධිකරණවල අපහාස නඩු 27ක් පවරනු ලැබුවේ එවැනි නඩුකර පැවරිය යුත්තේ අපහාසයට කෙළින්ම ලක්වූ තැනැත්තා විසින් පමණක්ය යන නීතිමය සම්මතයද බිඳ දමමිනි. බංග්ලාදේශ ජාතික පක්ෂය මීට ප්‍රතිචාර දැක්වූයේ මහ්මුද්ගේ පැත්තට නැඹුරුවක් ඇති ජනමාධ්‍ය සමාජ ජාලය ක්‍රියාත්මක කිරීමෙන් සහ එහි උපදේශකට සිදු වූ නීතිමය හිංසනයට එරෙහිව විරෝධතා රැළි පැවැත්වීමෙනි. රටේ නොයෙක් ප්‍රදේශවල ප්‍රධාන පෙළේ මාධ්‍යවේදීන් මීට සහභාගි කරවා තිබුණි එහෙත් නිරිත දිග ප්‍රාදේශීය මූලස්ථානය පිහිටි ඛුල්නා නගරයේ මාර්තු 20 දා පැවැත්වීමට නියමිතව තිබූ රැළියේ දී මහජනතාව ඇමතීමේ ක්‍රමවේදයක් භාවිත කිරීමට අවසර ලබා නොදීම හේතුවෙන් පාලක පක්ෂය සහ විරුද්ධ පක්ෂය අතර තවත් දෝෂාරෝපණ වටයක් ඇති විය.

මාධ්‍යවල පළ වූ විස්තර ද එකිනෙකට පරස්පර විය. නිදසුනක් ලෙස *ඩේලි ස්ටාර්* පුවත්පතේ තීරු ලිපි රචකයෙකු ප්‍රකාශ කළේ මහ්මුද් විසින් අගමැතිනියට කළ අනතුරු ඇඟවීම පිළිබඳ තමන් "පුදුමයට සහ කම්පනයට" පත් වූ බවත් එය පුද්ගලයෙකුට "ගරු කිරීම" පිළිබඳව සෑම සංස්කෘතියකම පිළිගනු ලබන සම්මතයන් ඉක්මවා යන බවත්ය. එය ඡන්දයෙන් තෝරා පත් කර ගත් අගමැතිවරයෙකුට ශාරීරික හිංසාවක් කරන බවට කළ තර්ජනයක් බවත් සඳහන් කළේ ය. ජෙනරාල් සියා උර් රහ්මන් විසින් බංග්ලාදේශය තුළ "බහු පාක්ෂික ප්‍රජාතන්ත්‍රවාදය" ප්‍රතිෂ්ඨාපනය කිරීම නිසා ඔහු ගෞරවනීයත්වයට පාත්‍රවීමට සුදුසුය යන ප්‍රකාශය ද නිශ්චිතවම වැරදි බව සඳහන් විය. "ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතිස්ථාපනය කිරීමට මුවා වී හිටපු ඒකාධිපති පාලකයා විසින් විමුක්තිය ලබා ගැනීම වෙනුවෙන් පැවති යුද්ධයට පදනම් වූ උතුම් ප්‍රතිපත්ති සියල්ල ම පැත්තකට දමා නිදහසේ සතුරන්ට නැවත දේශපාලන වේදිකාවට ඒමට ඉඩ දෙන ලදී. පැරණි පකිස්ථානයට ළැදි මුස්ලිම් ලීග පාක්ෂිකයන් සහ ජමාටිවරුන් වැනි රජද්‍රෝහීත්වය මත සිරදඬුවම් හෝ නියුරෙම්බර්ග් වැනි ඊටත් වඩා ඉහළ දඬුවමක් ලැබීමට සුදුසු පුද්ගලයෝ බංග්ලාදේශයේ වැදගත් පුද්ගලයන් ලෙස පෙනී සිටීමට නැවත පැමිණියහ. බහු පාක්ෂික ප්‍රජාතන්ත්‍රවාදයට නැවත යාම ලෙස එය හැඳින්විය හැකිද?"[6]

ජාතික පුවත්පත් සමාජය එළිපිටම දේශපාලනීකරණය වීම පිළිබඳ මාධ්‍යවේදී ප්‍රජාව අතර ප්‍රසිද්ධියේ අදහස් ප්‍රකාශ කිරීමේ නිහඬ බවක් විය. එහෙත් පක්ෂපාතී දේශපාලනයේ එළිපිටම යෙදී සිටි එකම ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියා මහ්මුද් පමණක් නොවූ නිසා ඔහු පිළිබද කතා බව කෙරුණේ ද නැත. 2009 දී බංග්ලාදේශ පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ සභාපති අවාමි ලීගය සමඟ එක් වූ අතර ඉක්බාල් සෝභාන් චෞද්රි එම පක්ෂයෙන් ජාතික මැතිවරණයට තරග කර පරාජය විය. ජාතික මට්ටමේ මාධ්‍යවේදී සංගමයක නායකයා ලෙස ඔහුගේ

6 බලන්න Syed Badrul Ahsan, "The mediocre and the maddening", *Daily Star*, March 24, 2010, extracted on the same day at: www.thedailystar.net/newDesign/print_news.php?nid=131302. The reference here is to two political parties - the Muslim League and the Jamaat-e-Islami - both electoral allies of the BNP.

## අමර් දේශ් සිදුවීම

2010 ජූනි පළමුවන දින බංග්ලාදේශ රජය විසින් බංග්ලා මාධ්‍ය දිනපතා පුවත්පතක් වන අමර් දේශ් සඳහා බලයලත් හෝ හඳුනා ගත හැකි ප්‍රකාශකයෙක් නොමැති බැවින් නීතිය උල්ලංඝණය වීමක් සිදු වී ඇතැයි  යන චෝදනාව මත පුවත්පතේ ''ප්‍රකාශණය'' - එනම්, ප්‍රාදේශීය නීතිය යටතේ පුවත්පතේ ලියාපදිංචිය - අත්හිටුවනු ලැබීය.

ඉන් ඉතා සුළු කාලයක් ඇතුළත පුවත්පතෙහි වැඩබලන කර්තෘ වූ මහ්මුදූර් රහ්මාන් අත්අඩංගුවට ගෙන ඔහුට විරුද්ධව රටෙහි දූෂණ මර්දන කොමිසම මඟින් විවිධ මූල්‍යමය අකටයුතු පිළිබඳ වූ විවිධ චෝදනා ගොනු කරන ලදී. ඩකාහි අදාල නීතිය වන මුද්‍රණාල සහ ප්‍රකාශණ (ප්‍රකාශණය සහ ලියාපදිංචිය) පනත 1973 යටතේ අමර් දේශ් හි ලිංයාපදිංචිය අත් හිටවනු ලදී. නියෝජ්‍ය කොමසාරිස්වරයා සඳහන් කළ පරිදි, ඊට හේතුව වූයේ එම පුවත්පත ලියාපදිංචි කර ඇති ප්‍රකාශකයා තමා පුවත්පත සම්බන්ධ කටයුතු නවත්වන බවට 2010 මාර්තු මාසයේදී බලධාරීන් දැනුවත් කළ බව සොයා ගැනීමයි.

බංග්ලාදේශය, සිවිල් නීතිය යළි ස්ථාපනය කිරීමෙන් සුළු කාලයකට පසුව රහ්මාන් විසින් 2009 දී පුවත්පත මිලදී ගෙන තිබුණි. මුල් ප්‍රකාශක තමා පුවත්පත සමග පැවැත්වූ සම්බන්ධය නැවත්වීමට 2009 ඔක්තෝබර් මාසයේදී තීරණය කළ අතර 2010 මාර්තු මාසයේදී නිල වශයෙන් ඒ පිළිබඳ ප්‍රාදේශීය බලධාරීන්ට දන්වා ඇත. රහ්මාන්ට විරුද්ධව අපරාධ චෝදනා ගණනාවක් තිබූ හෙයින් ඔහු පුවත්පතේ හිමිකාරත්වය සඳහා නුසුදුසු බව ප්‍රකාශ කරමින්, අමර්දේශ් පුවත්පතේ ප්‍රකාශක ලෙස ලියාපදිංචිවීමට රහ්මාන් විසින් ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍රය, ප්‍රතික්ෂේප කර තිබුනි. මෙම සොයා ගැනීම වාර්තා කරමින් ඩකා පොලීසියේ විශේෂ කාර්යාංශය විසින් නිකුත් කළ වාර්තාවකින් පසු පුවත්පතේ ලියාපදිංචිය අත් හිටවනු ලැබීය.

අමර් දේශ් වසා දැමීම පිළිබඳ නිල වෘතාන්තයට, පාලක පක්ෂයේ පාක්ෂිකයන් හැරුණ විට තවත් කිහිපදෙනෙක් ද පක්ෂව සිටිම පුදුමයට කරුණක් නොවේ. පුවත්පත මුහුණ දුන් ආසන්නම හේතුව වශයෙන් පුළුල් ලෙස හඳුනා ගැනුනේ පුවත්පත විසින් රජයේ ජ්‍යේෂ්ඨ බලධාරීන් විසින් සිදු කළා යැයි කියවුණ අකටයුතු පිළිබඳව විවේචනාත්මක ලිපි මාලාවක් පළකිරීම බවයි.

අග්‍රාමාත්‍යවරයාගේ බලශක්ති උපදේශකවරයාගේ විශේෂ නිර්දේශ මත සිදු කර ඇති ඇමරිකානු තෙල් සමාගමක් සමඟ කළ සැක සහිත ගනුදෙනුවක් පිළිබඳව 2009 දෙසැම්බර් 17 වන දින අමර් දේශ් පුවත්පත වාර්තාවක් පළ කළේය. එම වාර්තාවට අනුව ගනුදෙනුව කිරීමේදී ඇමරිකානු ඩොලර් මිලියන පහක පමණ නීති විරෝධි අල්ලසක් ගෙවා ඇත. දින තුනකින් පසු මෙම ලිපියේ වාර්තාකරු ලෙස නම සදහන් වූ ජනමාධ්‍යවේදියාට ඩකාහි කලබලකාරී ප්‍රදේශයකදී ප්‍රහාරයක් එල්ල විය.

බංග්ලාදේශ් ජාතික පක්ෂ ( බී.එන්.පී) රජයේ 2001 - 2006 ආයෝජන සහ බලශක්ති උපදේශක මණ්ඩලයේ හිටපු සභාපති වූ රහ්මාන් අත්අඩංගුවට ගැනීමට දින පහකට පෙර පූර්වාපේක්ෂිත ඇප ලබා ගත්තේය. මෙම සහනය ලබා දීමේදි අධිකරණය මීළඟ නඩු විභාග දිනය තෙක් රහ්මාන්ට විරුද්ධව අපහාස චෝදනා ගොනු කිරීමට ඉඩ ලබා නොදෙන ලෙස පහළ අධිකරණයක්ට දැනුම් දීමක්ද කරනු ලැබීය. 2010 පෙබරවාර් 11 වන දින ඩකාහිදී රහ්මාන්ට ප්‍රහාරයක් එල්ල විය. ඔහු ප්‍රහාරයෙන් තුවාල නොලැබූ නමුත් ඔහු ගමන් කළ මෝටර් රථය බරපතල ලෙස හානියට පත් විය. වැඩි කල් යන්නට මත්තෙන්, මෙම ප්‍රහාරය මාධ්‍ය නිදහස උල්ලංඝණය කිරීමක් යැයි සලකා එයට විරෝධතාව පෙන්වීමට මහජන රැස්වීමක් සංවිධානය කරන ලදී. එනමුත් එම සිද්ධිය ජාතික පක්ෂය (බී.එන්.පී) විසින් දේශපාලන සිදු වීමක් ලෙස පෙන්නා දීමට උත්සහ කරන බවට චෝදනා කළ ප්‍රමුඛ පෙළේ ජනමාධ්‍යවේදීන් කිහිපදෙනෙක්ම ඊට සහභාගී වීමෙන් වැළකුණහ.[1]

2010 අප්‍රේල් තුන්වන දින පැවැත්වූ රැස්වීමකදී බංග්ලාදේශ් දේශප්‍රේමී පෙරමුණ සහ එහි හවුල්කාර දේශපාලන පක්ෂයක් වන ජමාත් - ඉ- ඉස්ලාමි සමඟ එකතු වූ ජනමාධ්‍යවේදීහු, මාධ්‍ය වෘත්තිකයකුට කළ "මර්දනය" විවේචනය කරමින්, ඉල්ලීම් ප්‍රකාශයක් සකස් කර ඉදිරිපත් කළහ. එම ඉල්ලීම් ඉටු කිරීමට රජයට 2010 ජූනි 15 වන දින දක්වා කාලය ලබා දෙන ලදී. පැහැදිළිවම දේශපාලන හැඟවීමකින් සමන්විත වූ මෙම ව්‍යාපාරයට අවාමි ලීගයට පක්ෂ ජනමාධ්‍යවේදීන්ගෙන් අසතුටුදායක ප්‍රතිචාර එල්ල විය. උදාහරණයක් ලෙස ඔවුන් පෙන්වා දුන්නේ කතුවරයෙක් සහ ප්‍රකාශකයෙක් ලෙස

1 බලන්න Daily Star, issue dated June 20, 2008, extracted at this writing from: www.dailystar.net/story.php?nid=42890

භූමිකාව සහ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂවලින් එකකට ඔහු දැක්වූ පක්ෂපාතීත්වය අතර පරස්පරතාවක් පෙනෙන්නට නොතිබුණි

## ගැටුම් දේශසීමා ඉක්මවා යන ලකුණු

බංග්ලාදේශයට තවමත් ඉන්දියාව සමග ද්විපාර්ශ්වික සම්බන්ධතා පිළිබඳ උග්‍ර ගැටළු ඇත. මාධ්‍යවල ක්‍රියාකාරීත්වයටද මෙම ගැටලු දැඩි ලෙස බලපායි. වඩාත්ම මෑතකදී සිදු වූ ගැටුම වූයේ මනිපුර් ප්‍රාන්තයේ තිපායිමුක්හි වේල්ලක් තැනීමට ඉන්දියාව යෝජනා කිරීම නිසාය. මෙමගින් බංග්ලාදේශයේ පහත් මට්ටමේ ගං ඉවුරු ආශ්‍රිතව උග්‍ර ගැටලුවක් ඇති විය හැකි බවට බංග්ලාදේශ විශේෂඥයෝ ඇස්තමේන්තු කළහ. මාධ්‍ය මගින් මෙම ගැටළුව සාකච්ඡාවට ලක් කෙරෙන අතර සීමාව ඉක්මවන ප්‍රකාශ කරතැයි කියන බංග්ලාදේශයේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය මාධ්‍යවල නිරන්තර ඉලක්කය බවට පත් වී ඇත. මෙමගින්ද රජයේ ආයතන සහ මාධ්‍ය අතර එකිනෙකාට ඇඟිලි දිගු කරගැනීම සහ අමනාපවීම් දක්නට ලැබේ.

මේ හැරුණු කොට දෙරට අතර දේශසීමා තීරණය කිරීමේ ගැටළු ද තවමත් විසඳුමක් නොමැතිව දිගටම පවතී. බංග්ලාදේශ භූමිය තුළ ඇති භූමි ප්‍රදේශ කිහිපයක ස්වෛරීත්වය තවමත් ඇත්තේ ඉන්දියාවටය. එහෙත් එම භූමි ප්‍රදේශ පවතින්නේ ඉන්දියාවට යාවී නොවේ. ඉන්දීය දේශ සීමාවේ ඇති බංග්ලාදේශයට ස්වෛරීත්වය හිමි ප්‍රදේශ කිහිපයකටද මෙම තත්ත්වය එක ලෙස බලපායි. දේශසීමා පැහැදිලිව වෙන් කර ගැනීම, පුරවැසියන්ගේ පක්ෂපාතීත්වය සහ දේශසීමා මුර කරුවන්ගේ බලය පවතින ප්‍රදේශ පිළිබඳ ඇති මෙම අවිනිශ්චිතතාවන් නිසා දේශසීමා ප්‍රදේශයන්හි ආතතියක් පවතින අතර නිරන්තරයෙන් අහිංසක ජීවිත නැති වීමට ද හේතු වී තිබේ. මෙම ගැටළු පිළිබඳ කෙරෙන මාධ්‍ය ආවරණ ගැටළුවේ සැබෑ හේතූන් සහ දෙපාර්ශ්වයෙන්ම ලැබිය හැකි විසඳුම් සැඟවීමටද හේතුවී ඇත.

වෙළඳාම, සංක්‍රමණ සහ දේශසීමා අතර කැරලිවලට දායකත්වය ලබා දීම වැනි ගැටළු මෙම අසල්වාසීන් දෙදෙනා අතර අන්‍යෝන්‍ය සබඳතා තවත් පළුදු කිරීමට හේතු වී ඇත. ඩකා නුවර ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය විසින් අන්තර්ජාලය ඔස්සේ වීසා අයදුම් කිරීමේ නව ක්‍රමයක් හඳුන්වාදීමත් සමග මෑත කාලයේදී දෙරට අතර සංචාරය කිරීමද වඩාත් දුෂ්කර වී ඇත. නීති විරෝධී කටයුතු සඳහා බංග්ලාදේශයට මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පාලන ඒජන්සි වාර්තාවක සඳහන් වීමද මෑත කාලයේ දී එරට මාධ්‍යවල දැඩි අවධානයට ලක් විය. එසේ නීති විරෝධී මත් ද්‍රව්‍ය සපයන ප්‍රධානම මූලාශ්‍රය ලෙස හඳුනාගෙන ඇත්තේ ඉන්දියාවයි. එහෙත් ඉන්දීය මාධ්‍යවල මෙම පුවතට එතරම් අවධානයක් හිමි වූයේ නැත. ඒ බංග්ලාදේශය ඔවුන්ගේ අසල්වැසි විශාල රටක් වුවද එය තවමත් තමන් සමග ජාත්‍යන්තර සබඳතා පවත්වන ඉහළම පෙළේ රටක්

රහ්මාන්ගේ විශ්වසනීයත්වය සාපේක්ෂ වශයෙන් නව්‍යවන අතර ඔහු , අමර් දේශ් මිලදී ගත්තේ ආයෝජන සහ බලශක්ති උපදේශක මණ්ඩලයේ සභපති ලෙස කටයුතු ලෙස කටයුතු කිරීමෙන් අනතුරුව පමණක් වීම නිසා එය තරමක් සැක සහිත මූලාරම්භයකින් යුතු බවයි.

2007 දී බංග්ලාදේශ ජාතික පක්ෂයට බලය අහිමි වීමෙන් පසු 2009 දී අවාමි ලීගය බලයට පත් වන්නට පෙර පවා රහ්මාන්ට විරුද්ධව දූෂණ චෝදනා කිහිපයක්ම ඉදිරිපත් කර තිබිණි. උදාහරණයක් ලෙස 2008 ජූනි මාසයේදී "හදිසි නීතිය" යටතේ මෙහෙයවනු ලැබූ දූෂණ මර්දන කොමිසම විසින් බංල්ලාදේශී ටකා මිලියන 100ක පමණ මුදලක් සම්බන්ධ දූෂණ චෝදනාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධට පියවර ගැනීම ආරම්භ කර තිබිණි. මෙම චෝදනාව නැගුනේ ඩකා නගරයේ නිශ්චල දේපළ සංවර්ධන ව්‍යාපෘතියකට සම්බන්ධව රහ්මාන් විසින් හිමිකාරිත්වය දැරූ සීමා සහිත ෂිනේ පුකුර් හෝල්ඩින්ස් නම් ආයතනය පිළිබඳවය.

2010 පෙබරවාරි නමවන දින ජර්මනියට යාම සඳහා රටින් පිටවීමට රහ්මාන්ට අවසර නොදෙන ලදී. ගමනෙහි අරමුණ වූයේ පිඟන් භාණ්ඩ නිෂ්පාදනය කරන ඒකකයක හිමිකරු ලෙස ඔහුට ලැබිය හැකි ව්‍යාපාරික වාසි සඳහා ව්‍යාපාරික ප්‍රදර්ශනයකට සහභාගිවීම බව අප්‍රේල් මාසය මුලදී ඔහු විසින් ගොනු කළ හානි පිළිබඳ වූ නඩුවකදී ඔහු සඳහන් කළේ ය. එසේ වුවද මෙම සිදුවීම ප්‍රාදේශීය මාධ්‍යවල ඇතැම් පිරිස් කියා සිටියේ මාධ්‍ය නිදහස උල්ලංඝණය කිරීමක් ලෙසය.

තවත් මෙවන් සිදුවීම් රාශියක් මෙන්ම, මෙම සිදුවීමද පෙන්වා දෙන්නේ තම වුවමනා පුළුල් ස්වාධීන ජනමාධ්‍ය ප්‍රජාවෙහි වුවමනා සමඟ යම් කිසි ආකාරයකින් අනකූල වන බවට පුවත්පත් හිමිකරුවන් විසින් කරනු ලබන හුදකලා ප්‍රකාශයන් වටා ඇති ව්‍යාකූලතාවයයි. ජනමාධ්‍යවේදීන් සාධාරණ සහ අපක්ෂපාතී තොරතුරු මූලාශ්‍රයක් වෙනුවට පක්ෂග්‍රාහී සටන්කරුවෙකු ලෙස නිරූපණය කෙරෙන වටපිටාවක දෙශපාලන මඩ ගසාගැනීමේ යුද්ධයකට ජනමාධ්‍යවේදීන් මැදිවීමේ නැඹුරුවක් දක්නට ලැබේ.

ලෙස ඉන්දියාව පිළිනොගන්නා නිසාය. ඉදිරියේ දී ගැටළු ඇති වෙතැයි සිතිය හැකි කරුණු ඇතුළු දේශසීමා ගැටළු පිළිබඳ වඩාත් බුද්ධිමත් මහජන සංවාදයක් ඇති කිරීම සඳහා මෙම අසමමිතික අවබෝධයන් ආමන්ත්‍රණය කිරීම මාධ්‍ය විසින් කළ යුතුය.

## ගැටුම් මූලාශ්‍ර සහ පවතින විසඳුම් : මාධ්‍යවේදීන්ගේ අවබෝධය

අයි.එෆ්.ජේ. මගින් හදිසි අවස්ථා රජය පත් වූ මුල් කාලයේ දී බංග්ලාදේශ මාධ්‍යවේදීන් අතර පවත්වන ලද මත විමසුමකින් බංග්ලාදේශයේ ගැටුම්වලට ප්‍රධානතම හේතුව "බල දේශපාලනය" බවට පැතිර පවත්නා අවබෝධය තහවුරු විය. මෙම සොයා ගැනීම් මෑත භාගයේ කරන ලද මත විමසුමකින්ද තහවුරු වී ඇත.

මත විමසුමට ප්‍රතිචාර දැක්වූ වැඩි දෙනෙකු පවසන පරිදි මාධ්‍ය ප්‍රජාව පහසුකම් සපයන්නා ලෙස ක්‍රියා කරමින් පුද්ගලයන් අතර සම්බන්ධතා ඇති කරවීම මගින් මෙම ගැටළුව අවම කර ගත හැකිය. මෙම මත විමසුමෙන් දැකගත හැකිවූ තවත් ප්‍රබල මතයක් වූයේ මාධ්‍ය මගින් සියළු ගැටුම්වල මානුෂිය පැත්ත වෙත අවධානය යොමු කර නිවැරදි සහ අපක්ෂපාතී ලෙස වාර්තා පළ කළ යුතු බවයි.

මත විමසුමට ප්‍රතිචාර දැක්වූ වැඩි දෙනෙකු සිතුවේ මාධ්‍යවේදීන්ගේ සංගම්වලට සෙසු සිවිල් සමාජ කණ්ඩායම් සමග පුළුල් සම්බන්ධතා ඇති කර ගත හැකි නම් එමගින් වැදගත් සිවිල් දේශපාලන ගැටළුවලට මැදිහත් වීමට දෙපාර්ශ්වයටම ඇති හැකියාව වැඩි වන බවයි. 1990 දී ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා කළ ව්‍යාපාරයේ දී වසර 15ක් තිස්සේ පැවති හමුදා ආණ්ඩුව පෙරළා දැමීම සඳහා මාධ්‍යවේදීන්ගේ සංගම් සහ සිවිල් සමාජ කණ්ඩායම් එක්ව ක්‍රියා කළ අන්දම බොහෝ දෙනා සිහිපත් කර තිබුණි

ජාත්‍යන්තර මට්ටමෙන් එතරම් අවධානයකට ලක් නොවූ දේශීය නඩු කිහිපයක් ද මෙම මූලධර්මය තහවුරු කිරීමට යොදා ගැනේ. නිදසුනක් ලෙස 2001 අප්‍රේල් මස එවක පාලක පක්ෂය වූ අවාමි ලීගයේ ප්‍රාදේශීය නායකයෙකු චිතගොන්හි පූර්බාකොන් නම් පුවත්පතකට ප්‍රහාරයක් එල්ල කළේය. එම සිදුවීමේ වැරදිකරුවන් නීතිය හමුවට ගෙන ඒම සඳහා විවිධ වෘත්තීය කණ්ඩායම්, ශිෂ්‍ය සංගම් සහ සිවිල් සමාජය විසින් එකමුතුව ව්‍යාපාරයක් දියත් කරන ලදී.

මාධ්‍යවේදීන්ගේ සංගම් සහ සිවිල් සමාජයේ එකමුතුවෙහි සෙසු මං සළකුණු වන්නේ තෙල්, ගෑස්, බලශක්තිය සහ වරාය රැක ගැනීම පිළිබඳ ජාතික කමිටුව විසින් දායකත්වය ලබා දුන් ව්‍යාපාරය සහ 1980 ගණන්වලදී බුල්නා සරසවියෙන් දියත් කළ ව්‍යාපාරයයි. ත්‍රස්ත ප්‍රහාර දෙකකදී මනික් සහා සහ ෂම්සුර් රහ්මන් යන මාධ්‍යවේදීන් දෙදෙනා මිය ගිය අවස්ථාවල දී ද එසේ ම පුළුල් එකමුතුවක් ඇති විය.

කෙසේ වුව ද වත්මන් දේශපාලන තත්වය මත මෙම එකමුතුව කොතරම් දුරට සැබෑ විසඳුමක් ලෙස පවතීද යන්න වෙනම ප්‍රශ්නයකි.

වත්මන් ව්‍යාපෘතිය යටතේ සිදුකළ මත විමසුමට ප්‍රතිචාර දැක්වූ වැඩි දෙනෙකු විශ්වාස කළේ කතුවරුන්, හිමිකරුවන්, සහ අනෙකුත් මාධ්‍යවේදීන් එක්ව ක්‍රියා නොකරන තාක් කල් මාධ්‍ය අයිතීන් ලබා ගත නොහැකි බවයි. රටේ ස්වාධීන බව ගැටළුකාරී තත්ත්වයක පවතින අවස්ථාවක මානව හිමිකම්, ස්වාභාවික සම්පත් කෙරෙහි ස්වෛරී අයිතීන්, ස්වාධීනත්වය ලබා ගැනීම සඳහා කළ යුද්ධයේ පරමාදර්ශ, ආගමික භේදවලින් තොර ප්‍රජාතන්ත්‍රවාදයේ හරයන් සුරැකීම සහ යුද අපරාධකරුවන්ට නිසි දඬුවම් ලබා දීම සඳහා මෙවැනි එකමුතුවක් යොදා ගත හැකිය. මෙම පුළුල් එකමුතුව සැබෑවක් බවට පත් කර ගැනීම සඳහා මාධ්‍යවේදීන් සඳහා වන වැටුප් මණ්ඩලයේ නියමයන් ක්‍රියාවට නැංවීම සහ මාධ්‍යවලට අදාළ සියළු නිෂේධාත්මක නීති ඉවත් කිරීම අවම මට්ටමේ ක්‍රියාකාරී වැඩසටහනක් ලෙස යොදා ගත හැකිය.

සැබෑ හර පද්ධතියක් ඇති ජනමාධ්‍යවේදයක් ඇති කිරීමට ඇති විශාලතම බාධාව වන්නේ දේශපාලන ධ්‍රැවීකරණයයි.

තර්ජන සහ ශාරීරික හිංසා සිදු කිරීම බංග්ලාදේශ ජනමාධ්‍යවේදීන්ට ඇති අභියෝගයක් ලෙෂ දිගටම පවතී. මාධ්‍යවේදීන්ට වඩාත්ම භයානක තත්ත්වයන් යටතේ වැඩ කිරීමට සිදුව ඇත්තේ රටේ පරිපාලන ප්‍රදේශ හයෙන් එකක් වන බුල්නාහිය. බොහෝ මාධ්‍යවේදීන් පවසන ආකාරයට මාධ්‍යවේදීන්ට සහ සාමාන්‍ය සිවිල් වැසියන්ට එරෙහි ඉලක්කගත සහ අහඹු ප්‍රචණ්ඩ ක්‍රියා ඇතුළු "ත්‍රස්තවාදය" ඇරඹුණේ බුල්නා ප්‍රදේශයෙනි. ඉස්ලාමීය කණ්ඩායම් සහ රැඩිකල් වාමාංශික කණ්ඩායම් විසින් මාධ්‍ය තුළ අනාරක්ෂිත හැඟීමක් නිර්මාණය කිරීම නිසා ඇතිවූ එම තර්ජන අද දක්වාම පවතී.

බංග්ලාදේශයේ සෑම ප්‍රදේශයකම ඊට ම ආවේණික වූ ගැටළු පවතී. කැරලිකාරබව පහළ මට්ටමේ පවතින සහ කලාතුරකින් ජනවාර්ගික ගැටුම් ඉස්මතු වන චිතගොන් ප්‍රදේශය ජනමාධ්‍යවේදීන්ට නිරන්තර හිරිහැර අත්වන ප්‍රදේශයකි. චිතගොන් කඳුකර පෙදෙසේ ජීවත් වන මාධ්‍යවේදීන්ට අත්‍යාවශ්‍ය වෘත්තීමය මෙවලම් සහ ද්‍රව්‍ය ලබා ගැනීමට නොහැකි වීම නිතරම ලැබෙන අත්දැකීමකි. ඒ මෙම ද්‍රව්‍ය පොදුවේ මිලදී ගැනීමට ඉඩ තිබුණහොත් ජනවාර්ගික කැරලිකරුවන්ගේ සටනට ඉන් උපකාරයක් වේය යන සමාවට කරුණ මත ය.

අයි.එෆ්.ජේ. ව්‍යාපෘතියේ මුල් අදියරේ දී සිදු කළ මත විමසුමට ප්‍රතිචාර දැක්වූ මාධ්‍යවේදීහු වැඩි දෙනෙකු ගැටුම් තත්ත්වයන්ට මුහුණ දී තිබුණු අය වූහ. පැහැදිලිවම ඉන් තුනෙන් දෙකක් ඊට පෙර වසරේ දී ගැටුම් තත්ත්වයන් පිළිබඳ වාර්තා 10කට වඩා ලියා තිබුණි සියයට

දෙකකටත් අඩු පිරිසක් සිය වෘත්තීමය කටයුතුවලදී කිසිදු ගැටුම් තත්ත්වයකට මුහුණ නොදුන් අය වූහ.

ගැටුම් පිළිබඳ රජයේ දෙපාර්තමේන්තු, පොලීසිය සහ හමුදා මූලයන් විසින් ලබා දෙන තොරතුරු "සීමාසහිත" යැයි 60%කට වැඩි පිරිසක් සිතූහ. මෙම මූලයන්ගෙන් ලැබුණු තොරතුරු "පක්ෂපාතී" යැයි 36%ක් සිතූහ. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 88%ක්ම ගැටුම් පිළිබඳ මාධ්‍ය ආවරණ "පක්ෂපාතී" ලෙස හැඳින්වූහ. මාධ්‍යයන්ගේ පක්ෂපාතීත්වයට හේතුව ලෙස අඩකටත් වැඩි පිරිසක් දක්වා තිබුණේ වාණිජමය කරුණුය. මාධ්‍ය ආයතන හිමිකරුවන්ගේ දේශපාලන අදහස් මීට ප්‍රධාන ලෙසම හේතුවන කරුණ බව තවත් පහෙන් එකක් අය පමණ සිතූහ.

තමන් මුහුණ දෙන ගැටළුවලට සුදුසු ආයතනික විසඳුම් සම්බන්ධයෙන්වූ ප්‍රශ්නයකට ප්‍රතිචාර දක්වමින් ඉතා මෑතක දී සිදු කළ මත විමසුමට ප්‍රතිචාර දැක්වූ බහුතරය කියා තිබුණේ ඔවුන් සතුව ප්‍රායෝගික විසඳුම් ක්‍රමවේදයක් නොමැති බවයි. තමන්ගේ සංගමයේ ප්‍රාදේශීය ශාඛාවලට, තමන්ගේම මාධ්‍ය කාර්යාලයට සහ ප්‍රාදේශීය පුවත්පත් සමාජයට පැමිණිලි ඉදිරිපත් කිරීමට තමන්ට හැකි වුවද අවධානයක් ලැබෙනුයේ ඒවායින් ඉතා සුළු ප්‍රමාණයකට බව 80%කට ආසන්න පිරිසක් පැවසූහ. මාධ්‍ය ආයතන හිමිකරුවන් විසින් පුවත් ආවරණයේ දී ප්‍රමුඛත්වය දිය යුත්තේ මොනවාටදැයි තීරණය කළ පසු එම කරුණු වෙනස් කිරීමට මාධ්‍යවේදියෙකුට කිසිදු හැකියාවක් නැති බවද එමගින් දැක ගත හැකි විය.

අධ්‍යයනයට සහභාගි වූ මාධ්‍යවේදීන් විසින් විවිධාකාර ආයතනික වෙනස්කම් යෝජනා කරන ලදී. ඒවා අතරඃ

- ගැටුම් තත්ත්වයන් යටතේ මාධ්‍යවේදීන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන සෑම අවස්ථාවක් ගැනම අවධානය යොමු කර ඒ පිළිබඳව විසඳුම් ලබා දෙන ලෙස අදාළ ආයතනවලට බලපෑම් කරන කලාපීය සහ ජාත්‍යන්තර ආයතන
- සදාචාරාත්මක පුරුදු සහ කතුවරයා විසින් කරනු ලබන තෝරා ගැනීම් අධීක්ෂණය කිරීමට සෑම මාධ්‍ය ආයතනයකටම දුක්ගන්නාරාළ (ඔම්බුඩ්ස්මන්) ආයතනයක්
- වැඩ කරන මාධ්‍යවේදීන්ගේ පැමිණිලි ගැන සොයා බැලීමට ප්‍රමාණවත් බලය සහ සම්පත් සහිත ඒකකයක් බංග්ලාදේශ පුවත්පත් මංඩලය තුළ පිහිටුවීම
- මාධ්‍යවේදී කණ්ඩායම්, මාධ්‍ය ආයතන හිමිකරුවන්ගේ සංවිධාන සහ රජය සාමාජිකත්වය දරණ මාධ්‍ය ක්ෂේත්‍රය තුළ පුළුල් දැක්මක් සහිත විශේෂ කොමිසමක් හෝ අධිකාරියක් පිහිටුවීම
- මාධ්‍ය සදාචාරය සහ සාධාරණත්වය වැනි කරුණු පිළිබඳ ප්‍රමුඛ අවධානයක් සහිත මාධ්‍යවේදීන්ගේ සංවිධාන විසින් බැරෑරුම් පුහුණු වැඩසටහන් පවත්වන ආයතනයක් පිහිටුවීම

මෙම සියළුම නිර්දේශ වලට යටින් දිවෙන අවශ්‍යතාව නම් ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක මීට වඩා කාර්යසාධක ලෙස එකිනෙකා සමඟ කටයුතු කිරීම සහ සිවිල් සමාජ ක්‍රියාකාරකම්වලට බාධා කිරීම සඳහා දිගින් දිගට ක්‍රියාත්මක වන බලවේගයක් වීමට ඔවුන්ගේ විරුද්ධවාදීකමට ඉඩ නොතැබීම බව කීමට අවශ්‍ය නැත. මේ සඳහා අවම වශයෙන් මේ දෙපාර්ශවය රටේ මෑත කාලීන ඉතිහාසය, ස්වාධීනත්වය දිනා ගැනීමට කළ යුද්ධයේ හරයන් ආදිය කුමන අයුරින් අර්ථකථනය කළත් ඒ පිළිබඳ එකඟතාවකට පැමිණිය යුතු අතර සිවිල් සමාජ ආයතන ඔවුන්ගේ ඇඟිලි ගැසීම් වලට ලක් නොකරන බවට සම්මුතියක් අවශ්‍ය වේ

# ඉන්දියාව

## ශක්තිමත් පදනම් තිබියෙදීත් පවත්නා ගැටළු

මධ්‍ය නිදහස ආරක්ෂා කිරීම සදහා ශක්තිමත් ව්‍යවස්ථාමය විධිවිධානය සහ අධිකරණ නියමයන් ඉන්දියාව සතු වේ. එනමුත්, අර්ධ මහද්වීපයක තරම් විශාල ප්‍රදේශයකින් සමන්විත රටක් වන ඉන්දියාවේ ඇතැම් ප්‍රදේශයන්හි මාධ්‍ය නිදහස පුහු උද්යෝග පාඨයක් වැනිය. එමෙන්ම ඉන්දියාවේ ඇතැම් ප්‍රදේශ වල මාධ්‍ය නිදහස, මාධ්‍ය ක්‍රියාකාරිත්වය තුළ ඇති අසීමිත වාණිජ වාදය මඟින් තර්ජනයට ලක් වී ඇත. ඉන්දියවේ විශාලත්වය හේතුවෙන් රටෙහි ඇතැම් ප්‍රදේශ වල මාධ්‍ය නිදහස පිළබද පවත්නා ගැටළු. "ජාතික" පොදු ජන මතය නිර්මාණය කරන ජාතික අග නුවර හෝ එහි සෙසු විශාල අගනගරයන්හි අනුනාද වීමට නැඹුරුවක් නැත. එනමුත් දුර බැහැර පළාත් වල සිටින වෘත්තීමය සගයන් ගේ කැපවීම සහ ධෛර්යය අභියෝගයට ලක් වූ අවස්ථාවන්හිදී ජාතික අගනුවර මූලස්ථානය කොට ගත් කණ්ඩායම් විසින් සහයෝගීතාවය පෙන්නුම් කෙරෙන ශක්තිමත් ක්‍රියාවන් පෙන්නුම් කළ අවස්ථා ඇත.

ජම්මු හා කාශ්මීර් ප්‍රාන්ත වල මසක් පුරා පැවති සිවිල් කෝලහල වලින් පසු නිදහස් ජනමාධ්‍ය වාර්තාකරණයක් සදහා ඇති ඉඩකඩ දැඩි ලෙස සෝදා පාළුවට ලක් කිරීම සම්බන්ධයෙන් විරුද්ධත්වය ප්‍රකාශ කරමින් 2010 වසරේ ජූලි මුල් භාගයේදී ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනයට (IFJ) අනුබද්ධ ආයතනයක් වන ඉන්දීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයෙහි (IJU) සාමාජිකත්වය දරන දිල්ලි ජනමාධ්‍යවේදීන්ගේ සංගමය (DUJ) විසින් ප්‍රබල ප්‍රකාශයක් නිකුත් කරන ලදී. පසුගිය ජූනි මාසය මුලදී ආරම්භ වී විශාල ප්‍රදේශයක ව්‍යාප්ත වුණු විරෝධතා හේතුවෙන් කාශ්මීර් නිම්නයේ පිහිටි නගර වලට දින කිහිපයක්ම ඇඳිරි නීතිය පනවා තිබුණි.

ජූලි මස 07 වන දින හමුදාව කැඳවීමත් සමඟ සියළු සිවිල් වැසියන්ගේ ගමනාගමනය ආවරණය වන ලෙස ඇඳිරි නීතිය දැඩි කළ අතර මාධ්‍යවේදී අවසර පත්‍රයන්ට පැවති විශේෂ සැලකිල්ල ඉවත් කරන ලද බව දැනුම් දෙන ලදී. කාශ්මීරයෙහි මාධ්‍ය වෘත්තිකයන් සියළු දෙනාම ඔවුන්ගේ නිවෙස් තුළ සිරගත වූහ. අග නුවර වන ශ්‍රී නගර්හි කැමරා ශිලිපීන් දවසේ සිදුවීම් රූගත කිරීමට උත්සහ කළ අවස්ථාවේදී ඔවුන් අඩත්තේට්ටම් වලට ලක් වූ අතර ඇතැමුන්ගේ වෘත්තීය ආම්පන්න ආරක්ෂක නිලධාරීන් විසින් බලහත්කාරයෙන් ලබා ගන්නා ලදී.

ජූලි 06 වන දින සිදුවීම්ද එවැනිම ස්වරූපයක් ගන්නා ලදී. එදින, ආරක්ෂ බලඇණි විසින් ඡායාරූප ශිල්පීන් විරෝධතා රූගත කිරීම මැඩ පැවැත්වීමට උත්සහ කළ අවස්ථා වලදී ප්‍රදේශීය, ජාතික හා ජාත්‍යන්තර මාධ්‍ය ආයතන වෙනුවෙන් සේවය කරන ඡායාරූප ශිල්පීන් අවම වශයෙන් 12 දෙනෙකු ශ්‍රී නගර්හිදී අඩත්තේට්ටම් වලට භාජනය විය. ඡායාරූප මාධ්‍යවේදීන් සහ ප්‍රවෘත්ති කැමරා ශිලපීන් පහර දීමට ලක් වූ අවස්ථාවේ, මාධ්‍ය අවධානය නොමැති නම් විරෝධතාවයන්ගේ බලය ඉක්මණින්ම හීන වනු ඇති බව ජ්‍යේෂ්ඨ පොලිස් නිලධාරීන් ප්‍රකාශ කරනු අසන්නට ලැබිණි.

ඉන්දියානු ජාතික අග නගරය මූලස්ථානය කොට ගත් තවත් වැදගත් ආයතන 2ක් වන ඉන්දියානු ජනමාධ්‍යවේදීන්ගේ සමාජ ශාලාව සහ කර්තෘ සංසදය කාශ්මීර් මාධ්‍යවේදීන් වෙනුවෙන් පැවැත් වූ සහයෝගීත්වය පෙන්වීමේ ක්‍රියාවන් වලට සම්බන්ධ විය. මෙය




මැත දී කළබලකාරී ක්‍රියා මැඩපැවැත්වීමට පණවන ලද සීමාවන් ඉවත්කරවා ගැනීමට දුෂ්කර සාකච්ඡාවන්හි නිරතවීමට ජනමාධ්‍යවේදීන්ට සිදුවිය. ( ඡායාරූප ස්තුතියඃ රයිසින් කාශ්මීර්)

අවධානයට යොමු වූ සිදුවීමක් වූ අතර කාශ්මීර්හි මාධ්‍යවේදීන් පෙන්නුම් කළ පෙර නොදුටු විරූ මට්ටමක එකමුතු කම හේතුවෙන් දිල්ලියේ වෘත්තීමය සංවිධානයන් විසින්ද සාපේක්ෂ වශයෙන් බලවත් ප්‍රතිචාරයක් පෙන්නුම් කරන ලදී. ප්‍රදේශයෙහි අර්බුද පැවති දශක දෙක තුළදී පළමු වරට විවිධ සංවිධාන 5ක් එකම වේදිකාවක් මතට ඒකරාශී වී මූලික වෘත්තීමය නිදහස ඉල්ලා සිටිමින් ඒ පිළිබඳ පොදු ස්ථාවරයක් පෙන්නුම් කිරීමට සමත් වූහ. මෙම සංවිධාන 5 වූයේ, කාශ්මීර් පුවත්පත්කරුවන්ගේ සංසදය, කාශ්මීර් පුවත්පත්කරුවන්ගේ සංගමය, කාශ්මීර් පුවත්පත් ඡායාරූප ශිල්පීන්ගේ සංගමය, කාශ්මීර් වීඩියෝ ශිල්පීන්ගේ සංගමය සහ කාශ්මීර් ජනමාධ්‍යවේදීන්ගේ කණ්ඩායම යනාදියයි. සංවිධාන කෙරෙන් පෙන්නුම් කෙරෙන මෙම අනේකතාව අතීතයේදී පැවති අසමගිය පෙන්නුම් කෙරෙන දර්ශයකි. එනමුත්, තම ශක්තිය පවතින්නේ එකමුතුකම තුළ බව ඔවුන් අළුතින් අවබෝධ කරගෙන ඇති නිසා ඔවුන්ගේ ඉදිරි ගමන ශක්තිමක් එකක් වනු ඇති බව කිව හැකිය.

මෙම එකමුතුව සැලකිය යුතු ප්‍රමාණයක ජාත්‍යන්තර සහයෝගය දිනා ගන්නා ලදී. එමෙන්ම ඉන්දියාව තුළ ඇති බලගැන්වුණු සංවිධාන සැලකිය යුතු සංවේදීතාවයකින් යුතුව ප්‍රතිචාර දැක්වූහ. මාධ්‍ය හැසිරීම සහ ආචාර ධර්ම අධීක්ෂණය කිරීමට පිහිටුවන ලද නමුත් පසුව මාධ්‍ය නිදහස සහ ජනමාධ්‍යවේදී ආරක්ෂාව පිළිබදවද සිය සැළකිල්ල යොමුකළ ඉන්දීය පුවත්පත් මංඩලය මෙම තත්ත්වය අවධානයට ගෙන විස්තරාත්මක වාර්තාවක් සපයන ලෙස කාශ්මීර් ජනමාධ්‍ය ආයතනයන්ගෙන් ඉල්ලා සිටියාය. අනතුරුව ජනමාධ්‍යවේදීන් සඳහා වෘත්තීමය වටපිටාව වැඩි දියුණු වීම ආරම්භ කළ නමුත් 2010 සැප්තැම්බර් මුලදී එය සැණෙකින් නරක අතට හැරිණි. ඒ, රාමසාන් උත්සවය නිමිත්තෙන් පෙළපාලි කරුවන් විශාල සංඛ්‍යාවක් වීදි වලට රැස්වීමත් ආරක්ෂක හමුදාකෙරෙන් ප්‍රබල ආයුධමය ප්‍රතිචාරයක් ලැබීමත් සමගය. ඉන් දින දෙකකට පසුව කාශ්මීර් නිම්නයේ ජනයාට දැකීමට සිදු වූයේ ආසන්න වශයෙන් දශක දෙකක් තුළ ප්‍රදේශයේ සිවිල් වැසියන් වැඩිම සංඛ්‍යාවක් ඝාතනය වූ අවස්ථාවයි. දුර ඈත නිව්යෝර්ක් නගරයේ ඉස්ලාම් ධර්ම ග්‍රන්තය වන කුරාණය විනාශ කර ඇති බවට ඉදිරිපත් වූ චෝදනා හේතුවෙන් ඊට විරෝධතාවය පළ කිරීම සඳහා වීදි බට විශාල ජනකාය අතරින් ඇස්තමෙන්තු කර ඇති පරිදි විරෝධතාකරුවන් 15ක් පමණ පොලිස් වෙඩි ප්‍රහාර හමුවේ එදින මරණය පත් විය.

මෑතකදී දිල්ලි ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, ඉන්දීය සාංගමික රාජ්‍යට ප්‍රබල විරෝධතා ගොනු කරන ලද අතර ඉන්දියාවේ ඊසාන දිග පිහිටි මනිපූර්හි ජනමාධ්‍යවේදීන්ට සහයෝගීතාව දැක්වීමේ විරෝධතා දක්වන කරන ලදී. ඉන්දීය කර්තෘ සංසදය ද විසින් 2010 පෙබරවාරි 17 වන දින ප්‍රාදේශීය මාධ්‍යවේදීන් මුහුණ පා ඇති ගැටළු සම්බන්ධයෙන් මනිපූර් රජය දක්වන උදාසීනත්වය පිළිබදව දැඩි විරෝධතාවයක් දක්වන ලදී. රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් වල ක්‍රියාවන් හමුවේ ජනමාධ්‍ය නිදහස ආරක්ෂා කිරීමට රාජ්‍ය නිලධාරීන් අසමත් වීම විශේෂයෙන් ගැටළු කාරී බව ඔවුහු පෙන්වා දුන්හ.

## මාධ්‍ය නිදහසට ඇති බහුවිධ පීඩනයන්

මනිපූර්හි ජනමාධ්‍යවේදීන්ගේ තත්ත්වය පිළිබද විශේෂ අවධානයක් දක්වමින් ඉන්දීය කර්තෘ සංසදය ආණ්ඩුව සහ මනිපූර්හි ජනමාධ්‍ය අතර වැඩෙමින් පවතින පරතරය අඩු කිරීම සඳහා හදිසි ක්‍රියාමාර්ග වල අවශ්‍යතාවය පෙන්වා දෙන ලදී.

2009 මැද භාගයේදී ජත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය විසින් මනිපූර්හි ජනමාධ්‍යවේදීන් සම්බන්ධ කර ගනිමින් විමර්ශනයක් කරන ලද අවස්ථාව වන විට තත්ත්වය කෙතරම් බරපතල අතර හැරී තිබුණේද යත් ප්‍රාන්තයේ අග නගයර වන ඉම්ෆාල් හි ජ්‍යෙෂ්ට කර්තෘ වරයෙකුට ආත්මාරක්ෂාව උදෙසා ගිණි අවියක් රැගෙන යාම යන විකල්පය ලෙෂ සලකා බැලීමට සිදු වී තිබිණි. ආත්මාරක්ෂාව සඳහා හෝ ආයුධ සන්නද්ධ වීමට තීරණය කිරීමේදී තමන්ට සටන් නොවදින සිවිල් වැසියෙක් ලෙස සලකනු ලැබීමේ අයිතිය සහ ලැබිය හැකි සෙසු සියළු ආරක්ෂාවන් ද අහිමි වන බව තමා දැන සිටි බව විශ්වාසයෙන් යුතුව කතා කළ එම කර්තෘවරයා කියා සිටියේය. එනමුත් ඉන්දියාවේ වඩාත්ම කලබල කාරී ප්‍රාන්තයක කර්තෘවරයෙක් වීම හේතුවෙන් මුහුන දීමට සිදු වූ ප්‍රායෝගික අසීරුතා හමුවේ තම ප්‍රතිපත්ති කැප කිරීමට ඔහු සූදානම්ව සිටියේය. 1980 දී පන්ජාබ් සටන් ඇවිලී ගිය කාලයේ සිට මේ දක්වාම කර්තෘවරුන් තම ආරක්ෂාව සඳහා සන්නද්ධ ආරක්ෂක කණ්ඩායම් ලබා ගැනීමට උත්සහ කිරීම ඉන්දියවේ නිතර දැකිය හැකි සිදුවීමකි. මනිපූර් ජනමාධ්‍යවේදීන් මෙම සිදුවීම් පිළිබඳ කතා කළද එවැනි ආරක්ෂ කණ්ඩායම් ලබාගෙන නැති වීම ඔවුන්ගේ කීර්තියට කරුණකි. මනිපූර්හි ජ්‍යෙෂ්ඨ කර්තෘවරයා කියා සිටියේ සිවිල් සමාජය තමන් සමඟ සිටින බැවින් ආයුධ සන්නද්ධ යුධකාමීකණ්ඩායම් වල තර්ජනයන්ට එරෙහිව තමන් කරන අරගලය සිවිල් සමාජය විසින් ශක්තිමත් කරනු ඇති බවටත් විශ්වාස කරන බවයි.

2010 මැයි මස මැද භාගයේ දී, සියළුම නාගා ජනාවාස ඒකාබද්ධ කරමින් ස්වායත්ත නාගාලන්තයක් වෙනුවෙන් දීර්ඝ කාලයක් තිස්සේ පවතින කැරැල්ලේ නායකයා වන තුන්ගලාලෙන් මුයිවා, මනිපූර්හි උක්රුල් දිස්ත්‍රික්කයේ පිහිටි සිය නිවසට යැමට සූදානම් විය. සියුම් ජනවාර්ගික මිශ්‍රණයකින් යුත් එම ප්‍රාන්තයේ කෝලහලයක් ඇති කිරීමට උත්සයක් ඇතැයි සැක කළ මනිපූර්හි රජය ඔහුගේ පැමිණීම තහනම් කළේය. නාගලන්ත - මනිපූර් මායිමේදී මුලිවාගේ ආධාර කරුවන් විසින් පැවැත්වූ විරෝධතාවකට වෙඩි තබන ලද අතර එහිදී දෙදෙනෙකු මරණයට පත් විය. පසුව මුයිවාගේ දේශපාලන පක්ෂය වන නාගලිම් ජාතික සමාජවාදී කවුන්සිලය මනිපූර් වෙත ඇති ප්‍රධාන සැපයුම් මාර්ගය වන නාගලන්තය අධිවේගී මාර්ග අවහිර කරන ලෙස නියෝග කළේය. මනිපූර්හි තිබූ හා අනෙකුත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය තොග ඉතා ඉක්මණින් අඩු විය. භාණ්ඩ මිල අහසට නැගෙද්දී ප්‍රාන්තයේ බලධාරීන් විසින් ආයුධ සන්නද්ධ භටයන් යොදවා ආරක්ෂිත ලොරි මඟින් භාණ්ඩ ප්‍රාන්තයට ගෙන්වා ගත හැකි විකල්ප මාර්ගයක් විවෘත කරන ලදී. කෙසේ නමුත් ඉන්දීය සංගමික ආණ්ඩුවේ සන්නද්ධ තර්ජන හේතු කොට ගෙන අර්ධ වශයෙන් මාර්ග අවහිරතාවය ඉවත් කර ගැනීමට පෙර තුන් මසක් පුරා පැවති මාර්ග අවහිරතාවය විසින් මනිපූර්හි සිවිල් ජන ජීවිතයෙහි රිද්මය පළුදු කොට තිබිණි.

සිවිල් සමාජයේ සිටින සියළුම කොටස් මෙන්ම ජනමාධ්‍යවේදීන්ද මෙම අසාමාන්‍ය ලෙස පැතිරී ගිය එදිරිවාදිකම් වලින් පීඩාවට පත් විය. මාර්ග අවහිරතාවයෙන් පසු සති කිහිපයක් තුළ මනිපූර්හි දිනපතා පුවත්පත් සතුව තිබූ කඩදාසි තොග හිඟ වීමත් සමග ජනමාධ්‍යවේදය දැඩි බලපෑමකට ලක් විය. මනිපූර් දිනපතා පුවත්පත් බොහෙමයක් ඔවුන්ගේ පිටු ගණන අඩු කළහ. ඉන්ෆාල් හි කර්තෘවරුන් බෙහොමයක් වැඩ නැවැත්වීමට කල්පනා කරමින් සිටියදී මාර්ග අවහිරතාවට ඉවත් කර ගැණිනි.

ප්‍රාදේශීය මාධ්‍ය හා පැවති සම්බන්ධතාවය ගත් විට මනිපූර්හි සිවිල් සමාජයේ ආකල්පයන්හි වෙසක් ඇති වූ බව පෙනිණි. මැයි මස මැද භාගයේදී මුලිවා පැමිණීම තහනම් කිරීම පිළිබද විරෝධත්වය ප්‍රකාශ කිරීම සඳහා මහජනයා සංවිධානය කළ ඔහුගේ ගේ මව් දිස්ත්‍රික්කය වන උක්රුල්හි සිවිල් සමාජ කණ්ඩායම් කඳු කර ප්‍රදේශ වල සිටින ගෝත්‍රික කණ්ඩායම් වල හැඟීම්වලට අසංවේදීයැයි ප්‍රධාන වශයෙන් මෙයිටි ජනවාර්ගිකයන් ජීවත් වන මනිපූර් නිම්නයේ ජනමාධ්‍යය වෙත දෝෂාරොපණයට ලක් කළහ.

මාර්ග අවහිරතාවය නිසා සිවිල් ජනයාගේ දෛනික ජීවිතය දැඩිව පීඩාවට පත් වෙද්දී මනිපූර් නිම්නයේ ජනයා විසින් අත්‍යවශ්‍ය භාණ්ඩ ප්‍රාන්තයේ ඉහල කොටසේ කඳුකර දිස්ත්‍රික්ක වෙත යාම වළක්වමින් ප්‍රති අවහිරතාවයක්ද සංවිධානය කළහ. එළෙස අවහිර වූ භාණ්ඩ අතර පුවත්පත්ද විය.

මනිපූර් නිම්නයේ ක්‍රියාකාරින්ගේ කණ්ඩායම් විසින් සිදු කළ මෙම ප්‍රති අවහිරතාවය හේතුවෙන් සිවිල් සමාජ කණ්ඩායම් සහ ජනමාධ්‍යවේදීන්ගේ කණ්ඩායම් ඉතා කෝපයට පත් විය. ප්‍රාන්තය

පුරා සම්බන්ධතා සහ අනුබද්ධ ආයතන පවත්වාගෙන ගියද ඉන්ෆාල් මූලස්ථානය කොට ගත් මනිපූර්හි සියළු වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය යම් මට්ටමක අනතර් ජනවාර්ගික සහයෝගිතාවයක් පෙන්නුම් කරමින් පුවත්පත් අත් අඩංගුවට ගැනීම දෝෂාරෝපණයට ලක් කළේය. මූලික අවබෝධය වූයේ තම පක්ෂපාතිත්වය කුමක් වුවත් අදහස් හා තොරතුරු හුවමාරුව ජනවාර්ගික හෝ ජාතිවාදී විරුද්ධකම් හේතුවෙන් ප්‍රාණ ඇපකරුවෙකු තත්ත්වට පත් නොවිය යුතුය යන්නයි. උක්රුලි දිස්ත්‍රික්කයේ ජනමාධ්‍යවේදීන්ගේ සංගමයද පුවත පත් අවහිරකිරීම සම්බන්ධයෙන් විරෝධය දැක්වීමට හවුල් විය.[1]

එනමුත් මනිපූර් නිම්නයේ පුවත්පත් නාගා ජනයාගේ නිත්‍ය ඉල්ලීම් පිළිබඳව පෙන්වූ උදාසීනත්වයට විරෝධය දැක්වීම සඳහා පුවත්පත් ප්‍රවාහණය අවහිර කිරීමට ප්‍රජාව ඒකරාශී වීම තුළින් පෙනී ගියේ ජනමාධ්‍යවේදීන්ගේ මතය සිවිල් සමාජය තුල ව්‍යාප්ත වී තිබුණේ ඉතා අඩුවෙන් බවයි. ඉන්ෆාල් ෆ්‍රී ප්‍රෙස් වාර්තා කළ ආකාරයට උක්රුල් ප්‍රදේශයේ නාගා ගෝත්‍රිකයන් මනිපූර් නිම්නයේ පුවත් පත් සිදුකළ වාර්තාකරණය පිළිබඳ සතුටට පත් නොවූහ. මෙම වටපිටාව තුළ සිවිල් උද්ඝෝෂකයන් අතර පැවති පොදු මතය ජනමාධ්‍යවේදීන් ඒ වන විට දැරූ මතයට සම්පූර්ණයෙන්ම විරුද්ධ එකක් විය.

ජනමාධ්‍යවේදීන් මුහුණදෙන තර්ජනයන්ට එරෙහිව ආරක්ෂක යාන්ත්‍රණයක් ලබා ගැනීම සඳහා මනිපූර්හි සියළු වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය (එඋනඹ) දීර්ඝ කාලයක් තිස්සේ උත්සහ දරා ඇත. ප්‍රාදේශීය මාධ්‍යවේදියෙකුද වන මාධ්‍ය විශ්ලේෂකයෙකු ප්‍රකාශ කළ ආකාරයට "බහු විධ ඉතිහාස, සංස්කෘතීන් සහ අනන්‍යතා ඇති පිරිස් පිළිගැනීමක් ලබා ගැනීම සඳහා අරගල කරන"[2] විවිධාකාර ආකෘතීන්ගෙන් යුක්ත වූ සමාජයකට ඇතුලත්ව සිටියද ජනමාධ්‍යවේදී ප්‍රජාව බොහෝ අවස්ථා වලදී අභිමතාර්ථ සම්බන්ධයෙන් විශිෂ්ට ඒකමතිකතාවයකින් යුතුව කටයුතු කිරීමට සමත් වූහ.

2008 නොවැම්බර් 20 වන දින 'එඋනඹ විසින් දින තුනකට පෙර තරුණ ජනමාධ්‍යවේදයෙකු වූ කොනසාම් රිෂිකාන්ත සිං ඝතනය කිරීමට විරෝධය දැක්වීම සඳහා ප්‍රාන්තයේ සියළුම පුවත් පත් වසා දැමීම ප්‍රකාශයට පත් කළේය. දින 6ක් ගත වෙද්දී වර්ජනය සීමා රහිතව ව්‍යාප්ත වී ගියේය. දින 11කින් පසුව, 'එඋනඹගේ ප්‍රධාන ඉල්ලීම වන රිෂිකාන්ත ඝාතනය පිළිබඳ විමර්ශන ආරම්භ කිරීමට මධ්‍යම ආණ්ඩුව මඟින් පාලනය කෙරෙන මධ්‍යම විමර්ශන කාර්යංශයට (CBI) භාර දෙන ලදී. එහෙත්, 2010 පෙබරවාරි 17 වන දින කර්තෘ සංසදය පෙන්වා දුන් පරිදි රිෂිකාන්ත ඝාතනයේ වරද කරුවන් හඳුනා ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය ඉතා මන්ද ගාමී මට්ටමක පවතී. තත්ත්වය තවදුරටත් එසේය.

පෙර අවස්ථා වලදී AMWJU විශේෂයෙන්ම අසීරු තත්ත්වයන්හිදී විරෝධය දැක්වීම සඳහා මනිපූර්හි සියළුම පුවත්පත් සම්පූර්ණයෙන් වසා දැමීම ප්‍රකාශයට පත් කළේය. යම් දැක්මකට පක්ෂව සිටීමටත් අනෙක් සියළුම අදහස් ඉවත් කොට තැබීමටත් බල කරන ප්‍රදේශයේ පවත්නා  බහුවිධ කැරලිකාරිත්වයන් විසින් මනිපූර් ජනමාධ්‍යවේදීන් තෙරපුමකට ලක් කරයි. එමෙන්ම තවත් පැහැදිළි යථාර්ථයක් වන්නේ මාධ්‍ය තුළින් හඬ නැගීමට රාජ්‍ය ආඥාවට අකීකරු වන කිසිදු කැරලිකාර කණ්ඩායමකට අයිතියක් නොමැති බව රජයේ ආරක්ෂක බලධාරීන් තරයේ ප්‍රකාශ කිරීමයි. කැරලිකාර කණ්ඩායම් හා බලධාරීන් යන දෙපාර්ශයටම හිරවීමේ හේතුවෙන් බොහෝ අවස්ථාවලදී ජනමාධ්‍යවේදීන් පිළිසරණක් නොමැති තත්ත්වයට පත් වේ.

සාධාරණ වාර්තාකරණය පිළිබඳ නියමයන් ඇතුළත් යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා 2005 ජූනි මාසයේදී මනිපූර්හි ජනමාධ්‍යවේදීහු එක්සත් වූහ. විවාද ගණනාවකින් පස මෙම ලේඛනය පිළිබඳ එකඟත්වයක් ඇති විය. මේ විවාදය තුළ මනිපූර්හි ඇති විශේෂ තත්ත්වයන් සම්බන්ධයෙන් අව්‍යජ වාර්තා කරනය පිළිබඳව අධික සැලකිල්ලක් පෙන්නුම් කෙරිණි. (කොටුව බලන්න) මාධ්‍ය විසින් තම පරස්පර ඉල්ලීම් සැපිරීමේ සිය සීමාව කුමක් ද පිළිබඳ යුධකාමී කණ්ඩායම් සහ ආරක්ෂක කාර්යංශ දැනුවත් වන ආකාරයට යෝජනාවෙහි අන්තර්ගත න්‍යායන් සහ ක්‍රියා පටිපාටීන් පුළුල්ව ප්‍රචාරය කරන ලදී. මෙම සීමාවන්ගෙන් පිටත ඇති ඉල්ලීම් ඉටු කරන මෙන් බල කිරීම හේතුවෙන් මනිපූර්හි ජනමාධ්‍ය ආයතන විසින් එක්සත් වී විශාල වශයෙන් වැඩ නැවැත්වීමක් සිදුවිය හැකි බවත් එහි සඳහන් විය. එනමුත් ආචාර ධර්ම සංග්‍රහයෙහි ප්‍රථම වසර දෙක පිළිබඳව කළ ඇගයීමක් පෙන්වා දෙන්නේ එය ජනමාධ්‍යවේදීන්ගේ ශාරීරික සුරක්ෂිත භාවය හෝ වෘත්තීමය පරිපූර්ණත්වය ආරක්ෂා කිරීම සඳහා පළදායී මෙවලමක් ලෙස ක්‍රියාත්මක වී ඇත්තේ අවම වශයෙන් බවයි. "යුධවාදීන් සතුව ජනමාධ්‍ය ව්‍යවස්ථාව සහ නීති නොබිඳ ඔවුන්ගේ මාධ්‍ය ප්‍රකාශනයන් නිකුත් කරවා ගැනීමය අවශ්‍ය උපාය මාර්ගයන් පිළිබදව මනා නිපුණත්වක් තිබුණි"[3] මනිපූර් පුදේශයෙහි දෛනික මාධ්‍ය පැවැත්ම සැළකිය යුතු අවධානමකට මුහුණ දෙයි. එමෙන්ම මාධ්‍ය භාවිතය මත යෙදෙන අනේක බාහිර තෙරපුම් මඟින් ප්‍රවෘත්ති ගලා යාම කෙළෙසයි. තවද ජනමාධ්‍යවේදීන් මුණ දෙන උපද්‍රව සම්බන්දයෙන් ගත කළ ඉන්දියාවේ වඩාත්ම බරපතල වාතාවරණය දැකිය හැක්කේ ඇසෑම් ප්‍රදේශයේය.

## ඇසෑම්- වරදට දඬුවම් නැති වාතාවරණයක්.

2009 ජූලි 29 වන දින ඇසෑම් හි විශාලතම නගරය මෙන්ම නමින් නැතත් අන් සියළු අයුරින්ම ඇසෑම්හි අග නගරය ලෙස සැලකෙන ගුවාහතීහි අධිකරණය පරාග් කුමාර්දාස් ඝතනයේ එකම චූදිතයා නිදොස් කරන ලදී. පරාග් කුමාර්දාස් ඝතනය ලක් වන විට ඔහු වැඩිස අලෙවියක් තිබූ ඇසෑම් බසින් පළ වන දිනපතා පුවත්පත වන ඇසෝමීයා ප්‍රතිදින් විධායක කර්තෘ වරයා ලෙස කටයුතු කළේය. දාස් මානව හිමිකම් ව්‍යාපාරයන්හි ක්‍රියාකාරී ලෙස කටයුතු කළ ප්‍රකට ජනමාධ්‍යවේදියෙක් මෙන්ම ප්‍රසිද්ධ බුද්ධිමතෙක් විය. එසේම ඔහු, ඉලක්කගත ඝාතන සිදු කිරීම සඳහා පාතාලයට සම්බන්ධ පිරිස් රහසේ සම්බන්ධ කරගනු ලැබූ රාජ්‍ය බලධාරීන්ගේ ආරක්ෂක උපාය මාර්ග ඍජුව විවේචනය කල පුද්ගයෙක් ද විය. ඇසෑම් අනන්‍යතාවය පිළිබඳ විශේෂිත අදහසක් වෙනුවෙන් වූ ව්‍යාපාරයක ක්‍රියාකාරී සාමාජිකයෙකු වූ දාස් ගේ අදහස වූයේ අදහස වූයේ ඇසෑම් ජාතික අනන්‍යතාවය ඉන්දීය පාලනයෙන් පිටත ස්වෛරී පැවැත්මකට හිමිකම් කියන බවයි. 1996 මැයි මාසයේදී දාස් තම පුතා පාසලෙන් කැඳවාගෙන ඒමට ගිය අවස්ථාවේදී ගුවාහතීහි කාර්ය බහුල ස්ථානයකදී ඔහුට වෙඩිතබා මරා දමන ලදී. අහඹුවකට මෙන් එම ප්‍රාන්තයේ නව ආණ්ඩුවක් වැඩ භාර ගැනීම සඳහා දියුරුම් දුන්නේද එම දිනයේමය.

ඇසෑම් ජනමාධ්‍යවේදීන්ගේ එකමුතුව සහ ඇසෑම් වැඩ කරන ජනමාධ්‍යවේදීන්ගේ එකමුතුව මඟින් නියෝජනය කරනු ලබන 'ඇසෑම්හි ජනමාධ්‍යවේදියෝ' ඝාතනයට විරුද්ධව ආවේගශීලි ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වූහ. ප්‍රාන්ත ආණ්ඩුව විසින් ඝාතන සිද්ධියේ විමර්ශන කටයුතු ප්‍රදේශීය තෙරපුම් හමුවේ නොසැලී සිටීමේ හැකියාව ඇතැයි සැලකෙන මධ්‍යම විමර්ශන කාර්යංශයට පවරා දුන් විට ජනමාධ්‍යවේදීන්ගේ ක්‍රියාමාර්ගයට වැදගත් අනුග්‍රහයක් ලැබී තිබුණ බවක් පෙනෙන්නට තිබුණි. නමුත් එකම චූදිතයා නිර්දොෂ කිරීමේ තීන්දුව ඉදිරිපත් කිරීමේදී විනිශ්චකාර වරයා විමර්ශන කාර්යශයට දෝෂාරෝපණය කිරීම සඳහා

1 මෙම සිදුවීම් පෙළ ගොනු කැරුනේ මනිපූර් ජනමාධයවේදීන් සමඟ කළ සාකච්ජා සහ ප්‍රදේශිය පුවත්පත්හි විශේසයෙන්ම සන්ගල් එක්සප්‍රෙස් සහ ඉම්පාල් ෆ්‍රී ප්‍රෙස් ඇතුළුව තත්කාලීණ වාර්තා ඇසුරෙනි. යම් වැදගත් වාර්තාකරණයන් www.e-pao.net ys we;' ksïkfha ckudOH ms,sn| lÿlr ckhdf.a wi;=g i|yd n,kak http://www.e-pao.net/GP.asp?src=14..180510.may10 and http://www.e-pao.net/GP.asp?src=14..180510.may10 . ප්‍රති අවහිරතාවය සහ පුවත්පත බෙදා හැරීම් මත බලපෑම සඳහා බලන්නඃhttp://www.e-pao.net/GP.asp?src=14..180510.may10 and http://www.e-pao.net/GP.asp?src=14..180510.may10

2 Anjulika Thingnam, "Media Under Siege, Media Functioning in an Armed Conflict situation: A Case Study of Manipur", Social Action, Volume 57, Number 4, October-December 2007, p 382.

3 Anjulika Thingnam, "Media Under Siege, Media Functioning in an Armed Conflict situation: A Case Study of Manipur", Social Action, Volume 57, Number 4, October-December 2007, p 382.

## මනිපූර් ආචාරධර්ම සංග්‍රහය - ජනමාධ්‍ය ස්වායත්තතාවය රැක ගැනීමේ ව්‍යායාමයක්

යුධකාමී කණ්ඩායම් බහුලවීමත් සමග මනිපූර්හි ජනමාධ්‍යවේදීහු 2001 ඔක්තොබර් මාසයේදී සාමූහිකව අනුගමනය කළ හැකි ආචාරධර්ම සංග්‍රහයක් සම්මත කර ගැනීමට එක්රැස් වූහ.

සංශෝධන කිහිපයක් ඇතිව මෙම සංග්‍රහය මනිපූර් සමස්ත වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය විසින් 2005 ජූනි මාසයේදී නැවත ස්ථිර කරන ලදී. එය සංකීර්ණ අරමුණින් යුතුය: විසම්මුතිය පිළිබඳ හඬට සාධාරණ ආවරණයක් සපයමින් සහ කිසිදු අවස්ථාවකදී ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා උපකාරයක් ලෙස මාධ්‍ය නිරූපණය නොවන බවට වග බලා ගනිමින් ප්‍රවෘත්ති ප්‍රචාරණ ක්‍රියාවලිය තුළ සංස්කරණ ස්වාධීනත්වය නැවත තහවුරු කර ගැනීම.

මාධ්‍යට මුහුණ දීමට සිදුවූ පළමු අභියෝගය වූයේ නීතිමය තත්ත්වයන් නොසලකා, මාධ්‍ය තුළ නියෝජනය වීමට සුජාත හිමිකමක් ඇති විසම්මුතික අදහස් හඳුනා ගැනීමයි. මාධ්‍ය විසින් ඉදිරිපත් කළ මූලික අවශ්‍යතාවයක් වූයේ සෑම ප්‍රකාශයක් හෝ විස්තරයක් සඳහාම හඳුනා ගත හැකි මූලාශ්‍රයක් පැවතීමයි. මූලාශ්‍රය හඳුනා ගැනීමෙන් පසුව සාධාරණ ආවරණයක් සඳහා ඊට කොතරම් හිමිකමක් ඇත්දැයි කර්තෘවරයා විසින් තීරණය කරනු ඇත.

එසේම, මාධ්‍ය සාකච්ඡාවක් සඳහා වන ඕනෑම ආරාධනාවකට හඳුනාගත හැකි මූලාශ්‍රයක් තිබිය යුතු අතර මාධ්‍ය නිවේදයන්හි ලිපි ශීර්ෂයක නියමිත ආකාරයේ අත්සන් සහ සංවිධානයේ නිල මුද්‍රාව තිබිය යුතුය. සියළුම ආරාධනා සහ මාධ්‍ය නිවේදන අදාල සංවිධානය විසින් බෙදා හැරිය යුතු අතර කිසිදු අවස්ථාවකදී ජනමාධ්‍යවේදීන් හෝ මාධ්‍ය සංවිධාන දේශපාලන කණ්ඩායමක් වෙනුවෙන් වගකීම දරන්නේ නැත.

සංවිධාන විසින් ඉහත දැක්වූ සියළුම කොන්දේසි සපුරමින් ප්‍රතිවාදී ප්‍රකාශයන් නිකුත් කරන අවස්ථාවලදී කර්තෘවරයා ඔහුගේ නිගමනය ක්‍රියාත්මක කරන අතර බොහෝ අවස්ථාවලදී දෙපාර්ශවයටම සමාන ඉඩක් ලබා දෙනු ඇත. කුමන හෝ ප්‍රකාශයක මනුෂ්‍ය ජීවිතවලට තර්ජනයක් අන්තර්ගත වන්නේ නම්, එම කොටස ඉවත් කිරීමේ අයිතිය කර්තෘවරයා සතු වනු ඇත.

සියළුම මාධ්‍ය සංවිධානය සහ මාධ්‍ය වෘත්තිකයින්, අවස්ථා සහ පුද්ගලයන් පිළිබඳව සංවේදනාත්මක සහ අසංවේදී අයුරකින් නිරූපණය කිරීම සම්බන්ධයෙන් ඉන්දියානු පුවත්පත් මංඩලය විසින් සකස් කළ ජනමාධ්‍යවේදීමය ආචාර ධර්ම පිළිබඳ නියමයන් අනුගමනය කරනු ඇත.

අප්‍රසන්න යැයි හැගෙන බැහැර කිරීම් සහ ප්‍රමාද දෝෂ ඇතුළුව ජනමාධ්‍යයේ ආවරණය ඉදිරිපත් කරන අන්තර්ගතය සහ එහි ස්වරය පිළිබඳ පූර්ණ වගකීම කර්තෘවරුන් විසින් දරනු ඇත.

එනමුත් ප්‍රජාවන් අතර ආතතියන් හෝ අමනාපයන් ඇති කළ හැකියැයි සුජාත සැකයක් සහ අවිනිශ්චිතබවක් යම් ප්‍රවෘත්ති වාර්තාවක ඇතුළත් වේ නම් එම කරුණු ඉවත් කිරීමට හෝ සඳහන් නොකර සිටීමට කර්තෘවරයාට අයිතියක් ඇත.

අදාල ප්‍රවෘත්ති ආයතනයේ කර්තෘවරයාට ලිපියක් එවීම හරහා නිරවුල් කර ගත හැකි සුළු පරිමාණ දුක් ගැනවිලි හැරුණු කොට සෙසු සියළුම අවස්ථා වලදී පීඩාවට පත් ඕනෑම පුද්ගලයෙක් විසින් පළමුව පැමිණිය යුතු ආයතනය වන්නේ මනිපූර් සමස්ත වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයයි. මනිපූර් සමස්ත වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය එම දුක් ගැනවිල්ල ඔවුන්ගේ පාරදෘශ්‍ය න්‍යායන් සහ උපමානයන්ට අනුව සැළකිල්ලට බඳුන් කරනවා ඇත. එලෙසම ආචාර ධර්ම සංග්‍රහය යම් කිසි ආකාරයකට උල්ලංඝණය වී ඇත් නම් සුදුසු තහංචි පැනවීමට එම ආයතනයට හැකියාව ඇත.

මනිපූර් සමස්ත වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය මුහුණ දෙන වඩාත්ම කැපී පෙනෙන අපහසුතාවය වී ඇත්තේ ආචාර ධර්ම සංග්‍රහය නැවත නැවත උල්ලංඝණය කිරීම වැළැක්වීම සඳහා තහංචි පැණවීම බව නොකිවමනාය. තවත් අසීරුතාවයක මූලාශය වන්නේ ප්‍රාන්ත රාජ්‍යයේ සහ මනිපූර්හි විශාල වශයෙන් යොදවා ඇති ආරක්ෂක බලඇණි වල අනුකම්පා විරහිත ආකල්පයයි. 2004 අගෝස්තු මාසයේදී මනිපූර් ආණ්ඩුවේ ස්වදේශ කටයුතු අමාත්‍යංශය තහනම් සංවිධානයක් හෝ එහි නිලධාරියෙක් පිළිබඳ ඕනෑම ආකාරයකින් සදහන් වන ඕනෑම මාධ්‍ය දෙයක් රාජ සන්තක කිරීමට අවසර දෙමින් අවසර දෙමින් නියෝගයක් නිකුත් කළේය.

විශේෂ උත්සයක් ගත්තේය. පරිපාටිමය ප්‍රමාද විශාල සංඛ්‍යාවක් තිබූ බවත්, කාර්යංශය විසින් සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සැලසීමට පැහැදිළිව අසමත් වී ඇති බවත් ඒ හේතුවෙන් වැදගත් සාක්ෂිකරුවන් කිහිප දෙනෙක්ම සාක්ෂි නොදී සිටීමටත් විරුද්ධ වීමටත් පෙළඹුන බවත් ඔහු පෙන්වා දුන්නේය. දාස් ගේ නම 1990 සිට ඇසෑම්හිදී ඝතනයට ලක් වූ ජනමාධ්‍යවේදීන් 20 දෙනෙකුගේ නම් වලින් සමන්විත බිහිසුනු නාමාවලියක එකක් පමණි.

ඇසෑම්හි වඩාත් ක්‍රියාකාරී කැරලිකාර කණ්ඩායම් වන්නේ ඇසෑම් එක්සත් විමුක්ති පෙරමුණ සහ බොඩෝ කණ්ඩායම් කිහිපයකි. ඔවුන්ගේ දේශපාපාලන හා භෞමික න්‍යාය පත්‍ර තියුණු ලෙස එක්නෙක හා ගැටුණද ඔවුන් යුධ අවස්ථාවක මිත්‍ර රාජ්‍ය හැසිරෙන ආකාරයට එකිනෙකා සමඟ සහයෝගයෙන් කටයුතු කරන බව පෙනෙන්නට ඇත. ඇසෑම් එක්සත් විමුක්ති පෙරමුණ විවිධ අභ්‍යන්තර ගැටළු වලට මුහුණ දී ඇත. එමෙන්ම 'ඇසෑම් එක්සත් විමුක්ති පෙරමුණ අත්හල අය' නමින් තමන්ව හඳුන්වා ගන්නා පෙරමුණ අතහැර ගිය සාමාජිකයන් පිරිසක් රජයේ කැරළි මර්දන උත්සහයන්ට ආභරණයක් වෙමින් පෙනී සිටි තිබේ. බොඩෝ කණ්ඩායම්ද බෙදී පවතී. එක් පිළක් බොඩෝ ගොත්‍රයේ භෞමික ස්වාධිපත්‍ය සුරක්ෂත කිරීම පිළබඳ එකඟත්වයකට පැමිණීම සඳහා 2003 වසරේදී ප්‍රාන්ත සහ මධ්‍යම ආණ්ඩුව සමග සටන් විරාම ගිවිසුමකට අවතීර්ණ වූහ. අනෙක් කණ්ඩායම තව දුරටත් කැරැල්ල ගෙන යන නමුත් ඔවුන්ද 2008 දෙසැම්බර් මාසයේදී නැවත කොටස් දෙකකට බෙදිණි. එක් කොටසක් මිලිටරි මෙහෙයුම් තාවකාලිකව නැවැත්වීම සඳහා පක්ෂව සිටි අතර අනෙක් කොටස ඊට එකඟ නොවීය.

ඇසෑම් හි වඩාත් මෑත කාලින ජනමාධ්‍යවේදී ඝාතන සිදුවීම් දෙක වූ 2008 නොවැම්බර් මස සිදු වූ ජග් ජීත් සයිකියා ඝාතනය සහ 2009 මාර්තු මස සිදුවූ අනිල් මෙෂුම්දාර් ඝාතනය, කැරලි කණ්ඩායම් සමඟ ඔවුන් පැවැත්වූ සැඟවුණු හෝ විවෘත සම්බන්දතාවන්ගේ ඍජු ප්‍රතිඵලයක් වන බව ප්‍රාන්ත පොලීසියේ විශ්වාසයයි. මෙම සම්බන්ධතා ප්‍රසිද්ධ වූ අතර ඒවා බොහෝ කතාබවහටද බඳුන වී තිබුණි. නමුත් පුවත්පත් කළමණාකාරිත්වය හෝ ප්‍රාදේශීය බලධාරීන් හෝ යන කිසිවෙකු ජනමාධ්‍යවේදීන් රහසිගත කණ්ඩායම් සමඟ සම්බන්ධතා පැවැත්වීම වැළැක්වීමට ගත් පියවර ඉතා අඩු මට්ටමක පැවතිණි. මෙමඟින් පෙන්නුම් කරෙන වඩාත් බරපතල ගැටළුව වන්නේ තහනම් රහසිගත කණ්ඩායම් සමඟ සම්බන්ධතාවයක ඇති කර ගැනීමට උත්සාහ කරන ව්‍යාපාරික කණ්ඩායම් සහ ප්‍රාන්ත ආණ්ඩුවේ කාර්යංශ විසින් බොහෝ අවස්ථා වලදී ජනමාධ්‍යවේදීන්ව අතරමැදියන් ලෙස යොදා ගැනීමයි. මෙම ඝාතන ද්විත්වයට හේතුව රහසිගත කණ්ඩායම්






ඍසියසන්බජ්ීසබටයි. පමරාැර සබ ඒබසචමරි. ඒචසඒක ජසඑහ සබ හදඩැපඉැර 2008ල කැා එද'බ ැසටයඑ-ඕහ කදබට'ටසඒඑසදබ *:වයදඑදි ජදමරඒිහරිීදඉයේච්එසීපදප**

සමඟ ඝාතනයට ලක් වූවන් පැවැත්වූ සමීපත්වය බව පෙන්නුම් කරන ඒකාන්ත සාක්ෂි ඉදිරිපත් වී නැත. එසේ සාක්ෂි තිබුණද ඒවා වගකිව යුතු පුද්ගලයන් අල්ලා ගැනීමේ අවශ්‍යතාවය නැති නොකරයි.

## ජීවිකා වෘත්තියේ අර්බුද සහ ආචාර ධාර්මික ප්‍රමිතීන්

මෙකී නීතිමය සහ අධිකරණමය කටයුතු විසඳුනද ජනමාධ්‍යවේදයේ පුළුල් අචාරධාර්මික ව්‍යාධියකට ඒවා මඟ පෙන්වයි. ඉන්දියාවේ නාගරික මධ්‍යස්ථාන වල සිටින ජනමාධ්‍යවේදීන් බොහෝ විට, අඩු වැටුප් හෝ කිසිදු වැටුපක් නොලබන, පත්වීම් ලිපි හෝ රැකියාමය කොන්දේසි නොමැති සහ ප්‍රවෘත්ති වාර්තා කරණයේදී  දේශීය අධිකාරීන්ගේ බලපෑම් අවම කිරීමට මාධ්‍ය හිමි කරුවන්ගෙන් සුළු හෝ සහතිකයක් නොලබන දුර බැහැර ප්‍රදේශ වල සිටින සහෝදර ජනමාධ්‍යවේදීන් මුහුණ පාන තත්ත්වයන් දකින්නේ නැත.

ප්‍රචණ්ඩත්වය ක්‍රියාකාරී ලෙස අනුමත කරනු ලබන හෝ එහි ක්‍රියාකාරීත්වය විශිෂ්ඨ්‍යත්වයට නංවන ඒවා හැර කිසියම් හෝ දේශපාලන මතයක් දැරීම ජනමාධ්‍යවේදීන්ට තහනම් කරනු ලබන කිසිදු වෘත්තීමය ආචාර ධර්ම සංග්‍රහයක් නොමැත. එනමුත්, සයිකියා සහ මොෂුම්දාර් යන දෙදෙනාම ඔවුන් කැරලිකාර කණ්ඩායම් සමඟ පැවැත් වූ සම්බන්ධයේ ස්වරූපය අනුව ආචාරධාර්මික සීමාවන් කිහිපයක්ම ඉක්මවා යන්නට ඇතැයි ඇසෑම්හි ජනමාධ්‍යවේදීහු පිළි ගනිති. මේ දෙදෙනාම කැරලිකාර කණ්ඩායම් වෙනුවෙන් මුදල් ගනුදෙනු වලට සම්බන්ධ වූවන් විය හැකි අතර ඒ හරහා ඔවුන් ඔවුන්ගේ ජනමාධ්‍යවේදී අනන්‍යතාවයද අපයෝජනයට ලක් කරගන්නට ඇත.

ජනමාධ්‍යවේදීන් සහ රහසිගත කණ්ඩායම් අතරින් තෝරා ගැනීම පිළිබඳ බැදීම් වලට අමතරව, අවශ්‍යතාවය නිසා ඇති වූ බැදීම් ද ඇත. දුගී ගෙවීම් හා දුගී වෘත්තීය වටපිටාව සහ උසස් ප්‍රමිතියක මාධ්‍ය කරණය සඳහා ඇති අවශ්‍යතාවය පිළිබඳව මාධ්‍ය කණ්ඩායම් දක්වන උදාසීනත්වය හේතුවෙන් ජනමාධ්‍යවේදීන් , ඔවුන්ට යම් මට්ටමක භෞතික ආරක්ෂාවක් සහ යහ පැවැත්මක් පිළිබඳ පොරොන්දු ලබාදෙන, විවෘත සහ සැඟවුණු දේශපාන න්‍යාය පත්‍රයන්හි හවුල්කරුවන් වීමේ ඉඩකඩක් ඇත. මෙම ගැටළුව කෙතරම් මුල් බැසගෙන ඇත්දැයි කිවහොත්, මාධ්‍යකරුවෙකුගේ අනන්‍යතාවය භෞතික යහපත වෙනුවෙන් යෙදවීම තුළ වඩා වටිනා ප්‍රතිලාභ ලැබෙන බැවින්, මෑත කාලයේදී ඇසෑම් හි වඩාත් කලබලකාරී ප්‍රදේශයන්හි සිටින ජනමාධ්‍යවේදීන් වැටුප් නොලබා තම සේවය ස්වෙච්ඡාවෙන් ලබා දී ඇතැයි දැන ගන්නට ලැබී ඇත.

ඇසෑම් එක්සත් විමුක්ති කණ්ඩායම් සහ බොඩෝ කණ්ඩායම් හැරුණු විට කැරළි ඇති කිරීමට තරම් ශක්තියක් ඇති තවත් යුද්ධකාමී කණ්ඩායම් සහ දේශාපාලන ව්‍යාපාර ගනනාවක් ඇසෑම්හි දක්නට ඇත. මේවායින් බොහොමයක් ජනවාර්ගික පදනම් මත පිහිටුවාගෙන ඇති අතර ඔවුන්ගේ පක්ෂපාතීත්වය නිරන්තරයෙන් වෙනස් වේ. බලධාරීන් හෝ කැරලිකාරී කණ්ඩායම් සමග ආරවුල් මගහරිමින් ඉතා ආරක්ෂිතව කටයුතු කිරීමට තෝරා ගන්නා ජනමාධ්‍යවේදියෙක් පවා මෙසේ නිරන්තරයෙන් මාරුවන පක්ෂපාතීත්වයන් හේතුවෙන් තර්ජනයට ලක් වේ.

මෙම ක්‍රියාකාරකම් ඉන්දියාවේ ඈත එපිට පිහිටි දේශ සීමාවන්හි සිදු වන අතර ඒවා ජාතික මාධ්‍ය හරහා මතු වී පෙනෙන විශේෂාංග නොවේ. එමෙන්ම මෙම ප්‍රදේශ වල සිට වාර්තා කිරීම යනු ආයුධ සන්නද්ධ කණ්ඩායම් වල ප්‍රසිද්ධ බිය ගැන්වීම් සහ පැත්තක් ගැනීම පිළිබඳ වූ ස්වභාවික මානව නැම්යාව සමග කරනු ලබන නිමක් නැති සටනකි. සැකකාර 'හවුල්කාරිත්වයක්' යන කැළැල තමා වෙත ලඟා කර ගැනීමෙන් තොරව කැරලිකාර කණ්ඩායම් සමග නීත්‍යනුකූල වෘත්තීමය සම්බන්ධතාවයක් පවා පැවැත්විය නොහැකි තරමට පවතින තත්ත්වය අවුල් සහගතය. බොහෝ අවස්ථාවලදී රාජ්‍ය බලධාරීන් භෞමික සහ දේශපාලන කරුණු සම්බන්ධයෙන් රහසිගත කණ්ඩායම් සමග කතිකාවන්ට ඇතුළු වී ඇත. නමුත් මෙම කණ්ඩායම් වල න්‍යාය පත්‍ර අපක්ෂපාතී සහ නිවැරදිව මාධ්‍ය තුළින් නිරූපණය කිරීම, අර්බුදය හා සම්බන්ධ පක්ෂ තුළින් පිළිබිඹු කෙරෙන අන් අයගේ හඩ යටපත් කිරීමට ඇති නැඹුරුතාවය යන පොදු ලක්ෂණය මගින් අධෛර්යමත් කෙරේ. යුධවාදී ව්‍යාපාර ඇති සැටියෙන් නිරූපණය කිරීමට උත්සහ දරන මාධ්‍යවේදීන් සත්‍ය වශයෙන්ම අවධානමට භාජනය වේ. මෙහි ප්‍රතිඵලය වන්නේ ගැටුම් නිරාකරණය සඳහා දායක වීමට මාධ්‍යයට හැකියාව ඇති එක් ක්‍රමයක් එනම්, සටන් වදින කණ්ඩායම් අතර විවෘත සාකච්ඡාවක් ආරම්භ කිරීම සඳහා ඇති අවකාශය බරපතල ලෙස හානියට පත් වීමයි.

## ජම්මු හා කාශ්මීර් - ඉඩකඩ විවිරවීම

කාශ්මීර් නිම්නයේ සටන්කාමීත්වය පැන නැගීමෙන් පසු ගතවූ දශක දෙක තුළ මාධ්‍ය සහ ප්‍රාන්ත ආණ්ඩුවේ කාර්යංශ අතර පැවති සංයුක්ත සම්බන්ධතාවය විවිධ අවධි පසු කර ඇත. 1996 මැතිවරණ ආරම්භ වීමත් සමග මාධ්‍ය ආයතනයන්ට එල්ල වුණු බහුවිධ තෙරපුම්

හමුවේ කළ හැකි එකම දෙය වූයේ වැඩ නැවැත්වීමයි. 2002 වර්ශයේ දී පැවැත්වූ මැතිවරණයේදී මාධ්‍ය ආයතන මුහුණ දුනනේ සාපේක්ෂ වශයෙන් අඩු තෙරපුමකට ය.

2008 වසරේ මැතිවරණය පැවැත්වූයේ ආගමික භාරකාර මණ්ඩලයකට ඉඩම් පවරා දීම පිළිබඳ වූ මතභේදයකින් පසුව ඇති වූ දීර්ඝ කාලයක් පුරා පැවති සහ විශාල ප්‍රදේශයක පැතිරුණු සිවිල් කෝලහල වලින් පසුවය. කාශ්මීර් නිම්නයේ විශාල විරෝධතා සමඟ ආරම්භ වූ දේශපාලන අර්බුදය ජම්මු පුදේශයේ පලිගැනීමේ අදහසින් කරන ක්‍රියා ආරම්භ වීමත් සමග ගුණාත්මක වශයෙන් වශයෙන් පරිවර්ථනයකට ලක් විය. අර්බුදය ආරම්භව දින කිහිපයක් ගත වෙත්ම කාශ්මීර් නිමනයේ වඩාත්ම ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීහු සාකච්ජා සභාවක් කැඳවා ප්‍රාන්ත බලධාරීන් ජමුමු ප්‍රදේශයේ සහ කාශ්මීර් නිම්නයේ පවත්නා ප්‍රචණ්ඩත්ඩ ක්‍රියා සහ අවනීතික බව පිළිබඳව මාධ්‍ය සහ කාශ්මීර්හි මහජනයා සමඟ පූර්ණ විනිවිද භාවයක් පවත්වා ගත යුතු යැයි සම්මත කර ගත්හ. කෙසේ වෙතත් තත්ත්වය ක්‍රමයෙන් වඩාත් දරුණු වූ අතර අගොස්තු 23 වන දින කාශ්මීර් නිම්නයට ඇඳිරිනීතිය පනවන ලදී. ජනමාධ්‍යවේදීනගේ සහ අනෙක් මාධ්‍ය වෘත්තිකයන්ගේ ගමනාගමනය සඳහා වූ දැඩි බාධා හේතුවෙන් පිට පිට දින 06 ක් ශ්‍රී නගර් හි පුවත් පත් පළ කිරීමට නොහැකි විය. ආරක්ෂක කාර්යංශ විසින් තාවකාලිකව විකාශනය නවත්වන ලෙස හෝ විනොදාශ්වාද වැඩසටහන් පමණක් ප්‍රචාරය කරන ලෙස ප්‍රාදේශීය කේබල් ප්‍රවෘත්ති නාලිකා වලටද බල කරන ලදී.

විශේෂ ආරක්ෂක රාජකාරි සඳහා යොදවනු හමුදි පිරිස් විසින් තෝරා සිදුකළ ප්‍රහාර වලින් අගෝස්තු 24 වන දින ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය වෘත්තිකයන් 15 දෙනෙක් තුවාල ලද බව වාර්තා කෙරිණි. තුවලෙ ලද ජනමාධ්‍යවේදීන් අතර සිය කාර්යාලයට යාමට උත්සහ දරමින් සිටි ඉන්දියාවේ ප්‍රධාන ප්‍රවෘත්ති ආයතන දෙකක් වන ප්‍රෙස් ට්‍රස්ට් ඔප් ඉන්ඩියා සහ යුනයිටඩ් නිව්ස් ඉන්ඩියා යන ආයතනය වල සේවය කළ ජනමාධ්‍යවේදීන් ද විය.

ශ්‍රී නගර් හි ඉංග්‍රීසි බසින් ප්‍රකාශයට පත් වන පුවත් පත් 3ක් වන ග්‍රේටර් කාශ්මීර් , එටාලාට් සහ රයිසින් කාශ්මීර් යන පුවත් පත් සිය සේවයිනට සේවයට පැමිණීමට නොහැකි වූ නිසා පුවත් පත් මුද්‍රණය කිරීමට අසමත් වීම පිළිබඳ කළණගාටුව පල කරමින් වෙබ් අඩවි නිවේදන ප්‍රදර්ශනය කළහ. මෙම කාළ පරිච්ඡේදය තුළ ප්‍රවෘත්ති වෙබ් අඩවි කඩින් කඩ හෝ යාවත්කාලීන වූයේ ඇඳිරි නීතිය හේතුවෙන් ඇතැම් සේවකයන් කාර්යාලට කොටු වී සිටි නිසා පමණි. ඒ අතර සිංගාර්හි සිදු වූ ප්‍රහාර හා ප්‍රති ප්‍රහාර වටයක් අතරතුර ජම්මු නගයේ පළ කළ ඩේලි එක්සෙල්සියර් පුවත්පතෙහි පිටපත් කාශ්මීර් නිම්නයේ පැවති විරෝධතා පිළිබඳ පුවත්පත දැක්වූ උදාසීනත්වය වාර්තාකරණය හේතුවෙන් ගිණි තබා විනාශ කරන ලදී.

ගැටුම් පැවැති ප්‍රදේශ බොහොමයකදී විරුද්ධවාදී පාර්ශවයන් ඔවුන්ගේ රුචිකත්වයට ගැලපෙන අවස්ථා වලදී හැර අන් සෑම අවස්ථාවකදී අන් අයට මත ප්‍රකාශ කිරීමට අවස්ථා අහිමි කිරීමේ නැඹුරුවක් කාශ්මීරයේදී දක්නට තිබුණි. කාශ්මීර්හි මාධ්‍ය ප්‍රජාව මුහුණ දෙන කේන්ද්‍රීය ප්‍රශ්නයක් වන්නේ මාධ්‍ය තුළින් සාමාන්‍ය ජනයාගේ හඬ අසන්නට ලැබුනේ ද, එසේත් නැත්නම් ගැටුම හා කැරළි පැවති වර්ෂ පුරා ඔවුන්ගේ හඬ යටපත් වී තිබුනේද යන්නයි. මාධ්‍ය වාර්තාකරණය දෙස බලය විට සාමාන්‍ය ජනයාගේ හඬ යම් ප්‍රමාණයකට යටපත් වි ඇති බව කාශ්මීර්හි ජනමාධ්‍යවේදීන් අතර වන පිළිගැනීමකි. ඒ අතර කාශ්මීර්හි ජනමාධ්‍යවේදීන් මුහුණ දෙන ප්‍රධාන දුෂ්කරතාවය වන්නේ එකම සිදුවීමක් පිළිබඳ ව ප්‍රාදේශීය, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් එකිනෙකට වෙනස් වූ අඛ්‍යානයන් පැවතීමය. තවද, කාශ්මීරය සම්බන්ධව දීර්ඝ කාලීන පකිස්තානු මැදිහත් වීම තුළින් හට ගන්නා අඛ්‍යානයද රටෙහි පවතින කෙළවරක් නොපෙනෙන ආකූලතාවයන්ද, එම දුෂ්කරතාවය හා බැඳී පවතී.

ඉන්දියාවේ අර්බුදකාරී ඉතිහාසයක් ඇති වෙනත් ප්‍රාන්ත බොහොමයක මෙන්ම කාශ්මීර්හිද රජය සහ ආරක්ෂක කාර්‍යාංශ ප්‍රධාන ප්‍රවෘත්ති මූලාශ්‍රවේ. බොහෝ අවස්ථා වලදී රජයේ දැක්මට අනකූලව වාර්තා කරන මෙන් මාධ්‍යවේදීන්ට බල කෙරේ. මේ නිසා ආචාර ධර්මීය මාධ්‍ය භාවිතය පිළිබඳ ගැටළුවක් පැණ නගී. මන්ද යත්, නිල මූලාශ්‍රයන්ගෙන් ලැබෙන තොරතුරු බොහෝ විට ජනමාධ්‍යවේදීන් එකතු කර ගන්නා තොරතුරු සමඟ පරස්පර වන බැවිනි.

නිල වශයෙන් ලබා දෙන අඛ්‍යානය ප්‍රකාශ කිරීමේ කළ යුතමු වුවත් මෙම ගැටුම් ප්‍රතිසන්ධානය කිරීමේදී කාශ්මීර්හි මාධ්‍ය ප්‍රජාව අභියෝගාත්මක දරදඬු භාෂාවක් යොදා ගනී. එනමුත්, ජනමාධ්‍යවේදී භාවිතය සහ ආරූඪ කිරීම් කරනු ලබන ආකාරය මඟින්, ඇතැම් පුවත් තර්ජන මඟින් හැඩගස්සවා ඇති බව පැහැදිළිව පෙනී යයි. සාකච්ජා ක්‍රියාවලිය දීර්ඝ සහ දුෂ්කර එකක් වී ඇතත්, කාශ්මීර් ගැළුව ජාත්‍යන්තර වශයෙන් මතු වී පෙනීම සහ ප්‍රින්ත රජයේ කාර්‍යාංශ පිළිබඳ මහජනයාගේ අනවරත නිරීක්ෂණය හේතුවෙන් , අවශ්‍ය පියවර ගැනීමට බලධාරීන් ට බල කෙරුනි. එසේ වෙතත්, තවමත් කෙරීගෙන යන මෙම සාකච්ජා වැඩපිළිවෙළ ජනමාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සුරක්ෂිත නොකරයි.

මෙවන් ආතතීන් ආරම්භ වන්නේ ගැටුම් වාර්තාකරණයේ මූලික වචන මාලාව භාවිත කරන ආකාරය අනුවය. එනම්, කාශ්මීර්හි තත්ත්වය සාකච්ජා කිරීම සඳහා යොදා ගන්නේ "ආරවුල" යන්න හෝ "ගැටළුව "යන්නද, කැරලිකාර කණ්ඩායම් විස්තර කිරීමට යොදා ගන්නේ "ත්‍රස්තවාදීන්"යන වචනයද "සටන්කාමීන්" යන වචනයද යන්න අනුවයි. ජම්මු සහ නව දිල්ලි වැනි දුර බැහැර මධ්‍යස්ථාන වල සිටින වෘත්තීය සගයන් වෙත යවනු ලබන තොරතුරු පොදු වශයෙන් සංස්කරණය කිරීම, සිරස්තල යෙදීම, පිටු සැකසීම කරනු ලබන්නේ මෙම ප්‍රදේශයන්හි වෘත්තීය ජනමාධ්‍යවේදීන් දින පතා මුහුණ දෙන තෙරපුම් සහ ගැටළු පිළිබඳ අවබෝධයක් නොමැති අය විසින් විය හැකිය.

සටන්කාමී කණ්ඩායම් ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය මත ඔවුන්ට අවශ්‍ය පරිදි වාරණයන් පනවති. මිලිටරි කණ්ඩායම් අපහසුතාවයට පත් කරන, විශේෂයෙන්ම පවත්නා තත්ත්වය පිළිබඳ පකිස්තානය පෙන්වන උනන්දුව ප්‍රශ්න කරන ප්‍රවෘත්ති වාර්තා දැඩිව වාරණයට ලක් කර ඇත. ඉන්දියාව හා පකිස්තානය වෙන් කරන පාලක රේඛාවෙන් එපිට ඇති රාජ්‍ය කාර්යාංශ කාශ්මීර්හි ගරු කටයුතු දේශපාලන නායකයින්ට නින්දා කරන අවස්ථාවලදී හෝ ඉන්දියාවේ මිතුරු රාජ්‍යන් වන බටහිර රටවල බලපෑමේ උපායන් යටතේ සටන්කාමී පුහුණු කඳවුරු වසා දමන අවස්ථාවලදී සටන්කාමීන්ගේ අරමුණ පිළිබඳ ව මහජන අවබෝධය යටපත් වී නැති බව පෙන්වා සිටීමට කැරෙන තෙරපුම් මඟින් කාශ්මීර්හි පුවත්පත් මධ්‍යස්ථාන පීඩනයට පත් කරනු ලැබේ. යම් පාර්ශවයක් අසතුටටට පත් කරන ආකාරයේ වාර්තාකරණය නිසා මරණය දක්වා විහුදුනු තර්ජන වලට නිතර මුහුණ දෙන ජනමාධ්‍යවේදීහු සත්‍ය ප්‍රකාශ කිරීමට වඩා ස්වයංවාරණයක් පනවා ගැනීම තෝරා ගනිති.

කාශ්මීර්හි ජනමාධ්‍යවේදීන් නිසි පරිදි අර්ථදක්වා නැති චෝදනා මත දීර්ඝ කාලීන සිර ගත කිරීම් වලටද භාජනය කර ඇත. සාමාන්‍යයෙන් මෙවන් අවස්ථා වලදී යුක්තිය සහ සාධාරණත්වය වෙනුවෙන් ජනමාධ්‍යවේදීන් දියත් කරන උද්වේගකාරී උත්සාහයන්ට ප්‍රතිවිපාක පිළිබඳ තර්ජන පැතිරවීම මඟින් බාධා එල්ල කර ඇත. දිනපතා පුවත්පතක් වන *චන්තන්නි* සේවය කරන මක් බූල් සාහිල් 2004 සැප්තැම්බර් මාසයේදී අත්අඩංගුවට ගත් අතර ඔහුට විරුද්ධව චෝදනා කිසි දිනෙක ගොනු නොවුණද ඔහු අසල්වැසි සතුරු ප්‍රාන්තයක් වෙනුවෙන් ඔත්තු සේවයේ යෙදී සිට ඇති බව ප්‍රසිද්ධ කරන ලදී, කාශ්මීර්හි ජනමාධ්‍යවේදීහු මෙම කාරණය පිළිබඳ කටයුතු කිරීම ආරම්භ කළද ප්‍රමාණවත් බලපෑමක් ඇති කිරීමට ඔවුහු අසමත් වූහ. සාහිල්ගේ ගැටළුවට යම් බලාපොරොත්තුවක් ලැබුණේ ජාතික අගනුවර මාධ්‍ය ප්‍රජාව ඔහුගේ ගැටළුව පිළිබඳ කටයුතු කිරීම ආරම්භ කිරීමෙන් පසුවයි. එමෙන්ම කාශ්මීර් ටයිම්ස් දිනපතා පුවත්පතට ලිපි සැපයූ දිල්ලිය මූලස්ථානය කොට ගත් ජනමාධ්‍යවේදියෙක් වූ ඉෂිටික්කාර් ගිලානි 2002 ජූලි මාසයේදී ඔහුගේ නිවසේදී අත්අඩංගුවට ගැණුනු අතර ඉන් තෙමසකට පසු ඉපැරණි නිල රහස් පණත යටතේ ඔහුට චෝදනා

ගොනු කරනු ලැබීය. ඔහුව චෝදනාවට බඳුන් කිරීමට යොදාගත් ඔහු සන්තකයේ තිබී හමුවූ ලිපි ලේඛණ පොදු ජන විෂය පථය තුළ තිබූ ඒවා වූ අතරම විවිධ වෙබ් අඩවි වලින් උපුටා ගත් ඒවා විය. කාශ්මීරයේ මෙන්ම නවදිල්ලියේද විවිධ ජනමාධ්‍යවේදී කණ්ඩායම් ඔහුගේ ගැටළුව පිළිබඳව කටයුතු කිරීම ආරම්භ කළ අතර නඩු නිමිත්තක් නැති බව රජය විසින් පිළිගැනීමෙන් පසුව 2003 ජනවාරි මාසයේදී ඔහුව නිදහස් කරන ලදී. කාශ්මීර්හි ජනමාධ්‍යවේදීන් දියත් කළ ව්‍යාපාර සහ පෙත්සම් ගිලානිගේ නිදහස ආරක්ෂාකිරීමට ඉතා වැදගත් විය. නමුත් ඒවාට අවශ්‍ය කළ බලය ලැබුණේ ජාතික අග නුවර මාධ්‍යවේදීන් සහ සිවිල් සමාජ සංවිධාන හවුල් වීමත් සමගය.

## කේන්ද්‍රයෙහි මාවෝවාදී කැරලි

ඉන්දියාවේ චත්තිස්ගාර්, ඔරිස්සා, අන්ද්‍ර ප්‍රදේශ , මහා රාෂ්ඨ සහ ජර්කන්ඩ් යන ප්‍රාන්ත වල කොටස් ඇතුළත් මධ්‍යම ඉන්දියානු සානුව ජනමාධ්‍යවේදය කෙරෙහි අතිශයින්ම අවධානම් සහිත තවත් ප්‍රදේශයකි. විසතරාත්මකව කියතොත්, 2009 ඔක්තෝබර් මාසයේදී මෙම ප්‍රදේශයේ ප්‍රධාන කැරලි මර්දන මෙහෙයුම් ආරම්භ වීමත් සමඟ පොලීසිය විසින් ජනමාධ්‍යවේදීන් තිදෙනෙකු වෙත ඔවුන් පළකළ හෝ විකාශය කළ වාර්තාවන්හි මූලාශ්‍ර හෙළ කරන ලෙස නියෝග කරමින් නිවේදන ඉදිරිපත් කරනු ලැබීය. විශාල වශයෙන් බෙදා හැරෙන හින්දිභාෂා මාධ්‍ය දිනපතා පුවත්පත් වෙනුවෙන් සේවය කළ ජනමාධ්‍යවේදීන් තිදෙනෙකුගෙන් ඉල්ලා සිටිනු ලැබූයේ ප්‍රාන්තයෙහි දකුණුදිග වු දුෂ්තර ප්‍රදේශක කැරලි මර්දන මෙහෙයුම් අතර තුරදී අහිංසක ගැමියන් මරණයට පත් වූ බව සදහන් කළ වාර්තාවක් සදහා ඔවුන් අදාළ කර ගත් මූලාශ්‍ර හෙළ කරන ලෙසයි. තවත් සිදුවීමකදී ප්‍රදේශීය දේශපාලඥයෙකු ඝාතන සිද්ධියක වගකීම මාවෝවාදීන් පිළි ගන්නා බවට කළ ප්‍රකාශයක් විකාශය කිරීම හේතුවෙන් කාන්කර් දිස්ත්‍රික්කයේ ප්‍රාන්ත පොලීසිය හමුවේ ඉදිරිපත් වන ලෙස රූපවාහිනී ප්‍රවෘත්ති නාලිකාවක වාර්තාකරුවෙකු හට නියෝග කරනු ලැබූයේය. කැරලි මර්දන මෙහෙයුම් පිළිබඳ වාර්තා කිරීම සදහා අන්ද්‍ර ප්‍රදේශ් ප්‍රාන්තයේ අසල්වැසි දිස්ත්‍රික්ක වලින් චට්ටිස්ගාර් ප්‍රාන්තයට පැමිණෙන මාධ්‍යවේදීන්ට වෙඩි තැබීම ඇතුළු ප්‍රහාරක ක්‍රියාවන්ට ප්‍රාන්තයේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙක් අවසර දී තිබුණු බවද වාර්තා වී තිබිණි.

චත්තිස්ගාර් වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය (CSPS) ඔක්තෝබර් 12 වන දින තර්ජන පිළිබඳව සාක්ච්ඡා කිරීම සදහා රැස්වීමක් කැදෙව්වේය. එහිදී තියුණුවන ගැටුම් කාරී තත්ත්වය තුළ මාධ්‍ය නිදහස පිළිබද ගැටළුව පිළිබඳව මහජනයා දැනුවත් කිරීම සදහා ඉතා විශාල ව්‍යාපාරයක් ආරම්භ කළ යුතු බව තීරණය විය.

බොහෝ අවස්ථා වලදී මාවෝවාදී කැරලි පවතින ප්‍රදේශයන්හි ජනමාධ්‍යවේදීන් ප්‍රන්ත බලධාරීන් විසින් ඇති කර තිබෙන අසහනකාරී වාතාවරණය යොදා ගනිමින් ගැති ගන්වා නිහඬ කරනු ලැබේ. චත්තිස්ගාර් බස්ටාර් කළාපයේ පිහිටි ප්‍රධාන නගරය වන ජග්ඩල් පූර් හි ජනමාධ්‍යවේදියෙකුට අනුව ජනමාධ්‍ය පැවැත්ම "පවතින තත්ත්වයන් හේතුවෙන් පීඩනයට පත්ව ඇත".

2009 සැප්තැම්බර් හිදී චත්තිස්ගාර් හි දකුණු දිග වූ ගචන්පල්ලි ග්‍රාමයේදී ආරක්ෂක කාර්යාංශ විසින් "ප්‍රධාන ආකරෂක මෙහෙයුම" යැයි හදුන්වන මෙහෙයුමක් දියත් කරනු ලැබීය. එහිදී මාවෝවාදී සටන් කාමීන් 30ක් හා ආරක්ෂක නිලධාරීන් 6 දෙනෙකු මරණයට පත් වූ බව වාර්තා විය. කිහිප දිනකට පසු එනම්, 2009 ඔක්තෝබර් 1 වන දින චත්තිස්ගාර් ප්‍රාන්තයේ දන්තේවද දිසුත්‍රික්කයේ පිහිටි ගොම්පාද් ග්‍රාමයේදී දියත් කෙරුණු මෙහෙයුමකින් මාවෝවාදී සටන් කාමීන් 12ක් මරණයට පත් වූ බව වාර්තා විය.

2010 ජනවාරියේදී ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉහත කී දෙවන සිදුවීමේදී පාදයට බරපතල ලෙස තුවාල ලබා සිටි ඇසින් දුටු සාක්ෂිකාරිනියක් දිල්ලියෙහි වෛද්‍ය ආයතනයක් වෙත මාරු කර යවන ලෙසට නියෝග කරන ලදී. ඇය ප්‍රාන්ත අගනුවර වන රයිපූර් හරහා මාරුකර යවන අවස්ථාවේදී ඇයව හමුවීමට උත්සහ දැරූ ජනමාධ්‍යවේදීන්ට ඇය වෙත ළඟා වීම තහනම් කෙරුණි. එම අවස්ථාවේදී ජනමාධ්‍යවේදීන්ගෙන් පැමිණිළි ඉදිරිපත් වූ බවත් ඒ උඩ ප්‍රාද්ශීය පොලිස් අධිකාරීවරයා සමඟ විමර්ශනයක් ආරම්භ කළ බවත් චත්තිස්ගාර් හි කැරලි වලින් බලපෑමට ලක් වී ඇති ප්‍රදේශයන්හි ඉහළම පොලිස් නිලධාරියා වූ බස්ටාර් සදහා වූ පොලිස්පතිවරයා පිළිගත්තේය. ජනමාධ්‍යවේදීනට සාක්ෂිකාරිය වෙත ළගා වීමට ඉඩ නොදීමට හේතු වශයෙන් ඔහු ගෙන හැර පෑවේ ඇයට ප්‍රතිකාර කරන වෛද්‍යවරයාගෙන් ලැබුණු අවවාද වලට අනුව එසේ සිදු කළ බවයි.

ජනවාරි 17 වන දින මෙම සාක්ෂිකාරියගේ සහ වෙනත් සාක්ෂි කරුවන් දෙදෙනෙකුගේ ගමනාගමනය පාලනය කිරීම සදහා පොලීසිය දරන උත්සාහය පිළිබද වාර්තා කළ වාර්තා කළ ප්‍රථම ප්‍රධාන ජාතික පුවත්පත බවට *ද හින්දු* පුවත්පත පත්විය[4]. මෙම ප්‍රවෘත්ති වාර්තාවේ, චත්තිස්ගාර් පොලීසිය මෙම සිදුවීම සිදුවූ ස්ථානය තුළට සහ ඉන් පිටතට සිදු වන සියළුම ගමන්කිරීම් පාලනය කිරීමට දරන උත්සාහ පිළිබදව තව දුරටත් වාර්තා විය. පුවත්පතෙහි ජනවාරි 15 වන දින වාර්තා වූ ආකාරයට අවිගත් පොලිස් නිලධාරීන් පිරිස් දන්තේවද නගරයේ සිට ගොම්පාද් ප්‍රදේශයට ආසන්නම මුලස්ථානය පිහිටි කොන්තා ප්‍රදේශය දක්වා අධිවේගී මාර්ගය දිගට පෙළ ගැසී වාහන නවත්වමින් මගීන්ගෙන් ප්‍රශ්න කරමින් සිටියහ. පිළිවෙළින් *නායි දුනියා* සහ *නව් භාරත්* මාධ්‍ය වෙනුවෙන් සේවය කළ අනිල් මිශ්රා සහ යශ්වන්ත් යාදව් යන දන්තේවද මූලස්ථානය කොට ගත් ජනමාධ්‍යවේදීන් දෙදෙනා සමග ගමන් කරමින් සිටි *ද හින්දු* පුවත්පතේ වාර්තාකරුව මාර්ගය පුරාම නැවත නැවත රඳවා තබා ගැනුණ අතර 'නැක්සල් මර්දන මෙහෙයුමක් ආරම්භ වී ඇති බැවින් ගොම්පාද් ග්‍රාමය තහන්ම් කලාපයක් ලෙස සලකන බව' ඔවුන්ට දන්වා සිටින ලදී.

මිශ්රා සහ යාදව්, දන්තේවද දිස්ත්‍රික්කයේ චත්තිස්ගාර් වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ ක්‍රියාකාරී සමාජිකයන් වේ. මෙම සිදුවීම පිළිබද ඔවුන්ගේ විස්තරයේ දැක්වෙන්නේ ගොම්පාද් සිදුවීම සහ ඉන් පසුඇති වූ තත්ත්වය පසුපස ලුහුබැද යාමට ප්‍රාදේශීය මාධ්‍යයට නොහැකි වූයේ බාධාකිරීම් හේතුවෙන් බවයි. පළමුව ඔවුන්ට සිදුවීම වූ ස්ථානයට මෙන්ම විශ්වාස කටයුතු ආරංචි මාර්ග සදහාද ප්‍රවේශය අහිමි කිරීම සදහා සක්‍රීය උත්සහයක් පැවැතිණි. දෙවැනිව 2009 ජූලි මාසයේදී මාවෝවාදී කැරලි පැවත් ප්‍රදේශයන්හි විශාල ආරක්ෂක මෙහෙයුමක් දියත් කිරීමේ යටතේ විවේචනාත්මක වාර්තාකරණයට බාධා කෙරෙන වාතාවරණයක් නිර්මාණය වී තිබුණි. අවසන් වශයෙන් ආයුධ සන්නද්ධ ගැටුම් අධිකවීම නිසා ඉන්දියාවේ ආරක්ෂාව පිළබද ප්‍රධාන අභ්‍යන්තර අභියෝගය වන්නේ මාවෝවාදය බවට නැවත නැවත කැරුණු අනතුරු හැගවීම් කෙරෙහි මහජන නැඹුරුතාවය වර්ධනය වීමයි.

ගොම්පාද් සිදුවීමේ සන්ධර්භය තුළ, සාපේක්ෂ වශයෙන් කුඩා සහ ආර්ථික වශයෙන් එතරම් ශක්තිමත් බවක් නොඋසුලන ප්‍රාදේශීය මාධ්‍යයට දැරිය නොහැකි විය හැකි ආකාරයේ අවධානමක් ගැනීමට දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියන සහ සංස්කරණ කිහිපයක් නිකුත් කරන ජාතික පුවත් පතක් වූ *ද හින්දු* පුවත් පතට හැකි විය. 2009 ජූලි මාසයේදී කැරලි මර්දන මෙහෙයුම්හ් උත්සන්න අවධියක් ආරම්භ විමත් සමගම ප්‍රාදේශීය ජනමාධ්‍යයන්ට මුහුණ දීමට සිදු වූ තත්ත්වය උග්‍ර ලෙස වෙනස් විය. එනමුත්, 2009 ජනවාරි මාසයේදී චත්තිස්ගාර්හි දකුණු දිග වූ සිංගාවරම් ග්‍රාමයෙහි දියත් කළ ආරක්ෂක මෙහෙයුමකදී ගොම්පාද් සිදුවීමේ දී මෙන් ක්‍රියාකාරී සටන් කාමීන් වෙනුවට අහිංක ගෝත්‍රික ගැමියන් ඉලක්ක වූ විට ප්‍රදේශීය මාධ්‍ය, එම කරුණ ලිඛිත පෙත්සමක් හරහා ඉහල උසාවියට ගෙන යාම සදහා සිවිල සමාජ සංවිධාන ධෛර්යමත් කරමින් ප්‍රාන්ත ආණ්ඩුවෙන් වගවියයුතුභාවය ඉල්ලා සිටිමින්, ගවේශණාත්මක ප්‍රවෘත්ති වාර්තා සමග ඉදිරියට පැමිණියේය. මෙම සිදුවීම් දෙක සසඳා බැලීමේ දී පැහැදිළිව පෙනෙන්නේ මාවෝවාදී කැරලි පවතින ප්‍රදේශ වල මාධ්‍ය, 2009 ජූලි

4 බලන්න ද හිනිදු වෙබ් අඩවියේ ඇති : http://www.thehindu.com/2010/01/17/stories/2010011761241000.htm



මහාරාශ්ඨ්‍ර ප්‍රාන්තයේ පාලක සභාගයට වරක් නායකත්වය දුන් පක්ෂයක් විවේචනය කැරෙන සාකච්ඡාවක් විකාශණය වූ සෑම අවස්ථාවකම දාමරික ප්‍රහාර තර්ජන ඇතිවන බව ලොකමටු අයිබීඑන් රූපවාහිනිය සොයා ගත්තේය. (ඡායාරූප ස්තුතියඃ දීපක් සල්වි)

මාසයේ සිට පොදු ජනයා අතර ඉහළ නැගි අනාරක්ෂිත හැඟීමෙන් පසුබෑමට පත් නොවී ඔවුන්ගේ ජවය නැවත් සොයා ගත යුතු බවයි.

## ආරක්ෂක නීති අනාරක්ෂිතබව උපදවයි

ගැටුම් පවතින ප්‍රදේශයන්හි බලපවත්නා විශේෂ ආරක්ෂක නීති අතර කාශ්මීරයේ ඇති මහජන ආරක්ෂාව පිළිබඳ පනත, ඉන්දියාවේ ඊසාන දිග හා කාශ්මීරයේ ඇති ආයුධ සන්නද්ධ හමුදාවන්ගේ විශේෂ බලතල පනත සහ චත්තිස්ගාර් විශේෂ මහජන ආරක්ෂාව පිළිබඳ පනත වේ. "නීති විරෝධි ක්‍රියා" නමින් අර්ථ දැක්වුණු ක්‍රියාවන් පිළිබඳ සැක මතු වන අවසථාවන්හිදී සාපේක්ෂ වශයෙන් වරදට දඬුවම් නොලැබෙන ආකාරයකින් කටයුතු කිරීම සඳහා ආරක්ෂක කාර්යංශ බල ගැන්වීම සඳහා මෙම පනත්හි ඇතැම් පොදු ලක්ෂණ ඇත. "නීති විරෝධි ක්‍රියා" යන්නෙහි අර්ථ දැක්වීම පමණට වඩා පුළුල් වන අතර එවන් ක්‍රියා පිළිබඳ වාර්තා කිරීම සම්බන්ධයෙන් කියතොත්, සටන්කාමී ක්‍රියා පිළිබඳ දත්තමය වාර්තා ඉදිරිපත් කිරීම පවා තහනම් සංවිධානයකට "උපකාර කිරීම හා අනුබල දීම" යන චෝදනාවන්ට ලක්වීමට හේතුවක් විය හැකිය.

මාවෝවාදී කැරලි පවත්නා ප්‍රදේශ වල පවතින පාලනය පිළිබඳ පොදු ගැටළු වාර්තා කිරීමේදී තමන් තර්ජනයන්ට ලක්වනු ඇතැයි ජනමාධ්‍යවේදීහු සිතති. ඉන්දීය අගමැති සහ ස්වදේශ කටයුතු අමාත්‍යවරයා වැනි ජ්‍යෙෂ්ඨ නිලධාරින් විසින් ද පිළි ගන්නා පරිදි දැන් පොදු නිල අදහස වන්නේ මාවෝවාදී කැරලි ඇති ප්‍රදේශයන්හි පාලන ආයතන බරලතල ලෙස නොසැලකිළි මත් වී ඇති බවත් එම ප්‍රදේශයන්හි පවතින ප්‍රචණ්ඩත්වය, ආරක්ෂාව සහ සුභසාධන ප්‍රතිලාභ මහජනයාට ලබා දීමට එම රාජ්‍ය කාර්යාංශ දීර්ඝ කාලයක් පුරා අසමත් වීමේ ප්‍රතිඵලයක් බවත්ය. මේ හේතුවෙන් කළහකාරී ප්‍රදේශයන්හි ස්ථාන ගත කරන නිලධාරීන් පිළිබඳ මහජන නිරීක්ෂණය ඉතා ඉහල මට්ටමකට ලගා වී ඇත. එවන් ප්‍රදේශයක සේවය කිරිම ඔවුන් අපහසුතාවයක් ලෙස සලකන අතර විවේචනාත්මක වාර්තාකරුවන් මාවෝවාදීන් හට අනුකම්පාව දක්වන්නන් යැයි චෝදනා එල්ල කිරීම ඇතුළු හැකි සෑම ක්‍රමයක්ම යොදා ගනිමින් එම අපහසුතාවය මග හැරීමට ඔවුහු උත්සහ කරති.

ජනමාධ්‍යවේදීහු සම්ප්‍රදායික අර්ථයෙන් ගැටුම්වලට ගොදුරු වී ඇතැයි නොසැලකෙන ප්‍රදේශවලදීද අභියෝගයන්ට මුහුණ දෙති.

උදාහරණයක් ලෙස උතුරෙහි පිහිටි උත්තර් ප්‍රදේශ් ප්‍රාන්තයේ ලාක්හිම්පූර් කේරි දිස්ත්‍රික්කයේ හින්දු භාෂා මාධ්‍යයෙන් මුද්‍රණය කර බෙදා හැරෙන අපර් *උජාලා* නම් දිනපතා පුවත්පත වෙත ලිපි සැපයූ නිලූ නමින් හඳුන්වන සමියුද්දීන් ගේ සිද්ධිය දැක්විය හැකිය. 2004 වසරේ සිට ප්‍රාදේශීය පොලීසිය විසින් කරනු ලැබූ තර්ජනයන්ට ලක් වූ ඔහු 2005 මැයි මාසයේ දී සිය කාර්යාලයේ සිට නිවස බලා යන අතරතුරේදී විශේෂ පොලිස් කණ්ඩායමක් යැයි විශ්වාස කරනු ලැබූ පුද්ගලයන් කණ්ඩායමක් විසින් බලහත්කාරයෙන් රැගෙන යන ලදී.

සමියුද්දීන්ගේ කරදර ආරම්භ වූයේ ඔහු ප්‍රාදේශීය පොලීසිය විසින් සිදු කළ අත්තනෝමතික ක්‍රියාවන් සහ අහිංසක ජනයාට කළ හිරිහැර පිළිබඳව වාර්තා මාලාවක් ගොනු කිරීමෙන් අනතුරුව බව විශ්වාස කෙරේ. ඔහුගේ ජීවිතයට තර්ජනයක් ඇතැයි සැක කරමින් ඔහු මානව හිමිකම් කොමිමෙහි පැමිණිල්ලක් ලේඛන ගත කර තැබීමෙන් ඔහු ගත් ආරක්ෂක පියවරවල් නොවන්නට 2006 මැයි මාසයේදී ඔහුව පැහැරගෙන යාම මරණයෙන් කෙළවර වීමට ඉඩ කඩ තිබූ බව පසුව ඉන්දියානු ජාතික මානව හිමිකම් කොමිසම මගින් කෙරුණු විමර්ශන තුළින් පෙන්වා දෙන ලදී. එම සිදුවීම පිළිබඳව ජාතික මානව හිමිකම් කොමිසමේ අවධානය යොමු වී ඇති බව දැන ගනනට ලැබුණු පසු සමියුද්දීන් පැහැර ගනු ලැබූ පුද්ගලයන් ඔහුව නිදහස් කළ වබව වාර්තා වේ.

ඉන් වසර 5ක් ගත වීමට ආසන්න වත්ම මෙම සිදුවීම තමා සතු වාර්තා කිරීමේ සහ තොරතුරු ලබා දීමේ අයිතිය ක්‍රියාවෙහි යොදවන ජනමාධ්‍යවේදියෙකුට සිදු වූ 'අති විශේෂ' එකක් බව නිශ්චය කරමින් ජාතික මානව හිමිකම් කොමිසම මේ සිදුවීම පිළිබඳ තීරණයක් ප්‍රකාශ කළේය. කොමිසම විසින් සමියුද්දීන්ට ඉන්දීය රුපියල් 500,000ක වන්දි ගෙවන ලෙසත්, සති 6ක් තුළ අදාල වාර්තාවක් ගොනු කරන ලෙසත් උත්තර් ප්‍රදේශ් ප්‍රාන්ත බලධාරීන්ට නියෝග කෙරුණි.

තවත් වැදගත් පියවරක් තබමින් සමියුද්දීන්ගේ පැමිණිල්ල විභාග යට ගත් ඉන්දීය පුවත්පත් මංඩලය (PCI) ඉදිරි වසර 5 ඇතුළත ඔහුගේ ආරක්ෂාව පිළිබද ව අර්ධ වාර්ෂික වාර්තා සපයන මෙන් ප්‍රාන්ත බලධාරීන්ට නියෝග කලේ ය. ඔවුන්ටම විශේෂ වූ ක්‍රියාවලීන් තුළින් මෙම සිදුවීම විමර්ශනයට ලක් කළ ඉන්දීය පුවත්පත් මංඩලය සමියුද්දීන්ගේ සිද්ධිය විස්තර කළේ "දැඩි අවධානයක් යෙදවිය යුතු දුර්ලභ සිදුවීමක්" ලෙසයි.

මෙම සිදුවීම සහ තවත් විවිධ සිදුවීම් සලකා බලන විට පෙනී යන්නේ මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම සඳහා ජාතික මානව හිමිකම් කොමිසමේ සහ ඉන්දීය පුවත්පත් මංඩලයේ කාර්ය භාරය ඉදිරියට පැමිණ ඇති බවයි. කොසේ වෙතත්, මෙම ඒකකයන්ට අධිරණ බලය පැවැරීම පිළිබද ස්ථාවර ප්‍රමිතීන් තිබී නොමැත. එමෙන්ම, කරුණු සෙවීම සහ තීරණ ලබා දීම සඳහා ඔවුන් අනුගමනය කරන දීර්ඝ ක්‍රියා පටිපාටි හේතුවෙන් හදිසි අවස්ථාවකදී ඔවුන්ගේ උපයෝගීතාවය අඩු වැදගත් කමක් ගනී.

සන්නද්ධ කැරලි කණ්ඩායම් වලින් ජනමාධ්‍යවේදීන්ට එල්ල වන තර්ජන භයානක ලෙස ඉහල යාම පිළිබඳ සැල වීමෙන් පසුව 2007 වසරේදී ඉන්දීය පුවත්පත් මංඩලය විසින් ඇසෑම් සහ වෙනත් ඊසාන දිග ප්‍රාන්ත වල මාධ්‍ය නිදහසෙහි තත්ත්වය පිළිබද සොයා බැලීම සඳහා වූ කණ්ඩායමක් පත් කරනු ලැබීය. මෙම විමර්ශනයෙහි සොයා ගැනීම්, සවිස්තර නිර්දේශ ලැයිස්තුවක් සමග 2007 -2008 ඉන්දීය පුවත්පත්

මංඩලයේ වාර්ෂික වාර්තාවට ඇතුළත් කරන ලදී.[5]

ඉන්දියාව පුරා සිටින ජනමාධ්‍යවේදීන් විසින් ඉන්දීය පුවත්පත් මංඩලය සහ ජාතික මානව හිමිකම් කොමිසයමේ බලතල තම අයිතීන් ආරක්ෂා කර ගැනීම සඳහා යොදා ගෙන ඇත. ඇතැම් ප්‍රදේශ වල ප්‍රාන්ත මානව හිමිකම් ආයතන ද මාධ්‍ය නිදහස පිළිබද ගැටළු සඳහා විනිශ්චකරුවන් ලෙස කටයුතු කිරීමට හැකියාවක් ඇති ඒකක වේ.

## ත්‍රස්ත ප්‍රහාර සහ මාධ්‍ය

2010 පෙබරවාරි 13 වන දින ඉන්දියාවේ වෙළඳ අග නගරය යන මුම්බායි නගරයෙන් කිලෝ මීටර් 220 ක් දුරින් පිහිටි පූනේ හි ජනප්‍රිය අවන්හලකදී බෝම්බ පිපිරීමක් සිදු විය. ඒ වන විට ඉන්දියාව සහ පකිස්තානය සිය ගැටුම් සහිත අන්‍යෝන්‍ය ඉතිහාසයේ අවම වශයෙන් ඇතැම් ගැටළු හෝ නිරවුල් කර ගැනීම සඳහා නව්‍යකරණයවූ කතිකාවතක් ආරම්භ කිරීමට සියළුම දේ සූදානම් කර තිබුණි. පූනේ බෝම්බ පිපිරීම භේදව සිටි අසල්වැසි රාජ්‍යදෙක අතර සමාදාන වීමේ අපේක්ෂාව බිඳ හෙළීමට ගත් ප්‍රයෝගික උත්සහයක් ලෙස අර්ථ දැක්වීමට ප්‍රධානධාරවේ ජනමාධ්‍ය විස්තරකතන බොහොමයක් නැඹුරු විය.

මෙම බෝම්බ පිරීමෙන් තුවාල ලත් පුද්ගලයන් සිටි රෝහල් පර්ශ්‍රයන්ට ලගා වීමට උත්සහ කළ මාධ්‍ය වාර්තාකරුවන්ව අවහිර කරනු ලැබූ අතර ඔවුන්ට කියා සිටියේ ඒ වන විටත් කම්පන තත්ත්ව යටතේ සිටි පුද්ගලයන් බැලීමට ජනමාධ්‍යවේදීන්ට අවසර නොතිබූ බවයි. පසු දින පුවත් පත් සාකච්ඡාවක් පැවැත්වූ පූනේහි පොලිස් කොමසාරිස්වරයා ඔහු එතෙක් ලබා දී තිබුණු ප්‍රතිචාර සියල්ල සාරාංශ ගත කළේය. එහිදී ඔහු තම පොලිස් කණ්ඩායමෙහි ක්‍රියාකාරිත්වය පිළිබදව නැගුණු සියළු ප්‍රශ්න සූක්ෂම ලෙස මග හැරි ඔහු බෝම්බ සිදුධියේ ඇසින් දුටු සාක්ෂිකරුවන් වෙත ලගා වීමට මාධ්‍යයට හිමිකම නිශ්චිතවම නිශ්ප්‍රභ කළේය. පූනේහි ඉහල පොලිස් නිලධාරියෙක් සඳහන් කළේ සාක්ෂි කරුවන් වෙත ලගා වීමට ඉඩ දීම තුළින් විමර්ශන කටයුතු අවධානමට ලක් වීමට හැකියාවක් තිබූ නිසා හිතා මතාම මාධ්‍ය දුරස් කොට තබන ලද බවයි. කෙසේ වෙතත් විපතට පත් වූවන්ට සහන ලබා දිය හැකි ප්‍රධාන නියෝජිතයන් දේශපාලඥයන්වූ බැවින් , ඔවුන් සාක්ෂිකරුවන් වෙත ලගා වීම තහනම් කළ නොහැකි විය.

අපරාධ කරුවන් හදුනාගැනීම සඳහා කිසිදු ප්‍රගතියක් නැතිවීම පිළිබදව පිපිරීමෙන් සති දෙකකට පසු පූනේ පොලීසිය ප්‍රශ්න කිරීමට ලක් විය. මැයි 24 වන දින සැකකරුවෙකු යැයි පැවසූ පුද්ගලයෙකුව අත්අඩංගුවට ගැණුනි. චෝදනා ඔප්පු කිරීමට පොලීසිය විසින් ඉදිරිපත් කළ සාක්ෂි ප්‍රමාණවත් නොමැති වීම නිසා සැසිවාර උසාවියක් මගින් ජූනි 15 වන දින ඔහු ඇප මත මුදා හරින ලදී.

පසුගිය දශකය තුළ සෙසු බෙහෝ රටවලට වඩා ඉන්දියාව ත්‍රස්තවාදී ක්‍රියාවන්ගේ ඉලක්කයක් වී ඇත. 2001 දෙසැම්බර් මාසයේ නවදිල්ලි පාර්ලිමේන්තු සංකීර්ණයට එල්ල වූ ප්‍රහාරයෙන් ඇරඹි බෙහෝ විට නාගරික පහසුකම් සහ ඉතා වැදගත් මං සන්ධි ඉලක්ක කරමින් ප්‍රජාවෙහි නිර්භීත භාවය විනාශ කිරීම සහ උපරිම ජීවිත හානි සිදු කිරීම සඳහා සැලසුම් කරන ලද නගර කිහිපයකදී ඇතිවූ භංයකාර ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මාලාවක අවසානය සටහන් කරනු ලැබවේ 2008 නොවැම්බර් මාසයේ දී වෙළඳ අගනුවර වන මුම්බායි නගරය මධ්‍යයේ සිදු කළ කොමාන්ඩෝ ශෛලියේ ප්‍රහාර මගිනි. දේශපාලන කණ්ඩායම් කිහිපයක්ම තහනම් කිරීම, ත්‍රස්තවාදී ක්‍රියායැයි දක්වමින් පුද්ගලයින් විශාල සංඛාවක් චෝදනාවට ලක් කිරීම සහ දරුණු නීතියක් වන ත්‍රස්තවාදය වැළැත්වීමේ පනත පැනවීම මෙන්ම පසුව අවලංගු කිරීම මෙම වර්ෂ තුන තුළදී ඉන්දියාවට දැක ගැනීමට හැකි විය.

සාමාන්‍යයෙන්, ප්‍රසාරණය කරන ලද අත්අඩංගුවට ගැනීමේ බලතල සහ තොරතුරු ගලා යාම මත පනවන බාධා ඇතුළත් ත්‍රස්තවාදී තර්ජන මැඩ පැවැත්වීම සඳහා වූ විශේෂ බලතල ප්‍රාන්ත පොලිස් බලඇණි ඇතුළු ආරක්ෂක කාර්යංශ විසින් අත් පත් කර ගෙන ඇත. කෙසේ වෙතත්, මෙම භීෂණ පිළිබදව විමර්ශන්හි ප්‍රගතිය පිළිබදව සුවිශේෂ තොරතුරු අනාවරණය කර ගැනීමටත් ඉතා හරවත් ලෙස වාර්තා කිරීමටක් මාධ්‍ය සමත් වී ඇත.

2008 සැප්තැම්බර් මස ගිණිකොණ දිග දිල්ලියේ ජමියා නගර් හි පැවති අවි ගැටුමකදී වෙඩි ප්‍රහාරයට ලක්ව තරුණයන් දෙදෙනෙකු මිය ගිය සිදුවීම ඇසුරෙන් සිදු කළ විශාල ප්‍රති ත්‍රස්තවාදී ව්‍යාපාරයෙහි වාර්තාකරණය පිළිබද ඉතා වැදගත් වාර්තාවක් මඟින් දිල්ලි ජනමාධ්‍යවේදීන්ගේ සංගමය (DUJ) පෙන්වා දෙන්නේ මාධ්‍ය විසින් එකතු කරන ලද ත්‍රස්තවාදය පිළිබද වෘතාන්ත බොහෝ විට අස්ථිර සහ අදාල ආගමික කණ්ඩායමෙහි සමාජ ප්‍රතිරූපය ප්‍රබල ලෙස හානියට පත් කරන ඒවා බවයි.[6] කළබලකාරී දිල්ලි දිනපතා පුවත් පත් අතරට මෑතකදී එක් වූ කුඩා ප්‍රමාණයේ උදෑසන පුවත්පතක් වන *මේල් ටු ඩේ* පුවත් පත ඔවුන් ත්‍රස්තවාදී ක්‍රියාවන්ට සම්බන්ධ බව දක්වමින් සාමාන්‍ය ජනයා ඝාතනය කරනු ලැබීම වසං කිරීමේ පොලීස් ප්‍රයත්න අරභයා සාක්ෂි රාශියක් සහිතව අවි ගැටුම් වල සැක සහිත තත්ත්වයන් පිළිබද වාර්තා මාලාවක් ඉදිරිපත් කළාය.[7]

පොලිස් කාර්යාංශ මහජන යහපත සඳහා ක්‍රියාකිරීම සහතික කැරෙන පරිදි තොරතුරු වැඩියෙන් ලබා ගැනීම ප්‍රජාවගේ උනන්දුව බවට පත්වෙත්දී ආරක්ෂක අංශයන්හි මනෝභාවය වූයේ තොරතුරු ගලා යාම පාලනය කිරීමය.

2008 නොවැම්බර් මස මුම්බාහි ස්ථාන කිහිපයක් ඉලක්ක කොට ගෙන ප්‍රහාරය එල්ල වන විට, එවැනි හදිසි තත්ත්වයන්ට මුහුණ දීමට රාජ්‍ය කාර්යංශයන් හැකියාව මෙන්ම  මාධ්‍යයෙහි විශ්වසනීයත්වය සියුම් පරීක්ෂාව ලක්ව තිබුණි. මේ අවස්ථාවේදීත් දිල්ලි ජනමාධ්‍යවේදීන්ගේ සංගමය ත්‍රස්තවාදය පිළිබද ජනමාධ්‍යයෙහි ප්‍රතිචාර පිළිබඳ සැලකිය යුතු සහ ගැඹුරු ලෙස විශ්ලේෂණය කළ අධ්‍යයනයක් සමඟ නැවත වතාවක් ප්‍රතිචාර දැක්වීය.[8] තවද, මුම්බායි ප්‍රහාරයට වසරක් ගත වීම සැමරන අවස්ථාවේදී මුම්බායි සංගමයේ සාමාජිකයෙකු විසින් ඉතා උචිත ප්‍රශ්නයක් ඉදිරිපත් කළේය. ”ගැටුම සහ ශෝඛාන්තයේ චක්‍රය බිඳ දැමීමට අවශ්‍ය වන්නේ සාධාරණත්වය පමණක් නම් මාධ්‍ය සාධාරණත්වය පිළිබදව කතා කිරීම අරඹන්නේ කවදාද?”[9]

## ඉන්දියානු - පකිස්තාන සාකච්ජා සහ ජනමාධ්‍ය

දේශ සීමා හරහා ගලා යන ඉන්දු නදී ජල පද්ධතියේ ජලය ඉන්දියාව සහ පකිස්තානය අතර මෑතකදී කලහකාරී තත්ත්වයක් මතු කළේය. තාක්ෂණික සංකීරණතා හේතුවෙන් 1960දී දෙරට අතර අත්සන් තැබුණු ඉන්දු නදී ජල ගිවිසුමෙහි ඇතුළත් විවිධ කරුණු සම්පූර්ණයෙන්ම ග්‍රහණය කර ගැනීමට මාධ්‍ය අසමත් වී තිබේ. නමුත් හාවඩ් විශ්ව විද්‍යාලයේ, ජල සම්පත් පිළිබද විශේෂඥයෙකු පහත සදහන් අපූරු අදහස දක්වා ඇත. ”දිල්ලියේ ජීවත් වෙමින් ඉන්දියාව සහ පකිස්තානය යන රටවල් දෙකේම සේවය කරන මම දුටු විරෝධාභාසයෙන් පුදුමයට පත් වීමි. එක් රටක් ප්‍රබල ලෙස ප්‍රජාතන්ත්‍රවාදී වන අතර අනෙකෙහි ඇත්තේ හමුදා පාලනයකි. නමුත් ජල අර්බුදය පිළිබද ඉන්දියාවේ මතය සම්බන්දයෙන් පකිස්තානු මාධ්‍ය ප්‍රජාවේ සැලකිය යුතු පිරිසක් නිරන්තරයෙන් ඉතා අපක්ෂපාතී ලෙස වාර්තා කළද ඉන්දියානු මාධ්‍ය කිසි දිනෙක එසේ නෙකළේය.”[10]

---

5 වාර්තාව සඳහා: http://presscouncil.nic.in/HOME.HTM.

6 අධ්‍යනයේ සංරාංශ කොටස් සඳහා:http://www.thehoot.org/web/home/searchdetail.php?sid=3360&bg=1 සහ http://www.thehoot.org/web/home/searchdetail.php?sid=3367&bg=1

7 2008 ඔක්තෝබර් මාසය පුරා මේල් ටුඩේ නිල අඛ්‍යානය ප්‍රශ්ණ කැරෙන වාර්තා ගණනාවක් පළ කළා ය.ඒවා මෙම පැරණි කලාපයන්හි කියවිය හැකිය:www.mailtoday.in

8 බලන්න Anjali Deshpande and S.K. Pande, “Three Days of Mumbai Terror Reporting”, at http://www.thehoot.org/web/home/searchdetail.php?sid=3490&bg=1 මෙය වාර්තාවෙහි සාරංශයකි. සම්පූර්ණ වාර්තාව DJU කාර්යාලයෙන් ලබා ගත හැක.

9 Geeta Seshu, “26/11 myth making: to what purpose?”, available at: http://www.thehoot.org/web/home/searchdetail.php?sid=4219&bg=1.

10 John Briscoe, “War or Peace on the Indus”, extracted from: http://thesoutha-

මෙම නිරීක්ෂකයා හඳුනා ගන්නා ආකාරයට ඊට හේතු වන්නේ, දෙරටෙහි මාධ්‍ය ඔවුන්ගේ අන්‍යොන්‍ය සම්බන්ධතාවය පිළිබඳ වන කරුණු වලදී කෙතරම් දුරකට නිල නියෝගයන්ට අනුකූල වනවාදැයි යන්නයි.

2010 පෙබරවාරි මාසයේදී ඉන්දු සහ පකිස්තාන ගිවිසුමේ නව අදියරක් වෙත ගමන් කරන අවස්ථාවේදී මාධ්‍ය ඒ සම්බන්ධයෙන් දැරුවේ මුළුමණින්ම නිෂේධාත්මක අදහසකි. පෙබරවාරි 25 වන දින දෙරටෙහි විදේශ අමාත්‍යාංශ වල ඉහල නිලධාරීන් ගේ හමුවෙන් විශාල ප්‍රතිඵලයක් බලාපොරොත්තු නොවිණි. එවැනි ප්‍රතිඵලයක් ලැබුණේද නැත. මෙතුළින් මතුවන පැනය වන්නේ දෙරටෙහි මාධ්‍ය ඔවුන්ගේ ප්‍රජාවන් අපේක්ෂා විරහිතභාවයේ අත්තනෝමතිකත්වයට ලක් කර ඇත්ද යන්නයි.

2010 නව වසර උදා වීමත් සමගම ඉන්දියාවේ සහ පකිස්තානයේ පුවත් පත් පාඨකයින්ට දැන ගන්නට ලැබුණු සිත් ගන්නා සුළු වර්ධනයක් වූයේ ඉන්දියාවේ *ටයිම්ස් ඔෆ් ඉන්දියා* සමාගම සහ පකිස්තානයේ *ජන්ග්* සමාගම විසින් දියත් කරනු ලැබූ "අමන් කි ආශා " වැඩසටහනෙහි (සාමය සඳහා වූ ගවේශනය) මුල පිරීම සිදු වීමයි. මෙම සමාගම් ඔවුන්ගේ රටවල ඇති විශාලතම මාධ්‍ය ආයතන වන අතර පුවත් පත්, රූපවාහිනී සහ ගුවන් විදුලි නාලිකා ඔවුන්ගේ ස්ථාවර ලැදියාවන් වේ. මෙම වැඩසටහන කුමන හැඩයක් ගනී දැයි දැනට කිව නොහැකිය. නමුත් මෙම වාර්තාව සකස් කරන මොහොතේ, මහ ජනයා ඒ පිළිබඳව සැක සහිතව සිටිති. මේ වැඩසටහන තවත් එක් වාණිජ ලාභයකට වඩා සාමය සඳහා වූ ජනප්‍රිය ලැදියාව ප්‍රකාශ කිරීම සඳහා අවංකවම සකස් කෙරුණක් බව විශ්වාස කිරීමට කිසිවෙකුගේ වැඩි කැමැත්තක් නොමැත.

sianidea.wordpress.com/2010/04/03/war-or-peace-on-the-indus/.

# නේපාලය

## ආරම්භක ප්‍රජාතන්ත්‍රවාදයක් ආරක්ෂා කිරීම

ප්‍රජන ආන්දෝලන් හෙවත් මහජනයාගේ ව්‍යාපාරය හරහා දශක ගණනාවක් තිස්සේ පැවති රානා පෙළපත සහ රාජ නියෝග මත පදනම් වූ පංචායත් පද්ධතිය යටතේ පැවති ඒකාධිපති පාලනය වියැකී ගොස්, 1990 දී ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත වීමත් සමඟ නේපාලයේ පෞද්ගලික අයිතිය සහිත මාධ්‍ය මතු වී එන්නට පටන් ගැනිණි. එනමුත් බහු පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදය සමඟ සිදු කෙරුණු මෙම අත්හදා බැලීම 1996 දී නේපාල් සමාජවාදී පක්ෂය (මාවෝ වාදීන්) ජනතාවගේ යුද්ධය නමින් හැඳින්වූ කැරැල්ලක් ආරම්භ කිරීමෙන් පසු ඉක්මණින් නිමාවට පත් විය. මෙවන් කලබලකාරී සිදුවීම් පැවති කාලය පුරාවටම, භූගෝලීය වශයෙන් පැතිරී ඇති සහ දුර බැහැර පිහිටි ඈත කඳුකර ප්‍රදේශ වල තිබූ දුර්වල යටිතලපහසුකම්, විශාල වශයෙන් පැතිරී ඇති නූගත්කම සහ අන්ත දුගී භාවය වැනි දැඩි දුෂ්කර තත්ත්වයන් මධ්‍යයේ පවා නිදහස නම් වූ පහන දල්වා තබා ගැනීමට නේපාලයේ ජනමාධ්‍ය විශාල අරගලයක නිරත වූහ.

නේපාල් ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය (FNJ) විසින් සකස් කළ සංඛ්‍යාලේඛන වලට අනුව 2001 ජූලි මාසයේ සිට මාධ්‍ය වෘත්තිකයන් 31 දෙනෙකු ඔවුන් කළ කටයුතු වල ඍජු ප්‍රතිඵලයක් ලෙස ඝාතනයට ලක් වී ඇත. 2005 සවිස්තරාත්මක සාම ගිවිසුම අත්සන් තැබීමෙන් පසුවද, අර්බුදය උපරිම ලෙස බලගතුව තිබූ අවධියේදී තරම් ම ජනමාධ්‍යවේදීන් සංඛ්‍යාවක් ඝාතනයට ලක් වීම භයංකාර කරුණක් වේ. 2006 වසරේදී ප්‍රජාතන්ත්‍රවාදය නැවත ස්ථාපනය කිරීමෙන් පසුව ඇති වූ දේශපාලන අස්ථාවරභාවය මඟින් දශකයක් පුරා පැවති කැරළිකාරිත්වය හරහා පරීක්ෂාවට ලක් වෙමින් පැවති ජනමාධ්‍ය සඳහා වූ තත්ත්වයන් වඩා අයහපත් කරන ලදී.

තවමත් සිදු වෙමින් පවතින ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්ථනය මෙතෙක් සුමට බවක් පෙන්නුම් කර නොමැත. හිටපු මාවෝවාදී සටන්කාමීන් රාජ්‍යයේ ආරක්ෂක වැඩසටහනට එකතු කර ගැනීම මෙන්ම නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ දුෂ්කර කාර්යය ද තවමත් කළ යුතුව ඇත. රටෙහි ස්ථිර දේශපාලන නායකත්වයක් නොමැති වීම තුළ පවත්නා සමාජ දේශපාලන සහ ආර්ථික අවිනිශ්චිත භාවයද ඉහළ නංවා ඇත.



ජනමාධ්‍යවේදීහු රාජකීය ඒකාධිපතිත්වය පැවැති වර්ශ පුරාම දෛනික ජීවිතයේ දුෂ්කර තත්ත්වයන් අත්වින්දෝය. (ඡායාරූප ස්තූතියෑ බිකාශ් කර්කි)

විශේෂයෙන්ම දකුණු දිග තැනිතලා හෝ තෙරායි ප්‍රදේශයේ මෑත කාලයෙහි මාධ්‍ය හිමිකරුවන් ඝාතනය කිරීම මඟින් පෙන්වා දෙන්නේ නීතියක් නොමැති පොදු වාතාවරණයකි. 2010 ජූලි 22 වන දින රේඩියෝ තුල්සිපූර් ගුවන්විදුලි නාලිකාවේ සභාපතිවරයා වූ දේව් ප්‍රසාද් දිතාල් හඳුනා නොගත් ප්‍රහාරකයන් විසින් වෙඩි තබා

මරා දමන ලදී. දිතාල් නේපාලයේ 6 මසක් ඇතුළත ඝාතනය වූ තෙවන මාධ්‍ය ආයතන හිමිකරුවා විය. ඊට පෙර පෙබරවාරි මාසයේදී චැනල් නේපාල් රූපවාහිනී නාලිකාවේ සහ ස්පේස් ටයිම් නෙට්වර්ක් සැටලයිට් නාලිකාවේ සභාපති වූ ජමීම් ෂාහ් කත්මන්ඩු හි කාර්ය බහුල මාර්ගයකදී මුහුණු ආවරණය කර ගත් පුද්ගලයන් පිරිසක් විසින් වෙඩි තබා ඝාතනය කරන ලදී. ඉන් මසක් යන්නට මත්තෙන් අද ජනක් පූර් පුවත් පත මුද්‍රණය කරන සහ එම නමින්ම ගුවන් විදුලි නාලිකාවක් හිමි ටුඩේ ගෲප් හි සභාපති වූ අරුන් සිංග්හානියා දණුෂා දිස්ත්‍රික්කයේ ජනක්පූර් හි සිය නිවස ඉදිරිපිට දී යතුරුපැදි වලන් පැමිණි හඳුනා නොගත් කණ්ඩායමක් විසින් ඝාතනය කරන ලදී.

නේපාලයේ ජනමාධ්‍යවේදීන්ට නිරන්තරයෙන් රාජ උදහසට මුහුණ දීමට සිදුවේ. වඩාත් මෑත කාලයේදී ඔවුන්ට තෙරායි හි මාවෝවාදී කැරලිකරුවන්ගේ හා විවිධ ආයුධ සන්නද්ධ කණ්ඩායම් වල හදිසි කෝපයට මුහුණ දීමට සිදු වී ඇත. 2010 ජූනි අග භාගයේදී, නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයේ පියුතන් ශාඛාවෙහි උප සභාපති සහ මන්දාවි රේඩියෝ ගුවන් විදුලි නාලිකාවේ වාර්තාකරුවෙක් වූ කෙෂව් බොහරා පැහැර ගැනීම ජනමාධ්‍යවේදීන් දෛනිකව මුහුණ දෙන අවදානම පිළිබඳව උදාහරණයක් සපයයි. විශේෂයෙන්ම මෙම දිස්ත්‍රික්කයේ ජනමාධ්‍යවේදීන් අනතුරට භාජනය වීමේ අවදානමක් ඇත. රාජ්ධානි නම් දිනපතා පුවත් පතේ වාර්තාකරුවෙක් වූ ටිකා බිස්තා ගේ සිදුවීම ඊට නිදසුනකි. 2009 දෙසැම්බර් මාසයේදී ප්‍රාදේශීයව ප්‍රකාශයට පත් කෙරෙන ජනතිධාරා පුවත් පතේ මාවෝවාදීන් පිළිබඳ ව විවේචනාත්මක ලිපියක් පළ කිරීමෙන් පසුව, නේපාල්හි බටහිර දිග රුකුම් ප්‍රදේශයේ ඇගේ නිවස අසල ස්ථානයකදී දැලි පිහි වලින් කපා කොටා බිස්තාව ප්‍රපාතයකින් පහලට තල්ලු කර මැරෙන්නට දමා ගොස් තිබුණි. මෙම බිහිසුණු ප්‍රහාරය සිදු වූයේ තෙරායි ජනක්පූර් නගරේදී ධෛර්යමත් තරුණ ජනමාධ්‍යවේදිනිකය වූ උමා සිං සාහසික ලෙස ඝාතනය කර වසරක් ගත වීමට ඉක්මයාමටත් පළමුවයි. ඒ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම් කිහිපයක් සිදු වුවද ඇගේ ඝාතනයට වග කිවයුත්තන් තවමත් නිදල්ලේ පසු වෙති.

## රාජාණ්ඩුවේ සිට මාවෝවාදය දක්වා - මාධ්‍ය මර්දනය දිගටම

1996 වසරේ සිට නේපාලයේ දේශපාලනය තුළ ඉහළින්ම බල පැවැත්වූණේ මාවෝවාදී කැරැල්ලයි. ප්‍රචණ්ඩ හෙවත් පුෂ්පා කමල් දාස් විසින් මෙහෙයවන ලද කැරලිකරුවන් ක්‍රියාත්මක වූයේ විශේෂයෙන්ම අධික දුගී භාවය, නොසලකා හැරීම හා නූගත්කමින් සමන්විත ඈත එපිට ග්‍රාමීය සහ කඳුකර ප්‍රදේශයන්හිය.

2001 ජූනි මාසයේදී, රාජකීය පවුලේ නිවෙස වු කත්මන්ඩුහි නාරායන්හිටි මාලිගයේ ඉතා භයානක සිදුවීමක් සිදු විය. එනම්, එවක පාලකයා වූ බිරේන්ද්‍ර රජු, ඔහුගේ බිරිඳ ඓශ්වර්යා සහ රාජකීය පවුලේ තවත් සාමාජිකයන් 8 දෙනකු ඝාතනය කිරීමයි. කිරුළට උරුමකරුවන්ගෙන් පළමුවෙනියා වූ රජුගේ පුත්‍ර දීපේන්ද්‍ර මෙම සමූල ඝාතනය සිදු කර පසුව තමාට වෙඩි තබා ගන්නට ඇතැයි කියවිණි. ඉන් දින තුනකට පසු කිරුළ හිමි කුමාරයා ද මරණයට පත් වූයේ ඔහුගේ මාමා වූ ගයනේන්ද්‍රට රජකම හිමි කර දෙමිනි. මෙම ඝාතන කුමන්ත්‍රණය පිළිබඳව විවිධ අනුමාන කතා පැතිරුණද නිල විභාග යකින් පසුව තීරණය කෙරුණේ දීපේන්ද්‍ර ඝාතන සඳහා වරදකරු වූ බවයි. මාලිගයේ සමූල ඝාතනයෙන් පසු ආණ්ඩුව සහ මාවෝවාදී කැරලි කණ්ඩායම් අතර ලුහුඬු සටන් විරාමයක් ආරම්භ විය.

2001 නොවැම්බර් මාසයේදී සටන් විරාමය බිඳ වැටුණ විට ආණ්ඩුව විසින් හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන ලදී. ඉන් පසුව පැමිණියේ සිවිල් නිදහස දැඩි ලෙස පීඩාවට පත් කළ වසර තුනකිඃ ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය වෘත්තිකයන් විශාල සංඛ්‍යාවක් ඝාතනය වූහ, සිර අඩස්සියේ තබා ගැණිනි, ප්‍රාණ ඇප කරුවන් ලෙස රඳවා ගැණුනි.

2002 ඔක්තෝබර 4 වන දින ගයනේන්ද්‍ර රජු පාර්ලිමේන්තු ආණ්ඩුව පහකර පසුව, එසේ පහ කරන ලද අගමැතිවරයා සහ සිය අමාත්‍ය මණ්ඩලය නැවත තනතුරු වල පිහිටුවා ගැනීමේදී, ආරකෂාව පිළිබඳ බලතල තමා වෙතම රඳවා ගත්තේය. එමගින් ඔහු මාවෝවාදී කැරලි කරුවන් සමඟ රිසි සේ ගනු දෙනු කිරීමට හැකියාව ලබා ගත්තේය. 2003 වසර පුරාවටම පැවති සටන් විරාමය අතර තුරදී පවා නේපාලය තුළ දක්නට ලැබුණේ මානව හිමිකම් ඒකාකාරී ලෙස දැඩිව පිරිහීමට පත්වන අකාරයකි. මාධ්‍ය නිදහස සහ ප්‍රකාශනයේ නිදහස පැවතියේ අධික පීඩනයක් යටතේය.

ඒකාධිපති පාලනය සහ මාවෝ වාදීන් අතර මිරිකී තිබූ මාධ්‍ය, හමුදාව සහ කැරලිකරුවන් යන දෙපිල විසින්ම සිදු කළ දාමරික ක්‍රියා වලින් පීඩාවට පත් විය. දරුණු භීෂණ මර්දන පණත් යටතේ සිරගත කිරීම් සහ අතුරුදහන් වීම්, පැහැරගෙන යාම් , වද හිංසා පැමිණවීම්, ඝාතන ආදිය සුලභ විය. 2002 අගෝස්තු මස 29 වන දින හදිසි අවස්ථාව ඉවත් කළ අතර ඉන් පසුව ද ජනමාධ්‍යවේදීන් සඳහා වූ තත්ත්වය සැලකිය යුතු වර්ධනයකට ලක් වූයේ නැත. 2003 අගෝස්තු 27 වන දින තවත් සටන් විරාමයක් බිඳ වැටීමෙන් පසු ජනමාධ්‍යවේදීන් අර්බුද හා සම්බන්ධ පක්ෂයන්ගේ ඍජු සහ වක්‍ර තර්ජනයන්ට ලක්වීම හේතුවෙන් එම ජනමාධ්‍යවේදීන්ව ඔවුන්ගේ රාජකාරි කලාපයෙන් ඉවත් කර ගන්නා ලදී. 2004 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ බලහත්කාර හෝ අස්වෙච්ඡා අතුරුදහන් වීම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම විසින් බලහත්කාර අතුරුදහන් වීම් ලෙස පෙනෙන සිදුවීම් 130ක් පිළිබඳ කරුණු ඇතුළත් ලේඛනයක් ආණ්ඩුව වෙත ඉදිරිපත් කරන ලදී. නීතිය සහ යුක්තිය පිරිහෙමින් පැවති මෙම යුගය නේපාල්හි ඉතිහාසයේ වඩාත්ම කෲර සිදුවීම් වලින් එකක් සඳහා හේතුව බවට පත්විය.

## රාජ්‍ය කුමන්ත්‍රණය : ස්වාධීන ජනමාධ්‍ය පරීක්ෂණයට

බලයටපත් වූ ආණ්ඩු, කැරලි පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් කාර්යභාරයක් ඉටු නොකළේයැයි කියා සිටිමින් 2005 පෙබරවාරි 1 වන දින ගයනේන්ද්‍ර රජු විසින් සියළු බලතල තමා සතු කරගෙන දේශාපලන නායකයන් සිර ගත කර වහා ක්‍රියාත්මක වන පරිදි මාධ්‍ය නිදහස අත්හිටුවන ලදී. ප්‍රවෘත්ති කාමර සහ පෞද්ගලික රූපවාහිනී සහ ගුවන් විදුලි කාර්යාලයන්ට ඇතුළු වූ හමුදාව වහාම වැඩ නැවැත්වීමට නියෝග කළහ. දුරකතන සහ අන්තර්ජාල සබඳතා දින 3ක් ද ජංගම දුරකතන සබඳතා සති කිහිපයක් පුරාම ද අවහිර කර තිබිණි. හදිසියේ සිදු වූ මෙම තොරතුරු හිඩැස පිරවීමට විවිධ පිරිස් හැකි සෑම ආකාරයකින් රටින් පිටතට ලිපි සහ තොරතුරු යවන ලදී. රජතුමා බලය අල්ලා ගැනීමෙන් දින දෙකකට පසු නිකුත් කළ දැන්වීමක් මෙසේ අනතුරු හැඟවීය.

"ජාතිය සහ ජාතික යහපත පිළිබඳ සලකා බලමින් අප උතුමාණන්ගේ ආණ්ඩුව විසින් මෙතැන් පටන් මාස 6ක් දක්වා 2005 පෙබරවාරි පළමුවන දින පළ කළ රාජ නියෝගයන්ට විරුද්ධව යන සහ ඍජුව හෝ වක්‍රව විනාශයට හෝ ත්‍රස්තවාදයට ආධාර දෙන සම්මුඛ සාකච්ඡා, ලිපි, පුවත්, නිවේදන හෝ කිසිදු ආකාරයක හෝ පෞද්ගලික අදහස් තහනම් කර ඇත."

ඉන් පසු ඇරඹියේ දැඩි වාරණයක් සහිත කාල පරිච්ඡේදයකි. කර්තෘවරුන්ගේ කාර්යාලයන්ට අනවසරෙන් ඇතුළු වූ බුද්ධි අංශ නිලධාරීන් කොළ පැහැයෙන් සැරසුණු සන්නද්ධ පිරිස් වෙනුවට ප්‍රතිස්ථාපනය වූහ. එසේ වුවද, නේපාල ජනමාධ්‍ය උපහාසාත්මක සහ ව්‍යාජෝක්ත පිළිවදන් යොදා ගනිමින් බලවත් ප්‍රතිරෝධයක් දියත් කළහ. නේපාලයේ වැඩියෙන්ම බෙදා හැරෙන ඉංග්‍රිසි මාධ්‍ය දිනපතා පුවත්පතක් වන කත්මන්ඩු පෝස්ට් පුවත්පත නේපාලය වැනි දුප්පත් රටකදී හිල් නැති පා වැසුම් කීර්තියෙහි සංකේතයක් වන්නේ කෙසේ




මාධ්‍ය ව්‍යාපාරික අරුන් සිංහානියා ඝාතනයට විරෝධතා දක්වන ජනමාධ්‍යවේදීහු කත්මන්ඩුහි දී කැරලි මර්දන පොලීසිය සමග ගැටෙති. (ඡායාරූප ස්තුතියඃ රාජේශ් දුන්ගානා)

දැයි විස්තර කරමින් "සමාජයේ පා වැසුම් " ("Socks in Society") නම් වු උපහාසාත්මක කතු වැකියක් ප්‍රකාශයට පත් කළේය. නේපාල් ටයිම්ස් සහ හිමාල් ක්හාබර්පත්‍රිකා යන පුවත්පත් වාරණයට ලක් කැරුණු පුවත් තිබූ තැන් හිස්ව තැබූහ. දේශාන්තර් සහ බිමාර්ශ් වැනි සතිපතා පුවත්පත් කතු වැකිය සඳහා වූ ඉඩ හිස්ව තබමින් පත්වාගෙන ගිය මුරණ්ඩු නිශ්ශබ්දතාවය තවත් එක් උපක්‍රමයක් විය. මෙම බලවත් විරෝධය හේතුවෙන් ප්‍රාදේශීය සිවිල් පරිපාලනයේ ඉහලම නිලධාරියා වූ කත්මන්ඩු හි ප්‍රධාන දිස්ත්‍රික් නිලධාරීවරයා විසින් කර්තෘ වරුන් 5 දෙනෙක් කැඳවා ඔවුන්ගෙන් ප්‍රශ්න කරන ලදී. එම කර්තෘවරුන්ව මුද්‍රා හැරුණේ බලධාරීන් ඔවුන්ව කැඳවන ඕනෑම අවස්ථාවක වාර්තා කිරීමට පොරොන්දු වෙමින් ප්‍රකාශයක් අත්සන් කිරීමෙන් පසුවය.

කතුවැකියේ ඉඩ හිස්ව තැබීම තහනම් කළ විට සති පතා පුවත්පතක් වන සංගු හි කර්තෘවරයෙකු විසින් තවත් ආකාරයකට විරෝධය පල කරන ලදී. එනම් සංස්කාරක සහ ප්‍රකාශක ලෙස සාමාන්‍යයෙන් ඔහුගේ නම පල වන ස්ථානයෙහි නම පල නොකිරිමයි. "මම තව දුරටත් මාගේ ප්‍රකාශනයේ සංස්කාරක වරයා නොවේ. මාගේ පිටපත් වාරණය කරන ආරක්ෂක නිලධාරීන් ඔවුන්ගේ නම් හෙළි කරයි නම් 'නියම ' සංස්කාරකවරයන් ලෙස මම ඔවුන්ගේ නම් සඳහන් කරන්නෙමි" යැයි ඔහු එම අවස්ථාවේ දී ප්‍රකාශ කළේය.

ප්‍රචාරක දැන්වීම් සඳහා දරන වියදම් සීමා කිරීම හරහා ද 'මාර්ග උපදේශ' සමග එකඟ වන මෙන් මාධ්‍යයට බල කෙරුණු තවත් ක්‍රමයක් වන්නේ ප්‍රචාරක දැන්වීම් සඳහා දරන වියදම් පාලනය කළ ආකාරයයි. 2005 සැප්තැම්බර් මැද දී ප්‍රචාරක දැන්වීම් බෙදා හැරීම සඳහා "තනි පිවිසුමක් සහිත ප්‍රතිපත්තියක්" ගෙන ඒමෙන් පසු විවේචනාත්මක මාධ්‍ය වෙත රජයේ ප්‍රචාරක දැන්වීම් ලබා නොදෙන ලදී. සත්‍ය වශයෙන්ම රජයේ ප්‍රචාරක දැන්වීම් ලබා ගැනීමට සුදුසුකම් ලැබීම සඳහා නිරණායකයක් වූයේ ආරක්ෂක හමුදාවන්ගේ ධෛර්ය ඉහල දැමීම සඳහා ධනාත්මක ලෙස සම්බන්ධ වීමයි. එසේ කිරීමට අසමත් වීම විශේෂයෙන්ම සති පතා හෝ සති දෙකකට වරක් මුද්‍රණය කෙරෙන සාපේක්ෂ වශයෙන් කුඩා පුවත්පත් සඳහා අත්‍යවශ්‍ය ආදායම් මූලාශ්‍රයක් අහිමි වීමක් විය. පෞද්ගලික අංශයේ ප්‍රචාරක දැන්වීම් බොහොමයක් දිනපතා පුවත් පත් වලට සීමා වන අතර නේපාලයේ ප්‍රචාරක දැන්වීම් සඳහා වන දල වශයෙන් නේපාල රුපියල් බිලියන 2 ක ( ඇමෙරිකානු ඩොලර් මිලියන 26.5) පමණ මුදලින් 30% - 40% අතර ප්‍රමාණයක් පාලනය වන්නේ රජය මඟිනි. එම නිසා, සාපේක්ෂ වශයෙන් කුඩා පුවත්පත් හා ගුවන් විදුලි නාලිකා බොහොමයක් ඔවුහු දැක්වූ විරුද්ධකම් අතහැර රජය වෙත නැඹුරු වූහ.

## වෘත්තීය සමිති මාධ්‍ය නිදහස වෙනුවෙන් සටන් වදී

නීතිඥ, ගුරු, ඉන්ජිනේරු වෘත්තීය සමිති තම විරුද්ධත්වය ප්‍රකාශ කළ අතර ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ සංධාන පිහිටුවා ගත්හ. කණ්ඩායම් කිහිපයක්ම ඒකරාශී කරන අපක්ෂපාතී සංවිධානයක් ලෙස සැලකෙන නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයේ බැනරය යටතේ ජනමාධ්‍යවේදීහු උද්ඝෝෂණ වල ප්‍රමුඛස්ථානය ගත්හ. ප්‍රෙස් චයුතරී , නේපාල මාධ්‍ය එකමුතුව, ක්‍රාන්තිකාරී පත්‍රකාර් සංග් සහ පක්ෂානුබද්ධ තවත් සංගම්ද ක්‍රියාකාරී වූ නමුත් අත්අඩංගුවට පත් වීමේ බිය හේතුවෙන් ඔවුන්ගේ කටයුතු බොහොමයක් සැඟවී තිබිණි. "ඒ කාලයේදී ප්‍රසිද්ධියේ කතා කිරීම ඉතා වැදගත් වුණා. රජුගේ ක්‍රියාවන් විවේචනය කරමින් පුවත් පත් නිවේදනයක් නිකුත් කිරීම යන සරල ක්‍රියාව පවා නිර්භීත ක්‍රියාවක් වුණා. එය ප්‍රජාතන්ත්‍රවාදයට, නිදහසට හා මාධ්‍යයට ආදරය කළ සියළු දෙනාම ඒකරාශී කළ ක්‍රියාවක් වුණා." යැයි 2002 - 2004 යන තීරණාත්මක සමයේදී නේපාලයේ ජනමාධ්‍යවේදීන්ගේ සමුළුවෙහි භාණ්ඩාගාරික මෙන්ම 2005 - 2008 දක්වා එහි උප සභාපති තනතුර ඉසිලූ ශිවා ගයුනාල් ප්‍රකාශ කළේය. මාධ්‍ය කර්මාන්තය, "සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වෘත්තීයමය හවුල" යන බැනරය යටතේ ප්‍රජාතන්ත්‍රවාදී කණ්ඩායම් ඒකරාශී කිරීම සඳහා ද පෙරමුණ ගත්තේය.

නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය යටතේ ජනමාධ්‍ය සංවිධාන කෙතරම් බලගතු වීද යත්, සංවිධානයෙහි බලය හීන කිරීම සඳහා රාජකීය පාර්ශවය නැවත නැවත වෑයම් කරන ලදී. ඒ අතර රජුට අනුකම්පාව දක්වන්නන්ගෙන් සමන්විත "ජාතික ජනමාධ්‍යවේදී සම්මේලනය" ක් පිහිටුවා ගැණුනු අතර රජය විසින් නිර්ලෝභීව ඒ සඳහා අරමුදල් ලබා දෙන ලදී. කෙසේ වෙතත් අදහස් කර ගෙන සිටි පරිදි ජනමාධ්‍යවේදී ප්‍රජාව භේද කිරීමට මෙම පියවර අසමත් විය. එනමුත් මෙම සංවිධානයට බැඳීම ප්‍රතික්ෂේප කිරීම නිසා රාජ්‍ය මාධ්‍ය ආයතන වල (ජාතික ප්‍රවෘත්ති ඒජන්සිය සහ නේපාල ගුවන් විදුලිය) සේවය කළ ජනමාධ්‍යවේදීන්ගේ රැකියා අහිමි කරන ලදී. "ප්‍රජාතන්ත්‍රවාදය වෙත ජාතිය ගෙන යාම සඳහා ජනමාධ්‍යවේදීන්ගේ අරගලය දායක වූ නමුත් තවමත් ප්‍රකාශනයේ නිදහස සහතික වී නොමැති වීම විරෝධෝක්තියකි" යැයි මෙම ලේඛනය ලියන අවස්ථාවෙහි නේපාල් ජනමාධ්‍යවේදී සම්මේලනයේ මහ ලේකම් වූ පොෂාන් කේසී ප්‍රකාශ කළේය.

2005 අප්‍රේල් 25 වන දින හදිසි අවස්ථාව ඉවත් කිරීම ජනමාධ්‍ය නිදහස වැඩි දියුණු කිරීම සඳහා සැලකිය යුතු ලෙස බලපෑවේ නැත. රට පුරා, විශේෂයෙන්ම ඈත එපිට දිස්ත්‍රික්ක වල සේවය කළ ජනමාධ්‍යවේදීන් දිගින් දිගටම රජය හා මාවෝ වාදීන් යන දෙපාර්ශවය විසින්ම සිදු කළ ඝාතන ප්‍රචණ්ඩ ප්‍රහාර, බිය ගැන්වීම්, හිරිහැර කිරීම් සහ ස්ථාන මාරු කිරීම් වලට භාජනය විය. විශේෂයෙන්ම එවන් දිස්ත්‍රික්කයන්හි මාවෝවාදීන් සහ නේපාල රාජකීය හමුදාව අතර මිරිකී හිරවී සිටි ප්‍රාදේශීය මාධ්‍ය මුහුණ දුන් තත්ත්වයන් ඉතා කණගාටුදායක විය. ප්‍රවෘත්තියේ අන්තර්ගතය වෙනස් කිරීම සඳහා හෝ වාරණය කිරීම සඳහා එල්ල කළ පීඩන , බලකිරීම් සහ ඍජු තර්ජන සුලභ විය. මාධ්‍ය පහසුකම් හා ඒවායේ යටිතල ව්‍යුහයන් යුද්ධකාමී කණ්ඩායම් දෙපාර්ශය විසින්ම වසා දැමීමේ, හිතාමතා

අලාභහානි පැමිණවීමේ හෝ ඉවත් කිරීමේ අවදානමක තිබිණි. ස්වාධීන ප්‍රවෘත්ති බෙදා හැරීම වැළැක්වීම සඳහා නිෂ්පාදනයේ සිට බෙදා හැරීම දක්වා වූ ක්‍රියාවන් මාලාව බිඳී යාමේ ඉඩක් තිබිණි. සාම ක්‍රියාවලියට කලින් ඇතැම් ප්‍රදේශ වල විශේෂයෙන්ම තෙරායිහි නිරතුරුව පරීක්ෂාකාරීව සිටින සන්නද්ධ කණ්ඩායම් මතුවීම ද මාධ්‍ය වෘත්තිකයන් වෙත දැඩි තර්ජනයක් එල්ල කරන්නක් විය.




ඡායාරූප මාධ්‍යවේදියෙක් කත්මණ්ඩු විදි ප්‍රචණ්ඩත්වයකදී තුවාල ලද කාන්තාවකට උදව් වෙයි. (ඡායාරූප ස්තුතිය: කිරාන් පාණ්ඩේ)

## දුෂ්ට නීතීවලට විරුද්ධව ඒකරාශී වීම

2005 ඔක්තෝබර් 9 වන දින පැනවූ 2006 අප්‍රේල් මාසයේදී අළුත් කළ දුෂ්ඨ නීතියක් වන "මාධ්‍ය ආඥා පණත" මාධ්‍ය නිදහස සහ ස්වාධීන තොරතුරු ලබා ගැනීමට නේපාල පුරවැසියන්ට ඇති අයිතිය යටපත් කිරීමට රජය විසින් පනවන ලද සීමාවන්ට නීතිමය ආවරණයක් සැපයීමට ගත් ප්‍රයත්නයක් විය. මෙම පනත 1958 ගුවන් විදුලි පනත, 1992 ජාතික විකාශන පනත, 1992 පුවත්පත් මණ්ඩල පනත, 1992 පුවත්පත් සහ මුද්‍රණ පනත, 1962 ජාතික ප්‍රවෘත්ති ඒජන්සි පනත, 1959 ලිඛිත අපහාසය සහ අපකීර්තිය පිළිබඳ පනත ආදී වූ ප්‍රධාන මාධ්‍ය නීති 06 ක් සංශෝධනය කළේය. එවක් පටන් ගුවන් විදුලි නාලිකා වැටලීම්, ගුවන් විදුලි සම්ප්‍රේෂණ උපකරණ අත් පත් කර ගැනීම්, ප්‍රවෘත්ති විකාශනය මත සීමා පැනවීම් සහ ජනමාධ්‍යවේදීන් සිර භාරයේ රඳවා ගැනීම් හා ඔවුන්ට හිරිහැර කිරීම් සාධාරණීකරණය කිරීම සඳහා යොදා ගත් මෙම පණතට විරුද්ධව නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය හඬ නැගුවේය. ප්‍රකාශනයේ නිදහසට ඇති සහතිකය සම්බන්ධයෙන් මෙම පණත 1990 ව්‍යවස්ථාව කඩ කළ බව දක්වමින් නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය නීතිමය අභියෝගයක් ද ඉදිරිපත් කළේය. දෙවතාවක්ම පණත තාවකාලිකව අත්හිටවූ නේපාල ශේෂ්ඨාධිකරණය අවසානයේදී එහි වලංගුතාවය පිළි ගත්තේය. මෙම පනත අවලංගු කරනු ලැබුවේ 2006 මැයි මාසයේදී රජු ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයට යටත්වී පාර්ලිමේන්තුව නැවත පිහිටුවීමෙන් පසුව පමණි.

2001 දී ප්‍රකාශයට පත් කළ 2005 දී සහ නැවත 2006 දී දීර්ඝ කරනු ලැබූ ත්‍රස්තවාදී සහ කඩාකප්පල්කාරී ක්‍රියා (වැළැක්වීමේ සහ පාලනය කිරීමේ) පිළිබඳ පනත මඟින් ස්වාධීන ප්‍රවෘත්ති ප්‍රචාරණය කිරීම අපරාධයක් ලෙස නම් කරන ලදී. නඩු විභාගයකින් තොරව රඳවා ගැනීම සඳහා විධිවිධාන ඇතුලත් මෙම පනත මාධ්‍ය වෘත්තිකයන් අත්තනෝමතිකව රඳවා තැබීමටත්, හිරිහැරයන්ට ලක් කිරීමටත් යොදා ගනු ලැබිය. ප්‍රකාශනයේ නිදහස සහ සමාගමයේ නිදහස මර්දනය කිරීම සඳහා 1989 මහජන ආරක්ෂණ පනත දිගටම යොදා ගනු ලැබුණි. 2006 අප්‍රේල් මාසයේ සිදු කළ "ජන ආන්දෝලන් 2" නම් වූ පෙදුජන ව්‍යාපාරයෙන් පසුව මෙම පනතේ වඩාත්ම පෙනී ගිය ප්‍රයෝජනය වූයේ 2008 වසරේ බීජිං හි පැවැත් වූ ඔලිම්පික් තරඟාවලියට විරුද්ධත්වය පෙන්වීමට උද්ඝෝෂණය කළ ටිබෙට් වැසියන් අති විශාල සංඛ්‍යාවක් රඳවා තබා ගැනීම සඳහා යොදා ගැනීමයි.

## ප්‍රගාමී අධිකරණය

නේපාලයේ ශ්‍රේෂ්ඨාධිකරණය, කැරළි සහ විරෝධතා ව්‍යාපාර අතරතුර කාලයේ ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ ආධිපත්‍ය නැවත පිහිටුවීම සඳහා සුවිශේෂ කාර්ය භාරයක් ඉටු කළේය. නීත්‍යානුකූල නොවන අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තැබීම, වද හිංසා පැමිණවීම් සහ නීතියට අනනුකූලව ඝාතන සිදු වූ අවස්ථා කිහිපයකදීම අධිකරණය විසින් හබයාස් කෝපුස් අඥාපණත යටතේ නීති විරෝධීව රඳවා ගනු ලැබූ ජනමාධ්‍යවේදීන් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙස ආඥාවට නියෝග කෙරිණි. දේශපාලන ක්‍රියාවලිය පුරාවටම ජනමාධ්‍යවේදීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අධිකරණය සුවිශේෂී ලෙස උපකාරී විය. බිමාර්ජුන් ආචාරියා සහ ටිකරා භට්රායි යන නීතීඥයන්ට මෙන්ම හිෂ්ණු නිස්තුරි සහ ථාරානාත් ධාල් යන නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයේ හිටපු සභාපතිවරුන්ට අනුව සාපේක්ෂ වශයෙන් ස්වාධීන අධිකරණයක් නොතිබුණේ නම් ඝාතනය කළ සහ අතුරුදහන් වූ ජනමාධ්‍යවේදීන්ගේ සංඛ්‍යාව පවත්නා මට්ටමට වඩා වැඩි වන්නට ඉඩ තිබුණි. ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ නේපාලයේ අභියාචනාධිකරණ 16 ක විභාගයට ගැණුනු හබයාස් කෝපුස් ආඥාපණත යටතේ තිබූ නඩු 100කට වඩා වැඩි සංඛ්‍යාවකදී අධිකරණය ජනමාධ්‍යවේදීන්ට වාසිදායක තීරණ ලබා දුන්නේ ය.

නේපාලයේ බලහත්කාර අතුරුදහන්වීම් වල අනුපාතය ඉහළ අගයක් ගනී. 2003 - 2004 කාලය තුළ ලොව පුරා සිදුවූ අත්අඩංගුවේ පසුවුවන් අතුරුදහන් වීම වැඩිම ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ නේපාලයෙන් බව එක්සත් ජාතීන්ගේ බලහත්කාර හෝ අස්වෙච්ඡා අතුරුදහන් වීම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම විසින් සොයා ගන්නා ලදී. රටෙහි තත්ත්වයන් සම්බන්ධයෙන් නේපාලයේ අධිකරණය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. නීතීඥ කිෂෝර් උප්‍රති[1] පෙන්වා දෙන ආකාරයට "2007 දී නේපාලයේ ශ්‍රේෂ්ඨාධිකරණය සාධාරණත්වය වෙනුවෙන් ගතානුගතික සහ අකර්මණ්‍ය ප්‍රවේශයන් යොදා ගැණුනු දීර්ඝ සම්ප්‍රදාය බිඳ දමමින්, දේශීය මෙන්ම ජාත්‍යන්තර නීතිමය දෘෂ්ඨිකෝණයට අනුව රටෙහි දේශපාලන ක්‍රියාවලිය මත දීර්ඝ කාලීන බලපෑමක් ඇති කිරීමට ඉඩ සැළසූ සුවිශේෂ තීන්දු ප්‍රකාශයට පත් කළේය." එසේ සඳහන් කෙරෙන්නේ 2007 ජූනි පළමු වන දින හබයාස් කෝපුස් පෙත්සම් 83 කට ප්‍රතිචාර දක්වමින්, කිලා රාජ් රෙගිමි සහ කළ්‍යාන් ශ්‍රේස්ත යන විනිශ්චකරුවන් ඇතුළත් ශේෂ්ඨාධිකරණ විනිශ්චය මණ්ඩලයක් විසින් ලබා දුන් තීන්දුවයි. එහිදි, 1) රජය විසින් බලහත්කාරයෙන් කරනු ලැබූ අතරුදහන් වීම් වලට භාජනය වූ 83 දෙනෙකුගේ පවුල් වලට වන්දි ලබා දීමටත්, 2) බලහත්කාර අතුරුදහන් කිරීම් අපරාධ ලෙස නම් කරමින් පනතක් පැනවීමටත්, 3) රැඳවුම් කඳවුරු වලදී පුද්ගලයන් මරා දැමීම හා සම්බන්ධ පිරිස් සම්බන්ධයෙන් විමර්ශන පැවත්වීමට කොමිසමක් පිහිටුවීමටත් ඉන් පසු ඔවුන්ට අභිචෝදනා

1 උප්‍රති කේ. 2008 "Against Enforced Disappearance: the Political Detainees¡ Case before the Nepal Supreme Court". Chinese Journal of International Law. Vol. 7. No. 2. pp. 429–457

## මෙහෙවර ජීවිත සුරකියි

කැරැල්ල පැවැති කාල වකවානුවේදී සහ විශේෂයෙන්ම 2005 වසරේ සිදුවූ රාජකීය කුමන්ත්‍රණයෙන් පසු රාජ්‍යය හා මාවෝවාදීන් යන දෙපාර්ශවය විසින්ම ජනමාධ්‍යවේදීන්ට හිරිහැර පමුණුවන ලදි. වාරණය, තහනම් කිරීම්, බිය ගැන්වීම්, පැහැරගෙ නයාම් සහ අතුරුදහන් වීම් මෙන්ම යම් අවස්ථාවන්හිදී මරණීය වූ අඩන්තේට්ටම් දින පතාම සිදුවිය. නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය මාවෝවාදින්ගේ මධ්‍යම කමිටු නායකයින් සමඟ ජනමාධ්‍යවේදීන් ආරක්ෂා කිරීම හා ස්වාධීන ජනමාධ්‍යයක් පැවතීමේ වැදගත්කම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම ආරම්භ කළේය. එකල නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ මධ්‍යම කමිටුවේ සාමාජිකයකු වන පූර්ණා බැස්නෙට්, සතිපතා පුවත්පත්ක් වු අන්බා පුවත්පතේ ජනමාධ්‍යවේදියෙකු වූ සෝම් පරමා, නිදහස් කර ගැනීම සඳහා සාකච්ඡා පවත්වන ලද කණ්ඩායමේ මූලිකත්වය දැරුවේය. ඉලිම් හි සිට කටයුතු කළ මෙම ජනමාධ්‍යවේදියා මාවෝවාදීන් පිළිබඳව විවේචනාත්මක ලිපි ලිවීම හේතුවෙන් 2005 මැයි 13 වන දින පැහැර ගැනින. ඔහුගේ පවුලේ සාමාජිකයන් වෙත ලැබුණු ලිපියක දැක්වුණේ ශර්මා මාවෝවාදී "ජනතාවගේ අත්අඩංගුවේ" සිටින බවත්, ඔහුව ඝාතනය කරනු ඇති බවත්ය. දුරකතන හා ඊමේල් සංවාද කිහිපයකින් අනතුරුව ෂර්මා රඳවාගෙන සිටි පුද්ගලයන් නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයේ නිලධාරීන්ට මුණ ගැසුනි. දින 55ක් රඳවා තබා ගෙන සිටි ඔහු පසුව නිදහස් කෙරිණි. මෙය ගැටුම් වලින් ජනමාධ්‍යවේදීන් ආරක්ෂා කර ගැනීම සඳහා තබන ලද පළමු සුවිශේෂී පියවර විය. මෙම සාර්ථක මුදා ගැනීමේ මෙහෙවරෙන් අනතුරුව රටපුරා සිටින ජනමාධ්‍යවේදීන් තුළ කිසියම් ආත්ම විශ්වාසයක් ගොඩ නැගිනි. වසරකට පෙරදී "ඊට වසරකට පෙර මාවෝවාදීන් විසින් පැහැරගත් දකේන්ද්‍ර තාපා මුදා ගැනීම වෙනුවෙන් කරන ලද සාකච්ඡා බිඳ වැටීමෙන් පසු ඔහු ඝාතනයට ලක් වුවද මෙම සාර්ථක මුදා ගැනීමේ මෙහෙවරෙන් අනතුරුව නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය පිළිබද වූ විශ්වසනීයත්වය වර්ධනය වීය" යැයි බාස්නෙට් පවසයි.

මෙම අත්දැකීමෙන් දිරිමත් වූ නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය ඉදිරි මැදිහත්වීම් සිදු කිරීම සඳහා කමිටුවක් පිහිටුවා ගත් අතර පූර්ණා බාස්නෙට් මුදා ගැනීමේ මෙහෙවර රාශියක නායකත්වය දැරුවේය. මේ කාලය තුළ රට පුරා විවිධ දිස්ත්‍රික්කයන්ගේ මෙහෙවර 18කට වඩා වැඩි ප්‍රමාණයක් සිදු කෙරුණි. කන්තිපූර් වෙනුවෙන් සේවය කළ වාර්තාකරුවෙකු හමුදා බාරයෙන් මුදා ගැනීම සඳහා ඩයිලෙක් මෙහෙවර, දිස්ත්‍රික්ක ප්‍රධාන නිලධාරියෙකු විසින් මරණීය තර්ජන එල්ල කිරිමෙන් අනතුරව කත්මන්ඩු නගරයට යැවුණ ජනමාධ්‍යවේදීන් දෙදෙනෙකු පුනරුත්තාපනය කිරීම සඳහා සින්දූරි මෙහෙයුම, ප්‍රාදේශීය පුවත්පතක සංස්කාරක වරයෙකු වූ තෙමී බණ්ඩාරී හමුදා භාරයෙන් මුදවා ගැනීම සඳහා කන්චන් පූර්හි මෙහෙවර, මාවෝවාදීන් විසින් පහරදෙන ලද කන්තිපූර් හි වාර්තාකරුවෙක් සම්බන්ධ සිදුවීම සමථයකට පත් කිරීමට තප්ලේජුන්ග් මෙහෙවර, ඒ අතරින් වැදගත් ස්ථානයක් ගනී.

නේපාල රජයේ ගුවන් විදුලි නාලිකාවන් වන රේඩියෝ නේපාල් හි ජනමාධ්‍යවේදියෙකු වූ දකේන්ද්‍ර රාජ්තාපා කඳුකර ප්‍රදේශයක් වූ බටහිර දිස්ත්‍රික්කයේදී මාවෝවාදී කැරලිකරුවන් විසින් පැහැර ගැනීමෙන් සති හයකට පසුව 2004 අගෝස්තු මස 11 වන දින ඝාතනය කරන ලදී. නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයේ දූත කණ්ඩායමක් තාපා නිදහස් කරන ලෙස ඉල්ලීම සඳහා ඩයිලෙක් හිදි මාවෝවාදී කැරලිකරුවන් හමු වූහ. එනමුත් කැරලිකරුවෝ තාපා ඔත්තුකරුවෙකු බැවින් ඔහුව ඝාතනය කළ බවට තාපාගේ ගමෙහි දැන්වීමක් ඇලවූහ. ප්‍රාදේශීය මාවෝවාදී නායකයන් විසින් අවට දිස්ත්‍රික්ක වල සිටින තවත් මාධ්‍යවේදීන් දස දෙනෙකු ඝාතනය කිරීමට තීරණය කර ඇති බව දන්වා සිටින ලදී. තාපාගේ ඝාතනය හෙලා දකිමින් ජනමාධ්‍යවේදීහු අගෝස්තු 18 වන දින කත්මන්ඩුහිදී වීදි බැස විරෝධතා ව්‍යාපාරයක නිරත වූහ. මාවෝවාදීන්ගේ ප්‍රකාශක වූ ක්‍රිෂ්ණා බහදූර් මහරා සැප්තැම්බර් මාසයේදී නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය වෙත ප්‍රථම වතාවට කණගාටුව ප්‍රකාශ කිරීමේ ලිපියක් යවමින් කියා සිටියේ තාපාගේ ඝාතනය ප්‍රතිපත්ති කඩකිරීමක් බවත් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට පොරොන්දු වන බවත්ය. මාවෝවාදීන් විසින් පසු අවස්ථාවකදී ඒ හා සමානවූ "කඩ කිරීමක්" සම්බන්ධයෙන්, එනම්, 2003 සැප්තැම්බර් මාසයේදී ග්‍රස්ත්‍රියා සමාචාර් සමිත් නම් ජාතික ප්‍රවෘත්ත් ඒජන්සිය සමඟ කටයුතු කළ ගුරුවරයෙකු වූ ගයේන්ද්‍ර කද්කා ඝාතනය කිරීමේ වගකීම භාර ගන්නා ලදී. කෙසේ නමුත් කිසිදු සමාව අයදීමක් ලිඛිතව ඉදිරිපත් වූයේ නැත.

ගොනු කිරීමටත්, රජයට නියෝග කරන ලදී. උසාවි නියෝගයට අනුකූලව 2008 නොවැම්බර් මාසයේදී බලහත්කාර අතුරුදහන්වීම් සම්බන්ධව කෙටුම්පතක් සකස් වුවද එය සම්මතර කර ගැනීම තවමත් ඉතිරි වී ඇත. (තව දුරටත් බලයේ නොසිටින ) මාවෝවාදීන් විසින් නායකත්වය හෙබවූ ආණ්ඩුව විසින් පුද්ගලයන් අතුරුදහන් කිරීම (අපරාධ සහ දඬුවම) පිළිබඳ ආඥා පනත සහ සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිසම පිළිබද ආඥාපනත 2009 ජනවාරි මාසයේදී සම්මත කළද ඒවායේ ක්‍රියාකාරිත්වය මතභේදකාරීය.

අධිකරණ මැදිහත්වීම් පැවති තවත් වැදගත් ක්ෂේත්‍රයක් වූයේ ප්‍රකාශනයේ නිදහසෙහි ආරක්ෂාවයි. කැරලි සහ රජු විසින් බලය අල්ලා ගැනීම සිදුවූ කාලය අතරතුර තොරතුරු ලබා ගැනීම සහ භාෂණය සඳහා ඇති අයිතිය ආරක්ෂා කරමින් අධිකරණ, ගුවන් විදුලි නාලිකා සහ මාධ්‍ය ආයතනයන්ට වාසිදායී ලෙස නීතිමය විධි විධාන අර්ථ දැක්වූහ. ජාතික මානව හිමිකම් කොමිසම දුර්වලව තිබූ සමයක මෙය විශේෂ වැදගත්කමකින් යුක්ත ක්‍රියාවක් විය. 2001 දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ගුවන් විදුලිය ඇතුලත් වන සේ නේපාලයේ මාධ්‍ය නිදහස නැවත අර්ථ කථනය කරමින් ලබා දුන් තීන්දුව සුවිශේෂී සන්ධිස්ථානයක් විය. එමගින්, 2005 ජූනි මාසයේදී ගුවන් විදුලි වැඩසටහන් බෙදා හරින ආයතනයක් වූ කොමියුනිකේෂන්ස් කෝනර් වසා දැමීම වැළැක්වීය. එම වසරේ අගෝස්තු මාසයේදී ජනාමාධ්‍ය මර්දනය කිරීම ඉහලම මට්ටමක තිබියදී ගුවන්විදුලි ආයතතනයක් විසින් රිට් ආඥාවක් ඉදිරිපත් කිරීමෙන් පසු ආණ්වව විසින් ගුවන් විදුලි නාලිකා වල ප්‍රවෘත්ති විකාශනය පිළිබඳ පණවා තිබූ තහනම ව්‍යවස්ථා විරෝධී එකක් බව අධිකරණය විසින් තීන්දු කරන ලදී. එසේම, සම්ප්‍රේෂක සහ අනෙකුත් උපකරණ අත් පත් කර ගැනීම මඟින් ගුවන් විදුලි නාලිකා වසා දමන ලෙස රජය විසින් නිකුත් කළ නියෝගය ශ්‍රේෂ්ඨාධිකරණ මැදිහත් විම් වලින් පසු අත්හිටුවන ලදී.

### රේඩියෝ විප්ලවය

ශ්‍රාවකයන් ප්‍රමාණය සහ අන්තර්ගය සම්බන්ධයෙන් ගත් කල නේපාල් ගුවන් විදුලි විකාශයන් දකුණු ආසියාවේ පෙරමුණින් සිටී. කලාපයේ සෙසු රටවල් වල ගුවන් විදුලි තරංග බොහෝ දුරට රජය සහ සංස්ථා විසින් පාලනය කරන අතර පෞද්ගලික හෝ ප්‍රජා ගුවන් විදුලි නාලිකා විනෝදාස්වාදය සැපයීමෙහි කොටුවී සිටින නමුත් නේපාලයේ ස්වාධීන ගුවන් විදුලි නාලිකා විනෝදාස්වාදය මෙන්ම විවිධත්වයකින් යුතු ප්‍රවෘත්ති සහ කාලීන තොරතුරු ලබා දෙති. නේපාලයේ මේ වන විට ගුවන් විදුලි නාලිකා 186 ක් ක්‍රියාත්මක වන

අතර බලපත්‍ර 323ක් ලබා දී ඇත.[2]

නේපාල ගුවන් විදුලියේ ඉතිහාසය වැඩවසම් රානා ඒකාධිපතිවාදයට විරුද්ධව නේපාල කොංග්‍රස් පක්ෂය අරගල කරමින් සිටි 1950 ගණන් දක්වා දිව යයි. නැගෙනහිර දිග තෙරායි බීරත් නගර් සිට 'නිදහස වෙනුවෙන් සටන් වදිනන්' විසින් ප්‍රජාතන්ත්‍රවාදී නේපාල රේඩියෝව ආරම්භ කර තිබිණි. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය ස්ථාපිත කිරීම සඳහා පක්ෂයේ වැඩසටහන ප්‍රවර්ධනය කිරීමට ගුවන් විදුලිය යොදා ගැණුනි. රානා ඒකාධිකාරය අවසන් වූ විට නව ආණ්ඩුව එම ගුවන් විදුලිය කත්මන්ඩු නගරයට මාරු කළ අතර එය නේපාල් රේඩියෝ ලෙසත් පසුව රේඩියෝ නේපාල් ලෙසත් නම් කරන ලදී. කෙසේ වෙතත්, මෙම නාලිකාව ක්‍රම ක්‍රමයෙන් පවතින රජයේම කොටසක් සේ හඳුනා ගැනෙනන්ට වූ අතර එම නිසා ප්‍රවෘත්ති මූලාශ්‍රයක් ලෙස එහි වූ විශ්වසනීයත්වයෙන් යම් ප්‍රමාණයක් අහිමි විය.



තමන් මුහුණ දෙන තර්ජන සහ අභියෝග මැද නේපාල ජනමාධ්‍යවේදීහු සෑම එසැණ පුවත් අඩවියකම සෑම විටම ක්‍රියාකාරීය. (ඡායාරූප ස්තුතියඃ කිරාන් පාන්ඩේ)

1997 වසරේදී නේපාල් ජනමාධ්‍ය ක්‍රියාකාරීන් සහ මාධ්‍යවේදීන් කිහිප දෙනෙක් එකතු වී රටෙහි (එමෙන්ම දකුණු ආසියාවේ) ප්‍රථම ප්‍රජා ගුවන් විදුලි නාලිකාව කත්මන්ඩුහි එක කාමරයකින් යුත් මැදිරියක ඉතා කුඩාවට ආරම්භ කළහ. මහජන සේවා ගුවන් විදුලි විකාශ ලෙස හැඳින්විය හැකි ක්‍රියාවන් ආරම්භ කළ රේඩියෝ සාගර් මාතා ගුවන් විදුලිය රේඩියෝ විප්ලවය පිළිබඳ පූර්ව නිමිත්තක් විය. ගුවන් විදුලි භාවිතය රජයේ පාලනයෙන් නිදහස් වී වසරක් ඇතුලතදී ගුවන් විදුලි නාලිකා 50ක් පමණ ආරම්භ විය. සංගීත කර්මාන්තය නගා සිටුවීම වෙනුවට ගුවන් විදුලි නාලිකා ඉතාමත් ඉක්මණින් ප්‍රධාන - බොහෝ අවස්ථාවලදී එකම - ප්‍රවෘත්ති මූලාශ්‍රය බවට පත් විය. ප්‍රවෘත්ති ප්‍රචාරණය කිරීමට ගුවන් විදුලි නාලිකා වලට අයිතිය ලබා දෙමින් ශ්‍රේෂ්ඨාධිකරණය 2001 ලබා දුන් සුවිශේෂී තීරණයක් තුළින් මෙම භාවිතය නීත්‍යනුකූල කරනු ලැබීය.

2005 රජකීය කුමන්ත්‍රණයෙන් පසු ආණ්ඩුව හය මසක් පුරා ප්‍රවෘත්ති හා සම්බන්ධ වැඩසටහන් ගුවන් විදුලි හරහා ප්‍රචාරය කිරීම තහනම් කළේය. ඒ වන විට ගුවන් විදුලි නාලිකා කාලීන තොරතුරු සහ ප්‍රවෘත්ති සඳහා වූ ප්‍රවේශය වෙනස් කොට තිබිණි. තවද, ගුවන් විදුලිය මගින් 'පුවත් පතේ තියෙන්නේ කුමක්ද' නම් වූ විශේෂාංගය හරහා පුවත් පත් සඳහා ඇති අවකාශය වැඩි කර දී තිබුණි. ගුවන් විදුලි ප්‍රවෘත්ති සඳහා ප්‍රවේශය තහනම් කරමින් නේපාලයේ රජු 70%ක පමණ නූගත්කම මෙන්ම කඳුකර ප්‍රදේශ වල දුර්වල මාර්ග හා ගුවන් සබඳතා ඇති නේපාලයේ තිබූ වැදගත් ස්වාධීන ප්‍රවෘත්ති මූලාශ්‍රයක් ජනයාට අහිමි කළේය. එවිට තිබූ එකම ප්‍රවෘත්ති මූලාශ්‍රය බීබීසි හි නේපාල සේවය වූ අතර තොරතුරු දැනගැනීමේ පිපාසයෙන් පෙළුණ විශාල ජනයා සංඛ්‍යාවක් කෙටි තරංග ගුවන් විදුලි යන්ත්‍ර මිලදී ගැනීමට පෙළ ගැසිණි.

"රජය නේපාලයේ ප්‍රවෘත්ති ජනමාධ්‍ය තහනම් කළ හොත් පුවත් පත් සහ ගුවන් විදුලි ප්‍රචාර ගෙන ඒම සඳහා නේපාල දේශසීමා ඔස්සේ ඉන්දීය නගරවල ජාලයක් ජනමාධ්‍යවේදීන් කණ්ඩායමක් විසින්, ගොඩනංවා තිබුණි"යැයි වැඩියෙන්ම බෙදා හැරෙන ඉංග්‍රීසි මාධ්‍ය පුවත් පත වන කත්මන්ඩු පොස්ට් හි එවකට සිටි කර්තෘ වරයා වන ප්‍රතීක් ප්‍රධාන් ප්‍රකාශ කළේය. කෙසේ වෙතත් ,ජනමාධ්‍යවේදීන්ගේ මේ ආකාර ප්‍රතිරෝධයන් ට ප්‍රතිචාරය වූයේ මර්දනය ඉහළ යාමය.

ජනයාට ස්වාධීන ප්‍රවෘත්ති මූලාශ්‍රයක් අහිමි වීමට අමතරව තව දුරටත් ප්‍රචාරය කිරීමට අවසර නොමැති වූ ජනප්‍රිය වැඩසටහන්හි අනුග්‍රහකයින් ඔවුන් දක්වා තිබූ අනුග්‍රහය ඉවත් කර ගැනීමෙන් පසු ගුවන් විදුලි නාලිකා විශාල සංඛ්‍යාවක් බිඳ වැටුණි. ඉන්, රට පුරා ගුවන් විදුලි නාලිකා වල සේවය කරමින් සිටි මාධ්‍යවේදීන් 1000කට පමණ රැකියා අහිමි විය.

එනමුත්. රාජකීය කුමන්ත්‍රණයේ අර්බුදය සහ ඉන් පසුව ක්‍රියාත්මක කළ හදිසි අවස්ථාව, වාරණය සහ ගුවන් විදුලි නාලිකා වසා දැමීමට විරුද්ධව ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය සංවිධාන එකමුතු කිරීමට හේතුවක් විය. ප්‍රජා ගුවන් විදුලි ප්‍රචාරකයන්ගේ සංගමය (ප්‍රජා ගුවන් විදුලි නාලිකා කිහිපයක්ම නියෝජනය කරන සංවිධානයකි), නේපාල බ්‍රෝඩ්කාස්ට්ං ඇසෝසියේෂන්, කත්මන්ඩු නිම්න ගුවන් විදුලි ප්‍රචාරකයන්ගේ සංගමය සහ ස්වාධීන ගුවන් විදුලි ආරක්ෂා කිරීමේ ව්‍යාපාරය වැනි සංවිධාන යටතේ ජනමාධ්‍යවේදීහු විරෝධතා ව්‍යාපාර දියත් කළහ.

රේඩියෝ විප්ලවය, ඒ වන විට ශක්තිය අතින් වර්ධනය වෙමින් පැවති ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ව්‍යාපාරය තුළ ද ප්‍රමුඛස්ථානය ද ගත්තේය. ගුවන් විදුලි සඳහා අවමංගල්‍ය ආගමික වතාවත් ඇතුළත් මළ ගියවුන්ට කරනු ලබන ශාන්තිකර්ම පැවැත්වීම , ශබ්ද විකාශන යන්ත්‍ර යොදා ගනිමින් 'තෝරා ගත් පිරිස් වෙත' ප්‍රවෘත්ති බෙදා හැරීම සහ වීදිවල ප්‍රවෘත්ති ශබ්ද නගා කියවීම වැනි නව්‍ය ක්‍රම මඟින් මහජන පරිකල්පනය පුබුදුවාලන ලදී. ගුවන් විදුලි ජනමාධ්‍යවේදීන් පෙන්වූ ධෛර්‍යවන්තකම හා නිර්මාණාත්මක විරුද්ධකම්පෑම විසින් රට පුරා ප්‍රජාතන්ත්‍රවාදයට පක්ෂ පිරිස් ප්‍රබෝධමත් කරන ලදී.

ගුවන් විදුලිය වර්තමානයේදීත් නේපාලයේ විශාල ජන කොටසක් වසඟ කර ගෙන සිටී. මෑත කාලීන සමීක්ෂණයකට අනුව ග්‍රාමීය ප්‍රදේශයන්හි රූපවාහිනියට වඩා ගුවන් විදුලියට ඇති කැමැත්ත 2 : 1 ක් විය.[3] අද වන විට, ගුවන් විදුලි කර්මාන්තයේ සමෘධිමත්භාවය විශාල ගුවන් විදුලි නාලිකා ප්‍රමාණයෙන් පමණක් නොව ඉහළ සංඥා ශක්තියකින් සහ ආවරණයකින් යුත් සම්ප්‍රේෂණ කුළුණු ස්ථාපනය කිරීම මගින්ද පෙනී යයි. ආදායම සඳහා ප්‍රචාරක දැන්වීම් ලබා ගැනීමට දරුණු තරගයන් පවතී. වසර 12ක කැරලි සහ දේශපාලන අස්ථාවරත්වයෙන් පසු නැවත ප්‍රාණවත් වීමට වෙර දරන පූර්ණ දුගී

2 බලන්න Radio Station Information at http://www.nepalradio.org/p2_information.htm Accessed September 16, 2010.

3 බලන්න Broadcast Audience Survey (2006-2007) at http://www.nepalradio.org/p3_audience_reports.htm Accessed September 16, 2010.

භාවයේ උඟුළට හසුව සිටින්නාවූ ද, භූමියෙන් වටවූ ද ආර්ථිකයක් තුළ මෙම තරංගය ස්වාධීන ජනමාධ්‍ය පිළිබඳ ව කණගාටුදායක පූර්ව නිමිත්තකි. සැළකිල්ල යොමු විය යුතු තවත් කරුණක් වන්නේ පුහුණුවක් නොලත් පුද්ගලයන් ගුවන් විදුලි කර්මාන්තයට ඇතුළු වීමයි. මෙය කරුණ විසින් වෘත්තීයමය ජනමාධ්‍යවේදය සඳහා සදාචාර ප්‍රතිපත්ති සහ මාර්ග නිර්දේශ සංග්‍රහයක් සම්පාදනය කිරීම සඳහා ඇති හදිසි අවශ්‍යතාවය පෙන්නුම් කරයි. ගුවන් විදුලි සම්ප්‍රේක්ෂකයන්ගේ මෙහෙයුම් ප්‍රකාශනය සහ 2008 දී දියුණු කරන ලද මෙහෙයුම් මාර්ග උපදේශ අත්පොත ස්වයං නියාමනය සම්බන්ධයෙන් තැබූ සුවිශේෂ පියවරකි.[4]

## ජාත්‍යන්තර සහයෝගීතාවය

සාම ක්‍රියාවලිය තුළ, එක්සත් ජාතීන් විසින් හිටපු කැරළිකරුවන් රඳවා ඇති කඳවුරු නිරීක්ෂණය කිරීම නොනවත්වා සිදු කිරීම වැනි ක්‍රියාවන් ඇතුළත් වැදගත් කාර්යභාරයක් ජාත්‍යන්තර සංවිධාන සතුව තිබිණි. මෙවන් නිල මැදිහත්වීම වලට අමතරව, මානව හිමිකම් හා ජනමාධ්‍ය නිදහස උල්ලංඝණය වීම් ඉස්මතු කිරීමේදීද ජාත්‍යන්තර සහයෝගීතාවය වැදගත් මෙහෙයක් ඉටු කළේය.

රාජකීය කුමන්ත්‍රණයෙන් පසු නේපාල ජනමාධ්‍යවේදීන් සමඟ සහයෝගීතාව දැක්වීමටත් බලධාරීන් වෙත බලපෑම් කිරීමටත් මාධ්‍ය නිදහස පිළිබඳ වූ ජාත්‍යන්තර දූත පිරිස් පහක් නේපාලයට පැමිණියහ. දකුණු ආසියානු ජනමාධ්‍ය සහයෝගිතා ජාලය වැනි ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය මඟින් පිහිටුවා ඇති කලාපීය ජාලයන් විසින් කරන ලද මැදිහත් වීම් විසින් දේශ සීමා හරහා කැරෙන ජනමාධ්‍යවේදීන්ගේ සහයෝගීතාව ජාතික බලය දරන්නන්ට බලපෑම් කළ හැකි ශක්තිමත් මූලාශ්‍රයක් බව පෙන්වා දුන්නේය. ඔවුන් ගේ වාර්තා කිරීම් හේතුවෙන් අවතැන් වූ සහ අවදානමක පසු වූ ජනමාධ්‍යවේදීන් ජාත්‍යන්තර සහ කලාපීය ජාලයන්හි සහය ඇතිව ආරක්ෂාව තකා ඉන්දියාවට ගියහ. නේපාල දේශපාලනයේදී ඉන්දියාව වැදගත් කාර්ය භාරයක් ඉටු කළ බව පැහැදිළිව හඳුනා ගත හැකි වූ අතර සහය ඉල්ලීම් නව දිල්ලියේ ඇති ආරක්ෂක ආයතනය වෙත යොමු කරන ලදී. එසේම දකුණු ආසියාවේ ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ අනුග්‍රාහක ප්‍රකාශ ලබා ගන්නා ලදී. නේපාලයේ ප්‍රජාතන්ත්‍රවාදය සහ මාධ්‍ය නිදහස නැවත ස්ථාපිත කිරීමට අනුබල දෙමින් ප්‍රකාශන නිකුත් කළ හිටපු ඉන්දීය අග්‍රාමාත්‍ය අයි.කේ. ගුජ්රාල්, ජොෂ්ඨ තීරු ලේඛක ඉන්දියානු පාර්ලිමේන්තු මන්ත්‍රී කුල්දීප් නායර්, පකිස්තානු මානව හිමිකම් කොමිසමේ සභාපති අසීමා ජහන්ගීර් සහ පකිස්තානයේ ඩේලි ටයිම්ස් පුවත් පතේ කර්තෘ ජනාම් සේති යන අය එසේ අනුග්‍රහ දැක්වූ පුද්ගලයන් අතර වූහ.

"ජාත්‍යන්තර ජාලයන්, නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලය සතු ප්‍රධාන වත්කමකි. රාජකීය පාලනය පැවති කාලයේදී අපි එයින් සම්පූර්ණ ප්‍රයෝජන ගත්තෙමු" යැයි කුමන්ත්‍රණය අතරතුර සිරගත කර සිටි නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයේ බිෂ්ණු නිස්තුරි පවසයි.

පැහැදිලිව පෙනෙන පළමු ජාත්‍යන්තර මැදිහත් වීම වූයේ රාජකීය කුමන්ත්‍රණයෙන් සතියකට පසු ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයේ ඒ වන විට සභාපතිත්වය දැරූ ක්‍රිස්ටෝපර් වොරන් විසින් නායකත්වය දෙනු ලැබූ දූත පිරිස නේපාලයට පැමිණීමයි. කෝපන්හේගන්හි මාධ්‍ය සඳහා ජාත්‍යන්තර සහයෝගීතාවය විසින් ඊට සහාය ලබා දෙන ලදී. ඊළඟ මාස කිහිපය ඇතුළත තත්ත්වය ක්‍රම ක්‍රමයෙන් නරක අතට හැරීම හේතුවෙන් සංවිධාන 12ක පමණ එකතුවක් විසින් 2005 ජූලි මාසයේදී නේපාලය වෙත දූත මෙහෙවරක් එවනු ලැබීය.[5] ඉන් පසුව එවන් දූත මෙහෙවරයන් 2006 මාර්තු සහ සැප්තැම්බර්වලදී සහ 2008 ජනවාරි සහ අප්‍රේල් වලදීද 2009 පෙබරවාරි මාසයේදීද දියත් කෙරිණි. මෙම දූත මෙහෙයන්ගේ අරමුණ වූයේ ප්‍රකාශනයේ නිදහස සහ ජනමාධ්‍ය අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට සහ වඩා ශක්තිමත් කර ගැනීමට නේපාල ජනමාධ්‍යයට සහය දීමයි. එම අවස්ථාවේ සෑම සංවිධානයක්ම එකම හඬින් හඬ නැගීමටත් එකම උපාය මාර්ග පිළිබඳ එකම පරමාර්ථ පසුපස හඹා යාමත් අවශ්‍ය විය.[6]

අතිශය හුදකලා බවක් පැවති සමයකදී දියත් කළ පළමු දූත මෙහෙය රටෙහි ජනමාධ්‍යවේදීන්ගේ ධෛර්ය වර්ධනය කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදය සහ ජනමාධ්‍ය නිදහස සඳහා වන ඔවුන්ගේ ඉල්ලීම් නීත්‍යානුකූල කිරීම යන අරමුණ සාර්ථකව ඉටුකර ගත්තේය. ඒ වන විටත් ඇතැම් බටහිර රටවල් මාවෝවාදී අන්තවාදීන්ට විරුද්ධව ඇති එකම ආරක්ෂක ප්‍රාකාරය රජු බව සිතමින් විශාල වශයෙන් රජුට ආධාර කළ කාලයකදී ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ නේපාල ව්‍යාපාරය ජාත්‍යන්තරීකරණය කිරීම ඉතා වැදගත් විය.

පළමු වන දූත මෙහෙයන් දෙක බරපතල තර්ජන සඳහා දැක්වූ ප්‍රතික්‍රියාවන් විය. 2008 ජනවාරිවලදී දියත් කළ දූත මෙහෙය ජනමාධ්‍ය සංවර්ධනය සඳහා දීර්ඝ කාලීන නිර්දේශ සොයා ගැනීම සඳහා උත්සාහ කළ ඇගයීමක් විය. 2008 අප්‍රේල් දූත මෙහෙය තුළින් උත්සාහ කළේ නේපාල ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලය තේරීමේ මැතිවරණය අතරතුර මාධ්‍ය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ඒ පිළිබඳ නිරීක්ෂණය කිරීමයි. 2009 පෙබරවාරි දූත මෙහෙය ජනමාධ්‍ය විරෝධී ප්‍රචණ්ඩත්වයෙහි බරපතල හදිසි ඉහළයාමකට දැක්වූ ක්ෂණික ප්‍රතිචාරයක් විය.

දූත මෙහෙවර ඇගයීම් වාර්තාවක පෙන්වා දෙන පරිදි, "මාධ්‍ය මත පනවා ඇති සීමා ලිහිල් කිරීම පිළිබඳව එක් වරම රජයට ඒත්තු ගැන්වීමට ජාත්‍යන්තර ජනමාධ්‍ය දූත පිරිස අසමත් වූ නමුත්, වඩා බලවත් තහනම් වලට විරුද්ධ නිවර්තකයක් ලෙස ක්‍රියා කරමින් රාජ්‍ය පාලනය මත සාමූහික බලපෑමක් නිර්මාණය කිරීමේදී සහ ගොඩ නැංවීමේදී ඉතා සාර්ථක විය."[7]

## විපාක නොලැබීම - සමාප්තිය සහ සාධාරණත්වය ළඟා කර ගැනීම

දශකයක් පමණ වූ කැරළිකාර සමය තුළ වදහිංසා පැමිණවීම සහ අතුරුදහන්වීම් දක්වා පටන් නීතියට පිටින් සිදු කළ ඝාතන දක්වා වූ මානව හිමිකම් උල්ලංඝණය වීම් රාශියක් දැක ගත හැකි විය. නේපාල රාජකීය හමුදාව සහ මාවෝවාදී මහජන විමුක්ති හමුදාව යන දෙපාර්ශවයම එම මානව හිමිකම් උලංඝණය වීම් සඳහා වගකිව යුතු විය. මෙම සමය තුළ සහ ඉන් පසුව ජනමාධ්‍යවේදීහු බොහොමයක් ඝාතනයට ලක් වූහ, වදහිංසා වලට භාජනය වූහ, එමෙන්ම 'අතුරුදහන්' වූහ. යුද්ධය නිල වශයෙන් අවසාන වීමෙන් සහ අවබෝධාත්මක සාම ගිවිසුමට අත්සන් තැබීමෙන් පසුව ද ප්‍රචණ්ඩත්වය එක් වරම අවසන් වූයේ නැත. පශ්චාත් අර්බුද සමයේ සිදුවූ අමතක නොවන ඝාතන අතර 2009 ජනවාරි මාසයේදී සිදු වූ උමා සිං ඝාතනය කැපී පෙනේ. 2007 ඔක්තෝබර් මාසයේදී මාවෝවාදීන් විසින් පැහැර ගනු ලැබූ බාරා මූලස්ථානය කොට ගත් ඇවෙනියුස් ටීවී හි සේවය කළ ජනමාධ්‍යවේදියෙකු වූ බිරේන්ද සා ගේ මෘත ශරීරය 2007 නොවැම්බර් මාසයේදී සොයා ගන්නා ලදී.

4 බලන්න Radio Broadcasters' Code of Conduct & Operational Guidelines 2008 at http://www.nepalradio.org/p2_coc.htm Accessed September 16, 2010.

5 Article IXI, Committee to Protect Journalists, International Federation of Journalists, International Media Support, International Press Institute, Press Institute of India, Reporters sans Frontières, South Asia Free Media Association, UNESCO, World Association of Community Radio Broadcasters, World Association of Newspapers, World Press Freedom Committee

6 Bhattarai, Binod, 2008. *Mission: Press Freedom: An account of the International Press Freedom and Freedom of Expression to Nepal (2005 to 2008).*

7 Bhattarai, Binod, 2008. *Mission: Press Freedom: An account of the International Press Freedom and Freedom of Expression to Nepal (2005 to 2008).*

# ලොක්කාගේ පැතිරුණු බලය

2010 මැයි 27 වන දින, ඉන්දියානු ආදායම් බදු අංශය විසින් කැනඩාවෙන් හා දකුණු කොරියාවෙන් ආනයන කර කත්මන්ඩු කරා ප්‍රවාහණය කරමින් තිබූ නැව්ගත පුවත්පත් මුද්‍රණ කඩදාසි ටොන් 1000ක තොගයක් අත්අඩංගුවට ගන්නා ලදී. එම කඩදාසි තොගය අඩංගු කන්ටේනර් 39 "විමර්ශනයට" භාජනය කිරීමට අවශ්‍ය බව කියා සිටින ලදී. මෙම භාන්ඩ තොගය කත්මන්ඩුහි වැඩයෙන්ම බෙදා හැරෙන නේපාලි හා ඉංග්‍රීසි මාධ්‍ය දිනපතා පුවත්පත් වන කන්තිපූර් සහ කත්මන්ඩු පෝස්ට් ප්‍රකාශණය කරන කන්තිපූර් සමාගම වෙත ප්‍රවාහණය කරමින් තිබූ අතර එම ප්‍රකාශකයන් කත්මන්ඩු හා ඉන්දියානු තානාපති කාර්යාලය සමග සාකච්ඡා පවත්වමින් සිටි අතරතුර පවා කඩදාසි තොගය මසකට වැඩි කාලයක් කල්කටාහි රඳවා තබා ගැනින.

වෙළද හා සංක්‍රමණ එකඟතාවයන්ට අනුව නේපාලයට භාණ්ඩ අපනයනය හා ආනයනය කිරීමේදී ඉන්දියානු ප්‍රදේශ හරහා බාධාවකින් තොරව ප්‍රවාහණය කිරීමේ අයිතිය නේපාලනට තිබේ. මුද්‍රා තබන ලද කන්ටේනර් ඍජුවම නේපාල ගොඩබිම් වරායන් වෙත යැවීමේ ඉඩ දෙනු ලැබේ. මීට වෙනස් ආකාරයට කටයුතු සිදු වනු ඇත්තේ කිසියම් අයථා කටයුත්තක් සම්බන්ධයෙන් සාක්ෂි ඇත්නම් පමණකි. මෙම සිදුවීමේදී ඉන්දියානු තානාපති කාර්යාලය හා ඉන්දීය විදේශ කටයුතු අමාත්‍යංශය යන දෙකම කිසිදු අනිසි ක්‍රියාවක් සිදුව නැති බව කියා සිටියද කන්තිපූර් සමාගම විසින් ඉන්දියානු ජාතික යහපත හා සම්බන්ධ කටයුතු වලට හානි වන ආකාරයේයැයි සැලකෙන වාර්තා ඉදිරිපත් කිරීම නිසා ඔවුන් ඉන්දියානු රජයේ උදහසට ලක් වී ඇති බව පැහැදිළි විය.

ඉන්දියාවේ ඇසෑම් - මෙඝලයා කලාපයේ නේපාලි බස කතා කරන පුද්ගලයන්ට එල්ල වූ ප්‍රහාර පිළිබඳව පුවත්පත් ආවරණය සහ නේපාල ගැමියන් අවදානමකට පත් කරමින් රටවල් දෙකම බෙදා ගන්නා හෝසි නදියේ ඉදි කෙරෙන ඇල මාර්ග පිළිබඳ වාර්තාවක් නිසා ඉන්දියානු තානාපති කාර්යාලය කෝපයට පත් වී තිබූ බව විශ්වාස කරනු ලැබේ. "ඉන්දියානු පිටුබලය ඇතැයි පෘතුලව විශ්වාස කල" මහාදේව් කුමාර්ගේ ආණ්ඩුවට එරෙහිව කන්තිපූර්හි කර්තෘමය ස්ථාවරය සහ " ඉනිදියාවේ මාවෝවාදී අර්බුදය නව දිල්ලිය විසින් කළමණාකරනය කිරීම පිළිබඳ එහි ආවරණය" කේනිත්යට තවත් හේතුවක් වී යැයි කියනු ලැබේ.

තිරය පිටුපස සිදු වූ සාකච්ඡා සාර්ථක නොවූ විට කන්තිපූර් පුවත්පත පියවරක් ඉදිරියට තබමින් මාධ්‍ය නිදහස සඳහා වූ සංවිධාන කිහිපයකම සැළකිල්ල යොමු වී ඇති බව පෙන්වා දුන් ප්‍රකාශයන් ඉදිරිපත් කරමින් කඩදාසි තොගය අත්පත් කර ගැනීම පිළිබඳ ප්‍රවෘත්තිය මුල් පිටුවේ මුද්‍රණය කළේය.

ඊට ප්‍රතිචාරයක් ලෙස කර්කශ සටහනක් නිකුත් කළ ඉන්දියානු තානාපති කාර්යාලය ප්‍රකාශ කළේ භාන්ඩ අභිප්‍රායන් චර්යානුගත රේගු විමර්ශනයකට ලක්ව ඇති බවත්, "මෙම ගැටළුව ප්‍රසිද්ධ කර ඇති විකෘති ස්වභාවය රේගු විමර්ශනයන් ඉක්මණින් සමථයකට පත් කර ගැනීමට උපකාරී නොවන" බවත්ය. එනමුත් ජූනි 27 වන දින පුවත්පත් සඳහා යොදා ගන්නා කඩදාසි තොගය නිදහස් කිරීමට මඟපෑදුවේ ද නිශ්චිත වශයෙන් මෙම ප්‍රසිද්ධිය සහ බලපෑමයි.

එම සිදුවීම එතැනින් අවසාන විය යුතුව තිබිණි. අගොස්තු 27 වන දින කත්මන්ඩු හි ඉන්දියානු තානාපති කාර්යාලය "නේපාලයේ ඉන්දියානු හවුල් ව්‍යාපාර විසින් නිෂ්පාදිත භාණ්ඩ වලට විරුද්ධව" වාර්තාකරණයේ යෙදුණු "ඇතැම් මුද්‍රිත සහ රූපවාහිනී මාධ්‍ය" පිළිබඳ සදහන් කෙරුණ මාධ්‍යය නිවේදනයක් නිකුත් කිරන ලදී. තව දුරටත් මෙම ප්‍රකාශය එම මාධ්‍ය ආයතනයන්ට කප්පම් ගැනීමේ අභිප්‍රායක් ආරූඩ කළේය. එහි සදහන් වූ ආකාරයට ඇතැම් සංවිධාන කිහිපයක්ම, "එවන් මාධ්‍ය ආයතන" තමන් වෙත පැමිණ "ප්‍රචාරක දැන්වීමක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටිමින් එසේ නොකළ හොත් නිෂේධාත්මක ප්‍රසිද්ධියක් ලබා දෙන බවට තර්ජනය කළ බවත් තානාපති කාර්යාලයට දැනුම් දී ඇති බව" ප්‍රකාශයේ සදහන් විය.

එම සිදුවීමෙන් පසුව ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය සමිති, මාධ්‍ය ආයතන සහ නේපාල පුවත්පත් මංඩලය රාජ්‍ය තාන්ත්‍රික යෝග්‍යතාවයට හානිකිරීම සහ නේපාල ජනමාධ්‍ය නිදහස සහ ස්වායත්තතාවයට දරුණු ලෙස අගෞරව වන ආකාරයෙන් ක්‍රියාකලේයැයි ප්‍රසිද්ධියේ ඉන්දීය තානාපති කාර්යාලයට චෝදනා කරමින්,  සහිත විරෝධතා කුණාටුවක් දියත් කළේය. නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය තානාපති කාර්යාලයේ ප්‍රකාශනය "අනුචිත සහ නොහොඹිනා " එකක් ලෙස නම් කළ අතර සම්පූර්ණ සිදුවීම පිළිබඳව "සවිස්තරාත්මක අධ්‍යයනයක්" දියත් කිරීමට පොරොන්දු විය. ඒ අතර, නේපාල රූපවාහිනී විකාශකයෝ, නේපාල ජනමාධ්‍ය සමාජය, නේපාල විකාශන සංගමය සහ ප්‍රජා ගුවන් විදුලි විකාශකයන්ගේ සංගමය ද මෙම ගැටළුව ඉන්දීය තානාපති කාර්යාලයට සමඟ සම්බන්ධ කරන ලදී. ඉන්දීය තානාපති කාර්‍යාලය ඊට ප්‍රතිචාර දැක්වුයේ, ජනමාධ්‍යයන්හි පවත්නේ යැයි කියූ ආචාර ධර්මීය නොවන භාවිතයන්ට අවධානයක් ලබා දී තිබුණේ නම් ජනමාධ්‍ය සංවිධාන වැඩි විශ්වසනීයත්වයකට හිමිකම් කියනු ඇති බව සදහන් කිරීමෙනි.

කන්තිපූර් සමාගම විසින් ආනයනය කළ පුවත්පත් මුද්‍රණ කඩදාසි තොගය රඳවා තැබා ගැනීමට ඉන්දීය රජය ගත් තිරණය ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය සිය ඉන්දීය අනුබද්ධ ආයතනවල සහය ද ඇතිව දේශපාලන වෙනස්කම් උඩ කරන ලද්දකැයි විවේචනය කර තිබිණි. පසුව විරෝධය උත්සන්න වූ සන්ධර්භය තුළ ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය සිය නේපාල සහ ඉන්දියානු අනුබද්ධ සංගමයන් සමඟ එක්ව ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා අවසන් තීරණයක් ලබා ගැනීම පිණිස, ප්‍රශ්ණය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ඇතුළත් වාර්තාවක් නේපාල පුවත්පත් මංඩලය වෙත ඉදිරිපත් කරන ලෙස සියළුම පාර්ශවයන්ගෙන් ඉල්ලා සිටියේය. මෙම ක්‍රියා පිළිවෙත, නේපාල ජනමාධ්‍යයෙහි ආයතනමය ධාරිතාව ගොඩනැංවීමටත්, ආචාර ධර්මීය සහ වෘත්තීයමය කල් ක්‍රියා පිළිබඳ තීරණ ගැනීමෙහිලා මඟ පෙන්වනු ඇති පූර්වාදර්ශ ස්ථාපනය කිරීමටත් උපකාරී වනු ඇතැයි ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය සහ එහි අනුබද්ධ ආයතනයන් විශ්වාස කළෝය.

අපරාධකරුවන් තවමත් නීතිය ඉදිරියට පමුණුවා නොමැත.

අර්බුදය අතරතුර සහ පශ්චාත් සමයෙහි ජනමාධ්‍යවේදීන්ට සහ ජනමාධ්‍යයට එල්ල කළ ප්‍රහාරයන්ට දුර්විපාක නොලබන සංස්කෘතියක් ගොඩ නැංවී තිබිණි. එම සංස්කෘතිය අවසන් කිරීම මානව හිමිකම් සංවිධාන වල සහ මාධ්‍ය නිදහස වෙනුවෙන් අධිවාචනය කරන්නන්ගේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් වැදගත් අංගයකි. කෙසේ හෝ ස්ථාවර පෙළඹවීම් වලින් පසු ගැටුම නිසා අනතුරට භාජනය වූවන් වෙනුවෙන් අරමුදලක් පිහිටුවීම සඳහා නේපාල් ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය සාර්ථක ලෙස රජයට බලපෑම් කර ඇත. ඉදිරියට තබා ඇති තවත් පියවරක් වන්නේ දුර්විපාක නොලැබීම පිළිබඳ සොයා බැලීමට දිස්ත්‍රික්කයන්හි යාන්ත්‍රණයක් පිහිටුවීමට රජය පෙළඹවීමයි. දිස්ත්‍රික්කයන්හි මෙම ව්‍යාපාරය ජාතික මානව හිමිකම් කොමිසම සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක කර ඇත.

නේපාල් ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයේ වර්තමාන සභාපති වන ධර්මෙන්ද්‍ර ජාට හැඟී යන්නේ කායික ආරක්ෂාවෙහි මදබව හේතුවෙන් ජනමාධ්‍යවේදීන් ඉටු කරන කාර්යයට ඇති ගෞරවය අඩු

වන බවත්, යම් අවස්ථාවලදී ඔවුන්ගේ ජීවිත පවා අනතුරට භාජනය විය හැකි බවත්ය. "නීතිමය පිළියම් සොයා යන සංස්කෘතියක් ඇති කළ යුතුය. චෝදනා ගොනු කර ඒවායේ තාර්කික නිගමනයන්ට පැමිණිය යුතුය. නඩු විභාග ඉක්මණින් පැවැත්වෙන බවත් අපරාධකරුවන් නීතිය හමුවට පමුණුවන බවත් අපගේ නීතීඥ මිතුරන් සමඟ එක්සත් වී සුරක්ෂිත කර ගත යුතුය. කමකට නැති නීති පද්ධතිය අළුත්වැඩියා නොකළ හොත් සහ මානව හිමිකම් උල්ලංඝණය වීම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවුවහොත් දුර්විපාක නොලැබීමේ සංස්කෘතිය අවසන් නොවේ" යැයි ඔහු පවසා සිටී.

වෙනසක් ඇති කිරීම සඳහා බලධාරින්ට ප්‍රබල අවශ්‍යතාවයක් ඇති බව පෙන්වීමට උදාහරණයක් ලෙස ගත හැකි කිසිදු සිදුවීමක් මේ වන විටත් දැකිය නොහැකිය. 2008 ඔක්තෝබර් 8 වන දින අතුරුදහන් වූ, නොවැම්බර් 28 වන දින මෘත ශරීරයේ සුන්බුන් සොයා ගැනුණු, මාවෝවාදී නැඹුරුවක් ඇති ජනදිශා පුවත්පතේ දංගඩී සංස්කරණයේ කර්තෘ වූ, ජේ.පී ජෝෂි ගේ සිදුවීම පිළිබඳ විමර්ශනය කිරීමට කොමිසමක් ස්ථාපනය කරන ලදී. නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයේ මධ්‍යම කමිටු සාමාජික දහාල් ඉදිරිපත් කළ තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳ වූ නීතිය යටතේ වූ ලේඛනයක් හෙළි කළේ සභා වාර වෙනුවෙන් මෙම කොමිසම නේපාල රුපියල් මිලියන 3ක් වියදම් කර ඇති නමුත් මේ වන විටත් කිසිදු වාර්ථාවක් ප්‍රසිද්ධ කර නොමැති බවය.

එසේම 2007 දී බිරේන්ද්‍ර සා පැහැරගෙන ගොස් ඝාතන කිරීමට සම්බන්ධ සැකකරුවන්ට චෝදනා නොකිරීම වග කිය යුත්තන්ට ත්‍යාග පිරිනැමීමක් ලෙස බොහෝ දෙනාට දැණුනි. නේපාල් කොමියුනිස්ට් පක්ෂය (මාවෝවාදීන්) විසින් සා ගේ ඝාතනය මාවෝවාදී කාඩර් විසින් සිදුකර ඇති බව පිළිගත්තේය. පහළ ස්ථරයේ පක්ෂ සාමාජිකයන් තුළ දැකිය හැකි පුද්ගලවාදී සහ අරාජික ස්වභාවය හේතුවෙන් එම සිදුවීම හට ගත් බව පක්ෂය ප්‍රකාශ කළේය. එනමුත්, 2009 නොවැම්බර් මාසයේ දී මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය නිකුත් කළ ප්‍රකාශනයක දැක්වුණේ ඔවුන් දිගින් දිගටම සිදු කළ කැඳවීම් සහ අවවාද කිරීම් මධ්‍යයේ මාවෝවාදීන් සා ගේ ඝාතනය සඳහා චෝදනා ලද සැකකරුවන් සිවු දෙනාගෙන් දෙදෙනෙකු වූ ලාල් බහදූර් චවුදාරි සහ කුන්දන් පවෝයුජ්දාර් පක්ෂයේ බාරා දිස්ත්‍රික්ක කාරක සභාවේ ලේකම් තනතුරු වලට පත් කර ඇති බව වාර්තා වී ඇති බවයි.

## ජන ආන්දෝලන් 2 සහ වත්මන් අභියෝගයන්

2006 අප්‍රේල් මාසයේ දී ක්‍රියාත්මක වූ ජන ආන්දෝලන් 2 ව්‍යාපාරය රාජකීය අත්තනෝමතිකත්වය පෙරලා දමා පාර්ලිමේන්තුව නැවත ස්ථපිත කිරීම මගින් ජය ලබා ගත්තේ ය. වෙනස සඳහා වූ සියළුම ව්‍යාපාරයන් තුළ සාමය, ප්‍රජාතන්ත්‍රවාදය, ෆෙඩරල්වාදය, අන්තර්කරණය සහ වාර්ගික නියෝජනය යන ජනප්‍රිය මතයන් විද්‍යමාන විය. නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයද කාන්තාවන්, වාර්ගික සුළුතරයන් සහ දලිට් ප්‍රජාව වෙනුවෙන් නියෝජනය සහතික කිරීම උදෙසා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ මහත් උනන්දුව විසින් ඉදිරියට ගමන් කරවන ලදී. කෙසේ හෝ මෙම නැඹුරුතාවය, ජනතා ප්‍රශ්න කිරීම් වලට ලක් වූ අතර, වෘත්තීය අනන්‍යතාවයන්ට ඉහළින් වාර්ගික අනන්‍යතාවයන්ට අනුබල දීමට වෘත්තීයමය සංවිධාන යටත් නොවිය යුතු බව ඇතැම් විවේචකයන් පෙන්වා දුන්නේය. අනෙක් අතට මුද්‍රිත, ගුවන් විදුලි සහ අන්තර්ජාල ජනමාධ්‍යවේදීන්ට කෝටා ක්‍රමයක් නොමැති නම්, වාර්ගික පදනම් ඔස්සේ වන පංගු සහ කොටා ප්‍රිය උපදවන දෙයක් නොවීමට ඉඩ ඇත. තවත් අතකට, සමානුපාතික නියෝජන ක්‍රමය වඩා හොඳ යැයි පිළගන්නා පිරිස් වලට සිතන්නේ නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය විසින් වාර්ගික සංයුතිය අතින් සමාජයේ කැඩපතක් විය යුතු මෙන්ම අනතුරට භාජනය විය හැකි සහ හඬක් නොමැති ප්‍රජාවන් ගේ වුවමනාවන් වෙනුවෙන් පෙනී සිටිය යුතු බවයි.

නේපාලයේ 2007 අප්‍රේල් මාසයේ දී පැවැත්වුණු ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලය සඳහා වූ මැතිවරණයෙන් හිටපු කැරලිකාර කණ්ඩායම වැඩි ආසන ගණනක් ලබා ගත් තනි පක්ෂය බවට පත් වෙමින්, සහාග ආණ්ඩුවේ මූලිකත්වය ගැනීමට අවස්ථාව ලබා ගත්තේය. 2009 මැයි මාසයේදී නේපාල කොමියුනිස්ට් පක්ෂය (මාවෝවාදීන්) ආණ්ඩුව අතහැරීමක් සමඟ, විශාල බලාපොරොත්තු මධ්‍යයේ නේපාලය ජනරජයක් ලෙස ප්‍රකාශයට පත් කළද, වාර්ගික ෆෙඩරල්වාදය, හිටපු සටන් කරුවන් අන්තර් ග්‍රහණය කිරීම සහ සන්නද්ධ හමුදාවට ඉහළින් සිවිල් ආධිපත්‍ය බලපැවැත්වීම ආදිය පිළිබඳව පැවති කලහකාරී ගැටලු හේතුවෙන් අස්ථාවර භාවයක් ඇති විය.

නේපාල මාක්ස් ලෙනින්වාදී කොමියුනිස්ට් පක්ෂය (ඖළබ) විසින් මෙහෙයවන වත්මන් සහාග ආණ්ඩුව පරස්පර විරෝධී අදහස් සහ අභ්‍යන්තර අසමඟියෙන් පිරී ඇත. නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම ආරම්භ කර ඇති අවස්ථවේදී පවා වාර්ගික ෆෙඩරල්වාදී ඉල්ලීම් දිගින් දිගටම සමාජ දේශපාලන ව්‍යුහය සොලවාලමින් සිටී. ආර්ථික අර්බුදය මධ්‍යයේ සියුම් අඩුපාඩු, නීතියක් තොර බවෙහි වර්ධනය සහ තෙරායි අසහනය විසින් මූලික ප්‍රජාතන්ත්‍රවාදී නිදහස තර්ජනයට ලක් කර ඇත. ස්ත්‍රී පුරුෂ සහ වාර්ගික අනන්‍යතාවයන් විශේෂිත අනතුරට භාජනය විය හැකි පිරිස් අතර වේ. ඒ අතර, මදේශි හෙවත් තැනිතලා වල ජනයාගේ ව්‍යාපාරය හේතුවෙන් ඇති වී ඇති අසහනය නිසා වඩා දුෂ්කර ප්‍රදේශ වල සහ තෙරායිහි සේවය කරන ජනමාධ්‍යවේදීන් ද අනතුරට මුහුණ පාති. වර්තමාන සන්දර්භය තුළ ළඟා කර ගැනීමට අපහසු වෘත්තිමය දුරස් භාවය ඇති කරගැනීම දුෂ්කරය, වගකීම් සහගතවීම සහ දඬුවම් නොලැබීම අවසන් කිරීම වෙනුවෙන් බල කිරීම සඳහා නැගූ හඬ මෙන්ම රාජ්‍ය ගොඩ නැංවීමේ සහ සාමය ස්ථාපිත කිරීම පිළිබඳ වූ කතිකාව සඳහා දායක වීම පිළිබඳව ජනමාධ්‍ය ඉටු කළ කාර්යභාරය අසම්පූර්ණ ස්වභාවයකින් යුතුව ඉතිරිව තිබේ .

2007 දී සම්මතවූ වෘත්තීය ජනමාධ්‍යවේදී පනත සහ තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනත වැනි වැදගත් පනත් තිබුණ ද ඒවා ක්‍රියාත්මක වීම ප්‍රමාදය. එමෙන්ම තාවකාලික ව්‍යවස්ථාව අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහතික කරන නමුත් වත්මන් නීති ක්‍රියාත්මක කිරීම සඳහා තවමත් බොහෝ දේ කිරීමට ඇත. එලෙසම, කමිටුවක් හරහා මාධ්‍යවේදීන් සහ මාධ්‍ය වෘත්තිකයන් අවම වැටුප් තීරණය කිරීම අපමණ උත්සහයන් තුළින් ලබා ගත් ප්‍රතිඵලයක් වූ නමුත්, එම තීරණ ඒකාකාර ලෙස ක්‍රියාත්මක කිරීම තවමත් සිදුවන්නේ නැත.

රාජාණ්ඩුව පැවති සහ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සටන් කළ අවධියේදී, ප්‍රජාතන්ත්‍රවාදය නැවත ස්ථාපිත කිරීම නම් වූ එකම අරමුණින් යුතුව, හිමි කරුවන්, අයිතිකරුවන්, කර්තෘ වරුන්, ජනමාධ්‍යවේදීන්, සහ සෙසු සියළු මාධ්‍යසේවක ප්‍රජාව එකට ඒකරාශී වූහ. සාම ක්‍රියාවලිය ආරම්භ වීමෙන් පසු, කළමණාකාරීත්වය සහ සේවකයන් අතර ඇති අසමඟිය ප්‍රකට කරමින් කම්කරු සහ වැටුප් ප්‍රශ්න සමඟ ප්‍රතිවිරෝධතා තියුණු වීම ආරම්භ විය. වෘත්තියෙහි ආරක්ෂාව, සේවා ප්‍රතිලාභ, රක්ෂණ සහ වෙනත් ගැටළු කැකෑරීම දිගටම පැවතෙන්නට වූ අතර, මෙම ගැටළු සමඟ ගනුදෙනු කිරීමට ප්‍රථමයෙන් ව්‍යවස්ථාව කෙටුම්පත් කළ යුතු බවට පොදු හඬ නැගෙන තත්ත්වය තුළ තවමත් එම ඉල්ලීම් වලට සුදුසු අවධානය ලැබී නොමැත. කැරළිකාරිත්වයෙන් පසු ආර්ථිකය ගොඩ නැංවීමේ අභියෝගය විසින් අඩු වැටුප් සහ අනාරක්ෂිත සේවා වටපිටාවවන් සම්මතය බවට පත් කිරීමද ජනමාධ්‍යට අයහපත් ලෙස බලපා ඇත.

ජන ආන්දෝලන් 2 කාලයේ වූ උපාය මාර්ග උචිත අයුරින් වෙනස් වීමේ අවශ්‍යතාවය පෙන්වා දෙමින්, නේපාල් ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයේ උප සභාපති වරයා වන ගෝවින්ද් ආචාරියා ප්‍රකාශ කරන්නේ "මහ මඟ විරෝධතා දැක්වීමේදී අපි ශක්තිමත්. ආණ්ඩුවට තෙරපුමක් යෙදිය හැකි ආකාරයෙන් එක් දිනක දැනුම් දීමකින් අපිට මාධ්‍යවේදීන් දහස් ගණනක් වීදි වලට රැස් කළ හැකියි. කෙසේ වුවද, තත්ත්වය ඉතා ඉක්මනින්ම ආපස්සට ගිහින් දීර්ඝ කාලීන උපාය මාර්ග

යක දැඩි අවශ්‍යතාවය පෙන්නුම් කරනවා" යනුවෙනි.

ශිවා ගවුන්ලි පැවසුවේ "එෆ්.එන්.ජේ. වැනි ජනමාධ්‍යවේදීන්ගේ සංවිධානවල පරිණාමය, වෘත්තීමය ආයතන නියමයන් මත සිදු විය අතර ඒ සමගම එහි සාමාජිකයන් විසින් හොඳම ජනමාධ්‍යවේදී වටිනාකම් පිළිපැදීම සිදු විය යුතු" බවයි.

සාම ක්‍රියාවලියෙන් පසු ඇති වූ උද්ඝෝෂණ වලදී ප්‍රමාණවත් අවධානයක් නොලැබූ කරුණක් වූයේ රාජ්‍ය පාලිත මාධ්‍ය මහජන සේවා ජනමාධ්‍ය බවට පරිවර්තනය කිරීමයි. වර්තමානයේදී රාජ්‍ය සතු ගෝර්ඛා පත්‍ර සහ රයිසින් නේපාල් වැනි මුද්‍රිත මාධ්‍යද, රේඩියෝ නේපාල් සහ නේපාල් ටීවී වැනි ඉලෙක්ට්‍රොනික මාධ්‍යද, එමෙන්ම රශිත්‍රියා සමාචාර් සමිති (නේපාල පුවත් ආයතනය) වැනි පුවත් ඒජන්සි ද ප්‍රජාතන්ත්‍රවාදයට පක්ෂව සිටින අතර වඩා නිදහස් මතධාරී වී ඇත. නමුත් එය ආයතන මට්ටමින් ඇති සංවරණ සහ තුළන නිසා සිදු වූවකට වඩා වත්මන් දේශපාලන වාතාවරණයේ ප්‍රතිඵලයක් වේ.

දේශපාලනය අපරාධකරණය සහ අපරාධ දේශපාලනීකරණය කරා වර්ධනවීම මාධ්‍ය නිදහසට බරපතල අභියෝග මතු කර ඇත. සාම ක්‍රියාවලියෙන් පසුව මතුවූ සංසිද්ධියක් වන වාණිජ අවශ්‍යතාවයන්හි බලපෑම හා දැන්වීම් අදායම සඳහා ඇති තරඟය ඉහල යාම මාධ්‍ය නිදහස මත හානි කර බලපෑමක් ඇති කරයි. පෙර නිර්භීතව සිටි ජනමාධ්‍ය ප්‍රජාව තුළ ඔවුන්ට නොදැනීම ස්වයං වාරණයක් බිහි වී ඇත. එනමුත් පැතිරයන සර්ව සුභවාදය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ඇති මහත් උනන්දුව හේතුවෙන් ව්‍යවස්ථාව සම්පාදනය වන තුරු ලබන වසර ඇතුළත ජනමාධ්‍ය ප්‍රජාවෙහි පැවැත්ම සහතික වනු ඇතිබව බෙහෝ දුරටම පෙනේ.



පාකිස්ථානයට කෙරුණු මෑත කාලීන අන්තර්ජාතික මාධ්‍ය නිදහසේ දූත මෙහවරයන් දේශීය සහ ජාත්‍යන්තර වෘත්තීය සංගම අතර සහයෝගිතාවය ගොඩ නැගීමට පියවර ගත්හ. (ජායාරූප ස්තුතිය: පීඑප්යූජේ)

# පාකිස්ථානය

## ආතතියට හසුවූ ජනමාධ්‍යවේදය

රටක් වශයෙන් එහි ජීවිත කාලයෙන් අඩක් පමණ මිලිටරි ආඥාදායකයින් යටතේ පැවති පාකිස්තානය, සෙසු ප්‍රජාතන්ත්‍රවාදී ආයතන දුර්වලව පවතින අතරතුර ශක්තිමත් ජනමාධ්‍යයක් පවතින විට ජනමාධ්‍යවේදීන් මුහුණ දෙන භයානක තත්ත්වයන් පිළිබඳ උදාහරණ සපයයි. මාධ්‍ය, විශේෂයෙන් ජනමාධ්‍ය ප්‍රජාව දේශයේ ආරම්භයේ පටන්ම ප්‍රජාතන්ත්‍රවාදය සහ වගවීම සහතික කිරීම සඳහා වන අරගලයේ ප්‍රමුඛස්ථානයෙහි සිට ඇත. ආඥාදායක රිජීමයන් තුළ සංවරණ සහ තුළන ක්‍රියාත්මක නොවීම මගින් ජනමාධ්‍යවේදීන් පහසුවෙන් අනතුරට භාජනය විය හැකි වුවද, පාකිස්තානයේ මාධ්‍යවේදීන් අකමැත්තෙන් වුවද සඳහන් කරන්නේ පසුපසට ඇද දැමීමක් සිදු නොවුණ රටේ පවතින එකම ආයතන වන්නේ මාධ්‍ය සහ හමුදාමය ආයතන පමණක් වන බවයි.

## ගැටුම් ආවරණය කිරීම සහ දුර්විපාක නොලැබීම පිළිබඳ අනාවරණය

"සමස්ථ පාකිස්තානයම ගැටුම් කලාපයක්" බව කෘතහස්ථ මාධ්‍යවේදියෙකු සහ පාකිස්තානු පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ (ජඹ්න) හිටපු මහ ලේකම් වන මස්හාර් අබ්බාස් පවසයි. මාධ්‍ය ආයතන සිය සේවකයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය පමණින් කටයුතු නොකරන බව දක්වන හෙතෙම, "රාජකාරියෙහි ආරක්ෂාව කිසි සේත්ම ලැබී නොමැති අතර රක්ෂණ ආවරණ සහ ආත්මාරක්ෂක පුහුණුද සපයා නොමැති බවත්, මධ්‍යම පොඩරල් ආන්ඩුවෙන් පරිපාලනය කරන ගෝත්‍රික ප්‍රදේශ වන(ඵ්ඕ), බලුකිස්ථානය සහ වයඹ දිග ෆ්‍රොන්ටෙනියර් දිස්ත්‍රික්කය වැනි ගැටුම් කලාප ලෙස ප්‍රකාශයට

පත් කර ඇති ප්‍රදේශ වල සේවය කරන ජනමාධ්‍යවේදීන්ට පවා වෙඩි නොවදින කබා වැනි ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය උපකරණවත් ලබා ගැනීමට නොමැති බවත්" පෙන්වා දෙයි.

යුද්ධ නීතිය යටතේ, විවේචන හෝ හමුදාවේ කාර්ය භාරය පිළිබඳව ලිවීම පවා තහනම් වූ අතර මාධ්‍ය දැඩි සීමාවන්ට යටත් විය. පාකිස්තානය තුළ එක්සත් ජනපදයේ භූමිකාව විවේචනය කිරීමද විශේෂයෙන්ම 2007 මැද භාගයේදී තීව්‍ර කෙරුණු, 2001 සැප්තැම්බර් වලින් පසු දියත් කළ හමුදා මෙහෙයුම් පිළිබඳ වාර්තා කිරීම ආණ්ඩුව අපහසුතාවයකට පත් කරවනක් විය. කෙසේ වෙතත්, 2008 ආරම්භයේදී ජෙනරාල් පර්වේස් මුෂාරෆ් තනතුර අතහැරීම සහ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් ස්ථාපිත කිරීමෙන් පසු, මාධ්‍ය පිළිබඳ තත්ත්වය වෙනස් විය. පාකිස්තානයේ දෛනික කටයුතු වලට හමුදාව මැදිහත්වීම සාපේක්ෂ වශයෙන් අඩු ය. ඇමෙරිකාව තවදුරටත් අත නොතැබිය යුතු 'ශුද්ධ වූ ගවයා' නොවන අතර අතර එහි ක්‍රියාවන් ජනමාධ්‍ය විසින් බරපතල ලෙස විවේචනයට ලක්වෙයි. 2010 දී බීබීසී ආයතනය විසින් සිදුකළ අදහස් විමසීමකදී සමීක්ෂණයට බඳුන් වූ රටවල් 28ක්ම ගෝලීය වශයෙන් එක්සත් ජනපදයේ භූමිකාව පිළිබඳ පොදු අවබෝධය වැඩා දියුණු වී තිබූ අතර එය පහළ ගොස් තිබුණේ තුර්කියෙහි සහ පාකිස්තානයෙහි පමණි.

දැන් ජනමාධ්‍යවේදීන් බිය ගැන්වීම් කැරෙන්නේ රජය සහ හමුදාවට වඩා අවිගත් කණ්ඩායම් වලිනි. "තලෙයිබාන්වරු සෙවණැලි මිස පුද්ගලයන් නොවෙති" යැයි පවසන සාමා ටීවීහි ලාහෝර් කාර්යාංශ ප්‍රධානී හබීබ් අක්‍රම් "ව්‍යාජ විද්‍යුත් තැපැල් ලිපින මගින් පණිවුඩ හා නොදන්නා දුරකතන අංක මගින් ඇමතුම් ලැබේ. සමස්ථ සමාජයම බහු විධ තර්ජනයන් හමුවේ සිටින අවස්ථාවකදී ජනමධ්‍යවේදීන් මෙම බිය ගැන්වීම් බරපතල ඒවා ලෙස නොසලකති." යනුවෙන් ද පවසයි.

ගැටුම් වාර්තා කිරීම සඳහා ජනමාධ්‍යවේදීන් (ැපඉැාැා වදමරබ්කසිප) යුධ බිමට රැගෙන යාමේ ස්ථාවර නැඹුරුවක් පක්ස්තානයේ යුධ කලාප වල නොමැති නමුත්, හමුදාව මගින් අළුතින් අත් පත් කර ගත් ස්වාත් නිම්නය වැනි ප්‍රදේශවලට මාධ්‍ය කණ්ඩායම් රැගෙන යාමේ පුරුද්දක් පවතී. නමුත්, තොරතුරු සඳහා ඇති ප්‍රවේශය ඉතා අවම වන අතර එවැනි අවස්ථා වලදී සිදුවීම් වල සියළුම පැති ආවරණය කිරීමට කිසිසේත්ම නොහැකිය. මාධ්‍යයන්හි වාර්තාකරණයේ සමබරතාවයක් පවත්වාගෙන යාමේ ප්‍රයත්නයේ පැහැදිලි මාරු වීමක් දැකිය හැකි බව ජ්‍යෙෂ්ඨ ජනමාධ්‍යවේදියෙකු වන ෆාද් හුසේන් පෙන්වා දෙයි. ඔහු "වසරකට පෙර තුළ තලෙයිබාන් විරෝධී සහ තලෙයිබාන්වරුන්ට අනුකම්පාව දැක්වූ කණ්ඩායම් වශයෙන් මාධ්‍ය තුළ ව්‍යාකුලත්වයක් පැවති බව" ද පවසයි. ''නමුත් ස්වාත් හි විශාල මිලිටරි මෙහෙයුමක් දියත් කිරීමෙන් පසු ඇරඹි කාලය එනම්, 2009 මාර්තු - අප්‍රේල් කාලයෙන් පසුව ජනමාධ්‍ය ප්‍රතිචාරය සම්පූර්ණයෙන්ම වෙනස් විය. හදිසියේම, තලෙයිබාන් වරු ඉස්ලාමාබාද් වලට කි.මී. 60ක් පමණ ආසන්නයේ වන තම නිවෙස් කරාම ළගා වී බූනර් වෙත ඇතුළුවීම ජනමාධ්‍ය සොලවාලීය. එසේම, කාන්තාවකට පොදු ස්ථානයකදී කස පහර පහර දෙන දර්ශන ඇතුළත් වීඩියෝ පටය පොදු ජනතාව තුළ පැවති 'ශුද්ධ රණ විරුවන්' පිළිබඳ අදහස් වෙනස් කිරීමට විශාල ලෙස හේතු විය" යැයි තවදුරටත් පවසයි.

2009 දී ස්වාත් හි සිටි ජනතාව සහන කඳවුරු වෙත ගලා ආ විට, පළමු වතාවට එම ප්‍රදේශ වල සිටි ජනතාව සමග සම්බන්ධවීමට අවස්ථාව ලැබිණි. ස්වාත් නිම්නයේ සිටි බොහොමයක් ජනමාධ්‍යවේදීන්ද අවතැන්වී ජීවිතය පවත්වා ගැනීමේ උත්සාහයක යෙදී සිටියහ. පළමු වතාවට, ස්වාත් හි සාමාන්‍ය වැසියන්ගේ වේදනාවන් පිළිබඳ අවධානය යොමු කරන ලෙස ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය වලට බල කෙරුණි. තමන්ම අත්දුටු මෙම අත්දැකීම් සටන්කාමීත්වය පිළිබඳ ජනමාධ්‍යයේ අදහස් වෙනස් කළේය.

2001 සැප්තැම්බර් 11න් පසු පකිස්තානය සහ එහි ගෝත්‍රික ප්‍රදේශ කෙරෙහි යොමු වූ ලෝක අවධානය හැසිරවීමට දේශීය රූපවාහිනී ආයතන සූදානම් වී නොසිටි බව ඩේලි ටයිම්ස් හි පෙෂාවෝර් කාර්යංශයේ ප්‍රධානී සහ දේශ සීමා රහිත ජනමාධ්‍යවේදීන්ගේ ආයතනයේ නියෝජිතයෙකු වූ ඉක්බාල් කතාක් පවසයි. "ප්‍රමාණවත් පුහුණුවකින් තොර ජනමාධ්‍යවේදීන් වේගයෙන් වර්ධනය විය. බොහෝ ජනමාධ්‍යවේදීන් ජීවිතයෙන් වන්දි ගෙවූ අතර තවමත් සේවය වෙනුවෙන් මියයන" බවත් ඔහු පෙන්වා දෙයි. ආරක්ෂක ස්ථානයක සිට සිද්ධීන් ආවරණය කළ හැකි කැමරා ආරෝහන කාව වැනි තාක්ෂණික දියුණුවේ වාසි මගින් මෙන්ම, අනතුරට භාජනය විය හැකි බොහෝ ප්‍රදේශ වල පවත්වන සරල ආරක්ෂක පුහුණු මගින් අගනා ජීවිත ආරක්ෂා කර ගත හැකිව තිබූ බව කතාක්ගේ අදහසයි.

ගෝත්‍රික ප්‍රදේශ වලදී ජනමාධ්‍යවේදීන් වැඩි අවදානමකට ලක් වේ. එහිදී ඔවුන්ට සටන් කාමීත්වයේ සහ හමුදා නායකයන්ගේ බලපෑම් පමණක් නොව වැටුප් සහ රැකියාවේ තත්ත්වය පිළිබඳව ද අනාරක්ෂිත බවක් ඇත. 2009 දී ස්වාත්හි සිදුවූ හමුදා මෙහෙයුම් වැනි ගැටුම් කාලයන්හිදී පාකිස්තානු ෆෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයට අනුබද්ධ ක්යිබර් ජනමාධ්‍යවේදීන්ගේ එකමුතුව විසින්, ගැටුමට හිරවී සිටි ජනමාධ්‍යවේදීන් හට සිය තොරතුරු ජනතාව වෙත ලබා දීමේ වැඩකටයුතු දිගටම සිදු කිරීම සඳහා සහය ලබා දෙන ලදී.

පකිස්තානු ෆෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයට අනුව, 2008 පෙබරවාරි සහ 2010 මැයි දක්වා, යුද ගැටුම්වලට මැදිව සහ රජකාරියෙහි යෙදී සිටියදී ඝාතනයට ලක් වූ ජනමාධ්‍යවේදීන් හැර ඉලක්ක ගත ප්‍රහාර මගින් ජනමාධවේදීහු 9 දෙනෙකු ඝාතනය කරන ලදී. ඒ මෙසේ යඃ 2010 මැයි - සින්ද් පළාතේ වාහි පන්ධි හි ඩේලි සින්දු පුවත් පතේ ගුලාම් රසූල් බිර්හාමනී, 2010 පෙබරවාරි - කයිර් පූර්, මෙහ්රාන් ටීවී හි අශික් අලි මන්ගි, 2009 අගෝස්තු - ජම්රුද්හි ක්හේබාර් ඒජන්සියට අයත් , ශම්ෂාද් ටීවී හි සේවය කළ පෙෂාවෝර් පදනම් කර ගත් ඇෆ්ගන් නිදහස් මාධ්‍යවේදියෙකුවූ ජනුල්ලා හෂිම්සාදා, 2009 පෙබරවාරි - සිවාත්හි ද නිවුස් හි සහ ජියෝ ටීවී හි සේවය කළ මූසා ක්හාන් කේල්, 2009 ජනවාරි - කොහෙත්හි අවාමි ඉන්ක්‍යුලාබ් හි සේවය කළ අමර් වකීල් , 2008 නොවැම්බර් - පන්ජාබ්හි රෝයල් ටීවී වෙනුවෙන් සේවය කළ අබ්දුල් රසාක් ජොහ්රා , 2008 මැයි - බජාඋර් ගෝත්‍රික ප්‍රදේශයේ එක්ප්‍රෙස් ටීවී සහ ඩේලි එක්ප්‍රෙස් හි සේවය කළ මොහොමඩ් ඉබ්‍රහිම්, 2008 අප්‍රේල් - බලුකිස්ථානයේ ක්හාබ්‍රයින් පුවත්පතේ සේවය කළ ක්හාදිම් හුසේන් ශෙයික් සහ 2008 පෙබරවාරි -බලුකිස්ථානයේ ක්වෙටාහි අක්බර් ඉ ජෙහාන් හි සේවය කළ චිස්ති මුජාහිද් යන ජනමාධ්‍යවේදීන් නව දෙනා ය.

ජනමාධ්‍යවේදීන්ට දරුණු ප්‍රහාර එල්ලකිරීම ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් දක්වා ව්‍යාප්ත විය. එක් නිදසුනක් නම් 2006 නොවැම්බර් මාසයේදී දකුණු වසිරිස්තාන්හි බීබීසී වාර්තාකරුවෙකු වූ දිලවාර් ක්හාන් වසීර් ගේ සොහොයුරා වූ 16 හැවිරිදි තයිමූර් ක්හාන් වදහිංසා පමුණුවා ඝාතනය කිරීමයි. 2005 දෙසැම්බර් මාසයේදී අල් ක්වේඩාහි ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වූ මාසා රාබියා ඝාතනයට ලක් කළ පිපිරීම පිළිබඳ වාර්තා කිරීමෙන් පසු, උදූර් ඩේලි අවුසාෆ් සහ ද නේෂන් හි උතුරු වසිරිස්තාන් වාර්තාකරු ලෙස සහ යුරෝපියන් ප්‍රෙස් ඒජන්සිහි ඡායාරූප ශිල්පියෙකු ලෙස කටයුතු කළ හයතුල්ලාහ් ක්හාන් පැහැරගෙන යන ලදී. 2006 ජූනි මාසයේදී ඝාතනය කොට තිබූ හයතුල්ලාහ් ගේ සිරුර සොයා ගැනුණි. ඉන් පසුව ඔහුගේ බිරිඳ සහ බාල සහෝදරයාද ඝාතනය කරන ලදී.

කතාක් පවසන අන්දමට, 2002 සිට 2010 මැයි දක්වා ජමාධ්‍යවේදීන් 32කු ස්වය කරමින් සිටියෙදී ඝාතනය කර ඇත. කිසිදු නිසියාකාර පරීක්ෂණයක් මේ ඝාතන පිළිබඳව පවත්වා නොමැත. පාකිස්තානු ෆෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය විසින් යොදනු ලැබූ බලපෑම හේතුවෙන් හයතුල්ලාගේ මරණය පිළිබඳව පමණක් අධිකරණයේ නඩු විභාගයක් පැවැත්වීමට හැකි විය. එහි වාර්තාව තවමත් නිල වශයෙන් ප්‍රකාශයට පත් කොට නොමැති අතර නොනිල වශයෙන් ප්‍රකාශයට පත් කළ අධිකරණ විමර්ශනයේ නිර්දේශ මගින් දැක්වෙන්නේ ගෝත්‍රික ප්‍රදේශ වල නිසි ආකාරයේ පරීක්ෂණයක් සිදු කළේ නම් ඝාතකයයන් හඳුනා ගැනීමට අවශ්‍ය සාක්ෂි ලැබෙන්නට ඉඩ තිබූ බවයි. කෙසේ




පාකිස්ථානයේ වෘත්තීය සංගමයන්හි ස්ත්‍රී සහභාගිත්වය මෑත වසරහිදී ඉහළ ගොස් ඇත. එය තීරණාත්මක අරගලයන්හි ප්‍රතිපලයකි. (ඡායාරූප ස්තුතිය:පීඑජ්යූජේ)

වෙතත්, පෙෂාවෝර්හි මහාධිකරණයට ගෝත්‍රික ප්‍රදේශ පිළිබඳ අධිකරණ බලයක් නොමැත. එමෙන්ම, මුසා ක්හාන් කලීල්ගේ ඝාතනය පිළිබඳ පත් කළ විමර්ශන කමිටුව තවමත් ඒ පිළිබඳ වැඩ අරඹා නොමැත. 2002 පෙබරවාරි මාසයේදී වද හිංසා පමුණුවා මරා දැමුණු වොල් ස්ට්‍රීට් ජර්නල් හි දකුණු ආසියානු කාර්යාංශයේ ප්‍රධානී ඇමරිකානු ජාතික ඩැනියෙල් පර්ල් ගේ ඝාතන සිදුවීම පිළිබඳව පමණක් වේගවත් පරීක්ෂණ සහ සාක්ෂි ඉදිරිපත් කිරීමක් සිදුවූ අතර අහමඩ් ඕමාර් සයීඩ් වරදකරු බවට තීරණය කරන ලදී. ඇමරිකානු බලපෑම මත වේගවත් වූ මෙම පරීක්ෂණය මුෂාරෆ් පෞද්ගලිකව පාලනය කළේය.

මරා දැමුණු මාධ්‍යවේදීන්ගේ පවුල් නිහඬ කිරීමට හෝ පරීක්ෂන ඉල්ලා සිටීම නතර කිරීමට මහත් බලපෑමක් වූ බැවින් එකී පවුල්හි ආරක්ෂාව සහ වන්දි ලබා ගැනීම සහතික කිරීමට පකිස්තානු පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය ක්‍රියා කළේය. වරදකරුවන් නීතිය ඉදිරියට පැමිණ වීමට අදාල අංශ අසමත්වීම නීතියේ පාලනය සහ යහ පාලනය නොමැති වීමේ ලක්ෂණයකි. සියළුම ආයතනයන්හි වගවීම වැඩි කිරීම සඳහා යාන්ත්‍රණයන් වැඩි දියුණු කළහොත් මිස ජනමාධ්‍යවේදීන් නිහඬ කිරීමට උත්සහ දැරූවන්ට ඔවුන්ගේ අපරාධ සඳහා වන්දි ගෙවීමට සිදු විය හැකි අවස්ථා ඇත්තේ ඉතාමත් සුළුවෙනි. එනයින් යුද්ධ නීතිය සමයේ දී මෙන් "සතුරා" පැහැදිලිව හඳුණාගත නොහැකි ප්‍රජාතන්ත්‍රවාදීවාදයේ කාලයන්හි දී වගවීම උදෙසා උද්ඝෝෂනය කිරීම ජනමාධ්‍යවේදී සංවිධානයන්ට එක්සත් විය හැකි ඉල්ලීමක් බවට පත්වෙයි.

## ජනමාධ්‍යවේදීන්ගේ අයිතීන් වෙනුවෙන් සංගමයන්හි ඓතිහාසික අරගලය

ජනමාධ්‍ය විසින්, උපමහාද්වීපයේ යටත් විජිත විරෝධී ව්‍යාපාරයන්ට ශක්තිමත් දායකත්වයක් ලබා දුන් අතර, බ්‍රිතාන්‍ය පාලනය අවසන් වීමත් සමඟ මතු වී ආ ඉන්දියානු සහ පකිස්තානු ස්වාධීන ජාතීන් තුළ ඉතා වැදගත් භූමිකාවක් නොනවත්වාම රඟ දක්වයි. මොහොමඩ් අලි ජින්නා විසින් නිර්මාණය කරනු ලැබූ මන්ෂූර් හෙවත් අරුණෝදය, හමීඩ් නසාමි විසින් ආරම්භ කළ නවා ඉ වක්ත් සහ ඉෆ්තිකාරුධීන්ගේ සභාපතිත්වය යටත් ඇති ප්‍රොග්‍රෙසිව් පේපර්ස් ලිමිටඩ් (සීමාසහිත ප්‍රගතිශීලී පුවත්පත් සමාගම) හි ප්‍රකාශන, ශක්තිමත් ලෙස දේශප්‍රේමී සහ ස්ථිර යටත් විජිත විරෝධී ස්ථාවරයකින් සමන්විත වූ අතර ජනමාධ්‍යවේදය සඳහා වූ ඉහලම ප්‍රමිතීන් පිළිපැද්දේය. ජනමාධ්‍ය, විශේෂයෙන්ම සෙසු දේශපාලන සහ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන එතෙකුදු දුර්වලව තිබූ නිසා ජාතියේ විවිධ කටයුතු තුළ ක්‍රියාකාරී සහ පරීක්ෂාකාරී භූමිකාවක් රඟ දක්වූහ. ශක්තිමත් දේශපාලන විපක්ෂයක් හෝ වගකීම පිළිබඳ ආයතන ගත යාන්ත්‍රණයක් නොමැති අවස්ථාවකදී අළුතින් නිර්මාණය වූ ජාතීන්හි ආණ්ඩු බලය ක්‍රියාවේ යෙදවීමේදී බලහත්කාර සහ අභිමතානුසාරී ලෙස කටයුතු කිරීමේ ඉඩක් පැවතිණි.

පකිස්තානු ව්‍යවස්ථාදායක මණ්ඩලය විසින් සම්මත කළ මර්දනකාරී ආරක්ෂක පණත හෙලා දුටු ප්‍රථම ආයතනය වූයේ පාකිස්තානු පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයයි. 1953 ඔක්තෝබර් මාසයේදී එහි යෝජනාවක් මඟින් පණතේ ඉතා දරුණු විධි විධාන ඉස්මතු කර පෙන්වා දී තිබුණි. "විදේශීය ආණුඩු පවා වඩාත් අත්තනෝමතික නීතීන් යටතේ දඩුවම් නොකළ, අර්ථ නොදැක්වුණු අපරාධයක් වූ පකිස්තානයෙහි විදේශ සබඳතා සඳහා බාධා පැමිණවීම යන අපහැදිළි චෝදනාව මත ඕනෑම පුද්ගලයෙක් රඳවාතැබීමේ හෝ දඩුවම් දීමේ බලය විධායකයට මෙමගින් පැවරේ.. ... ජාතික පුවත්පත් පාලනය සඳහා පණතේ ඇතුළත් විශේෂ විධිවිධාන මගින්... සිර ගත කිරීමේ තර්ජනය යොදා ගනිමින් ඔවුන්ගේ තොරතුරු මූලාශ්‍රය හෙළි කරන ලෙස පුවත්පත් වලට බල කිරීමෙන් විදේශ සම්බන්ධතා පිළිබඳ ඇති මත නිදහසේ ප්‍රකාශ කිරීම සහ මාධ්‍ය විසින් නිවැරදි තොරතුරු බෙදා හැරීම යටපත් කිරීම සඳහා රජයට බලතල ලබා දේ. එවන් අත්තනෝමතික බලතල විධායකය සතු වන රටක නිදහස් ජනමාධ්‍යයක් පැවතිය නොහැකි බවත්, නිදහස් ජනමාධ්‍යයක් නොමැතිව සත්‍ය ප්‍රජාතන්ත්‍රවාදයක් පැවතිය නොහැකි බවත් පකිස්තානු පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ මතයයි. එබැවින්මෙම දූෂ්‍ය නීතිය අවලංගු කරන ලෙස මෙම රැස්වීම මඟින් ඉල්ලා සිටිනු ලැබේ."

1958 ඔක්තෝබර් 8 වන දින අණ දෙන නිලධාරී ජෙනරාල් අයුබ් ඛාන් යුද්ධ නීතිය ප්‍රකාශයට පත් කිරීමක් සමඟ පකිස්තානු රාජ්‍යයේ දෙවන දශකය ආරම්භ වී වැඩිකල් යන්නට මත්තෙන් දෙවන දශකයේ දී පකිස්තානු පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයට සහ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් අගය කරන සංවිධාන වලට ප්‍රථම විශාල අභියෝගයට මුහුණ දෙන්නට සිදු විය. ජාතික සභාව විසුරුවා හරින ලදී. ව්‍යවස්ථාව අවලංගු කරන ලදී. දේශපාලන පක්ෂ සහ විවේචනාත්මක ජනමාධ්‍ය තහනම් කරන ලදී. මෙම "ලේ වැගිරීමෙන් තොර විප්ලවය" ඇරඹී සතියක් තුළ ලයිලෝ නහාර් සතිපතේ පුවත් පත කර්තෘ සයිද් සිබතේ හසාන්, ඉම්රෝස් පුවත්පතේ කර්තෘ අහමඩ් නදීම් කස්මි සහ පකිස්තාන ටයිම්ස් හි ප්‍රධාන කර්තෘ මෙන්ම කවියෙකු වූ ෆයිස් අහමඩ් ෆයිස් (ඉහත කී සෑම පුවත්පතම ප්‍රකාශණය කළේ ප්‍රොගෙසිව් ප්‍රෙස් ලිමිටඩ් විසිනි.) යන ජනමාධ්‍යවේදීන් ආරක්ෂක පනත යටතේ රඳවා තබා ගැනිනි. මාස පකට පමණ පසුව ඔවුන් නිදහස් කරනු ලැබුවේ අධිකරණ මැදිහත්වීමකින් නිසා ය. නමුත් නිදහස් මාධ්‍ය පාලනය කිරීමට සහ වාරණය කිරීමට ආයතන ගත 'උපදේශක' පද්ධතියක් පිහිටුවනු ලැබීය. ප්‍රොග්‍රෙසිව් ප්‍රෙස් ලිමිටඩ් , අයුබ් ඛාන් ගේ පාලනයට සහය දීම ප්‍රතික්ෂේප කළ විට ඛාන් තවත් පියවරන් ඉදිරියට තබමින් එම පුවත්පත් ඔහු සතු කර ගත්තේය. කාර්ය මණ්ඩලයේ විරෝධතා නැවැත්වීමට ඇතැම් අවස්ථාවලදී කළමණාකාරිත්වයට හැකි වුවද, පාකිස්තානු පෙඩරල් ජනමාධ්‍යවේදින්ගේ සංගමය ඛාන්ගේ ක්‍රියා පිළිවෙතට විරෝධය දක්වමින් යෝජනාවක් ඉදිරිපත් කළාය.

ජනමාධ්‍ය මත රජය පනවා තිබූ සීමාවන් තවත් තර කිරීමේ බලපොරොත්තුව ඇතිව 1963 දී ජාතික ජනමාධ්‍ය අරමුදල සහ සීමා

# මාධ්‍ය මට්ටු කිරීම

ප්‍රථම මිලිටරි පාලක අයුබ් ඛාන්ගේ (1959-68) පාලන කාලයේ සිටම - සහ විශේෂයෙන්ම ෂියා යුගය තුළ දී - ප්‍රථමයෙන් පහර එල්ල වූයේ මාධ්‍යවේදීන්ටය. සැබවින්ම එය එසේ සිදුවිය. 1977 දී මාධ්‍ය මර්දනය කිරීමේ ප්‍රයත්නයක් ලෙස යුද නීති රිජීමය විවේචනයට ලක් කළ බෙහෙවින් ප්‍රගතිශීලී පුවත්පත් සමූහයක්ම අත්හිටුවීමට ජනරාල් ෂියා පියවර ගත්තේය. එය ආරම්භ වූයේ මුසාවාත් සහ හර්මත් යන උර්දු පුවත්පත් දෙකෙනි. පසුව ඩේලි ටයිම්ස් නමැති දිනපතා පුවත්පතද අල් ෆටා සහ මියාර් යන සතිපතා පුවත්පත් දෙකද අත්හිටුවිණ. සිය ගණනක් දෙනා රැකියා විරහිතයන් බවට පත් වූහ. පාකිස්තානු පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය සහ පාකිස්තාන සමස්ත පුවත්පත් වෘත්තිකයින්ගේ සංගමය යන සංවිධාන යටතේ ජනමාධ්‍යවේදී ප්‍රජාව ධෛර්ය සම්පන්න ප්‍රතිරෝධයක් පෑහ. උපවාස, විරෝධතා පෙළපාලි, හිඳ ගැනීම් සහ අත්අඩංගුවට පත් වීම් එදිනෙදා සිදු වන දේ බවට පත් විය. ජනමාධ්‍යවේදීන් සිව් දෙනෙකුට කස පහර 21 දීමට නියම වූයේ මෙම ව්‍යාපාර අතරතුරදීය. එය දේශපාලන රැඳවියන්ට පණවන ලද පෙර නොවීවිරූ දණ්ඩනයක් විය. මසූදුල්ලා ඛාන්ගේ ආබාධිතභාවය නිසා ඔහුට එරෙහි දඬුවම ක්‍රියාත්මක නොකෙරිණි. අනෙක් තිදෙනා ධෛර්ය සම්පන්නව දඬුවම් වලට මුහුණ දුන්හ. දඬුවම් වලට ලක්වූ තිදෙනාගෙන් එක් අයෙකු වන්නේ බවාර් නයීම් හෂ්මිය. ඩේලි නිව්ස් පුවත්පතේ නසීර් සෙයිදි දඬුවම් පැනවීමෙන් පවා නැවැත්විය නොහැකිවිය. ඔහුගේ කෙසඟ සිරුර මතට එල්ල වූ සෑම කස පහරකදීම ඔහු ෂියා විරෝධී සටන් පාඨ කියමින් විරෝධය පෑවේය. බන්ධනාගරයෙන් පිටත ප්‍රසිද්ධියේ එල්ලා මැරීම් සිදු වූයේ ෂියා යුගයෙහිය. එය ඉන් පෙර හෝ ඉන්මතු අනුගමනය නොකළ ක්‍රියාවක් විය. එසේම රැඳවියන් අතර කුමන හෝ සන්ධානයක් ඇති වීම වැළැක්වීමේ අදහසින් රැඳවි ජනමාධ්‍යවේදීන්ට කස පහර එල්ල කළේ අනෙක් සිරකරුවන්ලවාය.


(ඡායාරූප ස්තුතිය: ලක්ෂ්මි මූර්ති)

එවකට කරච්චියෙහි ඩේලි සන් පුවත්පතෙහි සේවය කළ 22 හැවිරිදි වාර්තාකරුවෙකුවූ ඉක්බාල් ජෆ්රි ද කස පහර ලැබූවන්ගෙන් කෙනෙක් විය. දැන් නවා-ඊ-වක්ට් නම් දිනපතා පුවත්පතෙහි සේවය කරන අළු පැහැති හිස කෙසින් යුතු ජෆ්රි (ඡායාරූපය බලන්න) පවසන්නේ මෙසේය.

"ව්‍යාපාරය ආරම්භ වෙන කොට ඔවුන් හිතුවේ අත්අඩංගුවට ගැනීම් සහ බන්ධනාගාර තුළ පවතින දීන තත්ත්වයන් නිසා අපි වගේ සුදු කර පටි විරෝධතාකරුවො අධෛර්යයට පත් වේවි කියලා. ඒත් ඒක සිද්ධ නොවුණු නිසා දිගින් දිගටම විරෝධය පාන්නන්ට සැර පරුෂ පණිවුඩයක් යැවීමේ අදහසින් කස පහරවල් යොදා ගත්තා. ඒත් ඒකෙන් අත්වුණේ ප්‍රතිවිරුද්ධ ප්‍රතිඵලයක්: ව්‍යාපාරය ඉන් ජවයක් ලබා ගත්තා." පාකිස්තානු පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය තදබල බලපෑමක් යෙදීමෙන් පසු පුවත්පත්වලින් බොහොමයක් යළි ආරම්භ කරන ලදී. ඒකාධිපතිවාදී තන්ත්‍රයට එරෙහිව දේශපාලන ව්‍යාපාරය සහ සිවිල් ව්‍යාපාරය එකමුතු කිරීමට ද නිර්භය කිරීමට ද ඉවහල් වූයේ මාධ්‍ය ප්‍රජාව තුළින් මූර්තිමත්වුණු ධෛර්යයත් නොවළහා කතා කිරීමත්ය. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමේ ව්‍යාපාරවලට මාධ්‍ය ප්‍රජාව නායකත්වය දීම එතැන් සිට අඛණ්ඩව සිදු වී ඇත. ජනරාල් මුෂාරෆ්ගේ මිලිටරි තන්ත්‍රය අතරතුර දී එය පැහැදිලි විය.

සහිත ජාතික ප්‍රකාශකයෝ යන ආයතන ස්ථාපිත කිරීමෙන් පසුව ස්වාධීන ජනමාධ්‍ය මත ඇති විය හැකි විනාශකාරී බලපෑම් පිළිබඳ අනතුරු හඟවමින් පකිස්තානු පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය විරෝධතාවක් ඉදිරිපත් කළේය. යම්යම් පුවත්පත්ද ඔවුන්ටම ආවේණික වූ ප්‍රතිරෝධය දැක්වීමේ ක්‍රම භාවිත කළහ. "1963 සැප්තැම්බර් 4 වන දින ඩෝන් එකදු පේලියක් වත් මකා දමන්නේ නැතිව පුවත් සටහනක් පළ කළාය. එහි කියවුණේ 'පකිස්තාන මාධ්‍ය තොරතුරු දෙපාර්තමේනතුව, රාවල්පිණ්ඩි දුරකතන 62276, කරච්චි 2674, ඩකා 3050, අත් පත්‍රිකාව ඊ නො. 1221- කේ.' ඉන් පසුව, එම පිටුවේ ශීර්ෂපාඨයද සඳහන් විය. ළඝුලේඛකයාගේ නම , දිනය සහ වේලාව සමඟ සටහන අවසන් විය. එය ඉතා සරල වූ නමුත් නව නීතිය විහිළුවක් බවට පත් කළ අද්විතීය සහ ශක්තිමත් විරෝධතාවයක් විය. ඩොන් විසින් නව පණත සම්පූර්ණයෙන්ම පිළිපදින ලදී. සියළු පුවත් සටහන් සහ අත් පත්‍රිකා කිසිවක් මකා දැමීමෙන් හෝ නිවැරදි කිරීමෙන් තොරව වචනයක් පාසා මුද්‍රණය කල යුතුය" යන්න පනතේ එක් කොටසකින් කියවිණි. පකිස්තාන පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය විසින් ඉදිරිපත් කළ ශක්තිමත් විරෝධතාවයකින් පසුව 1963 දී ජනමාධ්‍ය සහ මුද්‍රණ පණත අත් හිටවනු ලැබූ අතර ඒ වෙනුවට, එහි මර්දනකාරීභාවය පැවතියාට වඩා ඉතා සුළු ප්‍රමාණයකින් අඩු කොට නව පණතක් ක්‍රියාත්මක කරන ලදී. නමුත් ජනමාධ්‍යවේදීන්ගේ අරගලය අවසන් වූයේ නැත.

පකිස්තානයේ වෘත්තිය සමිති ව්‍යාපරය පිළිබඳ වාර්තා කළ කෘතහස්ත ජනමාධ්‍යවේදියෙකු වූ මින්ජා හර්නා ප්‍රකාශ කරන්නේ 1968 වර්ෂය පාකිස්තානු පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය විසින් ජනමාධ්‍ය නිදහස වෙනුවෙන් දියත් කළ අරගලයෙහි ඉතා වැදගත් වසරක් වන බවයි. "සම්පූර්ණ 1968 වර්ෂයම සහ 1969 වසරේ මුල් භාගයේ ජෙනරාල් අයුබ් ගේ ඒකාධිපති පාලනයට විරුද්ධව ජනතාව විශාල වශයෙන් නැගී සිටි (අවසානයේදී ජෙනරල් යහියා ඛාන්ගේ නායකත්වයෙන් යුතු නව යුද්ධ නීති රිජීමයක් මගින් අවසන් වූ) සමයක් විය. බලාපොරොත්තු රහිතව මෙන්ම ඉච්ඡාභංගත්වයට පත්වූ අයුබ්ගේ පාලනය වඩ වඩාත් මර්දනකාරි ක්‍රියාමාර්ග වලට පෙළඹුණි. ජනමාධ්‍ය වටා තිබූ තොණ්ඩුව වඩ වඩාත් තද විය. "1966 දී ඉටෙෆාක් දිනපතා පුවත් පත තහනම් කිරීමෙන් පසු රජය නැගෙනහිර පාකිස්තානයේ ඩකාහි (දැන් බංග්ලාදේශයේ අගනුවර වන ඩකාහි) පූර්බානි සතිපතා පුවත් පත සහ ලාහෝර් හි චාතන් නම් වූ සතිපතා පුවත්පත වසා දැමුවේය. ජනමාධ්‍යවේදීන් නඩු විභාගයකින් තොරව රඳවා තැබුණු අතර ලාහෝර්හි නවායි ඉ වක්ත්, හයිද්‍රාබාද්හි ඉබ්රත් සහ ඩකාහි මුද්‍රණය වන පකිස්තානු ඔබ්සවර්, ආසාද් සහ සන්ග්බාද් යන ඇතැම් පුවත්පත් වලට ලබා දී තිබූ නිල ප්‍රචාරක දැන්වීම් ඉවත් කර ගන්නා ලදී. "මෙය ජාතික මාධ්‍ය මුහුණ දුන් විශාලතම අනතුර බව පෙඩරල් විධායක කවුන්සිලය විශ්වාස කරන බවත් එබැවින් මාධ්‍ය නිදහස නැවත ස්ථාපිත කිරීම පෙරට වඩා ඉතා අත්‍යවශ්‍ය බව පෙන්වා දෙන බවත්" 1968 දෙසැම්බර් මස 15 සිට 17 දක්වා දිනයන්හි කරච්චි හිදී රැස් වූ පාකිස්තාන පෙඩරල් ජනමාධ්‍යවේදින්ගේ සංගමයේ පෙඩරල් විධායක කවුන්සිලය ප්‍රකාශ කළේය.

ඉන් පසු ඇරඹියේ නැගෙනහිර පකිස්තානයේ ඉතාම කැළඹිලි සහගත කාල පරිච්ඡේදයකි. එය අවසානයේදී නිදහස් සටන් තුළින් 1971 දී බංග්ලාදේශය උපත ලැබීය. එනමුත් "සියළුදේම යථා තත්ත්වයෙන් තිබේ" යන මිත්‍යාව යොදා ගනිමින් රාජ්‍ය පාලිත මාධ්‍ය පකිස්තානයේ මහජනයාගෙන් සත්‍ය වසන් කොට තැබීය. සටන් විරාම ගිවිසුමකට




2009 පෙබරවාරියේ දී මූසා ඛාන් කෙල් ඝාතනයට විරෝධ්‍ය පළ කිරීමට සැරසෙන පෙශාවර් ජනමාධ්‍යවේදීන් (ඡායාරූප ස්තුතිය: කුරාම් පර්වේස්)

ළඟා වී ඇති බවත් රට දෙකඩ වීමට යන බවත් පාඨකයන් හදිසියේ දැන ගත්තේ 1971 දෙසැම්බර් 17 වන දිනයි. පාකිස්තාන හමුදා පරාජයට පත් වීම පිළිබඳවත් බංග්ලාදේශයේ ජනයාට ඔවුන් සිදු කළ දාමරික කම් පිළිබඳවත් මහජනයා සෙමෙන් අවබෝධ කර ගන්නට පටන් ගත්තේය. එම හේතුවෙන් ජනමාධ්‍ය පිළිබඳව අවිශ්වාසයක් ගොඩ නැගිණි.

කෙසේ වෙතත් යුධ නීතිය ඉවත් කිරීමෙන් පසුවද අභියෝග යන් අවසන් වූයේ නැත. 1970 ගණන් වන විට මාධ්‍ය සංවිධාන 4ක් පැවතිණි. එනම්, 1950 ස්ථාපිත කළ පකිස්තාන පෙඩරල් ජනමාධ්‍යවේදින්ගේ සංගමය, 1976 දී ස්ථාපිත කළ සමස්ත පකිස්තානු මාධ්‍ය සේවක පෙඩරේෂනය, 1953 ස්ථාපිත කළ පුවත්පත් හිමිකරුවන්ගේ සංවිධානය වූ පකිස්තාන පුවත්පත් සමාජය සහ 1957 දී ආරම්භ වු පකිස්තාන පුවත්පත් කර්තෘ වරුන්ගේ කවුන්සිලය යනාදියයි. "පකිස්තාන පුවත්පත් සමාජය සහ පකිස්තාන පුවත්පත් කර්තෘ වරුන්ගේ කවුන්සිලය සමාන්‍යයෙන් මිලිටරි පාලනය සමඟ සම්මුතීන්ට එළඹුණ අතර අරගල කිරීමට සිදු වූයේ පාකිස්තානු පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයටය."යැයි පකිස්තානයේ මාධ්‍ය සංගමයන්ගේ ඉතිහාසය පිළිබඳ වාර්තාවක් සකස් කළ මාධ්‍ය විශ්ලේෂක මහාචාර්ය තවුසීෆ් අහමඩ් ප්‍රකාශ කරයි.

1971 දෙසැම්බර් මාසයේදී නැගෙනහිර පාකිස්තානය වෙන් වීමෙන් පසුව දිවුරුම් දුන් සුල්ෆිකාර් අලි භූතෝ ගේ ජනාධිපතිත්වය යටතේද ජනමාධ්‍යවේදීන් නිහඬ කිරීමේ වෑයම් වලට විරුද්ධව ජනමාධ්‍යවේදීහු අරගල කළහ. දුෂ්ඨ නීතීන්, විශේෂයෙන්ම ජනමාධ්‍ය සහ මුද්‍රණ පණත අවලංගු කරන බවට දෙන ලද පොරොන්දුව ඉටු කිරීමටත්, ජාතික මාධ්‍ය අරමුදල අහෝසි කිරීමටත් සහ විද්‍යුත් මාධ්‍ය රාජ්‍ය පාලනයෙන් මුදවා ස්වාධීන කිරීමටත් භූතෝ සහ ඔහුගේ පක්ෂය අසමත් විය.

''ප්‍රජාතන්ත්‍රවාදය අපගේ ආණ්ඩුක්‍රමයයි" යන්න එක් ප්‍රධාන සටන් පාඨයක් ලෙස පැවැති ආණුඩව බලය ලබා ගැනීමෙන් මාස දෙකකින් පමණ පසු ලාහෝර්හි ප්‍රකාශයට පත් කෙරුණු පන්ජාබ් පන්ච් සහ උර්දු ඩයිජෙස්ට් නම් සතිපතා පුවත්පත් දෙකක්ද සින්දගී නම් මාසික පුවත්පතක්ද යුද්ධ නීති නියෝගයක් යටතේ තහනම් කළේය. (ඒ වන විට භූතෝ ජනාධිපති මෙන්ම ප්‍රධාන යුධ පරිපාලකයාද විය.) නියෝග යටතේ එකී කර්තෘවරුන් සිර ගත කිරීමෙන් නොනැවතී වසර 10ක් යන තුරු කිසිදු පුවත්පතක් සංස්කරණය කිරීම ඔවුන්ට තහනම් කරන ලදී. රටේ සාමාන්‍ය නීති යටතේ විවෘත උසාවියක විනිශ්චයක් ලබා ගැනීමේ අවස්ථාව ඔවුන්ට හිමි වූයේ නැත. රජයේ මෙම ක්‍රියාව හෙළා දුටු පාකිස්තාන පෙඩරල් ජනාමධ්‍යවේදීන්ගේ සංගමය පුවත් පත් තහනම ඉවත් කරන ලෙසත් ඒවායේ කර්තෘවරුන් නිදහස් කරන ලෙසත් රජයට බල කර සිටියේය. ඉන් පසුව කර්තෘවරුන් නිදහස් කරන ලද අතර තහනම ඉවත් කරන ලදී." යැයි ඒ වන විට පකිස්තානු පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ සභාපතිත්වය දැරූ කෘතහස්ථ ජනමාධ්‍යවේදී මින්හාජ් බර්නා එම සිදුවීම් සිහිපත් කරයි. පන්ජාබ් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ සභාපති රාජ් හස්නේන් තාහිර් ප්‍රකාශ කරන ආකාරයට "ප්‍රතිරෝධය දැක්වීමේ නව්‍ය ක්‍රමයකට තහනම මඟහැරීම සඳහා සින්දගී පුවත්පත සෑම සතියේම වෙනස් නමකින් මුද්‍රණය කරන ලදී."

විසම්මුතික ජනමාධ්‍ය මැඩ පැවැත්වීමේ ඍජු ක්‍රම යොදා ගැනීම හැරුණු කොට ජනමාධ්‍යට නොනැසී පැවතීමට අත්‍යවශ්‍ය දෑ වන පුවත්පත් කඩදාසි සහ ප්‍රචාරක දැන්වීම් ඉතා තදින් සීමා කිරීම් තුළින් ඇති කළ පීඩනයන් භූතෝගේ වකවානුව තුළ දැකිය හැකි විය.

1977 දී සියාවුල් හක් යටතේ යුධ නීතිය නැවත පැනවීමත් සමඟ ජනමාධ්‍ය පාලන කිරීමේ සහ ප්‍රජාතන්ත්‍රවාදී විසම්මුතීන් මැඩ පැවැත්වීමේ දරුණු ක්‍රම නැවත මතු විය. කර්තෘවරුන් සහ ජ්‍යෙෂ්ඨ ජනමාධ්‍යවේදීන් අත්අඩංගුවට ගෙන බරපතල සිර දඬුවම් වලට ලක් කළ අතර ඇතැමුන් තැලීම් - පෙළීම්වලටද භාජනය කරන ලදී. මෙම සමයේ මර්දනය තරමටම මතකයේ රැඳෙන තවත් දෙයක් වන්නේ පකිස්තානු පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය සහ සමස්ත පකිස්තානු මාධ්‍ය සේවකයින්ගේ සංවිධානය වැනි වෙනත් සංවිධාන විසින් දියත් කළ ප්‍රතිරෝධයයි. ජෙනරල් සියා බලය අත් පත් කර ගැනීමෙන් මාස 5ක් ගත වී නොවැම්බර් මාසය අවසන් වනවාත් සමඟම 1977 දී කරච්චිහිදී මෙම අරගලය ආරම්භ විය. පකිස්තාන පෙඩරල් ජනමාධ්‍යවිදීන්ගේ සංගමයේ අරගල ආරම්භ වූයේ කරච්චියෙහි මුද්‍රණය කරන මුසාවත් දිනපතා පුවත්පත ප්‍රකාශනය කිරීම වළක්වමින් රජය පැනවූ තහනමත් සමඟය. තහනම ඉවත් කරන ලෙස ඉල්ලා යුද්ධ නීති නිලධාරීන් සමඟ එකමුතු කමින් කටයුතු කිරීම සාර්ථක නොවුණ විට පකිස්තාන පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය සහ සමස්ත පකිස්තානු මාධ්‍ය සේවක සංවිධානය 1977 දෙසැම්බර් පළමුවැනිදා කරච්චිහිදී උපවාසයක් ආරම්භ කරනු ලැබීය. එම උපවාසයට පාකිස්තානය පුරා විසිරී සිටි ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය වෘත්තිකයන්ගේ සහභාගිත්වය ලැබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස තහනම ඉවත් කරන ලදී. ඊළඟ වසරේදී තව දුරටත් පැනවූ තහනම් වඩා ශක්තිමත් ව්‍යාපාර සඳහා හේතුවක් විය. එම වසර එසේ ගෙවී ගිය අතර සියා විසින් මාධ්‍ය සංගම් විනාශ කිරීමට දැරූ උත්සහය අසාර්ථක වීමෙන් පසු ඔහු විසින් ජනමාධ්‍ය ප්‍රජාව බෙදා වෙන් කිරීමට සහ නිලධාරීන් තෝරා ගැනීමට කළ වෑයමක් ලෙස සමාන්තර පක්ෂපාතී සංගමයක් (රශීඩ් සිද්ධිකී කණ්ඩායම) පිහිටුවන ලදී.

1989 ඔක්තොබර් 12 වන දා සිට 1999 දක්වා පාකිස්තානය බෙනාසීර් භූතෝ සහ නවාස් ශරීෆ්ගේ සිවිල් ආණ්ඩු යටතේ පාලනය විය. ඔවුන් දෙදෙනාම ධූර කාල දෙක බැගින් බලයේ රැඳී සිටියහ. එනමුත් ධූර කාලය සම්පූර්ණ කිරීමට එම සිවිල් ආණ්ඩු හතරෙන් එකකටවත් හැකියාව ලැබුණේ නැත. ජනමාධ්‍යට මෙම කාලපරිච්ජේදය ප්‍රථමයෙන් පැවති මිලිටරි ආණ්ඩු තුන යටතේ තරම් කරදරකාරී නොවූ නමුත් එම සමය බලපුළුවන්කාරකම්වලින් සහ දැඩි විධායක බලතලයන්හි බලපෑමෙන් තොර වූයේ නැත. මින්හා බර්නාට අනුව "පකිස්තාන ජනතා පක්ෂයේ දෙවන නිල කාලය අතරතුර දී ආණ්ඩුව කරච්චි හි දිනපතා පුවත්පත් කිහිපයක්ම(අවාම්, කවුමි , අඛාබාර්, පබ්ලික්, අෆ්ඝාස් සහ ඊවිනිං ස්පෙෂල් ) මුද්‍රණය කිරීම පොදු යහපත පවත්වා ගැනීමේ පනත යටතේ තතහනම් කළේය. දින කිහිපයක් ඇතුළත මෙම තහනම් කිරීම ඉවත් කළද එමගින් කරුණු දෙකක්

# ජනමාධ්‍ය සමාජ(ශාලා): මාධ්‍ය ප්‍රජාවට වේදිකාවක්

පාකිස්තානයේ ජනමාධ්‍ය සමාජ රටෙහි ජනමාධ්‍ය ඉතිහාසය තුළ පෙරමුණෙහි සිටිමින් විශිෂ්ට භූමිකාවක් රඟ දක්වා ඇත. බොහෝ විට ජනමාධ්‍ය වෘත්තීය සමිතිවල සටන්කාමී භූමිකාව තුළ පැවති අඩුපාඩුකම් පිරිමසා ඇත. අද දින පවා බොහෝ ජනමාධ්‍ය වෘත්තීය සමිති සම්පත් හිඟයෙන් පෙළෙයි. ඒ තත්ත්වය තුළ වෘත්තීය සමිතිවලට සහ සංගම්වලට හමු විය හැකි, සාකච්ඡා කළ හැකි, තම සාමාජිකයන් ඒකරාශී කළ හැකි, අවකාශයක් සහ උපකාරී වාතාවරණයක් සපයා දීමට ජනමාධ්‍ය සමාජ කටයුතු කර ඇත. 1958 දී පිහිටුවන ලද කරච්චි ජනමාධ්‍ය සමාජය (කේපීසී ) රට තුළ බිහි වුණු එවන් පළමු වැන්නයි. එහි අරමුණ වූයේ සාමාජීය සහ සංස්කෘතික අවකාශයක් සැපයීම, වෘත්තීය නිපුණත්වය වැඩි දියුණු කිරීම සහ සුභසාධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම වුවද, විශේෂයෙන් කරච්චි ජනමාධ්‍ය සමාජයද පොදුවේ සියලු ජනමාධ්‍ය සමාජද කාලයත් සමග දේශපාලන අවකාශ බවට පත්ව ඇති බවට කිසිදු සැකයක් නොමැත. විශේෂයෙන් යුධ නීතිය පැවති කාලය අතරතුරදී ප්‍රසිද්ධ ස්ථානවල රැස්වීම් පැවැත්වීම තහනම් කෙරුණු විට ජනමාධ්‍ය සමාජ ඉතා වැදගත් භූමිකාවක් ඉටු කළේ ය. ඒවා දේශපාලන රැස්වීම් පවත්වන ස්ථාන බවට පත් විය. දරුණු මර්දන සමයේ දී මාධ්‍යය දේශපාලනිකව සජීවීකරණය කිරීම සඳහා සාපේක්ෂ වශයෙන් මතභේදකාරී නොවූ පෙරමුණක් සම්පාදනය කිරීම සඳහා රට පුරා පැවති ජනමාධ්‍ය සමාජ, විශේෂයෙන්ම කරච්චි සහ ලාහෝර් පුවත්පත් සමාජ සැලකිය යුතු කාරිය භාරයක් ඉටු කළේය.

1967 දී සුල්ෆිකාර් අලි භූතෝ ප්‍රජාතන්ත්‍රවාදී හිතැති ව්‍යාපාරය දියත් කළේ ඓතිහාසික කරච්චි ජනමාධ්‍ය සමාජයේ සිටය. සැබවින්ම, ජනමාධ්‍ය සමාජ තුළ ක්‍රියාකාරීවීම වෘත්තීය සමිතිය තුළ ක්‍රියා කිරීම සඳහා සැබෑ ආරම්භක පියරවක් විය. ප්‍රාදේශීය වෘත්තීය සමිතියට කාමරයක් සැපයිණ. මේ වන විට කරච්චි ජනමාධ්‍යවේදී වෘත්තීය සමිතිය ජනමාධ්‍ය සමාජ පරිශ්‍රය තුළ කාර්යාලයක් ද ගොඩ නගා ඇත.

එමෙන්ම, කවීන්, ලේඛකයන්, සාහිත්‍යකරුවන්, පුවත්පත් හා බැඳුණවුන් සහ පොදුවේ මාධ්‍ය කර්මාන්තයේ සාමාජිකයන් ඇතුළු සාපේක්ෂව පුළුල් පදනමක් සහිත සාමාජිකත්වයකින් හෙබි මෙම ජනමාධ්‍ය සමාජවලින් මාධ්‍යයට සම්බන්ධිත පුද්ගලයන්ගේ ජව සම්පන්න සම්මිශ්‍රණයක් සම්පාදනය විය. තවද, ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ව්‍යාපාරය තුළ ක්‍රියාකාරී ප්‍රගතිශීලී දේශපාලනඥයන් සහ සිවිල් සාමාජ සංවිධාන සමග සම්බන්ධතා ඇති කර ගැනීම සඳහා අවස්ථාවක්ද ජනමාධ්‍ය සමාජවලින් මාධ්‍යයට සම්පාදනය විය. උද්ඝෝෂණ, විරෝධතා රැළි සහ හිඳ ගැනීම් ආදී උද්ඝෝෂණ ඔවුන්ගේ ගොඩනැගිල්ල අසලම පැවැත්වීමත්, යුක්තිය ඉල්ලා



පෞරාණික ගොඩනැගිල්ලක් සහිත කරච්චි ජනමාධ්‍ය සමාජය මාධ්‍ය නිදහසේ දීප්තිමත් මර්මස්ථානයකි. (ඡායාරූප ස්තුතිය: ලක්ෂ්මි මූර්ති)

කෙරුණ විවිධ ආයාචනා ජනමාධ්‍යවේදීන් ක්ෂණිකව ආවරණය කිරීමත් නිසා, කරච්චි ජනමාධ්‍ය සමාජය ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාර සමග වඩ වඩාත් අනන්‍ය විය. පෙර සිටම තර්ජන තිබියද, ජනමාධ්‍ය ආයතනයකට පළමු වතාවට එල්ල වූ මරා ගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය වූ 2009 දෙසැම්බර් පෙෂාවෝර් ජනමාධ්‍ය සමාජය ඉලක්ක කර ගත් ප්‍රහාරය හේතුවෙන්, මෙවන් ආයතනවලට තිබූ ශක්තිය පිළිබඳ මහජන පරිකල්පනය නැවත වතාවක් අලුත් විය.

ඇතැම් අවස්ථාවලදී, වෘත්තීය සමිතිවලට ලබා දිය නොහැකිවී ඇති සම්පත් සිය සාමාජිකයන්ට ලබා දීමට ජනමාධ්‍ය සමාජවලට හැකි වී ඇත. උදාහරණයක් ලෙස, පෙෂාවෝර් ජනමාධ්‍ය සමාජය යතුරු පැදි මිලදී ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ යෝජනා ක්‍රමයක් දියත් කළ අතර එය ඉහළින්ම සාර්ථක විය. මුල් ගෙවීමෙන් කොටසක් සැපයූ ජනමාධ්‍ය සමාජය, යතුරු පැදි මිලදී ගැනීමට අපේක්ෂා කළ සාමාජිකයන් වෙනුවෙන් ඇපකරු ලෙසද ඉදිරිපත් වූයේ ය. සැබවින්ම ජනමාධ්‍ය සමාජයේ සෑම සාමාජිකයෙකුටම මෙම පහසුකම ලබා ගැනීමේ හැකියාව තිබිණ. සාමාන්‍යයෙන්, ජනමාධ්‍යවේදීන්, පොලීසිය සහ නීතිඥයන් බැංකුවලින් මූල්‍ය පහසුකම් ලැබීමට නුසුදුස්සන්වන පාකිස්තානය තුළදී මෙය වැදගත් යෝජනා ක්‍රමයක් විය. තවත් සාර්ථක යෝජනා ක්‍රමයක් වූයේ ලැප්ටොප් පරිගණක මිලදී ගැනීම සඳහා ණය ලබා දීමයි. වෘත්තීය සමිති රැස්වීම් සහ පුහුණු සැසි සඳහා වෙනත් නගරවලට ගමන් කිරීමටද පුවත්පත් සමාජ සිය සාමාජිකයන්ට ප්‍රවාහන ගාස්තු ලබා දී ඇත. ජනමාධ්‍යවේදීන්ට, වඩා බැරෑරුම්ව සිය වෘත්තියෙහි යෙදීමට මෙන්ම මාධ්‍ය ප්‍රජාව තුළ සහයෝගිතාව වඩා ශක්තිමත් කිරීමටද මෙම ප්‍රායෝගික මුල පිරීම් ඉවහල් විය. (ජනමාධ්‍ය සමාජ යනුවෙන් මෙහි හැඳින්වෙන්නේ පතිසිථානය ප්‍රධාන නගර පුරා විසිර ඇති ප්‍රෙස් ක්ලබ් යන ආයතන සමූහය යි.- පරිවර්ථක)

පෙනා දෙන ලදී. 1) ප්‍රජාතන්ත්‍රවාදට සහ ජනමාධ්‍ය නිදහස වෙනුවෙන් ඔවුන්ගේ කැපවීම කෙතරම් වුවද පකිස්තානයේ සිවිල් ආණ්ඩු පවා විවේචනාත්මක ජනමාධ්‍ය සහ සිය අයහපත් පාලනය අනාවරණය වීමේ ඉඩ කඩ ඉවසුවේ නැත. 2) සෑම දෙනාම වෛර කළ මාධ්‍ය සහ මුද්‍රණ පනතට අමතරව පාලකයින්ගේ අත්තනෝමතික ක්‍රියාවන් සොයා යන ජනමාධ්‍යවේදීන් සහ පුවත්පත් වලට විරුද්ධව රජයට යොදා ගත හැකි පොදු යහපත පවත්වාගැනීමේ පනත වැනි තවත් ප්‍රජාතන්ත්‍ර විරෝධී නීති කිහිපයක්ම යොදා ගන්නා ලදී. එමෙන්ම නවාස් ශරීෆ් ගේ ආණ්ඩුව විසින් 1998 අගෝස්තු මාසයේ සිට ජැන්ග් පුවත්පත් කණ්ඩායමේ කළමණාකාරිත්වය හරිහැර වලට භාජනය කළ ආකාරයත්, 1990 මැයි 08 වන දින ෆ්‍රයිඩේ ටයිම්ස් හි කර්තෘ නජාම් සේති අත්අඩංගුවට ගෙන හුදකලාව රඳවා තබා වද හිංසා වලට භාජනකිරීමත් සිහිපත් කළේ ෆැසිස්ට්වාදීන් යොදා ගත් උපක්‍රමය. මෙම පළිගැනීමේ ක්‍රියා දැඩිව හෙළා දැකීමෙන් නොනැවතුණු පකිස්තාන පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය සහ පකිස්තාන සියළු පුවත්පත් වෘත්තිකයන්ගේ සංවිධානය රට පුරා විරෝධතා උද්ඝෝෂණ දියත් කළේය. අවසානයේදී සිය එම පියවර ඉවත්කර ගැනීමට රජයට බල කෙරිණි. ”

1997 සිට ශරීෆ් දූෂිත බවත්, බලපුළුවන්කාරකම් යොදා ගන්නා බවත් අධිකරණය, නිලධර තන්ත්‍රය, පාර්ලිමේන්තුව සහ ජනමාධ්‍ය ඇතුළත් සෑම ආයතනයකම ස්වාධීනත්වය නොඉවසන බවත් තහවුරුව

තිබුණ නිසා 1999 දී මිලිටරි කුමන්ත්‍රණයකින් මුෂාරෆ් ඔහුව ධූරයෙන් පහ කළ අවස්ථාවේදී කිසිදු විරෝධතාවයක් හට ගත්තේ නැත. මුෂාරෆ් යටතේ පෞද්ගලික මාධ්‍ය, විශේෂයෙන්ම ගුවන් විදුලි නාලිකා සහ පුද්ගලික රූපවාහිනී නාලිකා ප්‍රමාණය වැඩි වූ අතර ඒ සමඟ ස්වාධීන තොරතුරු මූලාශ්‍ර ද වැඩි විය. ආරම්භයේදී මුෂාරෆ් සැළකිය යුතු ලෙස නිදහස් මාධ්‍ය ඉවසූ නමුත් අර්බුද වැඩිවීම ආරම්භ වීමත් සමඟම, 2001 'ත්‍රස්තයට එරෙහි යුද්ධය' දියත් කිරීමෙන් සහ 2002 ජනමත විචාරණයෙන් පසුව ඔහු ආඥාදායකයෙකු ලෙස හැසිරෙන්නට විය.

වැඩි වන ප්‍රහාර සහ බිය ගැන්වීම් සමඟ ඇති වූ දුෂ්ඨ නීති සහ නීතියට බාහිර වාරණය තුළින් ජනමාධ්‍ය නිදහස හැකිලීමට පටන් ගත්තේය. 2007 නොවැම්බර් මාසයේදී හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමත් සමඟම ස්වාධීන මාධ්‍ය මැඩ පැවැත්වූ අතර කිසිදු අවහිරතාවයකින් තොරව ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීමට අවසර ලැබුණේ රාජ්‍ය පාලිත පී.ටී.වී නාලිකාවට පමණි. ඉන් පසුව නීතීඥයන් සහ ජනමාධ්‍යවේදීන් විසින් දියත් කළ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ අරගලය මූලික දේශපාලන නිදහස නැවත ස්ථානපනය කිරීමෙහිලා සාර්ථක විය. 2007 දෙසැම්බර් මාසයේදී හිටපු ජනාධිපති ඝාතනය කිරීමෙන් පසු ඇති වූ අනුකම්පා රැල්ල විසින් අග්‍රාමාත්‍ය යූසුෆ් රාසා ගිලානි යටතේ පාකිස්තාන මහජන පක්ෂ ආණ්ඩුව බලයට පත් වීමත් සමඟ මැතිවරණය තුළින් එකී ජයග්‍රහණය තහවුරු විය. 2010 ජූලි මාසයේ ආරම්භ වී රට පුරා ව්‍යාප්ත වූ මහත් ව්‍යසන සහගත ගංවතුර තර්ජනයන්ගෙන් වඩාත් නරක තත්ත්වයට පත් වූ අති දුර්වල ආර්ථිකය, වේගයෙන් ඉහල නගින අත්‍යවශ්‍ය  භාණ්ඩ මිල , වැඩිවන විරැකියාව , ගෝත්‍රික ප්‍රදේශ වල පැවති ගැටුම්කාරී තත්ත්වය සහ දේශසීමාවන්හි ඇති ඉස්ලාම් අන්තවාදය වැනි බලපතල අභියෝගයන් තවමත් නිමා වී නොමැත.

අති විශාලව විසිරී ඇති නමුත් විවිධත්වයකින් තොර පාකිස්තානයේ මාධ්‍ය පෙන්නුම් කරන්නේ ඉස්ලාමික් පක්ෂ විසින් නායකත්වය දෙනු ලැබූ ගතානුගතික කණ්ඩායම් සහ මුෂාරෆ් විසින් පළමුව ඇති කරන ලද පසුව සිවිල් සමාජයේ විවිධ කොටස් වලින් අනුබල ලැබූ "අවබෝධාත්මක මධ්‍යස්ථභාවයෙහි" න්‍යාය පත්‍රය පිළිබඳ ව පාකිස්තානයේ පවතින මතවාදීමය අරගලයයි. මෙවන් පටු විග්‍රහයන් තුළ විවාදය කොටුවීමට ඉඩ දීම ප්‍රතික්ෂේප කරන වඩාත් රැඩිකල් න්‍යාය පත්‍රයක් පාකිස්තාන පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය සතුව තිබිණි.

## බිම් මට්ටමමේ ව්‍යාපාර, විවිධත්වයෙන් යුතු විරෝධතා

පාකිස්තාන පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය 1950 අප්‍රේල් මාසයේදී කරච්චිහි පාකිස්තානු වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයේදී සිය ව්‍යවස්ථාව සම්මත කර ගත්තේය. මෙමඟින්, සියළු ආපදා හමුවේ එක්සත්ව සිටි රටෙහි ප්‍රජාතන්ත්‍රවාදය සඳහා පෙනී සිටි එක් ශක්තිමත් හඬක් හට ගත්තේය. එවක් පටන් පාකිස්තාන පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය ජනමාධ්‍යවේදීන්ගේ අයිතීන් සඳහා වූ අරගලයෙහි ප්‍රමුඛස්ථානය ගෙන ඇත. ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම්, බිම් මට්ටමේදී ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික යාන්ත්‍රණයක් නොමැති අවස්ථාවක පිට පළාත් වෙත ළඟා වන යාන්ත්‍රණයක් ලෙස මෙම සංගමය කටයුතු කරයි. මෙම සංගමයට සහ දිස්ත්‍රික්, නගර සහ පළාත් මට්ටමමේ ඇති අනුබද්ධ සංගම් ජනමාධ්‍යවේදීන්ගේ දුක් ගැනවිලි සඳහා වේදිකාවක් ලෙස කටයුතු කර ඇත. අර්බුදයක් අවස්ථාවකදී මෙම සංගම් ඔවුන්ට හැකි උපරිමයෙන් කටයුතු කරයි. සතුරු තත්ත්වයකදී ඔවුන් ඉතා විශිෂ්ට ලෙෂ කටයුතු කරයි. සම්පූර්ණ ආඥාදායකත්වයක් තිබූ අවස්ථාවන්හිදී මෙම සංගම් ඵලදායි බව මුෂාරෆ් ද හඳුනා ගත්තේය. ඊට හේතුව ඡන්දයකින් තෝරා ගනු ලැබූ නියෝජිතයන් ලෙස ඔවුන්ට බලතල සහ හයියක් තිබූ අය වීමය. ආපදා තත්ත්වයකදී කළාපීය සහ ජාත්‍යන්තර ජාලයන් වෙත ප්‍රවේශයක් තිබීම ඉතා ඵලදායී වේ.

"අසල්වැසි මොහල්ලා මණ්ඩල සහ ටෙහ්සිල් මට්ටමේ සිට දිස්ත්‍රික්ක, කළාප සහ පළාත් මට්ටම් දක්වා පැවති ජනමාධ්‍ය සංවිධාන රටාව, ආයතන ගොඩනැංවීමට ප්‍රසිද්ධියක් නොඋසුලන රටක කැපී පෙනුනි." යැයි පාකිස්තානයේ ප්‍රධානතම ප්‍රවෘත්ති සහ කාලීන තොරතුරු නාලිකාවක් වන ආජ් ටී.වී. හි විධායක අධ්‍යක්ෂ සයිඩ් ටලාට් හුසේන් කියයි. පාකිස්තාන පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ බලමුළු ගැන්වීමේ උපායින මාර්ගයන්හි බලය මුෂාරෆ් ගේ පාලනය අතරතුර ඉතා හොඳින් පෙනෙන්නට තිබිණි. නීතිඥ සංගම්, මාධ්‍ය සංගම් සහ ජනමාධ්‍යවේදීන්ගේ සංවිධාන මඟින් එක්සත් කරන ලද විශාල සංඛ්‍යාත නීතීඥයන් සහ ජනමාධ්‍යවේදීන් වීදි බසිමින් ජන ගංගාවක් නිර්මාණය කිරීම තුළින් මහජනයා තුළ ඇති වූ චිත්ත ස්වභාවය යටතේ සාමාන්‍ය ලෙස එදිනෙදා කටයුතු කරගෙන යාමේ අවකාශය ආඥාදායකත්වයට අහිමි විය. ජනමාධ්‍යවේදී සංවිධාන, විවිධ පිරිස් එක්සත් කිරීමට සහ ආන්තීයකරණයට ලක් වූ ජනමාධ්‍යවේදීන් ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍යවේදීන් සමඟ සම්බන්ධ කිරීමට සමත් විය. කරච්චි හෝ ලාහෝර්හි මාධ්‍ය සංවිධාන වසා දැමුනු අවස්ථා වලදී ටොබා ටෙක්සින් , සුක්කූර් සහ ක්වෙටාහි තිබූ ප්‍රාදේශීය සංගම විසින් වැඩකටයුතු දිගටම පවත්වාගෙන යනු ඇතැයි විශ්වාස කළ හැකි විය. කොහාත් හෝ ස්වාත් හි වඩාත්ම දුෂ්කර ප්‍රදේශ වල ජනමාධ්‍යවේදියෙකුගේ මරණයක් තව දුරටත් අවධානයට භාජනය නොවී නොතිබූයේ මෙම හේතුව නිසාය. තනි ජනමාධ්‍යවේදියෙකුගේ වටිනාකම හඳුනා ගැනීම ආරම්භ වූයේ සාමූහික කණ්ඩායමික අනන්‍යතාවය ඇතිවීම සමඟයි.

විරුද්ධකම්පෑම සඳහා යොදා ගන්නා ක්‍රම විවිධය. 2007 නොවැම්බර් 3 වන දා මුෂාරෆ් හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කළ "කළු සෙනසුරාදාට" පසුව ඇති වූ නිරායාස උද්ඝෝෂණ පිළිබඳව පාකිස්තාන පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ සභාපති පේර්විසිස් ෂයිකත් මෙසේ සදහන් කරයි. "ප්‍රබල සාකච්ඡමය වැඩසටහන් සහ ප්‍රවෘත්ති වැඩසටහන් නවතා දැමූවත් අප විසින් දෙනු ලැබූ ධෛර්යයත් සමඟ තලාත් හුසෙන්, ෆහාඩ් හුසේන් සහ වෙනත් අය ඔවුන්ගේ සාකච්ඡා වැඩසටහන් උද්ඝෝෂණ ඉදිරිපස වීදියේ සිට මෙහෙයවූහ. මෙම වැඩසටහන් විරුද්ධකම්පෑමේ හඬින් පිරී ඉතිරී ගියා සේම සජීවීව මහජනයාගේ නිවෙස් වලට දර්ශනය වූ අතර ප්‍රජාතන්ත්‍රවාදී උනන්දුව දසත පැතිරවීය." විරෝධතා ව්‍යාපාර, කළු අත් පටි සහ මුඛවාඩම් පැළඳගෙන පැවැත් වූ හිඳ ගැනීමේ විරෝධතා, වීදියේ උද්ඝෝෂණ මෙන්ම පාර්ලිමේන්තු සභාවේ පටිපාටීන් වර්ජනය කරමින් ජාතික සභාවෙන් නැගිට ඒම වැනි උපාය මාර්ගද පාකිස්තාන පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය විසින් යොදා ගත්තේය. මෙම ක්‍රියාවන් කෙතරම් වැදගත් ලෙස සැලකුණේ ද යත් එක් අවස්ථාවක කථානායකවරයා විසින් වෘත්තීය සමිති නායකයන් සමඟ සාකච්ඡාකර එකඟතාවයකට ළඟා වන ලෙස විපක්ෂ නායකයන්ට පෙළඹවූයේය. "අපි ඇතැම් ක්‍රියාකාරකම් සඳහා රජයේ අරමුදල් පිළි ගන්නා නමුත් සාමාන්‍යයෙන් සම්ප්‍රදායක්ව පැවති ආකාරයට මාධ්‍ය සංගමයේ 'දිවුරුම් දීමේ' අවස්ථාවට මුෂාරෆ් ගේ පාලනයට සහ සියා උල් හක් සමඟ එකඟ වන දේශපාලන නායකයන්ට ආරාධනා නොකිරීමෙන් යුද්ධ නීතියට අපගේ විරුද්ධත්වය ප්‍රදර්ශනය කළෙමු." යැයි මාධ්‍ය ප්‍රජාවේ වඩාත් කැපී පෙනෙන සහ ප්‍රබල වේදිකාවක් වන ලාහෝර් මාධ්‍ය සංගමයේ සභාපති සර්මදි බෂීර් පවසයි.

ජනමාධ්‍ය නිදහස සහ වෘත්තීමය සුරක්ෂිත භාවය ඉතාමත් සමීපව බැඳී පවතින බව පාකිස්තාන පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය ආරම්භයේ පටන්ම විශ්වාස කළේය. මාධ්‍ය වාරණය සහ මාධ්‍ය ගැතිබවට පත්කර ගැනීමට විරුද්ධව විරෝධතා පැවැත්වීමත් අතරවාරයේම වැටුප් දීමනා සහ එවා ක්‍රියාත්මක කිරීම පිළිබඳ කරුණු සම්බන්ධයෙන් ද සංගමය ක්‍රියාකාරී විය. පාකිස්තාන පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ බලපෑම නිසා වැටුප් කමිටුවක් ක්‍රියාත්මක නොකරන සහ සාධාරණ වැටුප් නොගෙවන පුවත් පත් වලට පාකිස්තාන රුපියල් මිලියන 980 ක් පමණ වටිනා රජයේ ප්‍රචාරක

දැන්වීම් ලබා දීම නතර කරන ලදී. පාකිස්තානයේ තත්ත්වයට වඩා තරමක් වෙනස් බැවින් මෙවැනිම ක්‍රියාමාර්ග හරහා මේ හා සමාන ඵලදායිත්වයක් ලැබීමට නොහැකි නමුත් ඉන්දියවේ මෙවන් ආයතනද මෙවැනි විකල්ප ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරා ඇත.

## වෘත්තීය සමිත් තුළ කාන්තාවන්

1970 සහ 1980 ගණන් වලදී පාකිස්තානය කාන්තාවන් කිහිපදෙනෙක්ගේ ප්‍රමුඛ භූමිකාවන් ඇතුළත් වූ ඉහල මට්ටමින් දේශපාලනීකරණය වූ ජනමාධ්‍යවේදී ව්‍යාපාර අත්දුටුවෝය. උදාහරණයක් වශයෙන් 1978 දී ජෙනරාල් සියාගේ පාලනයට විරුද්ධ ව්‍යාපාරය අතරතුර දී ලාලා රුක් ඇගේ එක් වයසැති පුතාද සමගින් සිරගත කරන ලදී. ෂින් ෆාරුක්, මෙහ්නාස් රෙහ්මාන්, සහ ෆරිදා හෆීස් වැනි අය ක්‍රියාශීලී ජනමාධ්‍යවේදී ක්‍රියාකාරිනියන් ලෙස නැගී සිටියෝය. ඉන් කිහිපදෙනෙක් ජනමාධ්‍ය සංගම් සහ මාධ්‍ය ආයතන වල නායකත්වය ගත්තෝය. මේ අය අතර, පාකිස්තානු එක්සත් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ මහ ලේකම් තනතුරට පත් වූ ෆවුෂියා ශාහිද්, කරච්චි මාධ්‍ය සමාජයේ උප සභාපතිත්වයට පත් වූ උම්රායා අථර් සහ ද හෙරල්ඩ් පුවත්පතේ කර්තෘ රාසියා භාති ද විය. දුන්යා ටීවී හි සේවය කළ අනීලා ශහීන් 2010 දී කයිබර් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ මහ ලේකම් ධූරයට තෝරා ගැනීම, විශේෂයෙන් කයිබර් සමාජය ජනමාධ්‍යවේදීන්ට අනතුරුදායක ප්‍රදේශයන්හි ක්‍රියාත්මකවන එකක් වීම නිසා එය කාන්තාවන්ගේ චිත්ත ධෛර්ය වඩවන්නක්ද විය. කෙසේ වුවද මෙම පුද්ගලයන් හා සිදුවීම් ව්‍යතිරේඛයන්ය. පැවති ආදර්ශය වූයේ වෘත්තීය සමිති තුළ සාමාජිකයන් ලෙස මෙන්ම නිලධාරීන් ලෙසද කාන්තා නියෝජනය ඉතාම පහළ මට්ටමක පැවතීමයි.

මස්හාර් සමිති අනුව වෘත්තීය සමිති තුළ සාමාජිකත්වය දරන කාන්තාවන් සංඛ්‍යාව ස්ථාවර ලෙස වැඩිවී ඇත. (2006 දී පාකිස්තාන පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය විසින් දියත් කළ සමීක්ෂණයකින් සොයා ගැණුනේ පූර්ණ කාලීන ජනමාධ්‍යවේදිනියන් 300ක් පාකිස්තානය පුරා පමණ සිටින බවයි.) ඔහුට අනුව මීට පෙරදී වෘත්තීය සමිති වල සිටි කාන්තාවන් බොහොමයක් පැමිණියේ වාමාංශික අදහස් සහිත දේශපාලන වටපිටාවන්ගෙනි. අද, කාන්තාවන් වැඩි වශයෙන් ජනමාධ්‍යවේදයට ඇතුළත් වීමේ මාර්ගය රූපවාහිනියයි. රූපවාහිනිය විසින් ලබා දෙන අලංකරණය සහ ක්ෂණික හැඳිනීම හේතුවෙන් අඩු දේශපාලන දිශානතියකින් යුත් තරුණ වෘත්තිකයන් ඒ වෙත ආකර්ශනය වීමේ නැඹුරුවක් ඇත. වැඩසටහන් ඉදිරිපත් කරන්නන්, සාකච්ඡාමය වැඩසටහන් මෙහෙයවන්නන් සහ නිෂ්පාදකයන් බෙහෝමයක් කාන්තාවන් වන අතර කාන්තා ආයතන ප්‍රධානීන් සහ වාර්තාරුවන් සුළු පිරිසක් ද වේ. එනමුත් වෘත්තීය සමිති සන්ධර්භය තුළ ඔවුන් "විධිමත්" ජනමාධ්‍යවේදීන් ලෙස නොසැලකෙන අතර එම නිසා ඔවුන්ට සාමාජිකත්වය හිමි නොවේ. එම හේතුවෙන් මාධ්‍යයට සම්බන්ධ කාන්තාවන් ගණනෙහි පැහැදිළි වැඩි වීම වෘත්තීය සමිති සාමාජිකත්වය තුළින් පෙන්වා දෙන්නේ නැත.

පාකිස්තානයේ වෘත්තීය සමිති වෙනස්වන මාධ්‍ය වටපිටාව සමඟ ගමන් කිරීමට අසමත් වී ඇති බව පිළිගන්නා ආජ් ටීවී හි පුවත් අධ්‍යක්ෂ, සහිඩ් තලාත් හුසේන් වෘත්තීය සමිති තවමත් උද්වේග කාරී බවත් නව තත්ත්වයන් යටතේ අවශ්‍ය ආකාරයට ඔවුන්ගේ ප්‍රතිපත්ති බරපතල විභාගයට ලක්කර නොමැති බවත් ප්‍රකාශ කළේය. රජය ජනමාධ්‍යවේදීන්ට පහසුකම් සඳහා ආධාර දෙන අවස්ථාවලදී ඉඩම් පවරාදීමේදී පවා රූපවාහිනී ජනමාධ්‍යවේදීන්ව නොසලකා හරිනු ලැබේ. ඔහු තව දුරටත් ප්‍රකාශ කළේ කාන්තා ජනමාධ්‍යවේදීන් සාමාන්‍යයෙන් මතභේදකාරී කරුණු වලට සම්බන්ධ වීමෙන් වළකින බවයි. වෘත්තීය සමිති වෘත්තීයමය වර්ධනයට අවශ්‍යයැයි නොසලකන නිසා තම වෘත්තීයමය ගමන පිළබඳ පමණක් අවධානය යොමු කරන ජනමාධ්‍යවේදිනියන් වෘත්තීය සමිතින්ට බැඳීමේ අවශ්‍යතාවයක් නොදකී. තවද, වෘත්තීය සමිති තවමත් පුරුෂ මූලික ස්වභාවයක් උසුළන අතර වෘත්තීය සමිති වලට බැඳුණු විට විරෝධතා ව්‍යාපාර , විරෝධතා දක්වන සේවකයන් සමඟ කටයුතු කිරීම් සහ වීදි වල පෙළපාලි වැනි අම්හිරි ක්‍රියාවන්ට සම්බන්ධ වීම අවශ්‍ය වේ. තවද, ගේ දොර කටයුතු නිසා පීඩනයට පත් ව සිටින කාන්තාවෝ මෙවන් ක්‍රියාකාරකම් සඳහා යොමු වීමට මැළි වෙති. වෘත්තීය ජනමාධ්‍යවේදිනියන්ට වැදගත් සමිති සේවා ස්ථානයේ ලිංගික අඩන්තේට්ටම් හෝ රාත්‍රී වැඩ මුර අවසානයේදී නිවස වෙත ප්‍රවාහන පහසුකම් සහ වෙන්කළ වැසිකිළි පහසුකම් වැනි විශේෂිත කරුණු සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් නොදක්වන බව දැණුන විට මෙම මැළි වීම වඩා වැඩි වේ.

වෘත්තීය සමිති වල විධායක ව්‍යුහයන්හි ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය නොමැතිවීම යම් නිලධාරීන්ගේ සැළකිල්ලට භාජනය වී ඇත. මසාර් අබ්බාස් ඔහුගේ නිල කාලය තුළ විධායකයට අඩුම වශයෙන් කාන්තාවන් 4- 5 දෙනෙකුගේවත් සහභාගිත්වය සුරක්ෂිත කිරීම සඳහා පාකිස්තාන පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට අසාර්ථක උත්සාහයක් දැරුවේය. බහුතරය තමවත් කොටා ක්‍රමයට විරුද්ධත්වය දක්වන අතර කොටා ලබා දීමේ සඵලත්වය සහ කාන්තාවන්ගේ සහභාගිත්වය ඉහල දැමීමට දරන ස්ථිර ක්‍රියාමාර්ග පිළිබඳ ව සාකච්ඡාව අවිනිශ්චිතව පවතී.

## විද්‍යුත් මාධ්‍ය - ඉදිරිපෙළ 24 x 7

රාවල්පිණ්ඩි ඉස්ලාමාබාද් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ මහ ලේකම් ජමීල් මිස්රා ප්‍රකාශ කරන්නේ විද්‍යුත් මාධ්‍ය තුළ ඇති ඉක්මන් බව නිසා එම මාධ්‍ය මුහුණ දෙන තර්ජන ක්ෂණිව ප්‍රසිද්ධ වීමේ හැකියාව ඇති බවයි. "සෑම විටව ඉදිරි පෙළ ගන්නා කැමරාකරුවන් වැඩි අවධානමකට භාජනය වේ. දේශීය කටයුතු අමාත්‍ය රෙහ්මාන් මලික් ජනමාධ්‍යවේදීන්ට වෙඩි නොවදින කබා ලබා දීමට හය වතාවක් පොරොන්දු දී තිබුණද කිසිදු ප්‍රතිඵලයක් තවමත් ලැබී නැහැ." ඔහු ප්‍රකාශ කළේය.

2001 සැප්තැම්බර් 11 වනදායින් පසු පාකිස්තානු -ඇෆ්ගනිස්තාන කලාපය ප්‍රමුඛ ජාත්‍යන්තර අවධානයක් ලබාගෙන ඇත. එම හේතුවෙන් විශේෂයෙන්ම විද්‍යුත් මාධ්‍ය තුළින් ප්‍රවෘත්ති නිෂ්පාදනය ඉතා ඉහල ප්‍රසිද්ධියක් සහිත ක්‍රියාවක් වී ඇත.

එමෙන්ම ජාත්‍යන්තර ප්‍රකාශනවල වාර්තාකාරිනියන්ද වැඩිවී ඇත. ඉංග්‍රීසි ජනමාධ්‍ය සඳහා මෙම තත්වය විසින් යම් වැටුප් සහ කාර්ය තත්තවයන්හි වර්ධනයක් ළඟා කර දී ඇති නමුත් , විශේෂයෙන්ම අනියම් පුවත් වාර්තාකරුවන් සහ දුෂ්කර පළාත වල සිට ලිපි එවන වාර්තාකරුවන් සඳහා මෙම ජාත්‍යන්තර අවධානය කිසිදු ක්ෂණික වාසියක් ගෙනැවිත් නොමැත. ඒ වෙනුවට සිදු වූයේ මුෂාරෆ් යටතේ විද්‍යුත් මාධ්‍ය මත පනවා තිබූ සීමා පෙර නොවූ විරූ ආකාරයෙන් වැඩි වීමකි.

2005 මැයි 16 වන දින ජාතික මන්ත්‍රණ සභාව විසින් පාකිස්තාන විද්‍යුත් මාධ්‍ය නියාමන අධිකාරිය සංශෝධන (2004) කෙටුම්පත සම්මත කරනු ලැබීය. පෙම්රා නමින් හැඳින්වෙන මෙම නීතිය යටතේ නිර්මාණය කළ අධිකාරියට ජාතික යහපත, ආරක්ෂාව, පාකිස්තානු මතවාදයෙහි ආරක්ෂාව සහ අසභ්‍යත්වය වැළැක්වීම යන හේතු මත 27 වන වගන්තිය යටතේ රූපවාහිනී නාලිකා මත තහනමක් පැනවීමේ හැකියාව ඇත. මෙම කරුණු සම්පූර්ණයෙන්ම මනෝමූලිකය වේ. මෙම පනත මඟින් මෙම නීතිය උල්ලංඝණය කිරීමක්, හැඳින්විය හැකි සහ දඩුවම් දියහැකි වරදක් බවට පත් කර ඇති අතර ඒ සඳහා පාකිස්තානු රුපියල් මිලියන 10ක් (ඇ.ඩො. මිලියන 168000) තරම් බරපතල දඩයකට හා වසර 3ක් දක්වා සිර දඬුවම්ද නියම කළ හැකිය. 2007 දී තව දුරටත් සංශෝධන වූ මෙම අධිකාරිය විභාගයකින් තොරව රූපවාහිනී නාලික තහනම් කිරීමටත්, ආම්පන්න රාජසන්තක කිරීමටත් යොදා ගන්නා ලදී. මුෂාරෆ්ගේ පාලනය පුරාවට මෙම දරුණු නීතියට විරුද්ධ මාධ්‍ය සංවිධාන හඬ නැගූහ. 2008 දී ප්‍රජාතන්ත්‍රවාදය යලි ස්ථාපිත කිරීමෙන් පසු මෙම නීතියේ බලය විශාල වශයෙන් අඩුවූ නමුත් පාකිස්තාන පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, මෙම නීතිය යටතේ පිහිටුවන ලද මෙම අධිකාරිය විසුරුවා හැරිය යුතු බවටත් ඒ

වෙනුවට සියළු මාධ්‍ය කොටස්කරුවන් ඇතුළත් වන ලෙස ස්වයං නියාමන යාන්ත්‍රණයක් පිහිටුවිට යුතු බවටත් තමන් දරන මතය වෙනස් කොට නැත. මේ සඳහා එක් ඉදිරි පියවරක් ලෙස පාකිස්තාන පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය විසින් මහජන යහපත උදෙසා ජනමාධ්‍යවේදයේ ඇතුළත් විය යුතු මූලික පිළිගත් ප්‍රතිපත්ති සංග්‍රහයක් සම්පාදනය කිරීමේ වෑයමක් ලෙසින් 2008 අගෝස්තු මාසයේදී කරුණු 26ක් ඇතුළත් අචාර ධර්ම සංග්‍රහයක් කෙටුම්පත් කළේය. මෙම කෙටුම්පත විවාදයට සහ සාකච්ඡාවට බඳුන්ව පවතී. එසේම ස්වයං නියාමනය සඳහා යොදා ගත හැකි යාන්ත්‍රණයක් ලෙස ජනමාධ්‍ය පැමිණිළි කොමිසමක් ස්ථාපිත කිරීම පිළිබඳව ද වසර ගණනාවක් පුරාම සාකච්ඡා වී ඇත.

විද්‍යුත් මාධ්‍ය අංශයේ සේවකයන් සඳහා කම්කරු නීති අදාල වන්නේ නැත. වැටුප් සාධාරණ වුවද ගෙවීම් සිදු කරන්නේ මාස දෙක තුනකට එක් වරක් පමණි. බොහෝ නාලිකා විසින් හැකියාවන් ඇගයීමෙන් තොරව 24 ෮ 7 ප්‍රවෘත්ති වැඩසටහන් විකාශය කිරීම ආරම්භ කළ නමුත් ඉතා ඉක්මණින් ඒවා නවතා දමන්නට  සිදු විය. මස්හාර් අබ්බාස් ට අනුව පසුගිය වසර 2 - 3 කාලය ඇතුළත ජනමාධ්‍යවේදීන් 400 - 500 පමණ සංඛ්‍යාවකට රැකියා අහිමිවී ඇත. විද්‍යුත් මාධ්‍යවල රැකියා හැසිරවීමට කිසිදු නීතියක් නොමැති වීම නිසා අධිකරණයෙන් සහනයක් ලබා ගැනීමට ඉඩක් නොමැත. හිමිකරුවන් වෘත්තීය සමිතිවල ඉල්ලීම් වලට ඇහුම්කන්දීමේ යම්යම් තනි සිදුවීම් වාර්තාවුවද සාමාන්‍යයෙන් හිමිකරුවන්ට සමඟ කේවල් කිරීමට සේවකයන්ට ඇත්තේ ඉතා සුළු බලයකි.

සත්‍ය වශයෙන්ම ශීඝ්‍ර වශයෙන් වෙනස් වන මාධ්‍ය වටපිටාව තේරුම් ගැනීම සහ එම වෙනස පිළිගැනීම වෘත්තීය සමිති වලට වැදගත් වේ. වැඩ සංස්කෘතිය මෙන්ම හිමිකාරිත්වය සහ සේවා ස්ථානයේ තත්ත්වයන් ද පරිණාමය වී ඇත. පෞද්ගලීකරණය සහ විද්‍යුත් මාධ්‍යය මෙන්ම අන්තර්ජාලය සඳහාද නව ගුවන් තරංග විවෘතවීම විසින් නව අභියෝග නිර්මාණය කර ඇත. පූර්ණ මාධ්‍ය නිදහස සඳහා අධිවාචනය කිරීම සහ ජනතාවගේ ආගමික විශ්වාසයන් සහ සම්ප්‍රදායන්ට ගරු කිරීම අතර පවතින සියුම් සංතුළනතා සමඟ කටයුතු කිරීම වෘත්තීය සමිති වලට දුෂ්කර මෙන්ම මතභේදාත්මක ද වී ඇත. පරිහවාත්මක අයුරකින් ඉස්ලාම් ධර්මය පිළිබඳ සඳහන් කිරීම හේතුවෙන් 2010 අප්‍රේල් මාසයේදී සමාජ ජාල වෙබ් අඩවියක් වන ෆේස් බුක් තහනම් කිරීම සඳහා මාධ්‍ය සංවිධාන සහය ලබා දීම එසේ මතභේදාත්මක වූ එක් අවස්ථාවක් වේ.

## මාධ්‍ය නිදහස සහ රැකියා සුරක්ෂිත භාවය

පාකිස්තාන ජනමාධ්‍යවේදීන් රටෙහි අවම වැටුප් ලබන වෘත්තිකයන් අතර සිටී. ප්‍රධාන වශයෙන් විද්‍යුත් මාධ්‍ය කිහිපයක හැර සෙසු මාධ්‍යවේදීහු තම ජීවිතය හා ශරීරය අනතුරේ හෙලා ගනිමින් ඉතා සුළු වැටුපක් වෙනුවෙන් සේවය කරති. පාකිස්තානු පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය සහ සමස්ත පාකිස්තාන ජනමාධ්‍ය සේවක සංගමය විසින් ජනමාධ්‍යවේදීන සියළුම සේවකයින් සඳහා සාධාරණ වැටුප්ද වෘත්තියේ සුරක්ෂිත භාවයද වෙනුවෙන් නොකඩවා අධිවාචනය කර ඇත.

2000 ඔක්තෝබර් සිට අනුකූල වන පරිදි, සත් වන වැටුප් කමිටුව විසින් 2001 ඔක්තෝබර් 8 වන දින ජනමාධ්‍යවේදීන් සඳහා නීත්‍යානුකූලව බලපාන වැටුප් ප්‍රමාණ සහ සේවා ස්ථානය පිළිබඳ තත්ත්වයන් නියම කරන ලදී. වසර නවයක් පමණ ගත වී තිබුණද මෙම විධිවිධාන තවමත් ක්‍රියාත්මක වී නොමැත. අට වන වැටුප් මණ්ඩලයේ පාලනයද කල් ඉකුත් වී ඇති අතර තවමත් පාකිස්තානයේ පුවත්පත් 85%ක් සත් වන වැටුප් මණ්ඩලයේ නියමයන් හෝ ක්‍රියාතමක කර නොමැත. බොහොමයක් ජනමාධ්‍යවේදීහු සහ මාධ්‍ය සේවකයෝ වර්තමානය වන විට නිත්‍යානුකූල නොවන ගිවිසුම් යටතේ හෝ නිල පත්වීම් ලිපි නොමැතිව සේවය කරති. ඉන් බොහෝ දෙනෙක් දෛනික වැටුප් ලබන්නෝ වෙති. ප්‍රතිපත්ති සහ නීති ක්‍රියාත්මක කිරීමේලා ඇති අසාර්ථකභාවය මඟින් පෙන්වා දී ඇත්තේ උපාය මාර්ග සමාලෝචනය කිරීමේ සහ ඇතැම් විට වෙනත් ප්‍රවේශයක් යොදා ගැනීමේ බරපතල අවශ්‍යතාවයයි. මුෂාරෆ් පාලනය යටතේ පෞද්ගලික මාධ්‍ය සමෘද්ධිමත් කාලයක් අත්දුටු නමුත් දැන් අත්දකින්නේ සේවක ප්‍රමාණය අඩු කිරීම නිසා ඇතිවන බලපෑමයි. සිය ගණනක් ජනමාධ්‍යවේන්ට රැකියා අහිමි වී ඇති බව දැන ගන්නට තිබේ.

රාජ්‍ය මට්ටමින් හෝ හමුදාව මඟින් එල්ල වන කුමනාකාරයේ හෝ මර්දනයකට විරුද්ධවීම සඳහා මාධ්‍ය හිමිකරුවන්ට වෘත්තීය මාධ්‍යවේදීන්ගේ සහය අවශ්‍යය. විරෝධතා අතරතුරදී වෘත්තීය ජනමාධ්‍යවේදීන් වීදි වලට පැමිණියේ පුවත් පත වසා දැමීම හෝ පුවත් පිළිබඳ මුණිවත රැකීම මඟින් ඔවුන්ගේ රැකියා අනතුරේ හෙලන බව සම්පූර්ණයෙන්ම අවබෝධ කරගෙනය. ගැටුම් පැවති කාලවලදී , විශේෂයෙන්ම මුෂාරෆ්ගේ පාලනය යටතේ මෑතකදී කළ අරගලයේදී මාධ්‍ය හිමි කරුවන් ජනමාධ්‍යවේදීන් කරා පැමිණ ඒකාබද්ධ පෙරමුණක් ගොඩ නැගුවෝය. නමුත් විරෝධතා අවසන් වු විට, සහයෝගීතාවය බිඳී ගොස් ප්‍රතිවිරෝධතා ඉදිරියට පැමැණියේය. "පාකිස්තානු පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ මහා සභාව විසින් නඟන ලද ඉතා වැදගත් ප්‍රශ්නයක් විය. "මාධ්‍ය නිදහස සඳහා වූ ව්‍යාපාර තුළින් අප ලබා ගෙන ඇත්තේ මොනවාද? මාධ්‍ය නිදහස මාධ්‍ය හිමිකරුවන්ට මිස වැඩ කරන ජනමාධ්‍යවේදීන්ට නොවේ යැයි ඔවුන් කියන බව" මස්හාර් අබ්බාස් කියයි. මාධ්‍ය හිමිකරුවන් ඔවුන්ගේ පටු අරමුණු මුදුන් පත් කර ගැනීම සඳහා පමණක් පාකිස්තානු පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය පිළිබඳ සැලකිල්ල දක්වද්දී, රජය මගින් එල්ල කරන මර්දනයට විරුද්ධව නැඟී සිටීම සඳහා මහා සභාවට ඒත්තු ගැන්වීම සංගමයට අපහසුය. පැහැදිළිව පෙනෙන මෙම දෙකඩ කොතරම්ද යත් , ජනමාධ්‍ය විසින් පාකිස්තානු පෙඩරල් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ පෙළපාළි සහ වැටුප් සහ රැකියා තත්ත්වය පිළිබඳ උද්ඝෝෂන ආවණය කරන්නේ නැත.

ජනමාධ්‍යවේදයද ඇතුළු සෑම ක්ෂේත්‍රයකින්ම විධිමත් සේවා නියුක්තිය කෙමෙන් වියැකී යාමේ නැඹුරුව තුළ, කෙටි කාලීන ගිවිසුම් යටතේ සිටින සේවකයන් වෘත්තීය සමිති වලට සම්බන්ධ වීමට මැලි වීම නිසා රැකියා සුරක්ෂිත භාවය සහ වෘත්තීය සමිති වල වර්ධනයට කෙටි කාලීන ගිවිසුම් නරක අන්දමින් බලපා ඇත. සිය වෘත්තියෙහි ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීම පිළිබඳ සලකද්දී සැබවින්ම මූලික ගැටුම ඇත්තේ රජය සමඟ නොව මාධ්‍ය ආයතන සමඟ බව ජනමාධ්‍යවේදීහු අද වන විට අවබෝධ කර ගෙන සිටිති. ගිලානි යටතේ වන වර්තමාන රජය වැනි ඇතැම් ආණ්ඩු ජනමාධ්‍යවේදී සංගම් වල ඉල්ලීම් වලට ඇහුම්කන්දීමේ ස්වභාවයක් පෙන්වුවද මාධ්‍ය හිමිකරුවන් ඒ පිළිබඳ අවධානය යොමු කිරීමට සූදානම් නැත. රක්ෂණ ආවරණයක් සැපයීම හෝ ආචාර ධර්ම පිළිබඳ හවුල් කමිටුවකට සහභාගී වීම හෝ වෙත්වා හිමිකරුවන් වෘත්තීය ජනමාධ්‍යවේදීන් සමඟ සමානාත්මතාවයෙන් ගනුදෙනු කිරීමට සූදානමක් නොපෙන්වයි.

මෙසේ, පාකිස්තානය මාධ්‍ය සේවකයන්, ජනමාධ්‍යවේදී සංවිධාන, පුවත්පත් හිමිකරුවන් සහ කර්තෘවරුන් අතර සහයෝගයක් සහ මිත්‍රත්වයක් අත්දුටුවද, මෙම සහයෝගිත්වය අස්ථිර එකක් වන එය පැවත ඇත්තේ වාරණයට සහ ඒකාධිපති ආණ්ඩු වලට විරුද්ධව සටන්කිරීමේදී පමණි. එබැවින් තොරතුරු දැන ගැනීමේ නිදහස වෙනුවෙන් ආරම්භවූ ඒකාබද්ධ ව්‍යාපාරයන්ගෙන් උගත් පාඩම් ජනමාධ්‍ය නිදහස පිළිබඳ ඇති ව්‍යාපාර සහ ජනමාධ්‍යවේදීන්ගේ සේවා තත්ත්වයන් වෙනුවෙන් ඇති ව්‍යාපාර අතර සබඳතා වඩා ශක්තිමක් කරන්නේ කෙසේද යන්න පිළිබඳ යම් අවබෝධයක් ලබා දීමට ඉඩ තිබේ.

# ශ්‍රී ලංකාව

## පශ්චාත් යුධ කාලීන අභියෝග සහ ධ්‍රැවීකරණය වූ ජනමාධ්‍ය

ශ්‍රී ලංකා රජයේ හමුදා විසින්, දෙමළ විමුක්ති කොටි සංවිධානය (එල්.ටී.ටී.ඊ) දියත් කළ බෙදුම්වාදී කැරැල්ල පරාජය කළ බව 2009 වර්ෂයේ මැයි මාසයේදී නිල වශයෙන් ප්‍රකාශ කිරීමත් සමග ශ්‍රී ලංකාවේ 26 වසරක් පුරා පැවති සිවිල් යුද්ධය අවසන් විය. ඉන් පසුව එළඹි දිනයන්හි, දීර්ඝ කාලයක් තිස්සේ අතපසු කරන ලද ප්‍රතිසන්ධානය, සාමය ගොඩනැගීම සහ රාජ්‍ය පාලනයේ විනිවිදභාවය යනාදිය ප්‍රවර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය දේශපාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ බලාපොරොත්තු වඩා ඉහළ ගියේය. යුධ කාලය පුරාවටම යටපත් කිරීමට සහ අපවාදයට සහ පහරදීම්වලට ලක් වූ මාධ්‍ය, මෙම නව සාම කාලය විසින්, අදහස් ප්‍රකාශනයේ නිදහස සහ විසම්මුතිය සඳහා ඇති අවකාශය වඩා පුළුල් කරනු ඇතැයි මහත් බලාපොරොත්තු ඇති කර ගත්තාය.

කෙසේ වෙතත්, 2010 ජනවාරි මාසයේදී පැවැත් වූ එමෙන්ම උග්‍රලෙස භේදාත්මකවූ ජනාධිපතිවරණ ව්‍යාපාරය සහ ඉන් පසුව අප්‍රේල් මාසයේදී පැවැත්වුණු ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත් වූ සමය තුළ නොනැසී පැවැතීමට එම සුභවාදයට හැකි වූයේ නැත. අනතුරුව එළඹි කාලය විසින්, මාධ්‍යකරුවන්ට සහ ආයතන වලට නැවත ආරම්භ කරන ලද පහරදීම් සහ රජයේ පාලනය යළි තහවුරු කිරීම සඳහා වූ ප්‍රයත්නයක් සමගින් ඉහත කී බලාපොරොත්තු වලට පහර පිට පහර වැදුණි. මේ අතරින්, පුවත්පත් මණ්ඩලය නැවත පිහිටුවීම සඳහා ගන්නා ලද උත්සාහය සහ මාධ්‍ය ආචාර ධර්ම ඉහළ නංවා ගැනීම සඳහා දේශීය ජනමාධ්‍යට මගපෙන්වීමේ සඳහා යැයි මාධ්‍ය සංවර්ධන අධිකාරියක් ස්ථාපිත කිරීම සටහන් කළයුතු ප්‍රයත්නයන් දෙකකි.[1]

"රූපවාහිනී සහ ගුවන්විදුලි ආයතනයන්හි ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම , මාධ්‍ය මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ බලපත්‍ර ලබා දෙන ආකාරය විධිමත් ලෙස හැසිරවීම සඳහා" විකාශණ අධිකාරියක් පිහිටුවීමද එම සැළසුම් අතර වේ.[2] රජය විසින් දැනටමත් නව පෞද්ගලික රූපවාහිනී ආයතන, අන්තර්ජාල සේවා සපයන්නන් සහ දුරකතන ජාල සඳහා බලපත්‍ර ලබාදීම පිළිබඳ වූ නව රෙගුලාසි ප්‍රකාශයට පත් කර ඇත. මෙය 2009 අග භාගයේදී ආණ්ඩුව විසින් ඇතිකිරීමට බලාපොරොත්තු වූ ප්‍රවෘත්ති විකාශණය මෙන්ම අන්තර්ජාලය තුළින් තොරතුරු බෙදාහැරීම පිළිබඳ මතභේදාත්මක රෙගුලාසි අඩු මට්ටමකින් ක්‍රියාවට දැමීමකි.

දේශපාලන ප්‍රතිසංස්කරණ සහ මාධ්‍ය නිදහසට තවත් ප්‍රහාරයක් වූයේ 2010 සැප්තැම්බර් මස 8 වන දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද මතභේදකාරී වූ 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයයි. මාධ්‍ය සංවිධාන, සිවිල් සමාජ කණ්ඩායම්, වෘත්තීය සංගම් සහ විපක්ෂ දේශපාලන පක්ෂ විසින් ඇති කළ පුළුල් විරෝධතා මධ්‍යයේ හදිසි පනතක් ලෙස මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. සංශෝධනය හරහා අති මහත් බලයක් සහිත වූ විධායක ජනාධිපතිධූරය එක් පුද්ගලයෙකුට දැරිය හැකි උපරිම වාරගණන පිළිබඳ සීමා ඉවත් කරන ලද අතර 17 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපිත කරන ලද ස්වාධීන ආයතනයන්හි සෘජු පාලනයද ජනාධිපතිවරයාට හිමි විය.



2009 දී සිය මරණීය ප්‍රහාරයකට ගොදුරු වූ පොද්දල ජයන්ත 2006 ජූලි මාසයේ සිදුවූ මාධ්‍යවේදී සම්පත් ලක්මාල් ඝාතනයට විරෝධය පළකිරීමේ උද්ඝෝෂණයක් මෙහෙයවයි. (ඡායාරූප ස්තුතිය: බුද්ධික වීරසිංහ)

සංශෝධනයට පෙර එක් පුද්ගලයෙකුට ජනාධිපති ධූරය දැරිය හැකි වාර ගණන වූයේ දෙකක් වූ අතර මෙම සංසෝධනය මගින් මැතිවරණ, රාජ්‍ය සේවය, පොලීසිය, මානව හිමිකම්, ආණ්ඩුවේ වගවීම සහ අධිකරණ සේවය යන අංශයන්හි ක්‍රියාකාරිත්වය පාලනය කිරීමට පිහිටුවනු ලබන ස්වාධීන කොමිෂන් සභා පත් කිරීම සම්බන්ධයෙන් අති විශාල බලයක් ජනාධිපතිවරයාට ලැබේ. එමෙන්ම, ජනාධිපතිවරයාට සැබැවින්ම ඉහල ශ්‍රේණීන්හි නීති නිලධාරීන් සහ ජාතික විගණක කාර්යංශයේ ප්‍රධානියා පත් කිරීමටද කිසිදු බාධාවකින් තොර බලයක් ලැබෙනු ඇත. තවද, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා පත් කිරීමට ජනාධිපතිවරයාට ඇති බලතල හරහා පාර්ලිමේන්තුවේ කටයුතු පාලනය කිරීමටද නිසැක බලයක් හිමි කර ගනු ඇත.

මෙකී විධිවිධාන හරහා ප්‍රජාතන්ත්‍රවාදය දුර්වල කොට සහ යහ පාලනය බරපතල ලෙස සීමා කරනු ඇතැයි කල්පනා කැරේ. මෙම සංශෝධනය හදිසි පනතක් ලෙස පාර්ලිමේන්තුවට ගෙන ඒමම ජනතාවගේ නිදහස උල්ලංඝණය කිරීමක් ලෙසද සැළකේ. කෙසේ වෙතත්, මැතිවරණ සමයකදී රාජ්‍ය පාලිත සහ පෞද්ගලික මාධ්‍යයන්ට මාර්ගෝපදේශ නිකුත් කිරීමට සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත මැතිවරණ කොමිසම වෙත ඇති බලය ස්වාධීන ජනමාධ්‍යයට විශේෂ වැදගත්කමකින් යුතුය.

17 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ රජයේ පාලනය යටතේ පවතින මාධ්‍ය ආයතනයන්ට මාර්ගෝපදේශ සැපයීමට මැතිවරණ කොමිසමට බලය තිබුණි. 18 වන සංශෝධනය යටතේ කොමිෂන් සභා පත් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා සතු බලයද සැළකිල්ලට ගත්විට එම මාර්ගෝපදේශ සැපයීම පෞද්ගලික මාධ්‍ය දක්වා ව්‍යාප්ත කර තිබීම, සැබවින්ම මැතිවරණ සමයේදී කුමනාකාරයේ හෝ විසම්මුතික අදහස් ඉදිරිපත් කිරීමට සහ විපක්ෂ අදහස් ඉදිරිපත් කිරීමට ලියූ මරණ සහතිකය විය හැකිය. මෙම කාරණය, බලයට පත්වන සෑම රජයක් විසින්ම සිදු කරනු ලබන රාජ්‍ය පාලිත මාධ්‍ය අයථා භාවිතය සහ රාජ්‍ය පාලිත මාධ්‍ය මහජන සේවා ජනමාධ්‍ය බවට පත් කිරීම සඳහා ඇති දීර්ඝකාලීන අවශ්‍යතාවයේ සන්ධර්භය තුළ ඉතාමත් වැදගත් කාරණයක් බවට පත් වේ.

ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යාන්තර සම්මේලනය ශ්‍රී ලංකාවේ එහි පාර්ශවකරුවන් සමග එක්ව 2003 වසරෙහි කොළඹදී පවත්වන ලද සමස්ත ආසියානු සම්මේලනයේදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලිත මාධ්‍ය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය ඒ සඳහා වන මූලධර්මද සමඟ අවධාරණය කළේය. මහජන සේවා

1 බලන්න *Media Development Authority: Another name for media control in Sri Lanka?* at http://www.groundviews.org/2010/07/28/media-development-authority-another-name-for-media-control-in-sri-lanka/

2 බලන්න See *Sri Lanka to set up Broadcasting Authority* at http://blogs.rnw.nl/medianetwork/sri-lanka-to-set-up-launch-broadcasting-authority

ජනමාධ්‍ය කෙරෙහි පවතින සියළුම ආකාරයේ ඍජු දේශපාලන පාලනයන් නැවැත්වීම සහ ආචාර ධාර්මික, වගවීමක් සහිත සහ විනිවිද භාවයකින් යුතු ව්‍යුහයන් හරහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව එහි පරිපාලනය සඳහා වැඩ රාමුවක් සකස් කිරීම එහි ඇතුළත් විය. මෙම කාලයේදී ශ්‍රී ලංකාව ගැටුම් නවතාලීමේ අභ්‍යන්තර ගිවිසුමකට නිල වශයෙන් ඇතුලත්වී සිටි අතර චිරස්ථායී දේශපාලන තත්ත්වයක් ඇති කිරීම සඳහා එම සම්මුතීන්ට හැකි වනු ඇතැයි ඉහල බලාපොරොත්තු තබා තිබුණි.



ඝාතනය කරන ලද ජනමාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග වෙනුවෙන් පැවැති පහන් පූජාවක් (ඡායාරූප ස්තුතියෑ රොබට් ෂෝ)

## විවේචනාත්මක වාර්තාකරණයේ අවකාශය අහෝසි කිරීම

යුද්ධාවසානයේ සිට ඇති වූ වර්ධනයන් සිදු වී ඇත්තේ අතිශයින් ධ්‍රැවීකරණය වූ දේශපාලන පරිසරයක් තුළය. එමගින් යුද්ධය, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ශෝචනීය තත්ත්වය ඇතුළු පශ්චාත් යුධ සමයෙහි උතුරේ සහ නැගෙනහිර කැරෙන සංවර්ධනය සහ ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය පිළිබඳ විවේචනාත්මක වාර්තා සඳහා වන අවකාශය ප්‍රායෝගික ලෙස අහිමි කර තිබේ.

අනුකම්පාවකින් තොර සතුරු වටපිටාවක් තුළ, රටේ සියළුම ප්‍රදේශවල සිටින ජනමාධ්‍ය වෘත්තිකයන් ස්වයං වාරණය සහ තමන්ට සිදුවිය හැකි වදහිංසා වලින් ආරක්ෂා වීම සඳහා වෙනත් සුදුසු ක්‍රියාමාර්ග තෝරා ගත්හ. මෙලෙස ස්වයං ආරක්ෂාවේ නීති අනුගමනය නොකළ මාධ්‍යකරුවන් නියතවම බිය ගැන්වීම් වලට බඳුන් විය. ජනමාධ්‍යවේදීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, බිය ගැන්වීම සහ ඝාතන යුද්ධය පැවති කාලය පුරාම සුලභ සිදු වීම් වූ අතර යුද්ධයේ අවසන් අදියර තුළ එය ඉතා දරුණු අන්දමින් නරක අතරට හැරිණි.

මේ කාලය තුළ, විශේෂයෙන් දෙමළ භාෂා මාධ්‍ය අනවරත තෙරපුම් යටතේ පැවතිණි. යාපනයේදී දිනපතා ප්‍රකාශයට පත් කෙරෙන උදයන් සහ කොළඹදී ප්‍රකාශයට පත් කළ එහි හවුල්කාර පුවත්පත වූ සුදර් ඔලි යන පුවත්පත් නිරන්තර ඉලක්කයන් බවට පත් විය. රජය විසින් ජනමාධ්‍යයන්ට තෝරා ගත හැකි පැහැදිළි මතවාද දෙකක් පෙන්වා දී තිබුණි. ඒ අනුව රජයේ යුධ ප්‍රතිපත්තියට සහය නොදීම ත්‍රස්තවාදයට සහය දීම හා සමාන විය. මෙමගින් ජනමාධ්‍යවේදීන් නිහඬතාවයට යොමු කළ අතර ඔවුන්ට එක්කෝ ස්වයං වාරණය හෝ යුධ ප්‍රයත්නය අනුමත කිරීම තෝරා ගැනීමට සිදු විය.

යුද්ධය පිළිබඳ ස්වාධීන පුවත් ආවරණය සම්පූර්ණයෙන්ම තහනම් විය. රජය විසින් රාජ්‍ය පාලිත ජනමාධ්‍ය ආයතන දෙකක සහ යුද්ධයට පක්ෂපාතී වූ එක් පෞද්ගලික ජනමාධ්‍ය ආයතනයක ජනමාධ්‍යකරුවන්ට පමණක් 'හමුදාව සමග යන' ජනමාධ්‍යවේදීන් ලෙස යුද්ධය ආවරණය කිරීමට අවස්ථාව ලබා දෙන ලදී. රජයේ සහ එල්.ටී.ටී.ඊ යේ ප්‍රචාරක අංශ විසින් යුධ පුවත් සහ දර්ශන නොකඩවා බෙදා හරින ලද අතර මරණ පිළිබඳ ස්වාධීන සත්‍යාපනයකට කිසිදු ඉඩක් නොවීය.

යුද්ධය අවසන් වී වසරක් ඉක්ම වුවද, තීරණාත්මක අවසන් සටන පැවැති ප්‍රදේශයන්ට ප්‍රවේශ වීමට ස්වාධීන ජනමාධ්‍ය ආයතනයන්ට තවමත් ඉඩ ලබා දී නොමැත. උතුරු පළාතේ ප්‍රධාන නගරය වන යාපනය යුද්ධය පැවති කාලය පුරාම වාරණයේ ප්‍රධාන පීඩාවන්ට පත් වූ අතර තවමත්, කිසිදු විදේශ ජනමාධ්‍යවේදියෙකුට ස්වාධීනව නගරයට ඇතුළු වීමට ඉඩ ලබා දී නොමැත.

## අභ්‍යන්තර අවතැන්වූවන් පිළිබඳ නිහඬතාවය

යටපත් කරන ලද වටපිටාව සහ ස්වයං වාරණ සංස්කෘතිය නිසා මානුෂීය ගැටළු වාර්තාකරණය විශාල අභියෝගයකට මුහුණ දී ඇත. එක් උදාහරණයක් වූයේ 300,000 කට ආසන්න අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයන් සමූහය උතුරේ රඳවා තැබීමේ කඳවුරක ගාල් කිරීම පිළිබඳ සාධාරණ සහ විෂය මූලික වාර්තාකරණයක් නැතිවීමයි. වාර්තාකරණය ලෙස බොහෝ විට පෙන්වනු ලැබුවේ රාජ්‍ය නිලධාරීන් සහ විදේශ නියෝජිතයන් එහි යන අවස්ථාවන්හි දී කණ්ඩායමේම කොටසක් ලෙස ගමන් ගන්නා ප්‍රධාන වශයෙන් රාජ්‍ය මාධ්‍යයන්හි ජනමාධ්‍යවේදීන් විසින් ඉතා ප්‍රවේශමෙන් රූපගත කරන ලද මැණික් ෆාම් කඳවුරේ දර්ශනයි. ඇත්ත වශයෙන්ම නම් එම කඳවුර අතිශය නින්දා සහගත කඳවුරක් විය.

අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයන්ගේ තත්ත්වයන් පිළිබඳ දැක්වුන මාධ්‍ය අවධානය විවිධ විය. දෙමළ ජනමාධ්‍ය ඉතා සැලකිල්ලක්ද ඉංග්‍රීසි මාධ්‍ය, සැලකිල්ල අඩුවෙන්ම දැක්වූ සිංහල මාධ්‍ය වලට වඩා තරමක් වැඩි සැලකිල්ලක්ද මේ සම්බන්ධයෙන් දක්වා තිබුණි. දෙමළ මාධ්‍ය අතර, නිවුන් පුවත් පත් වන යාපනයේදී සහ කොළඹදී පිළිවෙළින් ප්‍රකාශයට පත් කරන උදයන් සහ සුදර් ඔලි පුවත් පත් අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයන් පිළිබඳ ඉතා කාර්යක්ෂම වාර්තාකරණයක් සිදු කරන ලද බව වාර්තාවූ අතර ඒ සඳහා කඳවුරු තුළ සිටි වාර්තාකරුවන්ගෙන් ලබාගත් තොරතුරු ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු නොවන අන්දමින් යොදා ගන්නා ලදී.

2009 සැප්තැම්බර් 6දා ද සන්ඩේ ටයිම්ස් පුවත් පත, මෙම කඳවුරු මනුෂ්‍ය කුට්ටනය සහ මිනිසුන් පත්ව සිටි දුක්ඛිත තත්ත්වය උපයෝගී කොට ගෙන මුදල් ලබා ගැනීම සඳහා රාජ්‍ය සේවකයින් විසින් සිදු කරන ජාවාරම් සඳහා සරු භූමියක් බවට පත්ව ඇති බව දක්වමින් විශිෂ්ට වාර්තා දෙකක් ඉදිරිපත් කළාය. එහෙත්, විශිෂ්ට අන්දමේ වාර්තාකරණයෙහි නියැලුණු මෙම ජනමාධ්‍යවේදීන් විසින්, මේ සම්බන්ධයෙන් සිංහල භාෂා මාධ්‍ය විසින් දක්වන ලද පූර්ණ උදාසීනත්වය නිසා තම වාර්තා හරහා සිදු වන බලපෑම ඉතා අවම බව පිළිගන්නා ලදී.[3] වවුනියාව සහ මන්නාරම ප්‍රදේශයන්හි සිටින පුවත්පතේ විශේෂ වාර්තාකරුවන් දෙදෙනෙක් එම වාර්තාවට සැළකිය යුතු අන්දමින් දායක වී තිබියෙදීත් වාර්තාවෙහි ඔවුන්ගේ නම් සඳහන් නොකෙරිණ.

3 බලන්න The two reports, titled “Scandalous Plunder of a Battered People” and “The High Price of Freedom”, were investigated and written by the Sunday Times Insight Team. They are available at: http://www.sundaytimes.lk/090906/News/nws_02.html and http://www.sundaytimes.lk/090906/News/nws_24.html

පුරවැසි ජනමාධ්‍ය වෙබ් අඩවියක් වන ග්‍රවුන්ඩ්විව්ස් : (www.groundviews.org) විසින් මුලින්ම අගෝස්තු සහ ඔක්තොබර් මාස වලදී ඇද හැළුණු මහ වැසි නිසා කඳවුරු තුළ වර්ධනය වූ අපවිත්‍රතාවය සහ පීඩාව පිළිබඳව, ජාතික සහ ජාත්‍යන්තර ජනමතයට කරුණු දක්වමින් කඳවුරු ඇතුළත තත්ත්වය පිළිබද සිත් ගන්නාසුළු වාර්තා ඉදිරිපත් කළාය. මෙම වෙබ් අඩවි වාර්තාව ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය කඳවුරුවල තත්ත්වය පිළිබද දක්වන සැලකිල්ලේ මට්ටම පිළිබඳ ඛේදජනක විස්තරයකින්ද සමන්විත විය.[4]

ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය බොහොමයක් අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයන් පිළිබඳ පැහැදිළිවම දිගින් දිගටම මුනිවත රැක්කහ. ඉන් පසු නොවැම්බර් මාසයේදී කඳවුරු විවෘත කිරීම සහ අවතැන්වූවන් පිරිසක් ඔවුන් පදිංචිව සිටි පුදේශ වලට නැවත යැවීම පිළිබදව ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය ප්‍රකට කළේ ද උදාසීනත්වයකි. නිහඬතාවය වර්ධනය වෙමින් පවතිද්දී, කඳවුරු වලින් නිදහස්ව පදිංචි ගම්මානවලට නැවත පදිංචියට ගිය පුද්ගලයන් ගණනාවක් ආවරණය කරමින් ඔවුන්ගේ ජීවිත නැවත සකස් කර ගැනීමේදී දැඩි දුෂ්කර ක්‍රියා පටිපාටීන් වලට මුහුණ පාන බව පෙන්වා දෙන තවත් වාර්තාවක් ග්‍රවුන්ඩ්විව්ස් ඉදිරිපත් කළාය. යුද්ධයේ ගොදුරු බවට පත්වූ අවතැන් පුද්ගලයන්ගේ තත්ත්වයන් පිළිබඳ ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය තවදුරටත් මුනිවත රැකීම හෙළිදරව්කරමින් යළිත් වතාවක් පුරවැසි ජනමාධ්‍ය වෙබ් අඩවිය මෙසේ වාර්තා කළේය:

"බොහෝ පවුල්වල ශක්ති සම්පන්න ස්ත්‍රීන් හා පුරුෂයන් යුධ කාලයේ (හෝ ඉන් පෙර), මරණයට පත් වීම හෝ බලහත්කාරයෙන් රැගෙන ගොස් රඳවා තබා ගැනීම හේතුවෙන් මෙම පුද්ගලයන්ට නැවත ගම් බිම් බලා යාම අප සාමාන්‍යයෙන් විශ්වාස කරන තරමට ප්‍රසන්න අත්දැකීමක් නොවන්නේය. කාන්තාවන්ට, කුඩා දරුවන්ට සහ වයස් ගත පුද්ගලයන්ට පමණක් සීමා වූ බොහෝ පවුල්ද අපට දැක ගත හැකි විය. සුදුසු වාසස්ථානයක්, රෝහල්, ගමනාගමන පහසුකම්, පාසල්, පානීය ජලය, විදුලි බලය සහ ජීවන මාර්ගයක් සඳහා ඇති අවකාශය වැනි මූලික පහසුකම් ද, ගමනාගමනය සඳහා වන මූලික අයිතියද නොමැති මෙම පුද්ගලයන්ට නැවත ආපසු යාම පිළිබද හැඟෙන්නේ කුමක්දැයි අප සිතා බැලිය යුතුය."[5]

2009 නොවැම්බර් මාසය වන විට බොහොමයක් අවතැන්වූවන් රඳවා තැබීමේ කඳවුරු වලින් නිදහස් කොට ඇති බව සහ ඔවුන්ට සිය ගම් බිම් කරා යාමට හැකියාව ඇති බව රජය කියා සිටියේය. කොළඹ සිට යාපනය දක්වා දිවෙන මහා මාර්ගයද මහජන ගමනාගමනය සඳහා විවෘත විය. පිරික්සුම් මුරපොළ කිහිපයක් ඉතිරිව තිබුණද කොළඹ සහ යාපනය අතර ගමන් කිරීමේදී ගත යුතුව තිබූ පූර්ව අවසර පත්‍රය පිළිබද රෙගුලාසි ඉවත් කරන ලදී. කෙසේ වුවද, උතුරු පළාතේ ජීවිත තවමත් පවතින්නේ සාමාන්‍ය තත්ත්වයෙන් බොහෝ දුරිනි.

## සාමය සහ ප්‍රතිසන්ධානය සඳහා ඇති අභියෝග

එල්.ටී.ටී.ඊ සංවිධානය සමග පැවැති යුද්ධයේ අවසානය ප්‍රකාශයට පත් කිරීමෙන් මාස 8 කට පසු එනම්, 2010 ජනවාරි 26 වන දින විධායක ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවෙහි මැතිවරණයක් පැවැත්විණි. එහි ප්‍රතිඵලය වූයේ ප්‍රධාන ප්‍රතිවාදියා වූ යුද්ධයේ අවසන් අදියරේදී හමුදාපතිවරයා ලෙස කටයුතු කළ සරත් ෆොන්සේකාට විරුද්ධව, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ඒක පාර්ශවීය ජයග්‍රහණයයි. මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ සමීපතමයින් සමඟ ගැටුම ඇති කරගන්නා තෙක්  යුධ ජයග්‍රහණයේ ප්‍රධාන නිර්මාණකරුවෙකු ලෙස ෆොන්සේකා ගෞරවයෙන් සැළකුනි.

මැතිවරණ ප්‍රතිඵල නිකුත් වී දින කිහිපයකට පසු මතභේදකාරී තත්ත්වයන් යටතේ නිශ්චිත නොවූ චෝදනා මත ෆොන්සේකා අත්අඩංගුවට ගන්නා ලදී. එතැන් පටන් ඔහු හමුදා නිලඇඳුමේ සිටි කාලයේදී දේශපාලන කටයුතු වල නියැලීම සහ ආයුධ මිලදී ගැනීමේදී කරන ලදැයි කියන දූෂණ සම්බන්ධයෙන් යුධ අධිකරණ දෙකක් වෙත පමුණුවනු ලදී. ෆොන්සේකා විසින් මෙම චෝදනා දෙකම ප්‍රතික්ෂේප කළ නමුත් අධිකරණ නිවාඩු කාලයක් වූ 2010 අගෝස්තු මාසයේදී පැවත් වූ පළමු යුධ අධිකරණය මඟින් හමුදා නිල ඇඳුමින් දේශපාලනයේ නියැලීම පිළිබද වැරදිකරු කළ අතර ඔහු සතු වූ නිලයන්, පදක්කම් සහ විශ්‍රම වැටුප් අහෝසි කරන ලදී. එය 2009 වසරේදී එල්.ටී.ටී.ඊ සංවිධානයට විරුද්ධව ලැබූ යුධ ජයග්‍රහණය නිසා තරු හතරේ හමුදා නිලයක් හොබවනු ලැබූ ශ්‍රී ලංකාවේ එකම හමුදා නිලධාරියාගේ වෘත්තියෙහි අමිහිරි අවසානය විය.

මැතිවරණයේ ප්‍රතිඵලය තීරණාත්මක වුවද, ඡන්දය ප්‍රකාශ කිරීමේ සැලකිය යුතු වෙනස්කම් දැකගත හැකි විය. 1990 මැද භාගයේදී යුද්ධයේ නරකම තත්ත්වයක් අත් දුටු උතුරු සහ නැගෙනහිර බොහෝ දිස්ත්‍රික්කයන්හි ෆොන්සේකා තීරණාත්මක ලෙස ජයග්‍රහණය කළේය. ඔහුට කොළඹ දිස්ත්‍රික්කයේදී සැලකිය යුතු මට්ටමක ඡන්ද ප්‍රතිශතයක් ලැබුණි. ඡන්දය ප්‍රකාශ කිරීමේ දැකිය හැකි වූ ධ්‍රැවීකරණය සහ ඒ ආශ්‍රිත සිදුවීම් පෙන්නුම් කළේ ප්‍රතිසන්ධානය පිළිබද ඇති බලාපොරොත්තුවට වඩා එදිරිවාදිකම්වල ගැඹුරුබවය. මැතදී, ප්‍රමුඛ පෙළේ ලේඛකයකු ශ්‍රී ලංකාවේ අධිපති සිංහල බහුතරයේ මුඛ්‍යධාරාවේ දේශපාලනයට යටපත් කිරීමේ ලක්ෂණයක් ඇතුල්වී ඇතැයි කණගාටුව පළ කර සිටියේය.[6]

ජනමාධ්‍ය දෘෂ්ඨිකෝණයෙන් බැලූ විට, උතුරේ ඡන්ද ප්‍රකාශිත ප්‍රතිශතය අවධානය හේතුවකි. ෆොන්සේකා උතුරේ ජයග්‍රහණය කළද, ඡන්ද ප්‍රකාශ කර තිබුණේ යාපනය දිස්ත්‍රික්කයේ ලියාපදිංචි මුළු ඡන්ද දායකයින්ගෙන් 26% ක් පමණි. උතුරේ තවත් දිස්ත්‍රික්කයක් වන වන්නි දිස්ත්‍රික්කයේ එම ගණන යාපනයට වඩා තරමක් 40% ක් විය. ඡන්දය ප්‍රකාශ කිරීමේ ජාතික ප්‍රතිශතය 74.5% ක් විය. අභ්‍යන්තර අවතැන් පුද්ගලයන් නිදහස් කළැයි කියා තිබූ නිසා යාපනය සහ වන්නි ප්‍රදේශ වල පිහිටා තිබූ කඳවුරු වල සිටි ලියංපදිංචි ඡන්ද දායකයින් ගණන සාමාන්‍යයෙන් පහළ මට්ටමක පැවැතිණි. එය පිළිවෙළින් 15,602 සහ 29,940 කි. නමුත් ඒවායේ ඡන්ද ප්‍රකාශ කිරීමේ ප්‍රතිශතය පිළිවෙළින් 65.04% සහ 51.42% වශයෙන් සැලකිය යුතු මට්ටමක පැවතිණි.

මෙම දිස්ත්‍රික්කයන්හි ඡන්ද ප්‍රකාශ කිරීමෙහි පහළ මට්ටම, ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යය යුද්ධයේ දරුණුම ප්‍රහාරයන්ට ගොදුරු වූ දෙමළ ජනයාගේ සුභ සිද්ධිය සහ දේශපාලන අභිලාශයන් කියා පෑමට කෙතරම් දුරකට සමත්වූයේද යන ප්‍රශ්නය මතුකරයි. මැතිවරණ ව්‍යාපාරය හෝ ඡන්ද ප්‍රකාශ කිරීම හරහා ඔවුන්ගේ හඬ නොඇසීම නිසා ඔවුන්ගේ සාධාරණ අවශ්‍යතාවයන් වෙත හිමි විය යුතු අවධානය නොලැබීම කණගාටුදායක තත්ත්වයකි.

මෙම මැතිවරණ කාලය පුරාම රාජ්‍ය ජනමාධ්‍ය පුළුල් අන්දමින් අයුතු ලෙස යොදා ගැනීමද ස්වාධීන ජනමාධ්‍යයන් මත යළි පතිතවූ මර්දනයද දැකිය හැකි විය. රාජ්‍ය පාලිත රූපවාහිනියේ සේවය කළ ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයන් කිහිප දෙනෙක්ම ජනාධිපතිවරණායෙන් පසු තනතුරුවලින් ඉවත් කරන ලදී. නැත්නම් විනය පරීක්ෂණ සඳහා කැඳවීම් ලිපි ලබා දෙන ලදී. ඔවුන්ට එල්ල වූ චෝදනාව වූයේ මැතිවරණ ව්‍යාපාරය තුලදී මැතිවරණ කොමසාරිස්වරයා විසින් නියම කළ සාධාරණත්වයේ ප්‍රතිමානයන් අනුග මනය කරන මෙන් රාජ්‍ය මාධ්‍යයට බලකර සිටීමයි.


ෆොන්සේකාගේ මැතිවරණය ව්‍යාපාරයට සහය දුන් වෙබ් අඩවි කිහිපයක් තහනම් කළ අතර තවමත් ශ්‍රී ලංකාවේ පාඨකයන්ට ඒවාට ප්‍රවේශ විය නොහැකිය. එමෙන්ම සතිපතා පුවත්පතක් වන ලංකා

4 The August report titled "The Shame of Menik Farms" is available at http://www.groundviews.org/2009/08/23/the-shame-of-menik-farm/ and the October report at: http://www.groundviews.org/2009/10/13/breaking-news-flooding-and-unrest-again-at-menik-farm/.

5 බලන්න "180 days after the end of war, the return of the IDPs: an eye-witness account", available at: http://www.groundviews.org/2009/11/18/180-days-after-end-of-war-the-much-anticipated-return-of-idps-an-eyewitness-account/#more-2026

6 බලන්න the well known political scientist, Dayan Jayatillake¡s, comment, "Sarath Fonseka Affair: Political Cannibalism Must Cease in Sri Lanka!", February 15, 2010, available at: http://www.groundviews.org/2010/02/15/sarath-fonseka-affair-political-cannibalism-must-cease-in-sri-lanka/.

## මව්බිම - සැමට වාර්තා කිරීම හේතුවෙන් ඉලක්කයක් වූ පුවත්පත




තිසෙයිනායගම්, ජසීහරන් සහ වලර්මතී ත්‍රස්තවාදී චෝදනා යටතේ දින 300 සිරගත කර සිටීමට වෙනුවෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සකස්කළ පෝස්ටරයක්

2006 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකා පොලීසියේ ත්‍රස්ත විමර්ශන අංශය මඟින් මව්බිම පුවත්පතේ සේවය කරමින් සිටි නිදහස් දෙමළ ජනමාධ්‍යවේදිනියක වූ 23 හැවිරිදි මුනුසාමි පරමේශ්වරී අත්අඩංගුවට ගන්නා ලදී. සිව් මසක් රඳවා තබා ගත් ඇය නිදහස් කරන ලද්දේ ජනමාධ්‍ය නිදහස පිළිබඳ ජාතික සහ ජාත්‍යන්තර සංවිධාන මඟින් කෙරුණු පුළුල් දෝෂාරෝපණයකින් පසුය. නිදහස ලැබීමට පෙර ඇය රජයේ අමාත්‍යවරුන්ගේ සහ රාජ්‍ය මාධ්‍යන්හි නිරන්තර හෙළාදැකීම් වලට ගොදුරු වූවාය.

පරමේශ්වරී අත්අඩංගුවට ගැනීම, යුද්ධයේ අවසන් අදියරේ දී ශ්‍රී ලංකාවේ සිවිල් ජීවිත වල අඳුරු සෙවණැල්ලක් ඇති කළා වූ මානව අයිතීන් උල්ලංඝණය කිරීම් අතරින් එකක් වූ, දේශපාලන අනුග්‍රහය ඇතිව පෘතුලව පවත්වාගෙන ගිය රහසිගත පැහැරගෙන යාමේ කල්ලි පිළිබඳ ඇය විසින් කළ වාර්තා සම්බන්ධයෙන් කළ පළිගැනීමක් විය. තවද, මෙම අත්අඩංගුවට ගැනීම තුළ මහින්ද රාජපක්ෂගේ දේශපාලන සමීපතමයෙකු වී සිටියද, අළුතින් ආරම්භ කළ ඔහුගේ පුවත්පතෙහි ස්වාධීන සංස්කරණ පිළිවෙත සීමාකරන ලෙස ජනාධිපතිවරයා විසින් කිහිප වරක්ම කළ ඉල්ලීම් නොතකා කටයුතු කළ පුවත් පතේ ප්‍රකාශකයා වූ ටිරාන් අලස් වෙතද පැහැදිළි පණිවුඩයක් විය.

සත්‍ය වශයෙන්ම මව්බිම පුවත්පත, මානව හිමිකම් පිළිබඳ සැළකිළිමත් නව ප්‍රවෘත්ති හා සංස්කරණ ප්‍රතිපත්තියක් ඇතිකරගෙන තිබූ අතර රටෙහි ජනයා අතර වූ ගැඹුරු වාර්ගික බෙදීම් අවම කිරීම සඳහා වඩාත් විශ්වාසදායී පුවත්පතක් ලෙස ඇගයීමටද ලක්වී තිබිණි. ඉතා කෙටි කාලයක් තුළ මව්බිම පුවත්පත බෙදා හැරුණු පිටපත් ප්‍රමාණය අනුව ශ්‍රී ලංකාවේ සිංහල පුවත්පත් අතර දෙවන ස්ථානය හිමි කර ගත්තේය.

2007 පෙබරවාරි මාසයේදී මව්බිම සහ එහි සහෝදර ඉංග්‍රීසි මාධ්‍ය පුවත්පතේ සංස්කරණ අධ්‍යක්ෂවරයා වෙත ජනාධිපතිවරයාට හෝ ඔහුගේ දේශපාලන වශයෙන් ක්‍රියාකාරී සහෝදරයන්ට විරුද්ධව කිසිදු ලිපියක් පුවත්පතේ පල නොකරන ලෙසට බල කරමින් මරණ තර්ජනය එල්ල කරන ලදී. මෙම පුවත්පත් හිමි සමාගම වන ස්ටැන්ටඩ් පේපර්ස් වෙතින් ප්‍රචාරක දැන්වීම් ඉවත් කර ගන්නා ලෙසට ජනාධිපතිවරයා විසින් ප්‍රචාරක දැන්වීම් ලබා දෙන්නන් කිහිපදෙනෙකුටම බල කර ඇති බව විශ්වාස කෙරේ. 2007 පෙබරවාරි මාසයේදී ප්‍රකාශක සමාගම විසින් දෙමළ බෙදුම්වාදීන්ට මුදල් දී ඇතැයි යන චෝදනාව මත ආයතනයෙහි මූල්‍ය අධ්‍යක්ෂවරයා ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් අත්අඩගුවට ගන්නා ලදී. ඔහුව දින 72ක්, වාර්තා වූ පරිදි, ඉතා නින්දා සහගත ආකාරයට රඳවා ගනු ලැබිණි.

ටිරන් අලස්ද සතියට දෙතුන් වතාවක් ප්‍රකාශන සටහන් කර ගැනීම සඳහා ත්‍රස්ත විමර්ශන ඒකකයට කැඳවනු ලැබිණි. ඇතැම් දිනවලදී නිමාවක් නොමැතිව ඔහුගෙන් ප්‍රශ්න කරන ලදී. 2007 මාර්තු පස්වන දින ත්‍රස්ත විමර්ශන ඒකකයේ නිලධාරීන් ඔහුගේ ව්‍යාපාර කාර්යාලය වැටලූ අතර සියළු මූල්‍ය වාර්තා සහ ලිපි ඔවුන් භාරයට ගන්නා ලදී. පසුදින අලස්ගේ සමූහ ව්‍යාපාරය සතුව තිබූ උතුර සහ නැගෙනහිර පළාත් වල ජංගම දුරකතන බෙදා හැරීමේ හිමිකාරත්වය අහෝසි කරනු ලැබීය. දින දෙකකට පසු රජය විසින් පුවත්පතෙහි සහ ඒ හා සම්බන්ධ සියළු සමාගම් වල ගිණුම් අත් හිටුවන ලදී.

සන්ඩේ ස්ටැන්ඩ් සහ මව්බිම පුවත්පත් අවසන් වරට නිකුත් වූයේ 2007 මාර්තු මස 24 වන දිනය. පුවත්පත් දෙකම ප්‍රකාශණය කර තිබුණේ වසරකට අඩු කාලයකි. අලස් ප්‍රශ්න කිරීම සඳහා කැඳවීම නොනැවතුන අතර ඔහු 2007 මැයි මාසයේදී අත්අඩංගුවට ගැණෙන තෙක් අඩන්තේට්ටම් අවසන් වූයේ නැත. අවසානයේ දී ඔහුට විරුද්ධව කිසිදු චෝදනාවක් ගොනු නොකොට අධිකරණ නියෝග මත සති දෙකක් ඇතුළත දී ඔහු නිදහස් කරනු ලැබීය.

පුවත්පතෙහි කර්තෘ අත්අඩංගුවට ගන්නා ලද අතර ඔහුගේ කාර්යාලටටද සීල් තබන ලදී. පසුව මෙම ක්‍රියාමාර්ග දෙකම අධිකරණ නියෝග මත අවලංගු කෙරුණි.

ෆොන්සේකාගේ මැතිවරණ ව්‍යාපාරයට තදින්ම සහයෝගය දැක්වූ පුවත් වෙබ් අඩවියක සේවය කළ ජනමාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ ජනවාරි 24 වන දින රාත්‍රී සිය නිවෙස බලා යමින් සිටියෙදී අතුරුදහන් විය. අද වන තුරු ඔහු පිළිබද කිසිදු තොරතුරක් ලැබී නැත.

මානව හිමිකම් පිළිබද එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරිය වන නවනීදම් පිල්ලේ විසින් 2010 මාර්තු 06 වන දින එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට සිය වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමින් පහත දැක්වෙන ආකාරයෙන් ශ්‍රී ලංකාවේ තත්ත්වය විස්තර කළාය. "ජනමාධ්‍යවේදීන්ට, මානව හිමිකම් ආරක්ෂකයන්ට සහ රජය විවේචනය කරන වෙනත් පුද්ගලයින්ට සලකන විෂම ආකාරය නිසා ශ්‍රී ලංකාවේ සාමය සහ ප්‍රතිසන්ධානය සදහා ඇති අවස්ථාවට දිගින් දිගටම බාධා සිදු වේ. මගේ අවබෝධය අනුව ශ්‍රී ලංකාව යුද්ධය පැවති වකවානුවේදී සියළු පාර්ශවයන් විසින් සිදු කරන ලද බරපතල ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබද පූර්ණ ගවේෂණයක් සිදු කළ යුතු අතර ඒ සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රජාවට උපකාරී විය හැකිය."

මෙම සන්දර්භය තුළ ශ්‍රී ලංකාණ්ඩුව 2006 වසරේදී මානව හිමිකම් කවුන්සිලයේ සාමාජිකත්වය සදහා තරග කළ අවස්ථාවේදී ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස උල්ලංඝණය වීම් පිළිබද සොයා බැලීම පිණිස ප්‍රකාශණයේ අයිතිය පිළිබද එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයාට ආරාධනා කරන බවට පොරොන්දුවක් ලබා දුන් බව සඳහන් කිරීම වටී. පසුව 2009 අගෝස්තු මාසයේදී එකී විශේෂ නියෝජිත කාර්යාලයෙන්

ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය නිදහස සොයා බැලීමට ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කළේය. තවමත් එම ඉල්ලීමට ආණ්ඩුව විසින් ප්‍රතිචාරයක් දක්වා නොමැත.

## උත්සන්න වූ එදිරිවාදිකම් මාධ්‍ය නිදහස පිළිබඳ ව්‍යාපාරය යටපත් කරයි

සාම සාධක හමුදාවක් ලෙස ඉන්දීය හමුදා ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු එල්.ටී.ටී.ඊ සංවිධානය සහ ඉන්දීය භට කණ්ඩායම් අතර ඇති වූ දරුණු ගැටුම් සහ සිංහල ජාතිවාදයට නැඹුරුව දකුණේ වාමාංශික දේශපාලන ව්‍යාපාරයක් වූ ජනතා විමුක්ති පෙරමුණ විසින් දියත් කළ කැරැල්ල දරුණු ලෙස මැඩ පැවැත්වීම යන සිදුවීම් අත්දුටු අඳුරු කාල පරිච්ඡේදයක් වන 1980 අග භාගයෙන් පසුව, ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදීන් මුහුණ දුන් ඉතා දුක්ඛදායක කාලයක් වූයේ යුද්ධයේ අවසාන කාල පරිච්ඡේදය යි. 2005 අප්‍රේල් මාසයේදී ප්‍රසිද්ධ ලේඛකයකු සහ විශ්ලේෂකයකු වූ කලකට පෙර දෙමළ දේශපාලන කණ්ඩායමක නායකයකු වී සිටි ඩී. සිවරාම් හෙවත් තාරකී කොළඹ කාර්ය බහුල ප්‍රදේශයකදී පැහැරගෙන යන ලදී. පසුදා උදෑසන වෙඩි වැදුණු තුවාල සහිත ඔහුගේ සිරුර සොයා ගැණින. ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන, විශේෂයෙන් දෙමළ දේශපාලන අරුමණු හා එකඟ වූ ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන, ඉලක්ක කෙරුණු ප්‍රහාර පසුව එළඹි මාස ගණනාව පුරා පුනරාවර්තී ලක්ෂණයක් බවට පත්විය.

2009 ජනවාරි මාසය, මාධ්‍ය ප්‍රජාව සහ බලධාරීන් අතර පැවති ආතතියේ දීර්ඝ ඉතිහාසය තුළ ඉතා වැදගත් සන්ධිස්ථානයක් බවට විය. ප්‍රධාන යුධ භූමිය අල්ලාගත් රජය පසුවූයේ ජයග්‍රාහී මනෝභාවයකය. විසම්මුතිය සඳහා පැවති ඉඩකඩ ඉක්මණින් අවසන් විය. ද සන්ඩේ ලීඩර් පුවත්පතේ කර්තෘ සහ ශ්‍රී ලංකාවේ වඩාම සුපතල උද්ඝෝෂනික ජනමාධ්‍යවේදියා ලෙස සැම දෙනාම දැන සිටි ලසන්ත වික්‍රමතුංග ඝාතනය එම මාසය තුළ ජනමාධ්‍යයට එරෙහිව සිදුවූ වඩාම සාහසික සිදුවීම විය. තවද, 2009 ජනවාරි මාසය, කොළඹ පිහිටි සිරස රූපවාහිනී මැදිරියට ගිණි බෝම්බ ප්‍රහාරයක් ද රජයේ මතයට අනකූල සිංහල පුවත් පතක කර්තෘවරයා වූ උපාලි තෙන්නකෝන්ට එල්ල වූ සාහසික කිනිසි ප්‍රහාරයක් ද අත් දුටුවේය.

සුදර් ඔලි පුවත් පතේ එන්. විද්‍යාදාරන් පවුලේ අවමගුලකට සහභාගි වෙමින් සිටි අවස්ථාවකදී පැහැරගැනීමේ ආකාරයක අත්අඩංගුවට ගැනීම 2009 පෙබරවාර් 27 වන දින වාර්තා වූ අතර ඔහු අත්අඩංගුවේ පසු වන බව ප්‍රකාශයට කෙරුණේ පැය 5 කට පසුවය . දින කිහිපයකට පසු, ඕස්ට්‍රේලියානු රූපවාහිනී කැමරා කණ්ඩායමක් ආරක්ෂක අමාත්‍යංශ ලේකම්වරයාගෙන් විද්‍යාදරන් පිළිබඳ විමසූ විටදී එම ප්‍රශ්ණය ඇසූ වාර්තාකරු ත්‍රස්තවාදී හවුල්කරුවෙකු ලෙස සැළකිය හැකි බව බවට අනතුරු හඟවන ලදී. විද්‍යාදරන් "ත්‍රස්තවාදියෙකු" ලෙස සැලකිය හැකි නිසා ඔහු පිළිබඳ විමසුවහොත් " ඔබගේ දැත් වලත් ලේ තැවරේවි" යනුවෙන් ආරක්ෂ ලේකම්වරයා ප්‍රකාශ කළේය. මාර්තු 11 වන දින එම සාකච්ඡාව ස්ක පුවත් නාලිකාව ඔස්සේ විකාශනය කරන ලදි. අත්අඩංගුවේ සිටින පුද්ගලයා පෙබරවාරි 20 වන දින කොළඹට එල්ල වූ ගුවන් ප්‍රහාරයට සම්බන්ධ බවට ආරක්ෂක අමාත්‍යංශ ලේකම් වරයා සතුව සාක්ෂි ඇති බව රජය ප්‍රකාශ කළේය. මාස දෙකකට පසු කොන්දේසි විරහිතව විද්‍යාධරන් නිදහස් කරන ලද අතර ඔහුට විරුද්ධව තිබූ චෝදනා විමර්ශනය කළ පොලීසිය, කිසිදු වරදක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිදු සාක්ෂියක් නොමැති බව අධිරකරණයට දන්වා සිටියේය.

ජනමාධ්‍යවේදීන් තුළ අනතුරට භාජනය වීමේ ඉඩකඩ පිළිබඳ හැඟීම තවත් වර්ධනය වීමට හේතු වූ සිදුවීමක් වූයේ 2008 මාර්තු 08 වන දින අත්අඩංගුවට ගෙන 2009 අගෝස්තු මාසයේදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ 20 වසරක සිර දඬුවමක් ලබාදුන් ජේ.එස්. තිසෙයිනායගම් නඩුවයි. ඔහුට විරුද්ධව චෝදනා ගොනු කරන ලද්දේ අත්අඩංගුවට ගැනීමට වසර තුනකට පමණ පෙරදී, (දැන් පළ නොවන) නොර්ත් ඊස්ටර්න් මන්ත්ලි නම් සඟරාවට ලියා පළ කරන ලද ලිපි දෙකක් සම්බන්ධයෙනි. ඔහු කරන ලද වැරැද්ද වූයේ හමුදා භට පිරිස් විසින් සිදු කරන ලද මානව හිමිකම් උල්ලංඝණයන් සහ යුද්ධයෙන් අවතැන් වූවන් මුහුණ දෙන මානුෂීය අර්බුද පිළිබඳ වාර්තා කිරීමයි. ප්‍රබල ජාත්‍යන්තර උද්ඝෝෂණයකින් පසු ඔහු 2010 ජනවාරි මාසයේදී ඇප මත මුදා හරින ලද අතර මැයි 03 වන දින ඔහුට ජනාධිපති සමාවක් පිරිනමන ලදී. දැන් ඔහු රට හැර ගොස් සිටී. රජයට විරුද්ධවීම හේතුවෙන් සෙසු ජනමාධ්‍යවේදීනට මුහුණ දීමට සිදු විය හැක්කේ කුමන තත්ත්වයන්ටදැයි පෙන්වාදෙන උදාහරණයක් බවට තිසේනායගම් නඩුව පත්විය.

එක්සත් ජාතීන්ගේ ඇස්තමේන්තු වලට අනුව ජීවිත ලක්ෂයක් බිලි ගත් යුද්ධය සහ රටෙහි සුළුතරය වන දෙමළ ජනතාව සහ සිංහල ජනයා අතර පවතින වාර්ගික ආතතීන් විසින්, ජාතිකවාදී මෙන්ම දේශපාලන වශයෙන් ද බෙදී ඇති ජනමාධ්‍ය මත නොමැකෙන කැලලක් ඇතිකර තිබේ. නමුත් ජනමාධ්‍යවේදීන් පවසන ආකාරයට රාජපක්ෂ - ෆොන්සේකා දේශපාලන ගැටුමෙහි ප්‍රබලත්වය විසින් ජනමාධ්‍ය පෙර නොවූ ආරයේ පක්ෂග්‍රාහිත්වයන් වෙත යොමු කර ඇති අතර එහි විපාක ලෙස ඇතැම් ජනමාධ්‍යවේදීන් නව අනතුරු වලට නිරාවරණය කොට තිබේ.

උත්සන්න වූ ප්‍රහාරයන් හේතුවෙන් 2009 දී මාධ්‍ය නිදහස සඳහා වූ ව්‍යාපාරයන්හි හදිසි බිඳ වැටීමක් දක්නට ලැබිණි. නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් පෙරමුණ ගන්නා ලද මාධ්‍ය අයිතීන් වෙනුවෙන් පෙනී සිටින කණ්ඩායම් සමූහය විසින් පවත්වාගෙන ගිය කොළඹ පිහිටි ආරක්ෂක නිවස සහ මාධ්‍ය මධ්‍යස්ථාන වසා දැමීමට සිදු විය. ප්‍රකාශනයේ නිදහස උල්ලංඝණයවීම් පිළිබඳ මාධ්‍ය ප්‍රකාශන නිකුත් කෙරුණේ දුර්ලභ වශයෙනි. දේශපාලඥයන් විසින් සිදුකළ ජනමාධ්‍ය විරෝධී නිවේදන පිළිබඳ කිසිදු ප්‍රශ්ණ කිරීමක් නොවූ අතර රාජ්‍ය පාලිත මාධ්‍ය විසින් ජනමාධ්‍ය නිදහස වෙනුවෙන් කටයුතු කළ සංවිධානවලට සහ මාධ්‍ය ක්‍රියාකාරීන්ට දිගින් දිගටම චෝදනා එල්ල කරන ලදී.

මාධ්‍ය නිදහස පිළිබඳ දේශීය ක්‍රියාකාරිත්වයේ කැපී පෙණුන දුර්වලවීම සමග 2009 වසර පුරා ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය නිදහස ආරක්ෂා කර ගැනීම සඳහා තිබූ බලවේගය වූයේ ජාත්‍යන්තර අධිවාචනයයි. 2009 මැයි මාසයේදී ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය ශ්‍රී පිළිබඳ දිර්ඝ විස්තරයක් අඩංගු වූ දකුණු ආසියාව පිළිබඳ සිය වාර්ෂික වාර්තාව, ප්‍රහාරය මධ්‍යයේ, දකුණු ආසියානු ජනමාධ්‍ය නිදහස පිළිබඳ වාර්ථාව 2008-2009 නමින් ප්‍රකාශයට පත් කරන ලදී . එම වසරේම නොවැම්බර් මාසයේදී ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය විසින් නායකත්වය දෙනු ලැබූ මාධ්‍ය නිදහසේ ජාත්‍යන්තර දූත මෙහෙය සිවුවන වරටත් ශ්‍රී ලංකාවට සංචාරය කළ අතර එහි වාර්තාව ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය සහ රජය වෙත නිර්දේශ ඉදිරිපත් කරමින් 2010 ජනවාරි මාසයේදී ප්‍රකාශයට පත් විය.

2009 වසරේ මාර්තු, ජූනි සහ සැප්තැම්බර් මාස වලදී පැවැත් වූ එක්සත් ජාතීන්ගේ කවුන්සිලයේ සැසිවාරයන්හිදී ආණ්ඩු සහ රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක්ම ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසෙහි තත්ත්වය වඩාත් නරක අතකට හැරීම පිළිබඳ දිගින් දිගටම සැළකිල්ල යොමු කළහ. යුරෝපීය සංගමය, නව අවධාරණයක් යොදමින් ඊනූ පහසුකම යටතේ ශ්‍රී ලංකාවට ලබා දුන් වෙළඳ සහන අලුත් කිරීම සඳහා පූර්ව කොන්දේසියක් ලෙස මාධ්‍ය නිදහස පිහිටුවීමත් මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සඳහා වගවියයුතු භාවය ස්ථාපිත කිරීමත් ඉදිරිපත් කළේය.

2009 වසර අවසන් වන විට ජනාධිපතිවරණය හේතුවෙන් නිර්මාණය වූ දේශපාලන අවකාශයට ස්තුති වන්නට තරමක ශක්තියක් ලබා ගත් ජනමාධ්‍ය නිදහස පිළිබඳව උනන්දු දේශීය සංවිධාන මාධ්‍ය ප්‍රතිසංස්කරණ සඳහා න්‍යාය පත්‍රයක් සියළු අපේක්ෂකයන් වෙත ඉදිරිපත් කළේය. රාජ්‍ය පාලිත මාධ්‍ය කවුන්සිලයක් නැවත පිහිටුවීමට විරුද්ධ වීම සඳහා ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ප්‍රජාව නැවත වතාවක්



නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ ක්‍රියාකාරීහු ලසන්ත වික්‍රමතුංගගේ දේහය සියකරින් ගෙය යති. (ජායාරූප ස්තුතිය: නි.මා.ව්‍යා.)

අභිප්‍රායෙන් සහ ක්‍රියාවෙන් එක්සත් වූහ. මාධ්‍ය නිදහස සහ සමාජ වගකීම පිළිබඳ කොළඹ ප්‍රකාශණයෙහි දස වන සංවත්සරය සැමරූ අවස්ථාවෙදී මෙම නව ජවය කැපී පෙණනි.

## ජනමාධ්‍යවේදීන් ආරක්ෂාව සඳහා පළා යාම

කෙසේ වුවද මාධ්‍යවේදීන්ගේ ධෛර්ය දිගින් දිගටම පහල වැටීම නතර වූයේ නැත. ප්‍රකට ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය නිදහස වෙනුවෙන් පෙනී සිටි ක්‍රියාධරයන් බොහොමයක්, ජීවිතාරක්ෂාවට පහසුම  විකල්පය තෝරා ගෙන රටින් පළා ගියහ. එසේ නමුත් තමන් සහ තමන්ගේ පවුලේ සාමාජිකයන් රටින් පිටවී ජීවත් වීම පිළිබඳ කිසිදු දීර්ඝ කාලීන සැලැස්මක් ඔවුන්ට තිබුණේ නැත. ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය නිදහස :ඒඕබ* නම් වූ මෑතකදී පිහිටවූ සංවිධානයකට අනුව 2009 වසරේදී අවම වශනේ මාධ්‍ය කරුවන් 34 දෙනෙකු වත් රටින් පිටවී ගොස් ඇත. මින් 24 දෙනෙකු බටහිර රටවලින් දේශපාලන රැකවරණ ඉල්ලා ඇත. 2010 මුල භාගයේදී තවත් මාධ්‍යවේදීන් 13 දෙනෙකු රට හැර ගොස් ඇත. මර්දනය දිගටම පැවතිය හොත් තමනුත් රට හැර යාමට බලාපොරොත්තු වන බව තවත් මාධ්‍යවේදීන් බෙහෝ දෙනෙක් ප්‍රකාශ කර ඇත.

2009 වසරේදී රට හැර ගිය පිරිස අතර පෝද්දල ජයන්ත ද එකි අයෙකි. ඔහු, 2009 ජූනි 1 වන දින සවස පැහැරගෙන ගොස් පැය කිහිපයක් තිස්සේ දරුණු පරහදීම් වලට භාජනය කරන ලදී. සදාකාලික ආබාධිත තත්ත්වයට පත්වන පරිදි ඔහුගේ එක් පාදයක් බරපතල ලෙස බිඳදමා තිබුණි.

නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ හිටපු කැඳවුම්කරු සුනන්ද දේශප්‍රිය නැවත පැමිණීමට නොහැකිව මේ වන විට ජිනීවාහි ජීවත් වෙයි. රජයේ වෙබ් අඩවි සහ ගුවන් විදුලි වැඩසටහන් හරහා ද්‍රෝහියෙකු ලෙස ප්‍රසිද්ධියේ චෝදනාවට ලක් කිරීමෙන් පසු ජීවිත ආරක්ෂාව සඳහා 2009 දී ඔහුද රටින් පිට විය.

2010 ජනවාරියේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන් විමෙන් කිහිප දිනකට පසු ලංකා ඊ නිවුස් හි කර්තෘ සඳරුවන් සේනාධීර රට හැර ගියේය. ඔහු දැන් ලන්ඩනයේ ජීවත් වන්නේ නැවත පැමිණීමට නොහැකි නිසාය. ඔහු මෙම වෙබ් අඩවිය පවත්වාගෙන ගිය වසර 5 ඇතුළත පොලීසිය විසින් කිහිප අවස්ථාවකදීම ප්‍රශ්න කිරීම් වලට බඳුන් කළ නමුත් කිසි විටෙක දිගු කාලයක් රඳවා ගත්තේ හෝ කිසිදු චෝදනාවක් ගොනු කළේද නැත. ඔහු රටින් පිට වීමට පෙර පවසා සිටියේ, "කිසිදු වැරැද්දක සිදු කර නොමැති නිසා නීතිමය ක්‍රියාමාර්ග ගැනෙත්දී ඒ පිළිබඳ කලබල නොවූ" බවයි. "නමුත් ප්‍රගීත් එක්නැලිගොඩ පැහැර ගත් විට තත්ත්වය වෙනස් වී ඇති බවත් බිය නොවී සිටිය හැකි කාලය අවසන් වී ඇති බවත්, නීති තව දුරටත් අදාල නොවන බවත්, මට අවබෝධ වුණා. වෙබ් අඩවිය අත හැරීම, රජය සමඟ සටන් කිරීම හෝ මා නොපෙනී යාම යන විකල්ප තුන මා සතු වුණා. මට පරාජිත හැඟීමක් නැහැ. නමුත් මා විඩාබරයි." යනුවෙන් ඔහු තව දුරටත් පැවසීය.

ඇතැම් ජනමාධ්‍යවේදීහු රට හැර ගොස් සිටින්නේ ස්ථිරවය. සෙසු අය තම මව් බිම කරා නැවත පැමිණීම සඳහා රශ්ණය පහව යන තෙක් බලා සිටිති. 2010 මාර්තු මාසයේදී, නීතිපති මෙහාන් පීරිස් විසින්, රට නැවත ගොඩ නැංවීම සඳහා රටින් පිටවී සිටින ජනමාධ්‍යවේදීන් අවශ්‍ය කරන බැවින් නැවත පැමිණෙන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටියේය. ඔහු පැවසුවේ ජනමාධ්‍යවේදීන් රටින් පිටවී ගෙස් රජයට 'පහර ගැසීමෙන්' ප්‍රයෝජනයක් නොමැති බවයි. "නැවත පැමිණ අප සමඟ වැඩ කරමින් ව්‍යුහයන් නැවත ගොඩ නැංවීමට සහය දුන් විට එකිනෙකාට ගෞරවයෙන් එක්ව වැඩ කිරීමට හැකි වනු ඇති" බව ද ඔහු පැවසීය. රටින් පිට වී සිටින ජනමාධ්‍යවේදීන් නැවත පැමිණිය හොත් ඔවුන්ගේ ආරක්ෂාව ද සහතික කරන බව පීරිස් පැවසුවේය.

කෙසේ වුවද ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන ජනමාධ්‍යවේදීන් :ඝී*, පිරිස්ගේ රැකවරණය අමතමින් ඔහුගෙන් ඉල්ලා සිටියේ මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් ඔහුගේ ප්‍රකාශය සැබෑ බව ඔප්පු කිරීමට සුදුසු පියවර ගන්නා ලෙසයි. පීරිස් විසින්, නැවත පැමිණීමට බලාපොරොත්තුවෙන් රටින් බැහැරව සිටින ජනමාධ්‍යවේදීන් වෙත ප්‍රකාශයට පත් කළ රැකවරණය ක්‍රියාත්මක කිරීමේ මූලික පියවරක් ලෙස, 'ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන ජනමාධ්‍යවේදීන්' විසින් ඔහුගේ එම යහපත් අදහස අතුරුදහන් වූ ප්‍රගීත් එක්නැලිගොඩ පිළිබඳ හෝඩුවාවන් හෙළි කිරීමෙන් සහ තවමත් නොවිසඳුනු රාජපක්ෂ පාලනය යටතේ ජනමාධ්‍ය වෘත්තිකයන්ට සිදුවු අපරාධ පිළිබඳ පරීක්ෂණ ඉක්මන් කිරීමෙන් මෙන්ම, වගකිව යුත්තන් අධිකරණයට පැමිණවීමෙන්ද ඔප්පු කරන මෙන් අභියෝග කරන ලදී. "ශ්‍රී ලංකාවේ කටයුතු කරන ජනමාධ්‍යවේදීන්ගේ බිය අවම කිරීම සඳහා සහ දුර්විපාක නොලබා සිටීමේ සංස්කෘතිය අවසන් කිරීමට සුදුසු පියවර රජය විසින් නොගන්නේ නම්, නීතිපතිවරයාගේ ප්‍රකාශයන් තවත් එක් හිස් පොරොන්දුවක් පමණක්ම වන බවත්, රටට ආදරය කරන ජනමාධ්‍යවේදීන්ට නැවත සිය රට පැමිණීම දුරස්ථ වූ සිහිනයක්ම වන බවත්" ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන ජනමාධ්‍යවේදීන් සිය ප්‍රකාශ මගින් පෙන්වා දී තිබුණි.

## සමගියෙන් අරගල කිරීම - මාධ්‍ය ප්‍රජාවෙහි උපාය මාර්ගය

මාධ්‍ය අයිතීන් සුරැකීම සහ මාධ්‍ය නිදහසේ මූලධර්ම සඳහා වන මාධ්‍ය ප්‍රජාවගේ ප්‍රයත්න ආරම්භ වූයේ කර්තෘවරුන්, ජනමාධ්‍යවේදීන් සහ වාර්තාකරුවන් කණ්ඩායමක් එක්ව 1992 දී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ස්ථාපිත කිරීමත් සමඟයි. කොළඹ දී පැවැත්වුණු මෙහි පළමු ජනතා හමුව පුළුල් ප්‍රචාරයක් දිනා ගත් අතර ජනවාර්ගික සහ පක්ෂග්‍රාහී දරුණු ප්‍රචණ්ඩත්වයක් පැවති යුගයෙන් බැහැර වීම පිළිබඳ වූ බොහෝ අභිලාශයන් අතර බලාපොරොත්තුවක් ජනිත කළේය. මෙම උද්යෝගය විසින් "සත්‍ය දැන ගැනීම සඳහා ජනතාවගේ අයිතිය" යන්න පදනම් කර ගනිමින් රට පුරා ජන රැලි සංවිධානය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ධෛර්යමත් කරන ලදී. ජනතාවගේ තොරතුරු දැන

ගැනීමේ අයිතිය සඳහා පමණක් හඩ නැගීමත් ජනමාධ්‍ය කිසිදු විශේෂ වරප්‍රසාදයක් ඉල්ලා නොසිටීමත් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ කේන්ද්‍රීය මූලධර්මය විය.

1990 දශකය සිවිල් අයිතිවාසිකම් සහ ජනමාධ්‍ය නිදහස පිළිබඳ වූ ව්‍යාපාරයන් සම්බන්දයෙන් සළකා බලන කළ අවස්ථාවන් මඟ හැරී ගිය සහ අපේක්ෂා පාවා දුන් යුගයක් බවට පත්විය. 1994 දී නව ආණ්ඩුවක් තේරී පත් වූයේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයක් නැවත පිහිටුවීම සහ ජනවාර්ගික අර්බුදයට සාකච්ඡාමය විසඳුමක් ගෙන එම යන පොරොන්දු සමඟය. නව ආණ්ඩුව අවධානය යොමු කළ ප්‍රධාන ගැටළුවක් වූයේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳ මතු වී තිබූ තත්ත්වයන්ය. ආණ්ඩුව විසින්, මේ සඳහා කමිටු 4ක් පත් කළ අතර ඒවා විසින් ජනමාධ්‍ය නීති ප්‍රතිසංස්කරණය කිරීම සහ භාෂණයේ නිදහස සඳහා බලපාන වෙනත් කරුණු සම්බන්ධයෙන් පුළුල් නිර්දේශ ඉදිරිපත් කළ ලදී. ඉහත කී කිසිදු නිර්දේශයක් නැවත වතාවක් යුධ ප්‍රයත්නය ඇරඹීම හේතුකොට ගෙන ක්‍රියාත්මක නොවුණද  එම වාර්තා අදටත් අදාළව පවතී.

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සිය අධිවාචන ක්‍රියාමාර්ග තුළ ජනමාධ්‍ය නීති පිළිබඳ ප්‍රධාන ප්‍රතිසංස්කරණ 3ක් අරමුණු කර තිබේ. එනම්, තොරතුරු දැන ගැනීමේ නිදහස පිළිබඳ පනත, රාජ්‍ය පාලිත ජනමාධ්‍ය මහජන සේවා ජනමාධ්‍ය බවට පරිවර්තනය කිරීම සහ සාපරාධී අපහාස නීතිය ඉවත් කිරීම යනුය. 2003 දී එවකට අග්‍රාමාත්‍යවරයා වූ රනිල් වික්‍රමසිංහ, අපහාසය අපරාධයක් වන බව දැක්වූ නීතිය ඉවත් කර එය පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගැනීමට වග බලා ගත්තේය.

දේශීය ජනමාධ්‍ය ප්‍රජාව සහ ජාත්‍යන්තර සගයන් අතර පැවති පුළුල් සහයෝගය මත පුවත් පත් පැමිණිලි කොමිසම සහ ජනමාධ්‍ය විද්‍යාලය පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා ජනමාධ්‍ය ආයතනය පිහිටුවීම සඳහා මඟ පෑදිණි. මෙහි ඉතිහාසය, දින තුනක් පුරා පැවති සම්මන්ත්‍රණ මාලාවකින් පසුව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, කර්තෘ සංසදය සහ ශ්‍රී ලංකා වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සංගමය එක්ව මාධ්‍ය නිදහස පිළිබඳ කොළඹ ප්‍රකාශය අත්සන් තැබීම දක්වා දිව යයි. මෙම ප්‍රකාශනය හරහා ජනමාධ්‍ය නීති ප්‍රතිසංස්කරණය සඳහා රජයට වෙත න්‍යාය පත්‍රයක් ඉදිරිපත් කළ අතර, මුද්‍රිත මාධ්‍ය සඳහා වෘත්තීය ආචාර ධර්ම පද්ධතියක් සහ ස්වයං නියාමන යාන්ත්‍රණයක දළ සැකසුමක් යෝජනා කරන ලදී. 2007 දී ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයද මෙම ප්‍රකාශනට අත්සන් තබන ලදී. ශ්‍රී ලංකා ජනමාධ්‍ය ආයතනය සහ පුවත්පත් කොමිසම 2003 වසරේදී ලියාපදිංචි කරන ලද අතර ස්කැන්ඩිනේවියානු රටවලින් සැලකිය යුතු මූල්‍යමය සහයක් දිනා ගත්තේය.

2002 වන විට, ජනමාධ්‍ය වේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය (ෂන) ඇතුළු ජාත්‍යනතර සංවිධාන සමග ඇති කර ගත් හවුල්කාරත්වය ඉතා ශක්තිමක් පදනමක් සකස් කර ගත්තේය. 2000 වසරේ මුල කාලයේදී, ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදීන් මුහුණ දෙන අභියෝග පිළිබඳ දෙදින සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. වාර්ගික පක්ෂපාතීත්වයන්ගෙන් බෙදී සිටි ජනමාධ්‍යවේදීන් හදිසි ප්‍රමුඛතා දෙකක් එනම්, ජනමාධ්‍යවේදීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ තෙරතුරු දැන ගැනීමේ ජනතාවගේ අයිතිය උදෙසා යහපත් ජනමාධ්‍යවේදී විකල්පයන් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමට එකතු වූහ. මෙය, ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය සහ ශ්‍රී ලංකාවේ එහි පාර්ශවකරුවන්ට අවබෝධාත්මක, දීර්ඝ කාලීන උපාය මාර්ගයන් සකස් කිරීමට පදනම සකස් කර දුන්නේය.

2003 අගෝස්තු මාසයේදී, වඩා වගකීමකින් යුක්ත සහ අපක්ෂපාතී ජනමාධ්‍ය භාවිතයක් සකස් කිරීමට එක්ව කටයුතු කිරීම සඳහා වන ප්‍රයත්නයක් වශයෙන් විවිධ භාෂා කතා කරන සහ වාර්ගික කණ්ඩායම් නියෝජනය කරන මාධ්‍ය සංවිධාන දෙදින සම්මන්ත්‍රණයකට සහභාගී වූහ. සාම සාකච්ඡා න්‍යාය පත්‍රය සූදානම් කර තිබූ ඉතා තීරණාත්මක අවධියදී මෙම සම්මන්ත්‍රණය පැවැත්විණි. සහභාගී වූ සියළුම සංවිධාන, ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනයේ ආචාර ධර්ම පද්දතිය ජාතික මිනුම් දර්ශකයක් ලෙස පිළිගත් අතර, එය සාමාජික සාමාජිකාවන් සහ අනුබද්ධ සංවිධාන අතර ප්‍රවර්ධනය කිරීමට එකඟ වූහ. ප්‍රථමයෙන් ජනමාධ්‍යවේදී සංවිධාන එක්සත් කළ වැඩසටහනක් වූයේ ගැටුම් සංවේදී වාර්තාකරණය පිළිබදව ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය විසින් 2004 දී ක්‍රියාත්මක වැඩසටහනකි. අර්බුද අවස්ථාවන්හි ජනමාධ්‍ය හැසිරීම පිළිබඳ වැඩසටහන යටතේ කරන ලද සාකච්ඡාවන්ගෙන් දැකගත හැකිවූයේ මහජනයාගේ අවශ්‍යතා සපුරාලන මාධ්‍ය නොඑසේනම් මහජන සේවා ජනමාධ්‍ය ඇතුළත් වනසේ මාධ්‍ය පිළිබඳ දැක්ම පුළුල් විය යුතු බවය.

ඉන් අනතුරුව ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය සංවිධාන දේශීය සිවිල් සමාජ සංවිධාන සමග සම්මන්ත්‍රණ මාලාවක් පැවැත් වූ අතර, 2004 වසරේදී කොළඹ පදනම් කර ගත් පර්යේෂණ හා අධිවාචන සංවිධානයක් වන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (ඎ) විසින් සියලු අදහස් ඒකාබද්ධ කරමින් මහජන සේවා ජනමාධ්‍ය පිළිබඳ නීති කොටුම්පතක් සකස් කළේය. වික්‍රමසිංහ ආණ්ඩුව වෙත මෙම යෝජනා ඉදිරිපත් කළ අතර 2004 වසර මැදදී පැවැත්වුණු මහා මැතිවරණයෙන් පැවති ආණුඩුව පරාජය වීමත් සමග මෙම මුල්පිරීම් ඉදිරියට ගමන් කිරීම වැළකිණි.

2005 ඔක්තෝබර් මාසයේදී , නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමය සහ මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය සමග තවත් ජනමාධ්‍ය සංවිධාන දෙකක් වන ශ්‍රී ලංකා දෙමළ ජනමාධ්‍ය සන්ධානයද ශ්‍රී ලංකා මුස්ලිම් ජනමාධ්‍ය සංසදයද තවත් ප්‍රදේශීය ජනමාධ්‍යවේදීන්ගේ සංවිධාන 22ක්ද සමග තෝලන්ගමුව නගරයේ පැවැති සමුලුවකදී ඒකාබද්ධ වූහ. එහිදී ඔවුහු, සංවාදයකින් පසුව ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී සහ බහුත්වවාදී ජනමාධ්‍ය සංස්කෘතියක් සහ ශ්‍රී ලංකාවේ මාධ්‍ය සහ මාධ්‍යකරණයේ සමාජීය සහ වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන්, මාධ්‍ය ප්‍රඥප්තියක් සම්මත කර ගත්හ. මෙම ප්‍රකාශය මත පිහිටා, ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ මාධ්‍ය සංවිධාන 5 ඔවුන්ගේ එකමුතු බව ශක්තිමක් තර ගත් අතර ඒකාබද්ධ ක්‍රියාකාරකම් සහ ව්‍යාපාර ඇතුළත් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට එකඟ වූහ.

යහපත් ජනමාධ්‍යයක් ප්‍රවර්ධනය කිරීම සහ රට පුරා විහිදී ගිය මාධ්‍යකරුවන්ගේ ජාලයක් ගොඩනැගීම සම්බන්ධයෙන්, 2004 - 2006 කාලයේදී මාධ්‍ය සංවිධාන 5 මඟින් මෙහෙයවන ලද මහජනසේවා ජනමාධ්‍ය වැඩසටහන හැරුම් ලක්ෂයක් බවට පත් විය. 2006 වසරේදී පළමු වතාවට, මහජන සේවා ජනමාධ්‍යයෙහි වටිනාකම් සමරමින් සහ විශිෂ්ට වාර්තාකරණයන් හඳුනා ගනිමින් ජනමාධ්‍ය ත්‍යාග උත්සවය පැවැත්විණි. මෙම ත්‍යාග වැඩසහන තවත් වසර දෙකක් දක්වා ක්‍රියාත්මක වූ අතර එහිදී විවිධත්වය සහ ඉවසීම පිළිබඳ වාර්තාකරණයද පිළිගැනීමට ලක් කරන ලදී. 2008 වසරේදී, මහජන සේවා ජනමාධ්‍ය තාග්‍ය වැඩසටහන හා සම්බන්ධ කරමින් මානව අයිතින් සුරැකීම පිළබඳ වූ ත්‍යාග වැඩසටහනක්ද ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකාවේ භාෂාමය සහ ප්‍රාදේශීය විවිධත්වය හඳුනා ගනිමින් ත්‍යාග පිරිනැමීම සඳහා අංශ ගණනාවක්ම තිබූ හෙයින් සහභාගිවීම සහ දිනා ගැනීම පිළිබඳ හැඟීමක් දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම පැමිණි ජනමාධ්‍යවේදීන්ට අවබෝධ කර ගැනීමට අවස්ථාවක් උදා විය.

අනතුරුව එළඹී වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ආරක්ෂා කල පවුර වූයේ ජනමාධ්‍ය සංවිධාන පහේ එකමුතුභාවයයි.

## යුද්ධාවසානයෙන් පසු සහන නොමැතිවීම

යුද්ධයේ නරකම කාල වකවානුව අතරතුර සිය භාවිතයේලා ජනමාධ්‍ය ප්‍රජාව තුළ දැනුවත් ක්‍රියාශීලී කණ්ඩායමක් සංවිධානය කිරීම මාධ්‍ය සංවිධාන 5 විසින් සිය උපාය මාර්ගය ලෙස යොදා ගන්නා ලදී. මෙම දැනුවත් ක්‍රියාශීලී කණ්ඩායම ගොඩ නැංවීම සඳහා ජනමාධ්‍යවේදයේ විවිධ දෘෂ්ඨීන් පිළිබඳ පැවැත් වූ පුහුණු වැඩසටහන් හා වැඩමුළු සහය විය. මෙම ක්‍රියාවලියේ ප්‍රධාන ස්ථම්භයන් වූයේ ජනමාධ්‍ය නීති ප්‍රතිසංස්කරණය, ආචාර ධාර්මික ජනමාධ්‍යවේදය සහ

## තිසේයිනායගම් වරදකරුවෙකු කිරීම

2009 අගෝස්තු මස 31 වන දින මුද්‍රිත සහ විද්‍යුත් ජනමාධ්‍යවේදියෙකු මෙන්ම සන්ඩේ ටයිම්ස් හි පුවුල් කියැවීමක් තිබූ තීරු ලිපි රචකයෙකු වූ ජේ.එස්. තිසේයිනායගම්ව කොළඹ මහාධිකරණය විසින් ත්‍රස්තවාදයට සහය දැක්වීම යන චෝදනාව මත බරපතල වැඩ සහිත විසි වසරක සිර දඬුවමකට යටත් කළේය. 2008 අගෝස්තු 25 වන දින ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ නිල වශයෙන් චෝදනා ඉදිරිපත් කරමින් තිසේයිනායගම්, ඔහුගේ ප්‍රකාශක වූ වී. ජසීහරන් සහ ජසීහරන්ගේ සහකාරිය වූ වී. වලර්මතී යන අයට විරුද්ධව මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා ගොනු කරනු ලැබීය. ඔවුන් මාර්තු මාසය මුලදී අත්අඩංගුවට ගෙන මාස පහක් පුරා රැඳවීම් භාරයේ තබාගෙන තිබුණි. එය ශ්‍රී ලංකාවේ පවතින 'හදිසි නීති රෙගුලාසි' යටතේ චෝදනා ගොනු නොකර රඳවා ගැනීම සඳහා ඉඩ ලබා දී ඇති කාලයට වඩා වැඩි කාලයකි. තිසේයිනායගම්ගේ නඩුව අන් අයගෙන් වෙන්ව තනිව විභාගයට ගැණුන අතර ඊට හේතු තවමත් පැහැදිළි නැත.

ඔහු 2006 දී ලියූ ලිපි දෙකට අමතරව ඔහු ස්වෙච්ඡාවෙන් අත්සන් තැබූ බවට කියවුන ප්‍රකාශයක් මත ඔහුට විරුද්ධව අධිචෝදනා ගොනු කරනු ලැබීය. කෙසේ වෙතත් එම ප්‍රකාශය වාර්තා කළ පොලිස් නිලධාරීන් දෙදෙනාගේ සාක්ෂි මත පමණක්ම විනිශ්චකාරවරිය එම ප්‍රකාශය බලකිරීම් යටතේ කළ එකක් වීමේ හැකියාව නොසලකා හරින ලදී. ඔහු ලියූ ලිපි වල තිබූ කරුණු "සාමාන්‍ය මිනිසෙකු" මත ඇති කළ හැකි බලපෑම සැලකිය යුතු බව විශ්වාස කල අධිකරණය විසින් එම ලිපි දෙකට ප්‍රජාවන් අතර අසමගිය හෝ එදිරිවාදිකම් නිර්මාණය කිරීමේ හැකියාව නොතිබුණු බවට වූ විත්තියේ තර්කය නොසලකා හරින ලදී. එම ලිපි ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති පරිදි ප්‍රකාශණයේ නිදහස පිළිබඳ වූ සීමා ඉක්මවා නොයන බවට ප්‍රසිද්ධ පුද්ගලයන් සහ නීති විශාරදයන් දුන් සාක්ෂිද බැහැර කරන ලදී.

2010 ජනවාරි මාසයේදී අභියාචනයක් ඉදිරිපත් කිරීමෙන් පසු තිසේනායගම් ඇප මත මුදා හැරුණි. ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය එනම්, මැයි 3 වන දින ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් ඔහුට ජනාධිපති සමාව ලැබෙන ඇති බවට ප්‍රසිද්ධ ප්‍රකාශයක් කළ අතර ඔහුට එම සමාව ලැබීමෙන් අනතුරුව ඔහු ජූනි අග දී ශ්‍රී ලංකාවෙන් පිට විය. ඔහුව නිදහස් කිරීමේ කොන්දේසි තවමත් අප්‍රසිද්ධය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ජසීහරන්ට සහ වලර්මතීට විරුද්ධව ගොනු කර තිබූ චෝදනා පිළිබඳ සමාන්තර නඩු විභාග පැවැති 2009 ඔක්තෝබර් 13 වන දින ඔවුන් දෙදෙනා විසින් සිය මූලික අයිතිවාසිකම් බරපතල ලෙස උල්ලංඝනය කරන ලදැයි ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ගොනු කර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සම් ඉල්ලා අස්කර ගැනීම යන කොන්දේසිය මත ඔවුන් නිදහස් කළ හැකි බවට ඔවුන්ට දැනුම් දෙන ලදී.

ජනමාධ්‍යවේදීන්ගේ අයිතිවාසිකම් යන ඒවායි. එසේ නමුත් සිවිල් සමාජයද හා එක්ව බලධාරීන් සමඟ කරගෙන ගිය බොහෝ විට සතුරු ස්වරූපයක් ගත් සාකච්ඡා ක්‍රියාමාර්ග, 2005 දී යුද මෙහෙයුම් යළි පටන් ගැනීමත් සමඟ සිවිල් සංවාදය සඳහා වන වාතාවරණය සහමුලින්ම අහෝසි වී ගිය කළ බිඳී ගියේය.

එකී අරගලයේ සහ ක්‍රියාකාරිත්වයේ අවධිය පිළිබඳව එහි ප්‍රමුඛයන් ගණනාවක් සමඟ සමුමුඛ සාකච්ඡා මගින් මෙම වාර්තාව සකස්කිරීම පිණිස කරන ලද අතීතාආවර්ජන අධ්‍යනය හරහා විවිධාකාර වූ ඉදිරිදැකීම් ඉස්මතු විය.

'යාපනයේ ජීවත්වන' හිටපු දෙමළ කතුවරයකු කියා සිටියේ 2005 දී යුද්ධයේ අවසන් අදියර ආරම්භ වූ කළ මාධ්‍ය සංවිධාන 5 ක්‍රියාවට දැමූ සමගිය සහ අරගලයේ උපාය මාර්ගය තීරණාත්මක බලපෑමක් කළ බවයි. එසේ නමුත් ඔහුට අනුව 2005දී ඔවින් විසින් ගිවිස ගන්නා ලද මාධ්‍ය ප්‍රඥාප්තියේ වූ සමබර සහ සාධාරණ වාර්තාකරණය අනුග මනය කිරීමෙන් ජනමාධ්‍යවේදීහු, ජනමාධ්‍ය මත පැණවුණු හිතිය විසින් වළක්වන ලදී.

විද්‍යුත් මාධ්‍යයෙහි පුවත් කතුවරයකු ලෙස සේවය කළ "මාධ්‍ය පුහුණුකරුවකු" තර්ක කරන්නේ මාධ්‍ය සංවිධාන 5හි උපාය මාර්ගය ඕනෑම ගැටුමකට පැති ගණනාවක් ඇති බවත් ප්‍රධාන අභියෝගය වන්නේ සෑම පාර්ශවයක්ම ආවරණය කිරීම බවත් යන අදහස ජනමාධ්‍ය ප්‍රජාව තුළ මුල් බැස්සවීමට සමත් වූ බවයි. මේ අරභයා ''ජාත්‍යන්තර සහයෝගය ඇතිව'' මාධ්‍ය සංවිධාන 5 ගෙන ගිය වැඩසටහන 'යුද්ධය පිළිබඳ මාධ්‍ය සාකච්ඡාව වෙනස් කිරීමට' උපකාරී විය. "වෙනස පෙනී යාමට සෑම විටම කළක් ගතවේ" යැයි පුහුණුකරු කියයි. මේ අවස්ථාවේදී ආණ්ඩුවේ සක්‍රීය මර්දනය නිසා වෙනසක් සඳහා මාධ්‍ය සංවිධාන 5හි ක්‍රියාකාරිත්වය තළ වූ විභවයන් යටපත් විය.

කොළඹ සේවය කරන තවත් මාධ්‍ය ක්‍රියාකාරිකයකු සහ පුහුණුකරුවකු සිතන්නේ මාධ්‍ය මර්දනය ක්‍රියාවට නැගූ විධිමත් සහ සංවිධිත අන්දමින් පෙනී යන්නේ ජනමාධ්‍යවේදීන් අතර ගොඩනැගෙ මින් තිබූ නව අවබෝධය විසින් යුදවාදී කඳවුර වෙත ඉදිරිපත් කළ අභියෝගයේ තරම බවයි. එනම් 'මාධ්‍ය සංවිධාන 5හි වැඩසටහන් විසින් ජනමාධ්‍ය සාකච්ඡාව වෙනස් කරමින් තිබීම සහ ඕනෑම වාර්තාවක ආචාර ධර්මීය අංශය ජනමාධ්‍යවේදීන් අතර බොහෝවිට කතාබවට බඳුන් වීම' ය. ගැටුම්, මානව හිමිකම්, පුමිතිරිබව සහ සුලුතර ප්‍රජාවන් ආවරණය සම්බන්ධයෙන් වෙනසක් ඇති කිරීමට මාධ්‍ය සංවිධාන 5 දැරූ ප්‍රයත්න ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය සංස්කෘතියෙහි නිත්‍ය ළකුණකි.

මාධ්‍ය සංවිධාන 5 විසින් සකස්කරන ලද ජනමාධ්‍ය සාහිත්‍යය වෙනස් වූ වාතාවරණය යටතේ පවා වැදගත් මූලාශ්‍රයක් ලෙස පවතිනු ඇතැයි වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමයේ හිටපු ප්‍රධානියකු කල්පනා කරයි. '2005 දී යුද්ධය පටන් ගැනීමෙන් පසු ඇතිවූ දරුණු මාධ්‍ය මර්දනය විසින් මෙම සාහිත්‍ය කොතරම් දුරට කියවනු සහ සාකච්ඡා කරනු ලබන්නේද යන්න තාවකාලිකව යටපත් කර තිබේ. රටේ ඉතිහාසයේ නව අදියරෙහි අභියෝග වලට මුහුණ දීම පිණිස මෙම සාහිත්‍ය වැදගත් මූලාශ්‍රයන් වනු ඇත.'

### අඩුපාඩු සහ අසාර්ථකත්වයන් ඇගයීම

2005 දී ආරම්භවී ඉතා උත්සන්න වූ ජනමාධ්‍ය මර්දනය සමග පොර බැදීමට මාධ්‍ය සංවිධාන පහ අසමත් වූවා යැයි කීම පූර්ණ පැහැදිළි කිරීමක් නොවන්නේය. භිය ගැන්වීමේ නව වාතාවරණයට දැක්වූ ප්‍රතිචාරය ප්‍රමාණවත් නොවූයේ සහ බිය පහ කිරීමට අසමත් වූයේ මන්දැයි සැළකිල්ලට භාජනය කිරීමද අවශ්‍යය. ඊට හේතු වූ සාධක දෙකක් විශේෂයෙන් සඳහන් කළ යුතුය. එකක් නම් ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය කර්මාන්තය අතර පුළුල් සහයෝගීතාවයක් නොමැති වීමය. අනෙක නම් ජාත්‍යන්තර සහයෝගිතාවය පෙන්වීමේ ක්‍රියාවන්, ශ්‍රී ලංකාව ත්‍රස්තවාදය සමග සටන් වැදීමට දරන උත්සාහයට අසාධාරණ ලෙස පහරදීමක් ලෙස නිරූපණය කිරීමට බලධාරීන් දැක්වූ හැකියාවය.

ශ්‍රී ලංකා ජනමාධ්‍ය ආයතන එහි සංස්ථාපනයේ පටන් වෘත්තීමය ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම සහ මාධ්‍ය නිදහස පිළබඳ අධිවාචනය සඳහා සුවිශේෂී වේදිකාවක් ලෙස පෙනී සිටියේය. කෙසේ වෙතත් එහි කොටස්කරුවන්වූ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජනමාධ්‍ය සංවිධාන

අතර එහි ක්‍රියාකාරිත්වය පාලනය විය යුතු නියමයන් සම්බන්ධයෙන් බොහෝ අවස්ථා වලදී එකගත්වයක් නොතිබිණි. මව්බිම පුවත්පතේ වාර්තාකාරිනියකවූ මුනුසාමි පරමේශ්වරී 2007 දී අනතුරට භාජනය වීම පිළිබද විශ්වසනීය ආකාරයකින් ප්‍රතිචාර දැක්වීමටත්, ඉන් පසු, පුවත්පත් ද්විත්වයම වසා දැමීමට හේතුවූ එකී පුවත්පත් ආයතනය සහ එහි හිමිකරු හිරුහැරවලට ලක් කිරීම පිළිබදව සවිමත් ස්ථාවරයක් ගැනිමටත් ශ්‍රී ලංකා ජනමාධ්‍ය ආයතනය සහ කර්තෘ සංසදය 2007 දී පැහැදිළි ලෙස අසමත් වීය.

2007 නොවැම්බර් මාසයේදී සන්ඩේ ලීඩර් පුවත්පතේහි මුද්‍රණාලය ගිණි තැබීමට ලක් වූ අවස්ථාවේදීත් ශ්‍රී ලංකා ජනමාධ්‍ය ආයතනය මාධ්‍ය නිදහසෙහි මූලිකාංග වෙනුවෙන් පෙනී සිටින ආකරයකින් ප්‍රතිචාර දැකිවූයේ නැත. වගකිවයුත්තන් හදුනා ගැනීමට සහ ඔවුන්ට විරුද්ධව චෝදනා ගොනු කිරීම සදහා ශ්‍රී ලංකා බලධාරීන්ට බලපෑමක් ඇති කිරීමට සහයෝගීව කළයුතුවූ ප්‍රතිචාරයට පාක්ෂික සහ දේශපාලන ගැතිකම්වලින් බධා එල්ල වූ බව වාර්තා විය.

2008 මැයි මාසයේදී ද නේෂන් ඉංග්‍රීසි මාධ්‍ය සතිපතා පුවත්පතෙහි පෘතුල පාඨක පිරිසක් සිටි ආරක්ෂක තීරු ලේඛක කීත් නොයාර් පැහැරගෙන ගොස් වධහිසාංවන් වලට බදුන් කරන ලදී. මාධ්‍ය සංවිධාන 5, පොලීසිය සහ කොළඹ ආරක්ෂක ඒජන්සි සමග අප්‍රමාදව මැදිහත් වීමෙන්ද සහ ඔවුන්ගේ ජාත්‍යන්තර ආධාර ජාල වෙත අනතුරු හැගවීම මගින්ද නොයාර් ලක් වීමට තිබූ වඩා දරුණු ශාරීරික හානි වලින් මුදවා ගන්නට සමත් විය. ඊලඟ මාසයේදී සිංහල මාධ්‍යවේදියෙක් මෙන්ම ශ්‍රී ලංකා ජනමාධ්‍ය ආයතනයේ අධිවාචන අංශයේ උප ප්‍රධාන තනතුර හෙබවූ නාමල් පෙරේරා මිතුරෙකු සමග රියෙන් යත්දී කොළඹ අවට ප්‍රදේශයකදී පහර දීමට ලක් විය. පුද්ගලයන් පිරිසක් එම ස්ථාන වෙත රොක්වීම හේතුවෙන් අත් හරින ලද නමුත් පැහැර ගෙන යාමේ එම උත්සාහයට මුහුණ දුන් දෙදෙනාම බලපතල තුවාල ලැබූහ.

ශ්‍රී ලංකා ජනමාධ්‍ය ආයතනය පෙර නොදුටු අභිප්‍රයකින් යුතුව මෙම ප්‍රහාර දෙකට ප්‍රතිචාර දැක්වූයේය. එම වසරේ ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකාවට එවූ ජනමාධ්‍ය නිදහස පිළිබද ජාත්‍යන්තර දූත මෙහෙයක සමාජිකයන් හමුවූ ශ්‍රී ලංකාවේ වඩාත්ම ජේෂ්ඨ පුවත්පත් කර්තෘ වරයෙක් ඉතාම විවෘත ලෙස මාධ්‍යට එල්ල වූ ප්‍රහාර සම්බන්ධයෙන් දැක්වූ අසමමිතික සහ අස්ථාවර ප්‍රතිචාරයන්ට ප්‍රධාන හේතුව ලෙස ඔහු දකින්නේ කුමක්දැයි විස්තර කළේය. පෙර වසර වල ප්‍රහාර සුලභ වූවත් බොහෝ අවස්ථා වලදී ඊට ගොදුරු වූයේ ශ්‍රී ලංකාවේ සුළුතර වාර්ගික පිරිස්ය. එම නිසා ඒවා දක්නා ලද්දේ මාධ්‍ය නිදහසට එල්ලවූ අතවර ලෙසට වඩා පවතින සිවිල් අර්බුදයේ පාර්ශ්වික හානි ලෙසය. එනමුත් නොයර් සහ පෙරේරා ප්‍රහාරයට ලක් වූ විට යථාර්ථය ඉතා පැහැදිළි විය. එම යථාර්තය නම් අනතුරට භාජනයවන්නාගේ ජනවාර්ගික අනන්‍යතාවය හෝ ගෙදුරු බවට පත් ආයතනයේ දේශපාලන මතය නොසලකා මාධ්‍ය නිදහස වෙනුවෙන් සටන් කිරීම වටිනාකාරියක් බවය.

# නිගමන සහ නිර්දේශ

දකුණු ආසියාවේ ප්‍රජාතන්ත්‍රවාදය සහ ප්‍රකාශනයේ නිදහස සඳහාවූ අරගල වලදී, ජනමාධ්‍යවේදීන් ඔවුන්ගේ වෘත්තීය සමිති හා සංගම් මඟින් ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කර ඇත. මෙම පර්යේෂන ව්‍යාපෘතියට පාදක වන්නේ එකිනෙක රටවලදී යම් ආකාරයක විවිධත්වයක් පෙන්නුම් කැරෙන සාමූහික ක්‍රියාකාරකම් මෙන්ම ප්‍රතිඵලයන් ය. ගැටුම් සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයන් පවතින අවස්ථාහිදී, තම ප්‍රජාව දැනුවත් කිරීමට ජනමාධ්‍යවේදියාට ඇති හැකියාවට රුකුල් දෙන වෘත්තීමය නිදහස, බොහෝ අවස්ථාවලදී ප්‍රචණ්ඩත්වය සහ අනෙකුත් ආකාරයේ බිය ගැන්වීම සහ හිරිහැර යොදා ගනිමින් පළමුවෙන්ම කප්පාදු කෙරේ. ජනමාධ්‍යවේදීහු නියෝජන වෘත්තීය සමිති වශයෙන් සංවිධානය වූ රටවල ඇති විය හැකි අර්බුදකාරී තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමේ දී ඔව්හු වඩාත් යෝග්‍ය තත්ත්වයක සිටින අතර, එවැනි සීමා කිරීම් අපසු හැරවීම සඳහාවූ සිවිල් සමාජ ක්‍රියාකාරකම් වලදී ඔවුන් බොහෝ විට පෙරමුණ ගෙන කටයුතු කරයි.

මෙම මූලික ලක්ෂණ හැරුණු කොට, දකුණු ආසියානු මාධ්‍යවේදීන්ගේ අරගලයන්හි පොදු ලක්ෂණ රාශියක් දැකිය හැකිය. මෙම ලක්ෂණ හඳුනා ගැනීම අනාගතයේ දී අදාල රටවල මෙන්ම අන්තර් දේශසීමා සහයෝගී ක්‍රියාකාරකම් සාර්ථක උපාය මාර්ගයන් පිහිටුවීමට මූලික පදනමක් වනු ඇත.

පළමු පාඩම වන්නේ ජනමාධ්‍යවේදීන් සමස්ථ වෘත්තීය ප්‍රජාව වෙනුවෙන් හඬ නැගීමට හා ක්‍රියාකිරීමට හැකියාව ඇති නියෝජන ආයතන ලෙස සංවිධානය වීම අවශ්‍ය බවයි. රට පුරා ජනමධ්‍යවේදීන් අතර සම්බන්ධතා ඇති කිරීමත් වඩාත්ම පුළුල් සහභාගිත්වයත් ධෛර්යමත් කැරෙන ප්‍රජාතන්ත්‍රවාදී ආකෘති සහ භාවිතයන් ඒ සඳහා යොදා ගත යුතුය. එකමුතු ජනමාධ්‍ය ප්‍රජාවක් සිටින රටක ඔවුන්ගේ කටයුතු වඩා සාර්ථක වීම ප්‍රත්‍යක්ෂ වී ඇති අතර අතර එය අහඹු සිදුවීමක් නොවේ.

දෙවනුව ජනමාධ්‍යවේදීන් සහ විවිධ සිවිල් සමාජීය ක්‍රියාධරයන් අතර තිරසාර සන්ධානයක් ඇති කර ගැනීම තුළින් සාමූහික අරගලයන් වඩාත් ශක්තිමත් වන අතර ඉන් ඇති කළ හැකි බලපෑමද අති විශාලය. මෙය පැහැදිළි නිගමනයක් වූ වූ නමුත් මේ හා සම්බන්ධ සිද්ධීන් ලෙස දැක්විය හැකි අවස්ථාවන් ඇත්තේ දෙකකි. එනම්, නේපාලයේ ඒකාධිපති රාජාණ්ඩුවට එරෙහිව 2006 දී ක්‍රියාත්මක වූ ව්‍යාපාරයත්, 2008 දී පකිස්තානයේ මිලිටරි ඒකාධිපතිත්වයට එරෙහිව දියත් කරන ලද සාර්ථක විරෝධතා මෙහෙයුමත්ය. එහි දී පුළුල් සන්ධාන ගත වීම් සාර්ථකව ක්‍රියාතත්මක වී ඇත. අනතුරුදායක දේශපාලන මැදිහත්වීම් ඇති වීමට පෙර වලට පෙර, අන්තර් ජනවාර්ගික සහයෝගීතාවය සාර්ථක ලෙස යොදා ගනිමින් ප්‍රජාතන්ත්‍රවාදය සහ මාධ්‍ය නිදහස සඳහාවූ මහජන ව්‍යාපාරයන්හි දී සිවිල් සමාජය මෙහෙයවීමටත්, එකමුතු කිරීමටත්, ශ්‍රී ලංකාවේදී ජනමාධ්‍ය ප්‍රජාව විසින් සමත් වීම උදාහරණයකි.

මේ අනුව, ජනමාධ්‍ය සංගම්වලට ඇති අභියෝගය වන්නේ, එළඹෙන ඕනෑම අවස්ථාවක මනා ධෛර්යකින් හා ජවයකින් යුතුව ක්‍රියාත්මක විය හැකි ආකාරයේ සම්බන්ධතාවයක් සිවිල් සමාජය සමඟ ගොඩ නගාගැනීමටත්, පවත්වාගැනීමටත් කටයුතු කිරීම ලෙස දැක්විය හැකිය.

ජාත්‍යන්තර ජාලයන් සමඟ හවුල් වී සිටීම , දේශීය ව්‍යාපාරයන්ගේ ශක්තිය වඩා වැඩි කර ගැනීමේ උත්සාහයන්ට සෑම අවස්ථාවකදීම වාසි දායක වී ඇති බැවින් එසේ ජාල ගත වීම ඉතා වැදගත් වේ. ඉතාමත් සාර්ථක ජාත්‍යන්තර මානයක් ස්ථාපනය කළ හැකි වන්නේ ශක්තිමත් දේශීය වෘත්තීය සමිති හෝ සංගම් පවතින අවස්ථාවලදී සහ දේශීය සීමාවන්ගෙන් පිටත වූ ජාලයන්ට පවත්වා ගැනීමට ඒවාට හැකි අවස්ථාවන්හිදීය. තවද, අත්දැකීම් මගින් පෙන්වා දෙන්නේ ජාත්‍යන්තර ජාලයන්, දේශීය ව්‍යපාර සම්බන්ධයෙන් ප්‍රමණවත් ලෙස දැනුවත් වී සිටින අවස්ථාවන්හිදීත්, ජනමාධ්‍යවේදීන්ගේ සංවිධාන අතර ඇති සහසම්බන්ධයට බොහෝ අවස්ථා වලදී එල්ල වන භාෂාම බාධා ජය අභිබවා යාමට ඔවුන්ට හැකි වන අවස්ථාවන්වලදීත්, වඩාත් ඵලදායී වන බවයි. දේශීය වෘත්තීය සමිති වැනි ස්ථාපිත නියෝජන ආයතන සමග එකට වැඩ කිරීම තුළින්, ප්‍රජාව තුළ ස්ථාවර ලෙස මුල් බැස ගැනීමටත්, ව්‍යාපාරයන්හි ඵලදායිත්වය සුර්කෂිත කිරීමට අත්‍යවශ්‍ය වන විශ්වසීය තොරතුරු වෙත ප්‍රදේශ වීමටත් ඇති හැකියාව සුරක්ෂිත කරනු ඇත. දේශීය ප්‍රජාවන් සමග ඇති මෙම මුල් බැසගත් සම්බන්ධතා ගෝලීය වශයෙන් අවබෝධ කරගත හැකි ව්‍යවහාරයන් බවට පරිවර්තනය කිරීමට ක්‍රම සොයාගත යුතුව ඇත.

හොඳම සහයෝගිතාවයන් වන්නේ දීර්ඝ කාලීන සබඳතා ඇති විටය. එවිට අන්තර් ජාතික සංවාධානයන්ට කල්තියා, දෘශ්‍යමාන සහ අනවරත සහයෝගයක් ලබා දිය හැකිය. කලාපීය සහ ජාත්‍යන්තර සහයෝගිතාවයේ වැදගත්කම මතුවන්නේ සහයෝගිතා ක්‍රියා මගින් ඒවාට සැපයිය හැකි සදාචාරමය සහයෝගය සහ ජාතික හෝ ප්‍රාදේශිය සිදුවීමක් අරභයා තෙරපුමක් ඇති කිරීමට කලාපීය සහ ජාත්‍යන්තර ජාලයන්ට ඇති හැකියාවත් නිසාය.

ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයේ ආසියා පැසිෆික් කළාපය විසින් 2002 වසරේදි වෘත්තීය සමිති සහ ජනමාධ්‍ය නිදහස පිළිබඳ සංවිධාන එකතු කර පිහිටවනු ලැබූ දකුණු ආසියානු මාධ්‍ය සහයෝගිතා ජාලය, පුළුල් ගැටළු මාලාවක් ආමන්ත්‍රණය කිරීමට උත්සහ ගන්නා කළාපීය ජාලයකි. මෙහි සාමාජිකයන් , තොරතුරු, අත්දැකීම් සහ කුසලතා දේශසීමා හරහා හුවමාරු කර ගනිමින් වඩා ඵලදායී අධිවාචන වැයම් සඳහා ඉඩ ලබා දෙන අතර සාමාජික වෘත්තීය සමිති සහ සංගම් හි ධාරිතා සංවර්ධනය සඳහා වැඩි අවධානයක් යොමු කරයි. මෑත කාලයේදී දකුණු ආසියානු මාධ්‍ය සහයෝගීතා ජාලය ජනමාධ්‍ය නිදහස ආරක්ෂා කර ගැනීම සඳහා මූලධර්මයන් සහ උද්ඝෝෂණ ව්‍යාපාර උපක්‍රම පිළිබඳ පුළුල් වූ පොදු සම්මුතියක් ස්ථාපනය කර ගැනීම සඳහා ඉන්දියාවේ කාශ්මීර්, චත්තිස්ගාර්, ඊසාන දිග වැනි ප්‍රදේශයන්හි ජනමාධ්‍ය එකමුතු ඇතිකිරීමට උත්සාහ දරා ඇත.

දකුණු ආසියානු මාධ්‍ය සහයෝගීතා ජාලයේ සහ ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයේ ආසියා පැසිෆික් කලාපයේ අත්දැකීම් වලට අනුව කළාපීය සහ ජාත්‍යන්තර ජාලයන්ට වඩාත්ම සහයෝගයක් දෙන්නේ ඉක්මන් සහ සම්පූර්ණ තොරතුරු ගලා යාම් මඟිනි. ගෝලීය සංවිධාන ඕනෑම ගැටළුවකදී ස්ථාවරයක් ගැනීමට පෙර අදාල සියළු දත්ත ඇගයීමකට ලක් කර ඇති බවට විශ්වාසයෙන් සිටීම අවශ්‍ය බැවින් දේශීය සංගමයක් විසින් ජාත්‍යන්තර සහය සහ සහයෝගීතාවය ඉල්ලා සිටිමින් කරනු ලබන පළමු ඉල්ලීම ව්‍යාකූලත්වයෙන් තොර විය යුතුය.

බලපෑම් කිරීම සහ අධිවාචන උත්සහයන් සාර්ථක වූ අවස්ථා පිළිබඳ මෙන්ම අසාර්ථක වූ අවස්ථා පිළීබද අත්දැකීම් හුවමාරු කර ගැනීම දීර්ඝ කාලීන වශයෙන් වැඩි ඵලදායීතාවයක් ළඟා කර ගැනීමට දායක වී ඇත. උදාහරණයක් වශයෙන් දකුණු ආසියාවේ ඇතැම් ජනමාධ්‍ය සංගම්, අවදානමක පසුවන ජනමාධ්‍යවේදීන් ආරක්ෂා කිරීම, මාධ්‍ය කාර්ය සම්බන්ධයෙන් නීති සම්පාදන ක්‍රියාවලියට බලපෑම් කිරීම් සහ ගැටුම් නිසා අනතුරට පත් වූ පුද්ගලයන්ට ආධාර කිරීම සඳහා අරමුදල් වැනි රාජ්‍ය යාන්ත්‍රණ පිහිටුවා ගැනීම ආදිය සම්බන්ධයෙන් සුවිශේෂී සාර්ථකත්වයක් ළඟා කර ගෙන ඇත. මේ සඳහා බොහෝ අවස්ථා වලදී ආධාර දෙන ආයතනයන්ගෙන් සහ වඩා පුළුල් වූ සිවිල් සමාජයෙන් ආධාර දීම පිළීබද කැප වීමක් අවශ්‍ය කරන බැවින් මේ සම්බන්ධයෙන් සංගම් තුළ ඇති විනිවිද භාවය පිළිබඳ ප්‍රතිපත්ති සාධනීය කාර්යක් ඉටු කරයි.

තමන් ලබා දෙන ආධාර ජාතික භෞමික දේශ සීමා තුළට සීමා

කරන ජාත්‍යන්තර ආධාර දෙන සංවිධාන සඳහා පණිවුඩයක් මෙහි ගැබ්ව පවතී. විවිධ ඉතිහාසයන්ට හවුලේ උරුමකම් කියන දකුණු ආසියාව වැනි සංකීරණ කළාපයක් සඳහා සකස් කැරෙන සක්‍රීය උපාය මාර්ගයන්හිදී අන්තර් දේශසීමා සාධකයක්ද එහි වේ න්ම එය වඩා සාර්ථක වනු ඇත. සරලව දැක්වුවහොත්, පකිස්තානයේ කයිබර් පක්තුන්කාවා සිට නේපාලයේ තෙරායි දක්වාත් එහි සිට ඉන්දියාවේ ඊසාන දිග ප්‍රදේශ දක්වාත් ඇති ගැටුම්කාරී යැයි සැලකෙන දකුණු ආසායාවේ සියළු කළාප ඒවා අද පවතින තත්ත්වයේ ඇත්තේ මධ්‍ය ගත වූ දේශපාලනය සහ රාජ්‍ය පාලනය විසින් දේශසීමා හරහා පවතින සබඳතා සාධාරණ ලෙස පවත්වාගෙන යාම වළක්වා තිබීම හේතුවෙනි.

මාධ්‍ය පිළිබඳ ප්‍රතිපත්ති සහ නීති යන විෂය සම්බන්ධයෙන් සංගම් තව දුරටත් ක්‍රියාකාරීව සිටිය යුතු ක්ෂේත්‍රයකි. බොහෝ රටවල විකාශණ මාධ්‍ය මත ඇති රාජ්‍ය ඒකාධිකාරයන් තුළින් ඇති කරන සීමාවන්, පෞද්ගලික මාධ්‍යයේ හදිසි නැග්ම විසින් නොසළකා හැරිය හැකි තත්ත්වයකට පත් කර දැමූවද නියාමනය සහ ආචාරධර්මී භාවිතය පිළිබඳ ගැටළු අදාලව පවතී. ඉන්දියානු උදාහරණ්‍ය පෙන්වා දෙන පරිදි පෞද්ගලික ප්‍රචාරක මාධ්‍යයන්ගේ හදිසි ප්‍රසාරණය විසින් අන්තර්ගතයේ ප්‍රමිතිය හෝ පොදු ජන යහපත සඳහා වියයුතු අවධානය සුරතක්ෂිත නොකරයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ සිදුවීම් පෙන්වා දෙන ආකාරයට රාජ්‍ය පාලිත ප්‍රචාරක මාධ්‍ය අයුතු ලෙස පාලනය කිරීමේන් හටගන්නා අනතුරු විලක්ප නාලිකාවන්ගේ බහුලත්වය හේතුවෙන් අඩු වන්නේද නැත. නේපාල ජනමාධ්‍යවේදීන්ගේ සංගමයන්, විකාශණ මාධ්‍ය වලට ආයතනික ස්වායක්තතාවය හෙබවීමට ඉඩ ලැබෙන ලෙසත් ප්‍රචාරක බලපත්‍ර පිළිබඳ රජය සතු පූර්ණ බලය ඉවත් වන ලෙසත් 1992 ජාතික ප්‍රචාරක පනත ප්‍රතිශෝධනය කළ යුතුය යන පිළි ගැනීම තහවුරු කිරීමේලා සුවිශේෂී ඉදිරි පියවර තබා ඇත. ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගැනීමෙහිලා ලැබූ පළමු සාර්ථකත්වය, එය සැබෑවටම ක්‍රියාවට නැගීම මගින් පිළිපදින බව තහවුරු කිරීමට සංගම් පියවර ගත යුතුය.

මෙම වාර්තාවෙන් ආවරණය කර ඇති සෑම රටකම විකාශණ සතුව ඇත. නේපාලය සහ යම් ප්‍රමාණයකට බංග්ලාදේශය හැරුණු කොට සෑම රටකම ප්‍රජා ගුවන්විදුලි සේවා පාලනය කරන නීති, සීමාකාරීය. ප්‍රජා විකාශණ සේවා  ප්‍රවර්ධනය කිරීමවෙනුවට ප්‍රජා මුල පිරීම් හා ක්‍රියාකාරිත්වන් සීමා කිරීමේ නැඹරුවක් දක්වයි. ප්‍රජා ගුවන් විදුලි සේවාවන්හිලා  සිවිල් සමාජයේ සෑම ප්‍රජාතන්ත්‍රවාදී පිරිසකගෙ ම සහභාගීත්වය තහවුරු කිරීම සඳහා සංගම් ඔවුන්ට හැකි උපරිම අයුරින් මෙම ක්ෂේත්‍රයෙහි ක්‍රියාකාරී විය යුතුය.

ඒ අතරම ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ අදාල නීති යොදා ගනිමින් ප්‍රකාශණය කිරීම හා විකාශය නැවැත්වීමට හැකි බලය අඩු කළ යුතුය. කවර හෝ තත්ත්වයක් යටතේ ඒවා අවශ්‍යවන්නේ නම්, එවන් සියළු තීරණ සාධාරණ සහ විනිවිධ භාවයකින් යුතු නීතිමය පරිපාටියකට අනුකූලව තීන්දු කළ යුතුය.

මාධ්‍ය සංවිධාන සහ සංගම් විසින් වෘත්තීමය ජනමාධ්‍යවේදය සඳහා වන ආචාර ධර්ම සහ මඟ පෙන්වීම් නිර්ණායක සංග්‍රහ ගත කළ යුතුය. වාර්තාව මඟින් ආවරණය කර ඇති සියළු රටවල සංගම ඉහත කරුණ සම්බන්ධයෙන් වැදගත් ඉදිරි පියවර ගෙන ඇත. රටවල් පහේම මෙවන් වැයම් සඳහා ඉහල ප්‍රමුඛතාවයක් පවත්වාගෙන යාම අවශ්‍ය වන අතර සංගම් විසින් දේශපාලන පක්ෂ සහ ඒ හා අනුබද්ධ සංවිධානයන්ගෙන් මෙන්ම ව්‍යාපාරික ලැදියාවන්ගෙන් එල්ල වන පීඩනයන්ට ප්‍රතිරෝධයක් නිර්මාණය කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් ආයතන ගත කිරීමද කළ යුතුව ඇත. මෙම රටවල් පහේම ඇති ප්‍රකාශ නොවන සත්‍යයක් නම්, බොහෝ අස්ථාවලදී පාතාල කණ්ඩායම් සහ අපරාධ කරුවන්ගේ කණ්ඩායම්, ඔවුන් ඇති කරන බියවැද්දීම් යොදා ගනිමින් මාධ්‍ය තුළ අවකාශයක් ලබා ගන්නා බවයි. වෘත්තීයමය වශයෙන් එකමුතු වීමට සහ ආචාරධර්ම සංග්‍රහයක් පිළිපැදීම හැර මෙවන් තර්ජනයකට විරුද්ධව යොදා ගත හැකි වඩා හොඳ වෙනත් ආරක්ෂක පිළියමක් නොමැති බව අත්දැකීම් හරහා පෙනි යයි.

ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය වෘත්තිකයන් ඝාතනය කිරීම්, ඔවුන්ට පහරදීම්, මෙන්ම ඔවුන්ව පැහැරගෙන යාම් රටවල් පහේම බහුල සිදුවීම් වී ඇති අතර එය ප්‍රකාශණයේ නිදහස මත භයංකර බලපෑමක් එල්ල කර ඇත. එවන් සෑම සිදුවීමක් විසින්ම අනිවාර්යයෙන්ම ජනමාධ්‍ය වෘත්තිකයන්ට එක්සත් වීමටත්, එවන් සෑම සිදුවීමකටම දඬුවම් ලැබෙන බව තහවුරු කිරීමටත් ගැනීමටත් පොළඹවනු ලබයි. එනමුත්, දුර්විපාක නොලැබීම, දකුණු ආසියානු සංස්කෘතිය තුළ මුල් බැස ගෙන ඇති අතර මෙය නිමාවක් දකින බව සහතික කිරීමට ක්‍රමයත් ජනමාධ්‍ය ප්‍රජාව විසින් සොයා ගත යුතුව ඇත. ජනමාධ්‍යවේදීන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය වීම් පිළිබඳව බලධාරීන් ඉක්මණින් සහ කාර්යක්ෂම ලෙස විමර්ශණය කිරීමත්, අධිචෝදනා කිරීමත් සිදු කරන බවට ජනමාධ්‍යවේදීන්ගේ සංවිධාන වග බලා ගත යුතුය.

ප්‍රබල දේශීය සංගම් සහ වෘත්තීය සමිති විසින්, පළමුව දේශීය මට්ටමේ ව්‍යාපාරත්, ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයේ සහය ඇතිව ජාත්‍යන්තර ව්‍යාපාරත් ගොඩ නගා ඇති කළාපයෙන් පිටත ඇති පිලිපීනය සහ ඉන්දුනීසියාව වැනි රටවල් වලින්ද පාඩම් ඉගෙන ගත හැකිය. දුර්විපාක නොලැබීමේ සංස්කෘතිය නිමා කිරීම තීරණාත්මකය. පුලුල් ජනමාධ්‍ය සහ නීතීඥ ප්‍රජාව සමග එකතු වී සංගමයන් විසින් කළාපීය සමානතා මෙන්ම පොදු ක්‍රියාවන් සහ පාඩම් හදුනා ගැනීමට දකුණු ආසියාව පුරා දුර්විපාක නොලැබීමේ අත්දැකීම් සිතියම් ගත කිරීම සඳහා හැකියාවන් සොයා ගත යුතුය.

සියළු දකුණු ආසියානු ජනමාධ්‍ය වෘත්තිකයන්, රාජ්‍ය පාලිත ජනමාධ්‍යයන් විසින් ගොඩනගන ලද සම්පත්, සමාජීය පාලනය වෙත මාරු කිරීම පිළිබඳ සංවාදයක සහභාගී විය යුතුය. රජයන් මහජන ලැදියාවන් මූර්තිමත් කරන බවට පවතින ගතානුගතික චින්තනය අත් හල යුතුය. මහජන සේවා ජනමාධ්‍ය විවාදයට කේන්ද්‍රිය ස්ථානයක් ලබාදීමත් මෙකී සම්පත් දේශපාලන බැඳීම් වලින් තොර පාලන ව්‍යුවහයන්ගෙන් හෙබි ස්වාධීන භාරකාර මණ්ඩලයන්ට පවරා දීමත් අත්‍යවශ්‍ය වේ. ඇතැම් සංගම් මේ සම්බන්ධයෙන් මේ වන විටත් ඉදිරි පියවර තබා ඇති අතර අත්දැකීම් හුවමාරු කර ගැනීමටත්, පොදු ව්‍යාපාරයක් ගොඩ නැගීමටත් ක්‍රමයක් සොයා ගැනීම අවශ්‍ය වේ.

ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයින් සඳහා පූර්ණ පුහුණ සහ අධ්‍යාපනයන් ලබා දෙන ජාතික වැඩසටහනක් අවශ්‍ය බවත්, ඊට ධෛර්ය සහ මූල්‍ය සම්පත් ආයෝජන මාධ්‍ය ආයතන හිමිකරුවන්, කළමණාකාරුවන් සහ මාධ්‍ය සංගම් විසින් ලබා දිය යුතු බවත් මෙම පර්යේෂණ ක්‍රියාවලිය මඟින් පැහැදිළි වී ඇත. මෙම ක්‍රියාවලිය තුළ ආචාරධර්ම , වෘත්තීයමය කුසලතා , කළමණාකාරණය සහ ව්‍යාපාර සැළසුම් කිරීම පිළිබඳ මුලික පුහුණුපාඨ මාලා සංවර්ධනය කළ යුතුය. මේපුහුනු පාඨමාලාවන්හිලා සඳහා සෑම රටකම බැහැර කර ඇති කණ්ඩායම් ඇතුළත්වන බවට තහවුරු කර ගත යුතුය.

සංගමයන්, ඔවුන්ගේ ව්‍යුහයන් මඟින් , ජාතික අගනුවර හා ජනමාධ්‍යවේදීන් විශේෂයෙන්ම දරුණු අභියෝග වලට මුහුණ දෙන දකුණු ආසියානු රටවල දුරස්ත වූ ප්‍රදේශ අතර ශක්තිමත් සබඳතාවයන් සපයන බව තහවුරු කළ යුතුය. ජාතික අගනුවර සහ සෙසු විශාල අගනගරයන්හි සංගම් වල සහය ඇතිව දුර බැහැර ප්‍රදේශයන්හි භාෂණයේ නිදහස ක්‍රියාවේ යෙදීම සම්බන්ධයෙන් ඇති අභියෝග සඳහා අවධානය ලබා ගැනීමටත් , එම ගැටළු වලට පුළුල් මහජන අවධානයක් ලබා දීමටත් ඉහත ආකාරයේ සබඳතා පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. ජනමාධ්‍යවේදීන් එකිනෙකා සමඟ සම්බන්ධ කිරීමටත්, තොරතුරු සන්නිවේදනය කිරීමටත් වඩා හොඳ ක්‍රම අවශ්‍ය වේ.

සංගමයන්, අයිතීන් ආරක්ෂා කිරීම පිළිබඳ දීර්ඝ ඉතිහාසයන් සහිත ජනමාධ්‍ය සංවිධාන වලට සහය දීම සම්බන්ධයෙන්

බොහොමයක් තරුණ වෘත්තිකයන් අතර දැකිය හැකි අඩු උනන්දුව පිළිබඳ ප්‍රශ්ණය ආමන්ත්‍රණය කිරීම උදෙසා තරුණ ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයන් ගෙන් සැදුම් ලත් නියෝජන ව්‍යුහයක් සකස් කිරීම පිළිබඳ ව අවධානය යොමු කළ යුතුය. මෙය මෙම සියළුම රටවල ජනමාධ්‍ය නිදහස පිළිබඳ ඉතා වැදගත් අනාගත ආයෝජනයකි.

සංගමයන්, සියළුම ජනමාධ්‍ය වෘත්තිකයන්ට යහපත් වැටුප් සහ සේවා කොන්දේසි ලබාදීම පිළිබඳ වූ සම්ප්‍රදායික භාරය නොකඩවා සිදු කළ යුතුය.  විශේෂයෙන්ම, වැටුප් තීරණය කිරීම ව්‍යවස්ථාපිත වැටුප් මණ්ඩලයක් විසින් සිදු කිරීම වැනි ආයතනගත ක්‍රියාපරිපාටීන් පවතින පාකිස්තානය, ඉන්දියාව සහ බංග්ලාදේශය වැනි රටවල මෙම මූලික ගැටළු පිළිබඳව ඇති වත්මන් පිවිසුම නැවත සලකා බැලීමේ අවශ්‍යතාවයක් ඇති අතර, සේවක අයිතීන් පිළිබද සේව්‍යයන් තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා කලාපීය ව්‍යාපාරයක් ද ගොඩනැගිය යුතුය.

වෘත්තිය තුළ මෙන්ම සතුට දනවන පරිදි ජනමාධ්‍ය වෘත්තීය සමිති තුළ ද කාන්තා නියෝජනය ඉහල යමින් සහ ධෛර්යමත් කෙරෙමින් පවතී. වෘත්තීය සමිති විසින්, සියළුම ස්ථරයන්හි කාන්තා සහභාගිත්වය ක්‍රියාකාරී ලෙස ධෛර්යමත් කිරීම සඳහා පියවර ගැනීම දිගටම කළ යුතුය.

අවසන් වශයෙන් සංවිධානය කිරීම සහ සාමාජිකයන්ව දැනුවත්ව සහ ක්‍රියාකාරීව පවත්වා ගෙන යාම සඳහා වෘත්තීය සමිති නව මාධ්‍ය තාක්ෂණය පිළිබඳව අවධානය යොමු කළ යුතුය. මෙම යම්තාක් දුරකට හෝ, හුදකලාභාවය පිළිබඳ හැඟීම ආමන්ත්‍රණය කරනු ඇති අතර සහ භූගෝලීය බාධක අභිබවා සහයෝගීතාවය ඉදිරියට ගෙන යනු ඇත.

Visit asiapacific.ifj.org or www.ifj.org for more information.

The IFJ is a non-governmental, non-profit organisation that promotes coordinated international action to defend press freedom and social justice through the development of strong, free and independent trade unions of journalists. IFJ Asia-Pacific coordinates IFJ activities in the Asia-Pacific region. The IFJ works closely with the United Nations, particularly UNESCO, the United Nations OHCHR, WIPO and the ILO, the International Committee of the Red Cross, the European Union, the Council for Europe and with a range of international trade union and freedom of expression organisations. The IFJ mandate covers both professional and industrial interests of journalists.